# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | තිනමින

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බිනර අව තෙළෙස්වක ලත් කුජ දින | කාණ්ඩය 111 පත්‍රය 232 පිටු 32 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 සැප්තැම්බර් 15 අඟහරුවාදා


**කොවිඩ් ව්‍යාප්තිය**



සතියේ තුනපහ මධ්‍යසරේ අද පත්‍රය සමග

# දියර කිරි අවශ්‍යතාව සපුරාලීමට පියවර ගන්න

## ජනපති නිලධාරීන්ට උපදෙස් දෙයි

දේශීය දියර කිරි අවශ්‍යතාව සපුරාලීමට රාජ්‍ය, පෞද්ගලික දෙඅංශයේ සහ කුඩා පරිමාණ ගොවීන්ගේ එකතුවෙන් කෙටි සහ දිගුකාලීන සැලැස්මක් ක්‍රියාත්මක කරන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හ සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලයේදී ඊයේ (14) පැවැති සාකච්ඡාවේදී නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

තෘණ වගාවල කිරි ගවයන් බෝ කිරීම සහ පර්යේෂණ ආයතන සේවා වැඩිදියුණු කොට කඩිනමින් ඉලක්ක සාර්ථක කර ගැනීමේ අවශ්‍යතාව ජනාධිපතිවරයා අවධාරණය කළේය. මෙරට වාර්ෂික කිරි අවශ්‍යතාවෙන් දේශීයව නිෂ්පාදනය කරනු ලබන්නේ සියයට 40කට අඩු ප්‍රමාණයකි. පෝෂ්‍යදායක නැවුම් දියර කිරි පානය සඳහා ඇති අවස්ථාව මේ නිසා ජනතාවට අහිමි වී තිබේ. පිට 06

## පාස්කු දා ප්‍රහාරය ගැන තොරතුර

# බුද්ධි අංශ රැස්වීමේදී සාකච්ඡා කළේ නෑ

**එය ලැබී තිබුණේ නිලන්ත ජයවර්ධනට බැවින් සාකච්ඡා කළ යුත්තේ ඔහුයි**

**මටත් එය ලැබී තිබුණා. අසනීප තත්ත්වය නිසා මම කාර්යාලයෙන් පිටව ගියා.**

**හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස්**

සුභාෂිණී සේනානායක

එල්ල විය හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 04 වැනිදා විදෙස් බුද්ධි අංශයකින් ලද තොරතුර සම්බන්ධයෙන් අප්‍රේල් 09 වැනිදා පැවැති බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා වන නිලන්ත ජයවර්ධන මහතා විසින් කිසිදු පැහැදිලි කිරීමක් නොකළ බව හිටපු ජාතික බුද්ධි ප්‍රධානී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සිසිර මෙන්ඩිස් මහතා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ ඊයේ (14 ) අනාවරණය කළේය. පිට 06

## රුවන්ට 28යි: රවිට 10යි

# එජාප නියෝජ්‍ය නායකත්වය රුවන්ට

පිට 03

# බූස්සේ වර්ජනය අත්හරිති

**වෙලේ සුදා කංජිපානි පොඩි ලසී නීරෝ-ඔස්මන් දිවා ආහාරය ගනිති**

පිට 03

# 13 වැනි කොරෝනා මරණය හලාවතින්

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 ආසාදිත 13 වැනි මරණය සිදු වූ බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා 'දිනමිණ'ට ඊයේ (14) ප්‍රකාශ කළේය. පිට 06

## නීතිපතිට එරෙහිව පියවර ගන්න

ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් පිට 06

## දිනක වැටලීම්වලින් මත්ද්‍රව්‍ය තොග සමඟ සැක 422ක් දැලේ

රක්ෂණ ශ්‍රියන්ත

බස්නාහිර පළාතේ දිනකදී කළ වැටලීම්වලින් හෙරොයින් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සමඟ සැකකරුවන් 422ක් අත්අඩංගුවට ගෙන තිබේ. පිට 06

## කොළඹ පොත් ප්‍රදර්ශනය 18 දා සිට

ශ්‍රීලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය 22 වැනි වරටත් සංවිධාන කරන කොළඹ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී එළැඹෙන 18 දා ආරම්භ වේ. පිට 06

## 19 රැකගන්න ඕනෑම දෙයක් කරනවා | සුනිල් වටගල

නදී මාණික්කගේ

19වැනි ව්‍යවස්ථා සංශෝධනය ආරක්ෂා කිරීමට ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට පසුබට නොවන බව ජවිපෙ හිටපු පළාත් සභා මන්ත්‍රී නිතිඥ සුනිල් වටගල මහතා ඊයේ (14) දිනමිණට පැවසුවේය. පිට 06

## නිලන්ත ජයවර්ධනගේ දුරකතනය කොමිසම භාරයට ගන්න

කොමිසමේ සභාපති නියෝග කරයි පිට 06

## කුරුණෑගල නගරාධිපති ඇතුළු 5කගේ රිට් පෙත්සමට එරෙහි විරෝධතා 12 දාට දෙන්න

### මහාධිකරණය කියයි

කුමුදු හෙට්ටිආරච්චි

කුරුණෑගල පුරාවිද්‍යා වටිනාකමක් ඇති බවට සැලකෙන ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමේ සිද්ධිය සම්බන්ධව අත්අඩංගුවට ගන්නැයි නිකුත් කළ වරෙන්තුව බල රහිත කරන රිට් ආඥාවක් නිකුත් කරන්නැයි ඉල්ලා කුරුණෑගල නගරාධිපතිවරයා ඇතුළු පස්දෙනකු ගොනු කළ රිට් පෙත්සමට නොවැම්බර් 12දාට විරෝධතා ගොනු කරන්නැයි නීතිපති ඇතුළු වගඋත්තරකරුවන්ට මහාධිකරණය ඊයේ (14) දැනුම් දුන්නේය. පිට 06

## වෙලේ සුදාගේ මස්සිනා 21 තෙක් රිමාන්ඩ්

එස් දියගහගේ
දකුණු පළාත් සංචාරක

හෙරොයින් ළඟ තබා ගෙන සිටියදී අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රැඳවුම් නියෝග ලබා සිටි වෙලේ සුදාගේ මස්සිනා ලබන 21 දක්වා රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමට ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා ඊයේ (14) නියෝග කළේය. පිට 06

## 20 අධ්‍යයන කමිටු වාර්තාව අද අගමැතිට

පිට 06

## කුඩු ජාවාරමට සම්බන්ධ

# නාකොටික් 13 දෙනා තවදුරටත් රක්ෂිතයට

කුමුදු හෙට්ටිආරච්චි

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය භාරයට ගනු ලැබූ හෙරොයින් තොග ජාවාරම් කිරීම සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරයේ පසු වන පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරීන් 13 දෙනා ලබන 22 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (14) නියෝග කළේය. පිට 06

## 2012 බන්ධනාගාර කැරැල්ලට ගෝඨාභය පටලවන්නැයි මම කිවුවේ නැහැ

රෝෂන් තුෂාර

2012 වසරේ සිදු වූ බන්ධනාගාර කැරැල්ලට හිටපු ආරක්ෂක ලේකම්, වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පටලැවීමට ක්‍රියාකරන්නැයි කිසි දිනක පවසා නොමැති බව හිටපු අධිකරණ ඇමැතිනි පාර්ලිමේන්තු මන්ත්‍රී තලතා අතුකෝරල මහත්මිය දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (14) පැවසුවාය. පිට 06

## 19 රැක ගැනීමේ සජබ සටන අද ඇරැඹේ

ශිවන්ති ප්‍රනාන්දු

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමේ අරමුණින් ස්ථාපිත 19 රැක ගැනීමේ ජනතා ව්‍යාපාරයේ සම්මන්ත්‍රණ මාලාව අද (15) සවස කොළඹ නව නගර ශාලාවෙන් ඇරඹීමට සමගි ජන බලවේගය කටයුතු යොදා තිබේ. පිට 06

## මහාධිකරණ විනිසුරෝ 12ක් පත් වෙති

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නව මහාධිකරණ විනිසුරුවරුන් 12 දෙනකු පත් කර තිබේ. නව මහාධිකරණ විනිසුරුවරුන් සඳහා පත්වීම් ලිපි ප්‍රදානය ජනාධිපති කාර්යාලයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (14) පෙරවරුවේ සිදු කෙරිණි. පිට 06

## මත් ජාවාරමින් - කප්පම්වලින් මිලට ගත් බස් 3ක් සමඟ ලඩියාගේ ගෝලයෝ තිදෙනෙක් කොටු වෙති

රක්ෂණ ශ්‍රියන්ත

විදෙස් රටවල සැඟව සිටින සංවිධානාත්මක අපරාධකරුවකු වන නලින් චතුරංග නොහාත් ලඩියා නමැත්ත මත්ද්‍රව්‍ය ජාවාරමෙන් සහ කප්පම් මුදල්වලින් උපයාගත් මුදලින් මිල දී ගත් බස් රථ තුනක් සමඟ ඔහුගේ ගෝලයන් තිදෙනකු අතුරුගිරිය පොලිසිය අත්අඩංගුවට ගෙන තිබේ. පිට 06

## රවීගේ පෙත්සමට විරෝධතා ගොනු කරන්න

### නීතිපතිට 21 තෙක් කල් දෙයි

කුමුදු හෙට්ටිආරච්චි

ශ්‍රීලංකා මහ බැංකුවේ බැඳුම්කර වෙන්දේසි දෙකකදී රජයට අයත් රුපියල් බිලියන 52කට අධික රජයේ මුදල් සාවද්‍ය ලෙස පරිහරණය කළ බව කියන සිද්ධිය සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වරෙන්තු නිකුත් කිරීමට එරෙහිව හිටපු ඇමැති රවි කරුණානායක මහතා ඇතුළු හත්දෙනකු ගොනු කළ රිට් පෙත්සම් සම්බන්ධයෙන් විරෝධතා ගොනු කිරීමට නීතිපතිවරයාට ලබන 21 වැනි දා තෙක් කල් දීමට අභියාචනාධිකරණය ඊයේ (14) තීන්දු කළේය. පිට 06




මොබිටෙල් සමඟ ආරක්ෂාකාරීව ඔබේ සබඳතාවය පවත්වාගන්න

UNLIMITED

රු. 99 + බදු අදාළ වේ | සක්‍රිය කිරීමට අමතන්න #170#

Facebook Instagram Twitter LinkedIn

INTERNET 4G LTE

මොබිටෙල් 4G සමඟ සුපිරි අන්ලිමිටඩ් අත්දැකීමක්

Sri Lanka Telecom Mobitel

# ආනවිළුන්දාවේ පරිසර හානිය ගැන දැනට ගෙන ඇති නීතිමය පියවර ඉදිරියටත්

## පරිසර ඇමැති මහින්ද අමරවීර

**අමෝදා ජයමහ**

ආනවිළුන්දාවේ රම්සා තෙත්බිම් එළි පෙහෙළි කිරීමෙන් වූ හානි සම්බන්ධව දැනට ගෙන ඇති නීතිමය පියවර අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කරන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා දිනමිණට පැවසීය.

භූ විද්‍යා හා පතල් කාර්යංශයේ සිදුව ඇති බව පැවසෙන අක්‍රමිකතා පිළිබඳ සෙවීමට පත් කළ කමිටුවේ අධීක්ෂණ වාර්තාවක් හෙට (16) ලැබීමට නියමිත බව ද ඒ මහතා කීය.

ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නිරීක්ෂණයට අනුව මේ තෙත් භූමියේ ඉස්සන් වගාව ඇති කරන පොකුණු පනහකට වැඩි ප්‍රමාණයක් අඛණ්ඩව හෝ විටින් විට ක්‍රියාත්මකව තිබී ඇති බව ද මේ පොකුණු සඳහා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 2018 වර්ෂයෙන් පසුව බලපත් නිකුත් කර නොමැති බව මේ වන විට අනාවරණය වී ඇත.

මේ සිද්ධියට සම්බන්ධ ඩොක්ටර් රථ රියැදුරු හා තවත් පුද්ගලයකු මේ වන විට ආරච්චිකට්ටුව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු බන්ධනාගාර ගත කර තිබේ. ඉස්සන් කොටුව ඉදිකිරීමට අදාළව ඩෝසර් රියැදුරුට කොන්ත්‍රාත්තුව වර්ණකුලසූරිය නිශාන්ත ප්‍රනාන්දු නමැති අයකු විසින් ලබාදී ඇති අතර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ජගත් සමන්තගේ ඉල්ලීම මත මේ ඉඩම ඩෝසර් කළ බවට කොන්ත්‍රාත්තුව ලබාදුන් අයගේ ප්‍රකාශයෙන් මේ වන විට අනාවරණය වී ඇත.

මේ හිටපු සභාපතිවරයා මේ වන විට පොලීසියෙන් පලා ගොස් සැඟවී සිටින අතර මොහු සතුව අක්කර එකේ ඉස්සන් කොටු පහක් ද,අක්කර දෙකේ ඉස්සන් කොටු දෙකක් ද,අක්කර තුනේ ඉස්සන් කොටු එකක් ද 2015 වසරේ සිට පවත්වාගෙන යෑම සඳහා ජලජීවී වගා අධිකාරියෙන් වාර්ෂික බලපත් ලබාගෙන තිබෙන බව ද හෙළිවී ඇති බව මහින්ද අමරවීර මහතා පැවසීය.

එමෙන්ම සිමෙන්ති සංස්ථාව භාරයේ ඇති ඉඩමේ සිදුව ඇති වන විනාශය සම්බන්ධව ද අදාළ අංශ හරහා මේ වන විට විමර්ශන සිදු වන බව ද මේ ඉඩම බදුගෙන තිබෙන සිමෙන්ති ආයතනය බදු කොන්දේසි කඩකර තිබේ නම් ඔවුන්ට එරෙහිව ද කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව ද ඇමැතිවරයා අවධාරණය කළේය.

මුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා, ජපානයේ ප්‍රධාන සංඝනායක දඹදිව සාංචි චෛතියන්හි විහාරාධිපති, කොළඹ මාලිගාකන්දේ අග්‍රශ්‍රාවක මහා විහාරාධිපති, ජපානයේ සවරා ලංකාජී විහාරාධිපති බානගල උපතිස්ස නාහිමියන් හමු වූ අවස්ථාව.

## 'Shilpa Thursday' අත්කම් අලෙවි පොළ හෙට-අනිද්දා

**නදී මාණික්කගේ**

ජාතික ශිල්ප සභාව සහ වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සංවිධාන කර ඇති 'Shilpa Thursday' අත්කම් අලෙවි පොළ හෙට (16) සහ අනිද්දා (17) පෙ.ව 8.30 සිට ප.ව. 8.30 දක්වා බත්තරමුල්ල දියත උයනේදී පැවැත්වේ.

හෙට (16) පෙ.ව. 10ට අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අලෙවි පොළ විවෘත කිරීමට කිරීමට කටයුතු සූදානම් කර ඇති අතර මේ සඳහා කර්මාන්ත ඇමැති විමල් වීරවංශ සහ වේවැල්, පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ප්‍රසන්න රණවීර මහත්වරුද එක්වෙති.

සමාරම්භක මොහොතට සමගාමීව 'සෞභාග්‍යයේ කිරි මුට්ටිය' හඳුන්වා දීම සිදුකරන අතර ප්‍රථම වරට අන්තර්ජාලය ඔස්සේ හස්ත කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචි කිරීමට කටයුතු යොදා ඇත. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන අත්කම් නිර්මාණකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කරගැනීමට මෙහි අවස්ථාව තිබේ. නිෂ්පාදකයා විසින්ම මේ නිර්මාණ අලෙවි කර ගැනීම සිදුකරන බැවින් පාරිභෝගිකයාට සාධාරණ මිලකට නිෂ්පාදන මිලදී ගැනීමේ හැකියාව ඇත. අලෙවි ප්‍රදර්ශනය අලෙවි කුටි 125කින් සමන්විත වන අතර එක් දිනයක් සඳහා රුපියල් 750ක් අයකරනු ලබයි.

## සොයා දෙන්න

ළහිරු නුවන්ජීව මහතා (36) පසුගිය 17 වැනිදා සිට අතුරුදන් වී ඇත. ළහිරු නුවන්ජීව මහතාගේ පියා වන නොම්බර 61 හොරණ පාර පිළියන්දර පදිංචි මොරවකගේ බුද්ධදාස පෙරේරා මහතා පවසන්නේ තම පුතා මීට ඉහතදී කොරියාවේ රැකියාවකද නිරත වී මෙරටට පැමිණිමෙන් පසු මෙලෙස අතුරුදන් වී ඇති බවයි.

මේ පිළිබඳ දරුවාගේ පියා පොලීසියටද පැමිණිලි කර ඇත . තොරතුරක් ඇතොත් 078 916 1001 අමතා දැනුම් දෙන්නැයි පියා කාරුණික ඉල්ලීමක් කරයි.

## සඳරුවන් කරුණාතිලකගේ 'කාමරයෙන් එළියට යං' එළිදැක්වීම 17දා

**රත්නසිරි පතිරණ**

සඳරුවන් කරුණාතිලකගේ නවතම ළමා ගීත කෘතිය 'කාමරයෙන් එළියට යං' එළිදැක්වීම මේ මස 17 වැනි දින සවස 3.00ට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

කෝට්ටේ ශ්‍රී ජයමංගලාරාමාධිකාරී කුරුපිට ධම්මානන්ද හිමියෝ මෙදින පැමිණෙන පිරිස පංචශීලයේ පිහිටුවීම සිදු කරති. ප්‍රවීණ මාධ්‍යවේදී තිලකරත්න කුරුවිට බණ්ඩාර, සුබසෙත කර්තෘ සහ මිහිර හිටපු කර්තෘ අජිත් ධර්මසිරි මහත්වරු මෙදින කෙටි දෙසුම් පවත්වති. ශ්‍රී ලංකා යුද හමුදාවේ (විශ්‍රාමික) ලුතිනන් කර්නල් රත්නප්‍රිය බන්දු, බොරැල්ල ආයුර්වේද රෝහලේ හිටපු අධ්‍යක්ෂ වෛද්‍ය ධනපාල හෙට්ටිආරච්චි, කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනි සුභාෂිණී දෙමටගොඩ, කොළඹ ජාතික රෝහලේ ජාතික හෙද පුහුණු කිරීමේ නිලධාරිනී පුෂ්පා රම්‍යානි ද සොයිසා, මහරගම තරුණ මධ්‍යස්ථානයේ සංස්කෘතික අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සරත් කොඩිකාර මහත්ම මහත්මීහු ද මේ අවස්ථාවට විශේෂ ආරාධිතයන් ලෙස සහභාගි වෙති.

සඳරුවන් කරුණාතිලක ප්‍රවීණ ගීත රචකයකු ද වන අතර ජගත් වික්‍රමසිංහ, කසුන් කල්හාර, අමරසිරි පීරිස්, කරුණාරත්න විජේවර්ධන, සන්ධ්‍යා බුලත්සිංහල ආදී ප්‍රවීණ ගායක ගායිකාවන් ඔහු ලියූ ගීත ගායනා කර ඇත. මේ සියලු ගීතවල තනු නිර්මාණය කර ඇත්තේ ප්‍රවීණ සංගීතවේදී නැසී ගිය එච්.එම්. ජයවර්ධනයන් විසිනි.

# මත්ද්‍රව්‍ය ජාවාරම්වලින් උපයාගත් මුදල් හා සියලු දේපළ රාජසන්තක කරනවා

## ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්

**කළුතර මධ්‍යම සමූහ හා කළුතර විශේෂ**

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් 102කගේ ගිණුම්වල පසුගිය වසර දෙකක කාලයේ රුපියල් මිලියන 2600ක් සංසරණය වී තිබෙනවා. මොවුන් මත්ද්‍රව්‍ය ජාවාරම්වලින් උපයා ගත් සියලු මුදල්, නිවාස, යාන වාහන ඇතුළු දේපළ මුදල් විශුද්ධිකරණ පනත යටතට රාජසන්තක කිරීමට කටයුතු කරනවා යැයි බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා පෙරේදා (13) කළුතර දී ප්‍රකාශ කළේය.

ඒ මහතා මෙසේ ප්‍රකාශ කළේ කළුතර මහ හීනටියන්ගල ශ්‍රී ආනන්දාරාමයේ ආනන්ද දහම් පාසලේ 'අනඳ ප්‍රතිභා- 2020' වාර්ෂික ශිෂ්‍ය නායක නිල ලාංඡන පැලඳවීම හා ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වෙමිනි.

රුහුණු විශ්වවිද්‍යාලයේ කුලපති ආචාර්ය අතුරලියේ නන්ද නාහිමියන් මුලසුන හෙබවූ මේ උත්සව සභාවේදී තවදුරටත් ඒ මහතා මෙසේද කීය.

මෙරට පළමු වරට හෙරොයින් මත්ද්‍රව්‍ය පාවිච්චි කළේයැයි හසු වුණේ මීගමුව ප්‍රදේශයේ සංචාරක මඟ පෙන්වන්නෙක්. එය ටිකෙන් ටික වර්ධනය වී මේ වන විට මෙරට ග්‍රාම නිලධාරි වසම් 14022ක් ආක්‍රමණය කර තිබෙනවා. එපමණක් නොව අපේ පාසල් පද්ධතියද බූවල්ලකු මෙන් අල්ලාගෙන සිටින අතර පාසල් දරුවන් සෑහෙන ප්‍රමාණයක් මේ වසංගතයට හසු වී සිටිනවා.

මාලදිවයින ඉතා ඉක්මනින් දියුණු වූ රටක්. එහෙත් අද එහි ජනගහනයෙන් 50%ක්ම මත්ද්‍රව්‍ය වසංගතයට ගොදුරු වී ඉවරයි. තව ටික කලක් යද්දී විදේශ ව්‍යාපාරිකයන් එහි දූපත් මිලට ගනීවි. හෝටල් හදල ඒවා පාලනය කරාවි. තව ටික කලක් යන විට මාලදිවයිනේ වැසියන්ට ඒ රට ඉතිරි වන්නේ නැහැ. අප රටේත් මත්ද්‍රව්‍යවලට එරෙහිව මේ ක්‍රියාමාර්ග නොගත්තා නම් 2030 වන විට රටට ළමා පරපුරක් හෝ තරුණ පරපුරක් ඉතිරි වන්නේ නැහැ.

අද විහාරස්ථානයක, මළ ගෙදරක, උත්සවයක කොඩි වැලක් එල්ලන්න කෙනෙක් සොයා ගන්න බැරි තත්ත්වයක් උද්ගත වී තිබෙනවා. මත්ද්‍රව්‍ය පාවිච්චි නොකර කොන්ක්‍රීට් එකක් දාගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා අපරාධකරුවන් අත්අඩංගුවට ගන්න ජනාධිපතිතුමා උපදෙස් දී තිබෙනවා. අප ඒ සඳහා උපරිම උත්සාහයෙන් කටයුතු කරනවා. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ සියලු දේපළ රාජසන්තක කිරීමට මුදල් විශුද්ධිකරණ පනත යටතේ කටයුතු කරනවා. අපෙන් නැතිවී ගිය බෞද්ධ සාරධර්ම තවදුරටත් රැකගෙන, නැති වූ සදාචාරය හා විනය යළි ඇති කර ගත යුතුයි.

## පාර්ලිමේන්තු පුස්තකාලයට පොත් පරිත්‍යාගයක්...

ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය පිළිබඳ රචිත පොත් කීපයක් මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා විසින් පාර්ලිමේන්තු පුස්තකාලය වෙත පිරිනැමූ අයුරුයි මේ.

## වකුගඩුවක් දන් දී කලණ නිම්සරගේ දිවි රැක දෙමු

කුලීගොඩ, වලව්වත්ත, ධීවර නිවාස සංකීර්ණයේ අංක 291/34 ලිපිනයේ පදිංචි දහතුන් හැවිරිදි ටී. කලණ නිම්සර ද සොයිසා නමැති පාසල් සිසුවාගේ වකුගඩු දෙකම අක්‍රීය තත්ත්වයට පත් වීම නිසා දැනට මාස එක හමාරක පමණ කාලයක සිට පේරාදෙනිය ශික්ෂණ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබයි. අවුරුදු විසි එකත් හතළිහත් අතර වයසේ අයකුගේ ඕ පොසිටිව් හෝ බී පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළයුතු බව සිසුවාට ප්‍රතිකාර කරන පේරාදෙනිය ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍ය එස්.තල්ගහගොඩ මහතා නිර්දේශ කොට ඇත. මොහුට අවශ්‍ය කරන ඖෂධ වර්ගවලට රුපියල් ලක්ෂ අටක මුදලක් වැය විය හැකි බවද විශේෂඥ වෛද්‍යවරයා දන්වා තිබේ. කුලී වැඩ කිරීමෙන් ජීවත්වන මේ සිවොගේ පියාට එතරම් මුදලක් වැය කිරීමට හැකියාවක් නැති බව ඔහු පවසයි. ඒ නිසා සිය දරුවාගේ ජීවිතය බේරා ගැනීමට වකුගඩුවක් පිරි නැමීමට හා මුදලින් ආධාර කිරීමට කැමති පින්වතුන් සිටිනම් පිහිට වන ලෙස දරුවාගේ පියා වන ටී. හර්බට් සොයිසා මහතා පින් කැමති පරිත්‍යාගශීලීන්ගෙන් ඉල්ලා සිටී. අම්බලන්ගොඩ මහජන බැංකුවේ අංක 035 200146329492 දරණ ගිණුමක් ආරම්භ කොට ඇති අතර වැඩි විස්තර 076 2151789 හෝ 076 2155342 දුරකථන අංකවලට කතා කරන ලෙස දරුවාගේ පියා ඉල්ලා සිටී.


Uswatte 60 රස මිතුරු

## උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි අනුග්‍රහයෙනි

# රුපියල් තිස්දහසක තෑගි

ත්‍යාග රටාව

පළමුවන ත්‍යාගය රුපියල් 10,000 — දෙවන ත්‍යාගය රුපියල් 5000

තෙවැනි ත්‍යාගය රුපියල් 3000 — රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11යි.

ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරදි විසඳුම් දිනමිණ පත්‍රයේ පළ වේ. ත්‍යාග මුදල් තෙමසක් ඇතුළත පිරිනැමේ.

**කොන්දේසි**

සතියට දෙවරක් පළවන මෙම ප්‍රහේලිකාව සඳහා මුදලින් රුපියල් තිස්දහසක් මාසිකව පිරිනැමේ. දිනමිණ පත්‍රයේ පළවන ප්‍රහේලිකා විසැඳුම් පුරවා එය 6 X 3 සාමාන්‍ය කවරවල පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ලිපියේ ඉහළින් වම් කෙළවරේ දිනමිණ ටිපි ටිප් ප්‍රහේලිකා අංක 36 යනුවෙන් සඳහන් කර දිනමිණ ප්‍රහේලිකාව තැ.පෙ. 1134, කොළඹ යන ලිපිනයට 2020 සැප්තැම්බර් මස 30 වැනිදා හෝ ඊට පෙර උස්වත්ත Tipi Tip හෝ බිස්කට් දවටන දෙකක් සහිතව එවිය යුතුය. ලියුම් කවරයේ ඔබේ ආපසු ලිපිනය ද ලියන්න. ඡායාපිටපත් ප්‍රතික්ෂේප කැරේ. ලේක්හවුස් ආයතනයේ සහ උස්වත්ත සමූහ ව්‍යාපාරයේ සේවක සේවිකාවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ට තරඟයට ඉදිරිපත් විය නොහැකිය.

TipiTip ටිපි ටිප් දිනමිණ

ප්‍රහේලිකා අංක - 36



නම: ----------

ලිපිනය: ----------

---

දිනය: ---------- අත්සන: ----------

## උපකාරක පද

**හරහට**

1. දේසේ හැටියට . . . . . .
3. වෘක්ෂය/ රුක
5. අමෘතය/ නිවන
7. ශ්‍රී ලංකාවේ මධ්‍ය ලක්ෂ්‍යය යැයි සැලකෙන ස්ථානයේ පිහිටි පුරාවිදු ස්මාරකය
9. කොස්
10. තාලය
11. මුදල් ණයට ගත් තැනැත්තා
14. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විශිෂ්ට නවකතාවකි.
17. ඉදුණු කොස්
19. වඩාත් ප්‍රසන්න
21. වස්ත්‍ර/ සාටක
22. බටහිරදිග/ සවස් කාලය

**පහළට**

2. සේනාවට නායක/ හමුදා ප්‍රධාන
3. ලොව ප්‍රථම කෘෂි තාක්ෂණ උද්‍යානය පිහිටියේ මෙහිය.
4. හැමකල්හි
5. පතුල/ පල්ල
6. මා හට අයත්
8. ශ්‍රීවාව/ බෙල්ල
9. ප්‍රාණය
12. වියළුණු පුවක්
13. '96 ලෝක ක්‍රිකට් ශූරතාවලියේ අවසන් මහ තරගයේ වීරයා
15. යම් සේවාවක් හෝ භාණ්ඩයක් හෝ වෙනුවෙන් ඉදිරිපත් කරන නිශ්චිත මිල
16. පිපාසාව
18. කර්කශ/ ගොරෝසු
20. අන්‍ය/ සතුරු

● සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරු මාධ්‍ය සේවා) 0784625925

## ප්‍රාථමික සිසු දරුවන්ට

# පාරම්පරික සහලින් තැනූ කැඳ වීදුරුවක්

**සිතාරා සේනානි**

පාසල්වල ප්‍රාථමික සිසුන් සඳහා දැනට ලබා දෙන දියර කිරි පැකට්ටුව වෙනුවට පාරම්පරික සහල් යොදා සැකසූ කැඳ වීදුරුවක් ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මේ වන විට කරුණු සලකා බලමින් සිටී.

කෘෂිකර්ම අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම්දීමක් කළ බවත්, ඒ අනුව එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සහ එහිදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරුන් සමඟ තමා මූලික සාකච්ඡාවක් පැවැත්වූ බව දිනමිණ කළ විමසුමකදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා පැවසීය.

# බූස්සේ වර්ජනය අත්හරිති

## කංජිපානි - පොඩි ලසී - නීරෝ - ඔස්මන් දිවා ආහාරය ගනිති

**බුද්ධිකා ඉඹුලාන**

බූස්ස බන්ධනාගාරයේ විශේෂ අංශයේ රඳවා සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් ඇරඹූ ආහාර වර්ජනය දින හතරකින් පසු අත්හැර දමා තිබේ.

ඉල්ලීම් කිහිපයක් මුල් කර ගෙන පසුගිය 10 වැනි දා ඇරඹූ මෙම ආහාර වර්ජනයට කංජිපානි ඉම්රාන් නායකත්වය දුන් අතර, වෙලේ සුදා, පොඩි ලසී, නීරෝ, ඔස්මන් ඇතුළු සංවිධානාත්මක අපරාධකරුවෝ 45 දෙනෙක් සම්බන්ධ වූහ.

එහෙත් පසුගිය දින හතර තුළදී කණ්ඩායම් වශයෙන් එම සිරකරුවන් ආහාර වර්ජනයෙන් ඉවත් වූ අතර, පෙරේදා (13) රාත්‍රී වන විට 32 දෙනකු ආහාර ගැනීම සිදු කළ බව බූස්ස බන්ධනාගාර වාර්තා සනාථ කර තිබිණි. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා ද මෙම සිරකරුවන්ගේ ආහාර වර්ජනය සම්බන්ධයෙන් දැඩි විනය නීති අනුගමනය කරන ලෙස බූස්ස බන්ධනාගාර අධිකාරිවරයාට උපදෙස් දී තිබූ අතර, ඔවුන්ට මේ කාලයේදී පවුලේ ඥාතීන් මුණ ගැසීමේ අවස්ථාව ද අහිමි වී තිබිණි.

හදිසියේ අසනීප වී බූස්ස නාවික හමුදා රෝහලට ඇතුළත් කර යළි බන්ධනාගාරයට රැගෙන ආ කංජිපානි ඉම්රාන් ද එම බන්ධනාගාරයට ඇතුළුවීමට පෙර ඉඳිආප්ප ආහාරයට ගෙන තිබූ බව ද හෙළිවිණි.

මේ සියලු සිදුවීම් මැද ඊයේ (14) දහවල් වන විට ආහාර වර්ජනය නිම කළ මෙම සිරකරුවන් තම දහවල් ආහාරය ගෙන ආහාර වර්ජනය අවසන් කළ බව බූස්ස බන්ධනාගාරයේ නිලධාරියෙක් 'දිනමිණ'ට පැවසීය.

## ආමි කමල් සමඟ දෙදෙනෙක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

සංවිධානාත්මක අපරාධකරුවකු වන ආමි කමල් නොහොත් අරුණ ශාන්ත නමැත්තා ඇතුළු සැකකරුවන් තිදෙනකු වැලිපැන්න පොලීසියේ විශේෂ විමර්ශන කාර්යාංශ ඒකකයට අනුයුක්ත නිලධාරීන් ඊයේ (14) අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ ඔවුන් සතුව හෙරොයින් මත්කුඩු ග්‍රෑම් 10ක් සහ ආරක්ෂක හමුදා නිල ඇඳුම් කට්ටල දෙකක් තිබී ඇති බව ද පොලීසිය පවසයි. අපරාධ රැසකට චෝදනා ලැබ සිටින ආමිකමල් නමැති සැකකරු ඊසි කෑෂ් මඟින් කුඩු ජාවාරම හා ගිනි අවි බෝම්බ සන්තකයේ තබා ගැනීම ඇතුළු කොල්ල කෑම් රැසක් සම්බන්ධව පොලීසියට අවශ්‍යව සිටි හා අධිකරණ නඩු කිහිපයක් ඇති අයකු බව ද පොලීසිය පවසයි. මෙම සැකකරුට දකුණු ප්‍රදේශ ගණනාවක සන්නද්ධ කල්ලි සමඟ සමීප සබඳකම් පවත්වමින් අපරාධ සිදු කර ඇති බව විමර්ශනවල දී අනාවරණය වී ඇති අතර, සැකකරු අධිකරණ නියෝග ලබාගෙන රඳවා ප්‍රශ්න කිරීමට නියමිතය.

අනෙකුත් සැකකරුවන් දෙදෙනා ද මත් කුඩු ජාවාරමට සම්බන්ධව අධිකරණයෙන් දඬුවම් ලැබ සිටින පුද්ගලයන් බව පරීක්ෂණවල දී අනාවරණය වී ඇත.

# ශ්‍රී ලංකා - චීන සබඳතා ආර්ථිකයට පමණක් සීමා වී නෑ

## වැඩ බලන චීන තානාපති කියයි

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාව සහ චීනය අතර පවතින ද්විපාර්ශ්වික සබඳතා ආර්ථික සහයෝගිතාවට පමණක් සීමා නොවන බව චීනය අවධාරණය කරයි.

ඒ අනුව ආර්ථික සහයෝගිතාව මත පමණක් නොව උපාය මාර්ගික වශයෙන් හවුල්කාරිත්ව සහයෝගයක් මත පදනම් වී තිබෙන බව ද ශ්‍රී ලංකාවේ වැඩ බලන චීන තානාපති හූ වෙයි මහතා පවසයි.

මාධ්‍ය වෙත විශේෂ ප්‍රකාශයක් කරමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් වැඩ බලන චීන තානාපතිවරයා පෙන්වා දුන්නේ කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය සිදු වූ පසුගිය කාලසීමාවේ ශ්‍රී ලංකාව සහ චීනය අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගයෙන් කටයුතු කළ බවත් මෙම වයිරස් තත්ත්වය පාලනය කිරීම වෙනුවෙන් පරීක්ෂණ කට්ටල 73,000, මුහුණු ආවරණ ලක්ෂ 45ක්, පෞද්ගලික ආරක්ෂක උපකරණ 54,000ක් ඇතුළු වෛද්‍ය උපකරණ රැසක් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කර තිබෙන බවත්ය.

ශ්‍රී ලංකාව සහ චීනය අතර සබඳතා ආර්ථික කරුණු මත පමණක් පදනම් නොවිය යුතු බව සඳහන් කරන හූ වෙයි මහතා එම සබඳතා ඊට වඩා පුළුල් වියයුතු බව ද කියා සිටී.

## මාධ්‍යවේදී චතුරංගගේ ඇප අයැදුම ඉවතට

**කුමුදු හෙට්ටිආරච්චි**

අධිකරණ කටයුතුවලට බාධා වන අයුරින් වෙබ් පුවත්පතේ ප්‍රවෘත්තියක් පළ කිරීම සම්බන්ධව චෝදනා ලැබ සිටින වෙබ් මාධ්‍යවේදියා වෙනුවෙන් කළ ඇප අයැදුම ඊයේ (14) ප්‍රතික්ෂේප කළ කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා සැකකරු ලබන 24 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට ඊයේ (14) නියෝග කළේය.

වෙබ් මාධ්‍යවේදියකු වන චතුරංග ද අල්විස් යන අය එසේ නැවත රක්ෂිත බන්ධනාගාරගත කෙරුණි.

සැකකරු භාවිත කළ ලැප්ටොප් පරිගණකය හා ජංගම දුරකථන දෙකක් ද අත්අඩංගුවට ගත් බවත් වැඩිදුර විමර්ශන සඳහා එම භාණ්ඩ රජයේ රස පරීක්ෂකවරයා වෙත යැවීමට පියවර ගන්නා බවත් නඩුව ඊයේ (14) කැඳවූ අවස්ථාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට දැන්වීය.

සැකකරු ලංකා නිවුස් වෙබ් පුවත්පතේ වෙබ් අඩවියේ පාලකවරයා ලෙස කටයුතු කරන අතර, නීතිඥ සංගමය විසින් කළ පැමිණිල්ලක් මත පරීක්ෂණ පවත්වා රහස් පොලීසියේ පරිගණක ඒකකය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

## කුඩා දරුවන්ගේ ඇටමිඳුළු බද්ධයට අලුත් ඒකකයක් ඔක්. 1 දා සිට ඇරේ

**සන්ධ්‍යා කරුණාරත්න**

කුඩා දරුවන්ට ඇටමිඳුළු බද්ධ කිරීමේ නව ඒකකයක් ඔක්තෝබර් 1 දා සිට කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ ආරම්භ කරන බව රෝහලේ විශේෂඥ වෛද්‍ය දීපාල් පෙරේරා මහතා 'දිනමිණ'ට ඊයේ (14) පැවසීය.

ඇට මිඳුළු බද්ධ කිරීම රජයේ රෝහලක ආරම්භ කරනුයේ ප්‍රථම වතාවට බවත්, පෞද්ගලික අංශයෙන් මෙම බද්ධ කිරීම සිදු කළ හොත් රුපියල් ලක්ෂ 50කට අධික මුදලක් වැය වන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

තැලසීමියා, ලියුකේමියා ඇතුළු රුධිර ගත රෝග පවතින දරුවන්ට ඇට මිඳුළු බද්ධ කිරීමෙන් පූර්ණ සුවය ලැබිය හැකි බවත්, වසරකට අලුතින් තැලසීමියා දරුවන් 50ක් පමණ වාර්තා වන බවත් ඔහු කීය. දැනට තැලසීමියා දරුවන් 4000ක් පමණ මෙරට සිටින බවත්, අලුතින් තැලසීමියා ඒකකය ආරම්භ කිරීමත් සමඟ වසරකට තැලසීමියා දරුවන් 20කට පමණ බද්ධ කිරීම සිදු කළ හැකි බවත් හෙතෙම පැවැසීය. රුධිරය පිටතින් ලබාදීම නිසා අතුරු ආබාධ ලෙස හෘදයේ, අක්මාවේ, ප්ලීහාවේ වැඩිපුර යකඩ තැන්පත් වීමක් සිදු විය හැකි බව ද, ඇට මිඳුළු බද්ධයෙන් කිසිදු අතුරු ආබාධයක් දරුවන්ට සිදු නොවන බව ද ඔහු කීවේය.

තැලසීමියා වාහකයන් දෙදෙනකු විවාහ වුව හොත් ඉපදෙන දරුවන් තැලසීමියා රෝගයට ගොදුරු විය හැකි බවත්, විවාහ වීමට පෙර විවාහ ගිවිස ගත් දෙදෙනා තැලසීමියා පරීක්ෂාවකට ලක් වීමෙන් මෙම තත්ත්වය වළක්වා ගත හැකි බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

## රුවන්ට 28යි: රවිට 10යි

# එජාප නියෝජ්‍ය නායකත්වය රුවන්ට

**ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ**

එක්සත් ජාතික පක්ෂයේ නව නියෝජ්‍ය නායකයා ලෙස පක්ෂයේ නියෝජ්‍ය මහ ලේකම්වරයා වන රුවන් විජයවර්ධන මහතා පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ වැඩි ඡන්දයෙන් ඊයේ (14) තේරී පත් විය.

රුවන් විජයවර්ධන සහ රවි කරුණානායක මහත්වරුන් නියෝජ්‍ය නායකත්වය සඳහා ඉදිරිපත් වූ අතර ඒ සඳහා පැවැති රහස් ඡන්දයෙන් රුවන් විජයවර්ධන මහතා ඡන්ද 28ක්ද රවි කරුණානායක මහතා ඡන්ද 10ක්ද ලබා ගත්තේය. රනිල් වික්‍රමසිංහ මහතා ඡන්දය ලබා දීමෙන් වැළකී සිටියේය.

වජිර අබේවර්ධන මහතාද නියෝජ්‍ය නායකත්වය සඳහා ඉදිරිපත් වන බව ප්‍රකාශ කර තිබූ නමුදු ඊයේ ඔහු ඉදිරිපත් නොවීය.

පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සිරිකොත පක්ෂ මූලස්ථානයේදී ඊයේ රැස් වූ අවස්ථාවේදී සාකච්ඡා මාර්ගයෙන් නියෝජ්‍ය නායකයකු පත් කර ගැනීම සාර්ථක නොවීම නිසා ඡන්දයකට යැමට සිදු වී තිබේ.

පක්ෂයේ පුරප්පාඩුව තිබෙන අනෙක් තනතුරුවලට සුදුස්සන් පත් කිරීම ඊළඟට පැවැත්වෙන කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී සිදු කිරීමට තීරණය විය.

නායක ධූරය පුරප්පාඩු වන තුරු අලුත් නායකයකු පත් කර ගැනීමට පක්ෂ ව්‍යවස්ථාව අනුව සිදු කළ නොහැකි බව සිරිකොත ප්‍රකාශකයකු පැවැසීය.

කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයන් වන පක්ෂයේ ජාතික සංවිධායක නවීන් දිසානායක, ලක්ෂ්මන් විජේමාන්න සහ අනෝමා ගමගේ මහත්ම මහත්මීන් කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා දැඩි විවේචනයට ලක් කර තිබේ.

ඕනෑම අවස්ථාවක පක්ෂයෙන් යැමට තමා සූදානම් වුවද ඉන් පසුව පක්ෂය ගෙන යන්නේ කවුදැයි පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ඊට ප්‍රතිචාර දක්වමින් පවසා තිබේ.

## අද ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ

### ටවර් - 'විකෘති' එල්ෆින්ටන් - 'සාරාංගා නැවෙන් ඇවිත්'

**උපාලි කරුණාරත්න**

ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ 2020 යටතේ අද (15) මරදාන ටවර් රඟහලේදී සෝමලතා සුබසිංහ නාට්‍ය නිර්මාණ 'විකෘති' සහ එල්ෆින්ටන් රඟහලේදී රොඩනි වර්ණකුල නාට්‍ය නිර්මාණ 'සාරාංගා නැවෙන් ඇවිත්' වේදිකාගත වේ.

විකෘති නාට්‍යයේ සංගීතය එම්. ආර් චූලසිංහ ගෙනි. විලානි අමරසිංහ, ප්‍රසන්නජිත් අබේසූරිය, මයුර පෙරේරා, යශෝධා රසදුනී, තිලක්ෂිණී රත්නායක, කුමුදු වික්‍රමතන්ත්‍රී රංගනයෙන් මේ සඳහා දායක වෙති.

සාරංගා නැවෙන් ඇවිත් නාට්‍යයේ සංගීතය රංජිත් බාලසූරියගෙනි. රුක්මන් තිලකරත්න, මිහිරි සිරිතිලක, රොඩනි වර්ණකුල රංගනයෙන් දායක වේ. මෙම සෑම නාට්‍යයක්ම 3.30ට සහ 6.30ට රඟ දැක් වේ.

එමෙන්ම ප්‍රේක්ෂා ළමා හා කෙටි නාට්‍ය උලෙළ ද හෙට (16) සිට මරදාන එල්ෆින්ටන් රඟහලේදී සහ ටවර් රඟහලේදී ආරම්භ වේ. ඒ යටතේ එල්ෆින්ටන් රඟලේදී 16 දින නලින් ලුසේනාගේ 'නොකියා හිටපු දෙයක්', සදුන් ලක්ෂාන්ගේ 'නයිට් ඩියුටි' සහ ඉන්දික සඳරුවන්ගේ 'ලෙටර්' නාට්‍ය වේදිකාගත වේ. ටවර් රඟහලේදී දිනිදු පද්ම ශ්‍රී බණ්ඩාරගේ 'ඔයාගේ කතාව' , 'ටීස්' සහ 'ලෝකා' නාට්‍ය වේදිකාගත කෙරේ. මේ සෑම නාට්‍යයක්ම 3.30ට සහ 6.30ට වේදිකාගත වේ.

# බාලවයස්කාර දරුවකුට හිංසා කළ විදුහල්පතිට අත්හිටුවූ සිර දඬුවම්

**සිතාරා සේනානි**

වයස අවුරුදු 12ක බාලවයස්කාර පිරිමි දරුවකුට කෘෂ්ර ලෙස පහර දීමේ චෝදනාවට වරදකරු වූ විදුහල්පතිවරයකුට වසර 2ක බරපතළ වැඩ සහිත සිර දඬුවම් නියම කර, එම දඬුවම වසර 5කට අත්හිටුවා රුපියල් 5000ක දඩ මුදලක් ගෙවීමට කොළඹ මහාධිකරණය නියම කළ බව ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය පැවසීය.

එසේම, වරදකරු දඩ මුදල නොගෙවන්නේ නම්, මාස 3ක සිර දඬුවම් නියම කර ඇති අතර, විත්දිත බාලවයස්කාර පිරිමි දරුවාට රුපියල් 25,000ක වන්දි මුදලක් ගෙවීමට ද නියම කර ඇත. වන්දි මුදල දරුවාට නොගෙවන්නේ නම්, වසරක සිර දඬුවම් ලබා දීමට ද නියම කර තිබේ.

2013 වසරේ සිදුව ඇති මෙම පහරදීම සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙත ලැබී තිබූ පැමිණිල්ලකට අනුව, එම අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විමර්ශනයක් සිදුකර කොළඹ ප්‍රදේශයේ පදිංචි 52 හැවිරිදි මෙම සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ. අනතුරුව නීතිපතිවරයා සැකකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ නඩු පවරමින් පසු, තමා වරදකරු බව සැකකරු පිළිගෙන තිබේ. ඒ අනුව මහාධිකරණය ඔහුට එරෙහිව දඬුවම් නියම කර ඇත.

# හොරණ ප්‍රා. සභාවේ හිටපු සභාපති පැවිදි දිවියට

**ඉංගිරිය මධ්‍යම සමූහ - ප්‍රියදර්ශනී කහවල**

හොරණ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයකු වන රංජිත් දාබරේ මහතා (අවු:52) ලබන 23 දා පෙරවරු 7.00ට ඉංගිරිය, මඩකඩ ආරණ්‍ය සේනාසන (නාවිවිමලේ) සීමා මාලකයේදී පැවිදි දිවියට එළඹේ. රංජිත් දාබරේ මහතා, 1997 සිට 2002 දක්වා හොරණ ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ අතර, 2002 වසරේදී එම සභාවේ සභාපතිවරයා ලෙසත්, 2006 පළාත් පාලන මැතිවරණයේදී එම සභාවේම විපක්ෂ නායකවරයා ලෙසත් තේරී පත් විය.

පසුගිය පළාත් පාලන මැතිවරණය සඳහා ද හොරණ ප්‍රාදේශීය සභාවට එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයකු ලෙස තරග කර ඇත.

# ගිනි දැල් - දුමාරය මැද මාගේ දිවි ගලවා ගැනීම අසීරු වුණා

## 'නිව් ඩයමන්ඩ්' නෞකාවේ තුන්වන ඉංජිනේරුවා කියයි

**රක්ෂණ ශ්‍රියන්ත**

දිවි ගලවා ගෙන විත් රෝහල්ගත කළ නිව් ඩයමන්ඩ් නෞකාවේ තුන්වන ඉංජිනේරු නිලධාරියාගේ සුවදුක් විමසීමට එම මෙහෙයුමට සම්බන්ධ වූ නාවිකයන් තිදෙනාට පෙරේදා (13) අවස්ථාව හිමි ඇත.

ගිනිදැල් මැද, දුමාරයෙන් පිරී තිබූ නෞකාවේ ඉහළ මාලයක පිවිසුම් මාර්ගයක වැටී සිටි තමා ප්‍රධාන මාලය වෙත ගෙන ඒම ඉතා අසීරු කාර්යයක් වූ බව එහිදී හෙතෙම පවසා තිබේ.

කෙසේ හෝ නාවික හමුදා සාමාජිකයන්ගේ දැඩි කැපවීම හා උත්සහාය මත ඉහළ මාලයේ සිට පහත පිහිටි ප්‍රධාන මාලය වෙත තමා ගෙන ඒමට ඔවුන්ට හැකි වීම තමාගේ වාසනාවට සිදු වූවක් බවත් මෙම පිලිපීන ජාතිකයා පවසා තිබේ.

කල්මුණේ මූලික රෝහලෙන් ප්‍රතිකාර ලබා මේ වන විට කොළඹ පෞද්ගලික රෝහලක වැඩිදුර ප්‍රතිකාර ලබන මෙම පිලිපීන ජාතිකයා මුණගැසුණු නාවික හමුදාවේ ලුතිනන් කේ.ජී.ඒ.එස්. එම්. විජේරත්න, නායක ඉංජිනේරු කාර්මික ඩී.එල්.කේ. මුදියන්සේ සහ බළ නාවික ඩබ්ලිව්.ජී.ජී. යූ. සේනාරත්න යන නාවිකයන් තිදෙනා තම අත්දැකීම් ඔහු සමඟ බෙදා හදා ගෙන තිබේ.

## ගිනිබාගේ

සමහරු කැමති වෙති සමහරු උරණ — වෙතී
හදමින් වෙනස්කම් කරමින් ගමන — යතී
විස්සට යන අයට වැටිලද කොහෙද — හතී
දහනවයයි දශම නවයේ ඇත — නැවතී

මේ වර වාරෙ යූ.එන්.පී අඹ — අත්තේ
කාටත් කන්ට එක ගෙඩියයි පළ — ගත්තේ
ඒ එක කන්ට තාමත් කවුරුත් — නැත්තේ
ඒකත් අයිතිකරුටයි හිමි අඹ — වත්තේ

බොදු බලයටත් වූයේ ඒ ටිකම — තමා
පාත්තරය අල්ලති ගෙඩියටම — යොමා
මේවා කියනවට මට වනු මැනවි — සමා
මැතිසබයෙහි තමා ඇත්තේ නිවන — අමා!

රටේමුල්ලේ මුදන්නායක

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 සැප්තැම්බර් 15 අඟහරුවාදා

# 20 සංශෝධනයට කල් මරන්න එපා!

විසිවන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත තව-දුරටත් නිරීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත් කර තිබේ. එහි අදහස කෙටුම්පතෙහි නිරවද්‍යතාව හා ජනහිතකාමී බව තහවුරු කරගැනීම යැයි සිත-න්නට පුළුවන. මේ අතර, විපක්ෂ නායකවරයා කියා සිටින්නේ 'දහනවය ප්ලස්' ව්‍යවස්ථා සංශෝධනයක් ගැනය. ඒ ගැන පුදුම විය යුතු නැත. කුමන හෝ හේතු සාධක නිසා විපක්ෂය මේ දිනවල කටයුතු කරන්නේ බහුතර මහජන මතයට එරෙහිවය. ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූ දේශපාලන ව්‍යාපාර දක්වන මතිමතා-න්තර සැලකිල්ලට ගත යුතු නැත. කළ යුත්තේ රටට හා ජනතාවට වැඩ කරන්නට අවස්ථාව ලැබෙන අයුරින් ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගැනීමය.

ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියෙහි මූලික තර්ක-යක් වන්නේ 1978 ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට දුන් බලය තහවුරු කළ යුතුද? කපාහැරිය යුතුද? යන්නය. බහුතර ජනතාවගේ මතය වන්නේ ජනාධි-පතිවරයා සතු බලය තහවුරු කළ යුතුය යන්නය. ඊට අදාළ ජනමතය වාර දෙකකදී ප්‍රකාශ වී ඇත. විද්ව-තුන්ගේ මතය වන්නේ නව ව්‍යවස්ථාවක් සම්මත කරගන්නා තුරු ජනාධිපතිවරයාට වැඩ කළ හැකි පරිසරයක් නිර්මාණය කරගැනීම සඳහා නොපමාව විසිවන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගත යුතු බවය. කල් මැරීම සුදුසු දෙයක් නොවන බව කවුරුත් පිළිගනිති. ඒ අනුව සිදු විය යුත්තේ ඉහත සඳහන් නිරීක්ෂණ කමිටුව වඩාත් කාර්යක්ෂම වීමය.

විධායක ජනාධිපති ක්‍රමය ඉබේ පහළ වූවක් නොවේ. ඒ පිළිබඳ සංවාදය 1960 ගණන්වලදී පවා පැවැතිණි. පූර්ණ බලය සහිත රාජ්‍ය නායකයකු මඟින් රට ඉදිරියට ගෙන යා හැකි බව එදා පිළිගැ-නිණි. අදත් බහුතර ජනයාගේ මතය වන්නේ යුක්ති-ගරුක, නීතිගරුක හා පූර්ණ බලය සහිත නායක-යකු නැතිව රට ඉදිරියට ගෙන යා නොහැකි බවය. එමෙන්ම පොදු ජනයාට සාධාරණය ඉටු කිරීම සඳහා ද එබඳු නායකයකු අවශ්‍ය බව මහජන විශ්වා-සය වෙයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු යැයි ඉල්ලීමක් හෝ සංවාදයක් හෝ අද නැත. 1978 සිට වසර හතළිස් දෙකක් පුරාවට විධායක ජනාධිපති ක්‍රමය රටට මුල්බැසගෙන තිබේ. එය වෙනස් කිරීමට යෑමෙන් ඇති වන්නේ දේශපාලන විකෘතියකි.

78 ව්‍යවස්ථාව දහනව වතාවක් සංශෝධනය වී ඇත. එයින් 13, 17 හා 19 යන ව්‍යවස්ථා සංශෝධන අසාර්ථක බව පැහැදිලිය. මහජන මතයට අනුව එම සංශෝධන දේශපාලන විහිළු ලෙස සැලකේ. මෙයින් 19 ව්‍යවස්ථා සංශෝධනය මහජනයාගේ දැඩි විවේ-චනයට ලක් විය. එම ව්‍යවස්ථා සංශෝධනය නිසා රටට සිදු වී ඇති විනාශය බරපතළ බව කිව යුතුය. ජනාධිපතිවරයාගේ බලය සීමා කිරීම සංශෝධනයේ අරමුණ විය. රාජ්‍ය නායකයාගේ තටු කැපීම ලෙස එය සමාජගත විය. යහපාලනයේ හිටපු ජනාධිපති-වරයා ද ස්වකීය තටු කපාගැනීමට සාඩම්බරයෙන් ඉදිරිපත් වූ අතර, එය දේශපාලන මෝඩකමක් සේ අද සලකනු ලැබේ.

දහනවය ඉදිරිපත් වූයේ යහපාලනයට අදාළ ප්‍රධාන සාධකයක් හැටියටය. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම එහි සටන් පාඨය විය. ප්‍රජාතන්ත්‍රවා-දය ශක්තිමත් කිරීම යන්න නූතන ධනපති ලෝකයේ මෝස්තරයකි. ධනපති රටවල් සේම රාජ්‍ය නොවන සංවිධාන ඒ වෙනුවෙන් පෙනී සිටිති. ධනපති ක්‍රමයේ නූතන විලාසය නව ලිබරල්වාදය ලෙස හඳුන්වති. ලෝක ප්‍රකට බුද්ධිමතකු වන නොම් චොම්ස්කි වරක් පෙන්වා දුන්නේ නව ලිබරල්වාදය ලෝකයේ සමාජ ගැටලු හා අර්බුද උත්සන්න කරන බවය. එය හරි-යටම හරිය. ශ්‍රී ලංකාවේ නව ලිබරල් නායකයා වූ රනිල් වික්‍රමසිංහ දහනවය ඔස්සේ රටේ අර්බුද ගණ-නාවක් නිර්මාණය කළේය.

දහනවයෙන් පසු රටේ ජාතික ආරක්ෂාව පිරි-හිණි; බුද්ධි සේවා දුර්වල විය. එහි ප්‍රතිඵලයක් ලෙස පාස්කු ප්‍රහාරයට රට ගොදුරු විය. යහපාලනයේ ආරම්භයේ සිට අවසානය දක්වාම දකින්න ලැබුණේ දේශපාලන ආරවුලක් පමණි. ජනාධිපතිවරයාගේ වැඩසටහන් අගමැතිවරයා පිළිගත්තේ නැත. අග-මැතිවරයාගේ වැඩසටහන් ජනාධිපතිවරයා පිළි-ගත්තේ නැත. දෙදෙනාගේ ආරවුල මැද ආර්ථිකය කඩාවැටිණි. රජය කෙරෙහි පැවැති මහජන විශ්වා-සය බිඳවැටිණි. එය අරාජික යුගයක් ලෙස හඳුන්ව-න්නට ද සමහරු පෙලඹුණහ. මේ අතර, දහනවයෙන් ස්ථාපිත වූ කොමිෂන් සභා හිතුවක්කාරී ලෙස ක්‍රියා කරනු දක්නට ලැබිණි. මින් කියවෙන්නේ රාජ්‍යයට හා ජනතාවට නායකයකු අවශ්‍ය බවය; ඔහු පූර්ණ බලය සහිත නායකයකු වීම සුදුසු බවය.

ශ්‍රී ලංකාවේ දේශපාලනය ඈත අතීතයේ සිටම පෙන්වා දෙන යථාර්ථයක් තිබේ. එනම්: බලය නැති දුර්වල නායකයා හැමවිටම රාජ්‍යයත් රටත් විනාශ කරන බවය. රාජ්‍යය නැත හොත් රාජ්‍ය තන්ත්‍රය දුර්වල වූ විට යුක්තිය හා සාධාරණත්වය ද අහිමි වෙයි. එය ශ්‍රී ලංකාවේ පමණක් නොව, සමස්ත ලෝකයේම දේශපාලන යථාර්ථය වෙයි. ඈත අතී-තයේ රජතුමාට අසීමිත බලයක් තිබිණි. රටවැසියා ඒ බලය පිළිගත්තේය. යටත්විජිත යුගයේ මහ රජ-නට එම බලය තිබිණි. නිදහසින් පසු අග්‍රාණ්ඩුකා-රවරයාට එම බලය තිබිණි. 1972 ව්‍යවස්ථාවෙන් එම බලය පැවරීමට උත්සාහ කළේ ජනාධිපතිව-රයා වෙතය. 1978 ව්‍යවස්ථාවෙන් එය සම්පූර්ණ විය. ජනාධිපති ක්‍රමය යනු දේශපාලනයේ ක්‍රම විකාශන-යකි.

රට ගොඩනැඟීමට නම්, 19 වන ව්‍යවස්ථාව අහෝසි කළ යුතුය. ඒ සඳහා 20 වන සංශෝධනය නොපමාව සම්මත කරගත යුතුය. කල් ගත වීම සුදුසු දෙයක් නොවේ. කල් ගත වන විට ජනතා විශ්වාසය බිඳී යයි; වැඩසටහන් හා සැලසුම් අවුල් වෙයි.

## දිල්රුගෙ සීවද

| | |
|---|---|
| වවුනියාවෙ හෝටලයක රෝල්ස්වල | තිබී |
| ප්ලාස්ටික්වලින් සැකසූ බිත්තර ඇත | ලැබී |
| කාපු කෙනෙක් විස වී මිය ගියොත් කඳුළු | බිබී |
| සැනසීමක් ලැබෙවිදැයි අසනු හිතට | එබී |

# රජයේ අලුත් පත්වීම්
## ක්‍රමවේදය, ඉලක්ක සහ ගැටලු

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය

රැකියාවෙන් පෙළෙන උපාධිධාරීන් පනස් දහසකටත්, කිසිවක් කරකියාගත නොහැකි ව අපහසුතාවට පත්ව සිටින දුගී පවුල්වල ලක්ෂයකටත් රැකීරක්ෂා ලබාදෙන බවට වත්මන් ජනාධිපතිතුමන්ගේ සෞභා-ග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් විය. වත්මන් රජය යටතේ 150000ක් රැකියාගත කිරීමට මූලික පදනම වැටුණේ එතැනිනි. ඒ අනුව උපාධිධාරීන් 50 000 බඳවා ගැනීමේ වැඩසටහන රාජ්‍ය සේවා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේත්, අනෙකුත් රැකියා ලක්ෂයක් ලබාදීමේ වැඩසටහන විශ්‍රාමික මේජර් ජෙනරල් නන්ද මල්ලවආරච්චි යටතේ වන බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බළකා දෙපාර්තමේන්තුව ඔස්සේත් සිදු වේ.

උපාධිධාරීන් 50 000කට රැකියා ලබාදීමේ වැඩසටහන යටතේ ඉකුත් පෙබරවාරියේ ඉල්ලුම් පත් කැඳවා තිබුණේ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කරමිනි. ඒ යටතේ ඉල්ලුම් පත්‍ර 91000ක් පමණ ඉදිරිපත් වී තිබුණ ද සුදුසුකම් සපුරා නොමැති ඉල්ලුම්කරුවෝ ද අයදුම්පත් දේවිත්වය බැඟින් ඉදිරිපත් කළ ඉල්ලුම්කරුවෝ ද ඒ අතර වූහ.

### ■ ප්‍රධාන කොන්දේසි

ඉල්ලුම්පත් කැඳවා තිබුණේ වයස අවුරුදු 45ට අඩු වීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමි-ෂන් සභාව යටතේ ලියාපදිංචි ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරන අයකු වීම, 2019. 12. 31 වන විට උපාධිය සම්පූර්ණකොට තිබීම, අවම වශයෙන් වස-රක්වත් රැකියා විරහිතව සිටි අයකු වීම යන ප්‍රධාන කොන්දේසි යටතේ ය. එසේ වුවත් විවිධ පුද්ගලයන් සුදුසුකම් නොමැතිව ද ඉල්ලුම් පත්‍ර යොමු කොට තිබිණි. 91000ක් ඉක්මවන ඉල්ලුම් පත් ඉදිරිපත් කළ අය අතර වයස අවුරුදු 45ට වඩා වැඩි, ශ්‍රී ලංකාවේ අනුමත විශ්වවිද්‍යාලය-කින් උපාධියක් ලබාගෙන නොමැති, නියමිත දිනයට (2019. 12.31) පෙර උපාධිය සම්පූර්ණ නොවූ පිරිසකුත් සිටිති. එසේම මේ වන විටත් රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු පිරිසක් ද ඒ අතර හඳුනාගත හැකි ය. ඉල්ලුම් පත් ඉදිරිපත් කළ සියලු දෙනා සුදුසුකම් සපුරා නොතිබුණු බැවින් සුදුසුකම් අනුව 50 000ක් දෙනා රජයේ රැකියා ලබාදීම වෙනුවෙන් තෝරා ගැනිණි.

ඉකුත් මාර්තු මස වන විට මේ පිළිබඳ මූලික කටයුතු යොදමින් පත්වීම් ප්‍රමාණයක් ප්‍රදා-නය කළ ද මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ මැතිවරණ කොමිසන් සභාව විසින් එම වැඩපිළිවෙළ තාවකාලිකව නැවැත්වීමට දන්වා සිටීමත් සමඟ පත්වීම් ලැබූ පිරිසට ද රාජකාරි-යට වාර්තා කළ නොහැකි විය. කොවිඩ් අර්බුදය රටම භීතියට පත් කළේ ද ඒ අවධියේ ම ය. මෙවැනි කාරණා හේතුවෙන් ඇනහිටි පත්වීම් පිරිනැමීමේ වැඩසටහන යළිත් ක්‍රියාත්මක විය. ඒ, අගෝස්තු මස 5 වැනි දා මහමැතිවරණය අවසන් වීමත් සමඟ, ඉක්මනින් ම ජනාධිපතිතු-මන් තමන් දුන් පොරොන්දුව ඉටු කිරීම සඳහා අවශ්‍ය කටයුතු යෙදීමත් සමඟිනි. දෙසතියක් ඇතුළත උපාධිධාරීන්ට පත්වීම් පිරිනැමීම සඳහා පියවර ගත් අතර මේ වන විටත් සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි 50 000කට රැකියා දීමේ කටයුතු අවසන් වී ඇත. කෙසේ වෙතත් මෙම පත්වීම් දීමේදී ඇතැම් පිරිස් එල්ල කළ චෝදනාව වූයේ ඔවුන් පෞද්ග-ලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ රැකියාවක් කරමින් සිටි අතර මේ සඳහා ඉල්ලුම් කිරීම වෙනුවෙන් එම රැකියාවලින් ඉවත් වූවත් මෙම රැකියාව ද නොලැබී යෑම තුළ අතරමං ව අසරණ ව සිටින බව ය. එලෙස චෝදනා කරමින් තැන තැන සංවිධානය වූ උද්ඝෝෂණ ද දියත් විණි.

### ■ ප්‍රතික්ෂේපිත ඉල්ලුම්පත්

එසේ වුවත් හැඳුනුම්පත් අංක-යට අනුව පරීක්ෂා කිරීමේදී මෙම ඉල්ලුම් පත් යොමු කර ඇති පිරිස අතරින් සේවක අර්ථ සාධක, සේවක භාරකාර අරමුදල් හිමි පුද්ගලයන් 6000 ඉක්මවූ පිරි-සක් හඳුනාගත හැකි විය. එසේ ම රැකියාවල නිරත වන තවත් 3000 ඉක්මවූ ප්‍රමාණයක් ද ඒ අතර විය. එසේ වුවත් ජනාධිපතිතු-මන් කැබිනට් මණ්ඩලය හා කළ සාකච්ඡාවකින් අනතුරු ව කියා සිටියේ රැකියාවක නිරතව සිටීම හේතුවෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රති-ක්ෂේප වුණු යම් අයකුට අසාධාර-ණයක්, අපහසුතාවක් වී ඇත්නම් එම පිරිසට සහනයක් සලසා දීම වෙනුවෙන් බඳවාගත් උපාධිධාරීන් 50000ට අමතර ව තවත් උපාධිධා-රීන් 10 000කට අවස්ථාව දෙන බව ය. ඒ අනුව රාජ්‍ය සේවයට බඳවා ගන්නා උපාධිධාරීන් සංඛ්‍යාව 60 000ක් දක්වා වැඩිකොට තිබේ. ඒ අනුව උපාධිධාරීන් 50 000ක් රජයේ රැකියාවලට බඳවා ගත් අතර ඉතිරි 10 000 බඳවා ගැනීමේදී, ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප වීමෙන් අසාධාරණයක් සිදු වූ අය වේ නම් ඔවුන්ට අභියා-චනා ඉදිරිපත් කිරීම වෙනු-වෙන් සැප්තැම්බර් මස 15 වැනිදා දක්වා කාලය ලබාදී තිබිණි.

මෙම අභියාචනා ඉදිරි-පත් කිරීමේදී සැලකිලිමත් විය යුතු විශේෂ කාරණා-වක් ද සිහිපත් කළ මනා ය. එනම් වරින් වර රජයේ රැකියා අවස්ථා ලබාදීමත් සමඟ පෞද්ගලික අංශයේ සිදු වන කඩාවැටීම ය. එබැවින් පෞද්ගලික අංශයේ රු.50 000, රු.60 000 වැටුප් ලබා-ගන්නා රැකියා නියුක්ති-කයන් මෙම පත්වීම් වෙනු-වෙන් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු නැත. ඒ, රටේ සංවර්ධනයට විශාල දාය-කත්වයක් දක්වන පෞද්ග-ලික අංශයත් අප විසින් ආරක්ෂා කරගත යුතු බැවිනි. කෙසේ වෙතත් පැහැදිලිව ම උපාධියට නොගැළපෙන අන්දමේ රැකියාවල නිරත වූ පිරිසක් පෞද්ගලික අංශයේ සිටිනම් ඔවුන් පිළිබඳ සලකා බැලීමට රජය සූදානමින් සිටී. ඔවුන් නිරත වී සිටි රැකියාව, පත්වීමේ ලිපිය, ඉවත් වී සිටි නම් අස්වීමේ ලිපිය ඇතුළු සියලු දේ සමඟ අභියාචනා ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන්නේ එබැවිනි. ඒ අනුව අභියාචනා ඉදිරිපත් කළ අය පිළිබඳ කරුණු සකලා බලා සහනයක් සැලසීමේ සූදානමක් ඇති බව කිව යුතු ය.

ඉල්ලුම් පත් යොමු කළ 90 000කගේ නාම ලේඛනය www.pubad.gov.lk වෙබ් අඩවියේ අන්තර්ගත වේ. තෝරාගත් 50000 ද ප්‍රති-ක්ෂේප වූ පිරිස ද ප්‍රතික්ෂේප වීමට හේතුව ද එහි ම පැහැදිලිව සඳහන්කොට තිබේ. ඒ අනුව අපේක්ෂකයා තමන් ප්‍රතික්ෂේප වීමට හේතුව පිළිබඳ දැනුවත් වන අතර අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් ඉදිරිපත් කළ යුත්තේ ප්‍රතික්ෂේප වීමට බලපෑ හේතුව, එසේ නොවන බවට පැහැදිලිව ඔප්පු කළ හැකි කාරණාද සමඟිනි.

### ■ දීර්ඝ පුහුණු කාලයක්

කෙසේ වෙතත් මෙවර උපාධිධාරීන් 50000 බඳවා ගැනීම තුළ පෙර නොවූ විරු විශේෂ-ත්වයක් දැකිය හැකි ය. එනම් බඳවා ගන්නා උපාධිධාරීන් මුල සිටම ක්‍රියාත්මක වන දීර්ඝ පුහුණු කාලයකට ඇතුළත් වීම ය. මෙම පුහුණු වැඩසටහන ආරක්ෂක අමාත්‍යාංශය සහ ත්‍රිවිධ හමුදාවල සහයෝගයෙන් දියත් කිරීමට සැලසුම් සකස් කොට අවසන් ය. ඒ අනුව පුහුණුව දෙන්නේ බඳවා ගත් පිරිස 10 000 බැගින් කණ්ඩායම් 05කට බෙදා වෙන් කර ගැනී-මෙනි. පොදුවේ මේ සියලු දෙනාටම වට පහකදී පුහුණුවීම් ලබාදීම සිදු කෙරේ. නායකත්වය පිළි-බඳ සති තුනක නේවාසික පුහුණුවක්, කළමනාකරණ කුසලතා වර්ධනය පිළිබඳ සති තුනක පුහුණුවක්, රාජ්‍ය අංශයේ ආයතන-යක සති තුනක පුහුණු-වක්, පෞද්ගලික අංශයේ ආයතනයක සති තුනක පුහුණුවක් ආදි වශයෙන් මෙම පුහුණු වැඩසට-හන පියවර කිහිපයක් ඔස්සේ ඉදිරියට ගෙන-යන අතර ඊට අමතරව බඳවාගත් උපාධිධාරීන්ට තෝරාගත් මාතෘකාවක් යටතේ යම්කිසි ව්‍යාපෘති-යක් පිළිබඳ අධ්‍යයනය-කින් අනතුරුව ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර යම් වැඩසටහනක් සකස් කිරීමේ අවස්ථාවක් ද දීමට අපේක්ෂිත ය.

> **නේවාසික නායකත්ව පුහුණුව සති තුනක් පුරා ලබා දෙන්නේ ආසන්නත ම ආරක්ෂක කඳවුරක් ආශ්‍රිතව ය. ඉදිරියේදී රාජ්‍ය සේවකයන් බවට පත් වන මෙම පිරිස තුළ නායකත්වය, ආකල්ප, කුසලතා වර්ධනය කිරීමත් සාමූහිකවත් වගකීම් සහගතවත් රාජකාරිය ඉටු කරන ආකාරය පිළිබඳ පුහුණුවක් ලබාදීමත් මෙහි අරමුණ වේ.**

නේවාසික නායකත්ව පුහුණුව සති තුනක් පුරා ලබා දෙන්නේ ආසන්නත ම ආරක්ෂක කඳවුරක් ආශ්‍රිත ව ය. ඉදිරියේදී රාජ්‍ය සේවකයන් බවට පත් වන මෙම පිරිස තුළ නායක-ත්වය, ආකල්ප, කුසලතා වර්ධනය කිරීමත් සාමූහිකවත් වගකීම් සහගතවත් රාජකාරිය ඉටු කරන ආකාරය පිළිබඳ පුහුණුවක් ලබාදීමත් මෙහි අරමුණ වේ.

### ■ විශ්වවිද්‍යාල පුහුණුව

ඊළඟ සති තුනේදී සිදු කෙරෙන්නේ විශ්වවි-ද්‍යාලවල සහයෝගයෙන් පවත්වන පුහුණුවකි. එහිදී කළමනාකරණ පීඨයේ ආචාර්යවරුන් විසින් මෙම පිරිසට කළමනාකරණය සහ කළම-නාකරුවකුගේ ගුණාංග පිළිබඳ මනා අවබෝ-ධයක් දීමටත් නියමිත ය. කාර්යාල පරිපාලනය, පිරිස් පාලනය, කළමනාකරණය පිළිබඳ සති තුනක පුහුණුවක් දීමට විශේෂ හේතුවක් තිබේ. එනම් බඳවා ගත් උපාධිධාරිහු 50 000 අතරින් 31 000ක් ම සිටිනුයේ කලා උපාධිධාරීන් ය. ඔවුන් සතුව කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් හැකියාවක්, දක්ෂතාවක් නොමැත. විශේෂ-යෙන්ම කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබාදීමේ යෝජනාවක් ඉදිරිපත් වූයේ එබැවිනි.

ඉන් අනතුරුව මෙම කණ්ඩායම නිලධාරියකු දෙදෙනකු ආදී වශයෙන් ප්‍රාදේශීය මට්ටමේ රාජය ආයතනවලට බෙදා යවා, කාර්යාල කට-යුතු, ලිපිගොනු පවත්වාගෙන යෑම, මුදල් රෙගු-ලාසි, විනය පවත්වාගෙන යෑම වැනි කාරණා පිළිබඳ අවබෝධයක් ලබාදීමේ කටයුත්තක් ද සිදු කෙරේ.

පෞද්ගලික අංශයේ ආයතනවල ද පුහුණුවක් දීමේ අපේක්ෂාවක් ඇතිමුත් අවස්ථා කිහිප-යකදී ම රජයේ පත්වීම් දෙන විට පෞද්ගලික අංශයේ රැකියාවල නියැළි සිටි උපාධිධාරීන් එම ආයතනවලින් ඉවත් වී රජයේ රැකියාවලට යොමු වී ඇති බැවින් උපාධිධාරීන්ට ආයත-නික පුහුණුවක් දීම පිළිබඳව පෞද්ගලික අංශය යම් ආකාරයකින් අදිමදි කරමින් සිටී. එබැවින් පෞද්ගලික අංශයේ ආයතන තුළ පුහුණුවක් ලබාදීම සම්බන්ධයෙන් තවම අවසන් තීරණ-යකට පැමිණිය නොහැකි වුවද එවැනි ආය-තනවල රාජකාරි කෙරෙන ආකාරය පිළිබඳව ද මෙම කණ්ඩායමට ප්‍රමාණවත් අවබෝධයක් ලබාදීම වඩා වැදගත් වේ.

### ■ නව ව්‍යාපෘති

බඳවා ගත් පිරිසට ව්‍යාපෘතියක් දියත් කිරීමේ කටයුත්තක් ද භාර වේ. එහිදී නියඟය, ගංවතුර වැනි මහජනතාව පීඩාවට පත් කරන ප්‍රශ්න ඇතුළු රටේ පොදු ප්‍රශ්න, සංචාරක ව්‍යාපාරය, කෘෂිකර්මාන්තය වැනි මාතෘකා 800ක් පමණ හඳුනාගෙන ඇති අතර එතුළින් අපේක්ෂා කෙරෙනුයේ මෙම කණ්ඩායම ඒ පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකොට ගැටලු සහ එම ගැට-ලුවලට දිය හැකි විසඳුම් සොයන ආකාරයේ ව්‍යාපෘතියක් පවත්වාගෙන යෑමයි.

මෙම පුහුණුව අවසන් වූ පසුව බඳවාගත් උපාධිධාරීන් යම් යම් ආයතනවලට අනුයුක්ත කෙරේ. කෙසේ වෙතත් මේ පිරිස කුමනාකාර-යෙන් ආයතනගත කරන්නේද? යන කාරණය ස්ථිර වශයෙන් තීරණය වනුයේ වසරක පුහුණු කාලය අවසන් වූ පසු ය. පුහුණු කාලය තුළ මාසිකව රුපියල් 20 000ක දීමනාවක් ලබා-දෙන අතර වසරකින් පසු මෙම කණ්ඩායම රජයේ සේවයට ඇතුළත් කරගැනීමේ කටයුතු සිදු කෙරෙන්නේ සංවර්ධන සේවා ව්‍යවස්ථාව යටතේ ය. මොවුන්ට ද සෙසු රාජ්‍ය සේවකයන්ට සේ ම විශ්‍රාම වැටුප් හිමි ය.

මෙහිදී අප විසින් අවධානය යොමු කළ යුතු තවත් වැදගත් කාරණයකි. එනම් දැනටමත් අතිරික්තයක් දැකිය හැකි රාජ්‍ය සේවයට තවත් 15 0000ක් බඳවා ගැනීම රජයේ ආයතවල-ටත් රටටත් බරක් නොවේද? යන්න යි. මෙම රැකියා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ රාජ්‍ය ප්‍රතිපත්තියක් යටතේ ය. ජනාධිපතිතුමන් උපදෙස් දී ඇත්තේ අලුතින් බඳවා ගන්නා පිරිස කොළඹ හෝ කොළඹින් පිට කාර්යාල පිරවී-මට යොදාගන්නා ලෙස නොවේ, විශේෂයෙන් ගම්බද මට්ටමේ කෘෂිකර්ම ක්ෂේත්‍රය, වාරිමාර්ග ක්ෂේත්‍රය සහ වෙනත් ක්ෂේත්‍රවලටත් වන අලි පිළිබඳ ගැටුම් වැනි මහජනතාවගේ ගැටලුවලට විසඳුම් සෙවීමටත් පිළිගත් ක්‍රමවේදයකට අනුව යොදාගන්නා ලෙස ය.

### ■ අධ්‍යාපන මට්ටම

විශේෂයෙන්ම අඩුආදායම් ලාභීන් ලක්ෂය බඳවා ගැනීමේ කටයුත්ත සිදු වනුයේ රටේ පිළි-ගත් යම් අධ්‍යාපන මට්ටමක් ලබාගත නොහැකි වූ ඉතාමත් දුගීදුප්පත් පවුල්වල දුප්පත්කම නැති කරගැනීම වෙනුවෙන් ඔවුන්ට ද අවස්ථාවක් ලබාදීමේ අවශ්‍යතාව අනුව යි.

එහිදී රාජ්‍ය ප්‍රතිපත්තියේම සඳහන් වන්නේ කිසිවක් කරගත නොහැකි, අඩු අධ්‍යාපන සුදුසුකම් ඇති දුගී පවුල්වල සාමාජිකයන්ට මෙම රැකියා අවස්ථා හිමි වන බව ය. මෙරට තුළ වසරකට උපත් 3 50 000ක් පමණ සිදු වේ. පාස-ල්වලට 350000ක් පමණ ඇතුළත් වන නමුත් සාමාන්‍ය පෙළ දක්වා යෑමේදී යම් පිරිසක් යම් යම් හේතු මත අධ්‍යාපනය ක්‍රමයෙන් ඉවතට විසි වේ. උසස් පෙළ දක්වා යන විට විශාල පිරිසක් අධ්‍යාපනයෙන් ඉවත් වී යන අතර, විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වන්නේ 30 000ක පමණ පිරිසකි. එවිට අපොස සාමාන්‍ය පෙළ හෝ සමත් විය නොහැකි වූ පිරිස ඇතැම් විට රටේ ආරක්ෂාව පිළිබඳ එල්ල වන තර්ජනයක් විය හැකි ය. රටේ සංවර්ධනයට ඔවුන්ගේ දායකත්වය ද නොලැබී යනු ඇත. එසේ ම ඔවුන්ගේ දුප්ප-ත්කම හැමදාමත් ගසට පොත්ත සේ ඔවුන් හා බැඳී තිබෙනු ඇත. විශේෂයෙන් ම අඩුආදායම් ලාභි පවුල්වල 100 000කට රැකියා දීමේ අපේක්ෂාව වූයේ මේ සඳහා යම් පිළියමක් යෙදීම යි. මෙය දේශපා-ලන අත පෙවීම් හෝ බලපෑම්වලින් තොරව විනිවිද භාවයකින් යුතුව සිදු විය යුත්තකි.

**කාංචනා සිරිවර්ධන**



# බූස්ස හිරගෙදර පාතාලයන්ගේ වැරදුණු වර්ජන කුරුමාණම

බූස්ස බන්ධනාගාරය පිහිටා ඇත්තේ අධි ආරක්ෂිත කලාපයකය. ඒ නිසාම මනා පරීක්ෂාවකින් තොරව කිසිවෙක් එයට ඇතුළු කර නොගැනෙති. ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා ද එහි ඇතුළුවන විට පරීක්ෂාවට ලක් කිරීම සාමාන්‍ය සිරිතකි.

බූස්ස බන්ධනාගාරයේ රඳවා සිටින්නේ ද එසේ මෙසේ අය නොවේ. නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් විවිධ ආකාරයේ අපරාධ සිදු කළ මහ මොළකරුවන් මේ කඳවුරට ගාල් කරන්නට සිදු වූයේ සිරගතව සිටියද ඔවුන් මෙහෙයවන අපරාධ නොනැවතුණ බැවිනි. බන්ධනාගාරයේ සිට වුවද මේ පාතාලයන්ගෙන් සාමාන්‍ය ජන ජීවිතයට එල්ලවන පීඩනය වළකා ගැනීමට සුදුසුම ක්‍රියාමාර්ගය බූස්ස වැනි අධි ආරක්ෂිත කලාපයක ඇති සිරකඳවුරක ඔවුන් රැඳවීම බව මෙරට සේනාධිනායකවරයා ඇතුළු ආරක්ෂක ප්‍රධානීන් ගත් තීරණය අනුවය.

එසේ වුවද එහි සිදුරුවලින් පාතාල ක්‍රියා සිදු කිරීමේ කටයුතු මෑතක් වන තුරුම සිදු කෙරෙන බව බුද්ධි තොරතුරු අනාවරණය කිරීමත් සමඟ එහි සම්පූර්ණ ආරක්ෂාව විශේෂ කාර්ය බළකායට පැවරිණි.

මෙවන් වාතාරණයක් තිබුණද බූස්ස සිර කඳවුරේ රඳවා සිටින පාතාල නායකයන් සිය කටයුතු වෙනත් ක්‍රම උපයෝගී කර ගනිමින් සිදු කිරීම නවතා ගැනීම ඉතා අසීරු කරුණක් වූයේ ඔවුන් හා සබඳතා ඇති මුදලට හා මතට එක් වූ සාමාජිකයන් සමාජය පුරා විසිර සිටීමය.

මිනිමැරුම්, මංකොල්ල කෑම්, කප්පම් ගැනීම් වැනි දරුණු අපරාධවලට අමතරව මෙහි වැඩි කොටසක් රඳවා ඇති පාතාල නායකයන් හෙරොයින් ජාවාරමත් අවි ජාවාරමත් එකට සිදු කළ හෝ ඒවාට මුල්ව කටයුතු කළ හෝ පිරිසය. මේ නිසා අධි ආරක්ෂාව තිබුණද තවත් නීති රීති මාලාවක් මොවුන් වෙනුවෙන් දැම්මට ආණ්ඩුවට සිදු විය.

මේ නිසා බූස්සේ රැඳවූවන්ට ඥාතීන් සමඟ සම්බන්ධවීමට ලබාදී තිබූ දුරකතන සබඳතා අත්හිටුවීමට මූලිකවම පියර ගනු ලැබීය. මීට හේතු වූයේ මොවුන් රඳවා සිටියද පිටත සිදු කරන විවිධ අපරාධ රැල්ල මෙහෙයවීමය.

කුලියට මිනී මැරීම, හෙරොයින් ජාවාරම, කප්පම් ගැනීම ආදී කටයුතු මගින් මහා පරිමාණයෙන් මුදල් හම්බ කර සිය කල්ලි සාමාජියන් නඩත්තු කරමින් සමාජයේ සැඟවී සිටින තම කල්ලි සාමාජිකයන්ට අපරාධ සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීමත්, මෙහෙයවීමත් මොවුහු බන්ධනාගාරයේ සිට සිදු කරන බවට අනාවරණය වී තිබුණේ කලක සිටය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා පත්වීමත් සමඟ වර්තමාන ආණ්ඩුව සමඟ එක්ව මත්ද්‍රව්‍ය හා අවි ජාවාරම මූලික කරගනිමින් අනෙකුත් සියලු අපරාධ මැඩලීමට ගත යුතු නිවැරදිම තීරණ ගනු ලැබීය. මේ නිසා බන්ධනාගාර ආරක්ෂාවට විශේෂ කාර්ය බලකාය යෙදවීමත් රැඳවූවන් බැලීමට එන්නන් දැඩි පරීක්ෂාවට ලක් කිරීම, පිටතින් ආහාර ගෙන ඒම සීමා කිරීම මෙහිදී ගත් ක්‍රියාමාර්ග විය.

ඒ අනුව බන්ධනාගර රැඳවූවන් හමුවීමට එන සේවාදායක නීතිඥවරුන් පරීක්ෂා කර ඇතුළුකර ගැනීම අනිවාර්ය කෙරිණි.

මෙසේ තම සේවාදායක නීතිඥවරුන් බූස්ස බන්ධනාගාර පරිශ්‍රයට ඇතුළු වීමේදී පරීක්ෂා කිරීම පිළිබඳ රැඳවූවන් විරෝධය පළ කරමින් එසේ නොකරන ලෙස ඉල්ලා සිටියහ. එසේ වුවද රැඳවූවන්ගේ ඉල්ලීම නොසලකා හැරුණු අතර පරීක්ෂාව අනිවාර්ය කෙරිණි. ආහාර පිටතින් ගෙන ඒමට දැමූ සීමාද එසේම ක්‍රියාත්මක විය.

මෙවැනි දැඩි නීති පනවන්නට හේතු වූ තවත් කරුණු ගණනාවක්ද පසුගිය දා අනාවරණය වී තිබිණි. ඒ අනුව ජනාධිපතිවරයාට, ආරක්ෂක ලේකම්වරයාට සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් කිහිප දෙනෙකුට ප්‍රසිද්ධියේ මරණ තර්ජන එල්ල කිරීම පිළිබඳව 'කොස්ගොඩ තාරක' සහ 'පොඩි ලසී' දෙදෙනා සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළ අවස්ථාවේදී ය.

බූස්ස බන්ධනාගාරයේ රැඳවියන් කිහිප දෙනෙකු ඔවුනට ලැබෙන පහසුකම් ප්‍රමාණවත් නොවන බව පවසා උපවාසයක් ආරම්භ කර තිබූ අතර ඒ පිළිබඳ සොයා බැලීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරුන් කිහිප දෙනකු ජූනි මස 26 දා බූස්ස බන්ධනාගාරයට ගොස් ඇති බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා අධිකරණය හමුවේ කරුණු දැක්වීය.'පොඩි ලසී' නමැත්තා එම නිලධාරීන්ටත් බූස්ස බන්ධනාගාර අධිකාරිවරයාටත්, ජනාධිපතිවරයාටත්, ආරක්ෂක ලේකම්වරයාටත් ඔවුන්ගේ පවුල්වල අයටත් ප්‍රසිද්ධියේ මරණ තර්ජන එල්ල කර ඇති බව දිලීප පිරිස් මහතා අනාවරණය කළේ ය.

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා පෙන්වා දුන්නේ, අධිකරණ නියෝග මත රඳවා සිටින පිරිස මැර බලය අවි බලය සමග රජයේ නිලධාරීන්ට ප්‍රසිද්ධියේ මරණ තර්ජන එල්ල කිරීම බරපතළ කාරණයක් බව ය. සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂි රැසක් තිබෙන බව දිලීප පිරිස් මහතා අධිකරණයට පෙන්වා දුන්නේ ය. බන්ධනාගාරයට ගෙන එන අවස්ථාවේ බෝම්බ ගසා ප්‍රතිවාදීන් ඝාතනය කිරීමට බන්ධනාගාරය තුළ සිට මොවුන් සැලසුම් කර ඇති බවද හෙළිව තිබෙන බව අනාවරණය විය.

රැඳවූවන් බන්ධනාගාරයේ සිට සිය ක්‍රියාකාරමක් සිදු කිරීම නැවැත්වීමේ අවශ්‍යතාව දැඩිව දැනුනේ මේ නිසාය. ඒ අනුව ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් දැඩි සේ කලබලයට පත් පොඩි ලසී, කොස්ගොඩ තාරක, වෙලේ සුදා, කංජිපානි සහ මාකඳුරේ මධුෂ් වැනි අපරාධ කල්ලි නායකයන් සිය ඉල්ලීම් දිනා ගැනීම සඳහා ආහාර වර්ජනය කරමින් මාරාන්තික උපවාසයක් ආරම්භ කළේ ඉකුත් 08 දාය. ධර්මකීර්තිගේ තාරක පෙරේරා විජේසේකර හෙවත් 'කොස්ගොඩ තාරක' ගිනි අවි පරිහරණය කිරීම මත්ද්‍රව්‍ය ජාවාරම ඇතුළු අපරාධ රැසක් සම්බන්ධයෙන් අත්අඩංගුව පත් වූ පාතාල නායකයෙකි.

අරුමානන්දි ජනිත් මධුසංක ද සිල්වා හෙවත්'පොඩි ලසී' සිය පියාගේ මරණයෙන් පසු පාතාලයට පිවිසියේය. මිනිමැරුම්, කප්පම් ගැනීම ඇතුළු දකුණේ විවිධ අපරාධ රැසක් මොහු සිදු කළ බව අනාවරණය කරගෙන තිබේ. "කොස්ගොඩ සුජී" එස්ටීඑෆ් නදුන්ගේ ගෝලයෙකි. එල්ටීටීඊ නායක වූ ප්‍රභාකරන්ගේ ආරක්ෂකයා ලෙස සිටි බුම්මා ද සුජීගේ නායකත්වයෙන් පාතාලයට එක්වුවකු බව හඳුනාගෙන තිබිණි. ජල්බරි සියාම් මාකඳුරේ මදුෂ්ගේ ගෝලයෙකි. දෙමටගොඩ චමින්ද භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනය සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූවෙකි. බ්ලූ මැන්ඩල් සංඛ නොහොත් ඩී. සංඛ මනුෂ්‍ය ඝාතනයක් සිදු කර රටින් පලා ගොස් ඉන්දියාවේ සිටියදී අත්අඩංගුවට පත් වූවෙකි. පොට්ට නවුෆර් විනිසුරු අඹේපිටිය මහතා ඝාතනය කිරීමට වරදකරුවා විය. මේ සියලු දෙනාම සිය ඉල්ලීම් දිනා ගැනීමට උපවාසයට එක්ව සිටියහ.

අප දන්නා ඉතිහාසයේ මාරාන්තික උපවාසයකින් මිය ගියේ "තිලීපන්" නමැති අන්තවාදී නායකයා පමණි. වෙනත් කිසිවකු එසේ මිය යන තෙක් උපවාසයේ නොයෙදුණු අතර උපවාසය අසීරු වන විට කිසියම් රෝග තත්ත්වයක් පෙන්වා කිසිවෙකුට කියා ජල හෝ වෙනත් පානයක් ලබා ගෙන රෝහල් ගත වූ බව අපි දනිමු.

මෙරටට හෙරොයින් වැනි අහිතකර උවදුරු වැඩි වශයෙන් ආවේ 1978 ගෙනා විවෘත ආර්ථික රටාවත් සමඟය. රටකට විදේශයකින් ගෙන ආ යුතු වන්නේ ස්වදේශයේ නිෂ්පාදනය කිරීමට අපහසු අත්‍යවශ්‍ය දේය. එසේ වුවද 1977 මැතිවරණයෙන් ජය ගත් ජේ ආර් ජයවර්ධන මහතා ප්‍රමුඛ එජාපයට ලැබුණු අසීමිත ජයග්‍රහණය සමඟ එතෙක් පැවති 1972 ගෙනා අගමැති මූලික ජනරජ ව්‍යවස්ථාව වෙනස් කරමින් 1978 දී ජනාධිපති මූලික විවෘත ආර්ථික ප්‍රතිපත්ති සහිත ජනාධිපති ව්‍යවස්ථාව ස්ථාපිත කෙරුණේය. මේ නිසා ඇති වූයේ මුදල මූලික කරගත් ආර්ථික රටාවකි. මානුෂික අවශ්‍යතා දෙවන තැනට වැටෙන තරමටම මුදල මූලික වූයේ විවෘත ආර්ථිකය සමඟ සැකසුණු සමාජ ආර්ථික අවශ්‍යතා අනුවය. මේ කරුණු මූලික කර ගනිමින් පාතාල කල්ලි කණ්ඩායම් බිහි වන්නට විය. එහිදී දේශපාලන අධිකාරියේ අවශ්‍යතා සපුරාලීමේ කල්ලි ලෙස මූලිකව මේ පිරිස ගොඩ නැඟුනු අතර ආර්ථික ගැටලු අනුව දුප්පත් පොහොසත් භේදය හේතුවෙන් පන්ති පරතරයක් ඇති වීමද විවෘත ආර්ථිකය ඇති කිරීමෙන් වූ තවත් වරදකි. මේ නිසා කෙසේ හෝ මුදල් හරි හම්බ කිරීමට මිනිසා පෙලඹිණි. මේ අනුව ලොව පුරා කුඩු ජාවාරම ද සිදු වෙමින් පැවති හෙයින් වැඩි බාධාවකින් තොරව ශ්‍රී ලංකාවට කුඩු ගෙන ඒමටද හැකි විය. ඒ සඳහා දේශපාලන හස්තයේ ද ආරක්ෂාව ලැබුණු බව නොරහසකි.

එදා මුදල මූලික කර ගනිමින් ඇති වූ කල්ලි ලොව ඇමෙරිකාවේ ඇරිසෝනා ප්‍රාන්තයේ වෙඩික්කායන්ගේ කල්ලි බිහිවීමේ පාතාල කණ්ඩායම් ආකාරයට කටයුතු කිරීම ආරම්භ වූයේ නීති විරෝධී අවිද නිරන්තරයෙන් සංක්‍රමණය වීම නිසාය. බොහෝ විට මුහුදු මාර්ගයෙන් කුඩු මෙන්ම අවි ආයුධක රට තුළට ඒම වැළැක්වීමට එදා ආරක්ෂක අංශවලට හැකි වූයේ නිසි නායකත්වයක් නැති කම පමණක්ම නොවන බව ඉතිහාසය පිළිබඳ ගවේෂණයේදී හඳුනා ගත හැක. එදා දේශපාලන පැවැත්ම උදෙසා බලය මුදල අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් වූයේ එජාපය ගෙනා විවෘත ආර්ථිකයට පින් සිදු වන්නට බව අද වන විට හොඳින්ම වටහා ගැනීමට හැකි තිබේ. එල්ටීටීඊයද පෝෂණය වූයේ එම කාල වකවානුවේය.

ලොව දරුණුම ත්‍රස්ත කණ්ඩායම් අතර ප්‍රමුඛස්ථානයට පැමිණ සිටි එල්ටීටීඊය පරාජය කරන්නට හැකි වූයේ 2005 රට පාලනය බාරගත් ජනාධිපති වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ආණ්ඩුවටය. එදා මහින්ද මහතාගේ ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කිසිවෙකුට පරාජය කළ නොහැකි බව කියූ එල්ටීටීඊය පරාජයට පත් කළ අයුරින් මෙදා ජනාධිපති ලෙස ඒ මහතාට පාතාලය පරාජය කිරීමට උර දෙන්නට ශක්තිමත් පිරිස දෙපස සිටිති. ඒ අනුව එදා ජනාධිපති අද අගමැති වන මහින්ද රාජපක්ෂ සමඟ වර්තමන ආරක්ෂක ලේකම් එදා එල්ටීටීඊය පරාජය කිරීමේ කාර්යයට උරදුන් මහා සෙන්පතියකු වූ මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා ජනපති සමඟ එක්ව ක්‍රියාත්මක වී සිටිති.

ත්‍රස්තවාදය ලෙසම කාලයක් තිස්සේ දේශපාලන රැකවරණය මත හැදී වැඩුණු පාතාලය සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට වර්තමාන ආණ්ඩුවට හැකියාව පවතින බව මේ වන විටද තහවුරුව තිබේ. මේ නිසාම පාතාල නායකයන් භීතියට පත්ව සිටින බව බූස්ස බන්ධනාගාරයේ රැඳවූවන්ගේ ක්‍රියාවෙන් පෙන්නුම් කෙරේ. ජන සමාජයෙන් ඈත් කර වෙනම රඳවා තිබුණද මෙතෙක් මොවුන්ට බන්ධනාගාරය තුළින්ම ලැබී ඇති ආධාර උපකාර සහ අනුබල දීම නිසා අපරාධ හැසිරවීමට හැකියාව ලැබී තිබුණ බවට බුද්ධි අංශ තොරතුරුවලින් හෙළි කර තිබිණි. අනාගතයේ කුඩ්ඩන්, මිනිමරුවන් නැති සාමකාමී සමාජයක් සැකසීමට වර්තමානයේ ගන්නා තීන්දු තීරණ ඉවහල් වන්නේය. මේ පිළිබඳ නිසි නායකත්වය ලබා දීමේ වගකීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මනාව බාර ගෙන තිබේ. එවැනි නායකයකු අප රටට බිහිවීම ගැන අප ආඩම්බර විය යුතුය.

මේ නායකත්වයේ තීන්දු තීරණ අනුව පාතාලයට හිස එසවීමට අනාගතයේ දී නොහැකි වන බව නම් කිව යුතුමය. පාතාලයේ හිතුවක්කාරි කටයුතුවලට නැවත ඉඩක් නැති කරමින් ගනු ලැබූ තීන්දු හේතුවෙන් දරුණු ගණයේ අපරාධකරුවන් බූස්සට කොටු වුණේය. එය දරා ගැනීමට ඔවුන්ට අද නොහැකිව තිබේ. රැඳවූවන් තමන්ගේ අවශ්‍යතාව කෙසේ හෝ ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් ඉකුත් දා ආහාර වර්ජනයට පෙළඹුණ බව නොරහසකි.

කෙසේ වුවද ආහාර වර්ජනයේ සිටියදී ඉකුත් 11 දා කංජිපානි හදිසියේ ලෙඩ වුණේය. ඔහු තමාට දැඩි සේ අසනීප බැවින් කරාපිටිය රෝහලට රැගෙන යන ලෙස කලබල කරන්නට විය. එසේ වුවත් බන්ධනාගාර ආරක්ෂක අංශය ඔහු බූස්ස නාවික හමුදා රෝහල වෙත රැගෙන ගොස් පරීක්ෂාවට ලක් කළ ද කිව යුතු අසනීපයක් නොවුණු බව අනාවරණය විය. බන්ධනාගාරයෙන් පිටතට රැඳවූවකු ගෙන ගිය විට යම් හෙයකින් ගුද මාර්ගයේ යමක් සඟවා ගෙන ඒමේ අවදානමක් තිබෙන බැවින් වැසිකිළි කැසිකිළි කටයුතු සඳහා රැගෙන යයි. කංජිපානිද මේ අයුරින් රැගෙන ගියද දින දෙකකින් පමණ ආහාර නොමැති බැවින් කැසිකිළි යෑමට නොහැකි බව ඔහු බන්ධනාගාර නිලධාරීන්ට පවසා තිබිණි. මේ අනුව ලබා දුන් ඉදිආප්ප කංජිපානි ආහාරයට ගෙන ඇති අතර පසුව කැසිකිළි කටයුතු නිමකර නැවත ඔහු උපවාසයට වාඩි වීමට ගොස් තිබිණි.

එසේ පිටත අපරාධ මෙහෙයවීමට නොහැකි වන පරිදි තමාට අවාසි සහගතව ක්‍රියාත්මක වුණු කරුණු රැසකට එරෙහිව සිදු කළ ආහාර වර්ජනයට බූස්ස බන්ධනාගාරයේ රැඳවූවන් 45 දෙනකු එක්ව සිටි අතර ඊයේ (14) වන විට මේ සියලු දෙනා ආහාර වර්ජනය අතහැර සාමාන්‍ය ලෙස කටයුතු කිරීම ආරම්භ කර තිබුණු බව බන්ධනාගාර ප්‍රකාශකයෙක් සඳහන් කළේය. පාතාල නායකයන් සිය අවශ්‍යතා සපුරා ගැනීම මූලික කර ගනිමින් මෙසේ කටයුතු කළද ආරක්ෂක ලේකම්වරයා සිය ස්ථාවරය නොවෙනස්ව පවත්වාගන යෑම පැසසුමට ලක් කළ යුතුය. පාතාල මර්දනය සඳහා තවදුරටත් කටයුතු කිරීම ජන සමාජයේ ආරක්ෂාවට ගත් හොඳම ක්‍රියාමාර්ගය ලෙස අපි දකිමු.

**චන්ද්‍රිකා පෙරේරා**

**ආහාර වර්ජනයේ සිටියදී ඉකුත් 11 දා කංජිපානි හදිසියේ ලෙඩ වුණේය. ඔහු තමාට දැඩි සේ අසනීප බැවින් කරාපිටිය රෝහලට රැගෙන යන ලෙස කලබල කරන්නට විය. එසේ වුවත් බන්ධනාගාර ආරක්ෂක අංශය ඔහු බූස්ස නාවික හමුදා රෝහල වෙත රැගෙන ගොස් පරීක්ෂාවට ලක් කළ ද කිව යුතු අසනීපයක් නොවුණු බව අනාවරණය විය. බන්ධනාගාරයෙන් පිටතට රැඳවූවකු ගෙන ගිය විට යම් හෙයකින් ගුද මාර්ගයේ යමක් සඟවා ගෙන ඒමේ අවදානමක් තිබෙන බැවින් වැසිකිළි කැසිකිළි කටයුතු සඳහා රැගෙන යයි. කංජිපානිද මේ අයුරින් රැගෙන ගියද දින දෙකකින් පමණ ආහාර නොමැති බැවින් කැසිකිළි යෑමට නොහැකි බව ඔහු බන්ධනාගාර නිලධාරීන්ට පවසා තිබිණි. මේ අනුව ලබා දුන් ඉදිආප්ප කංජිපානි ආහාරයට ගෙන ඇති අතර පසුව කැසිකිළි කටයුතු නිමකර නැවත ඔහු උපවාසයට වාඩි වීමට ගොස් තිබිණි.**

| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 09 - 14 | 2020 - 09 - 14 | 2020 - 09 - 08 | 2020 - 09 - 06 | 2020 - 07 - 31 | 2020 - 09- 09 | 2020 - 09 - 09 | 2020 - 09- 07 | 2020 - 09-02 | 2020 - 09 - 09 | 2020 - 09 - 07 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 2540 | දිනුම් වාරය - 1535 | දිනුම් වාරය - 2916 | දිනුම් වාරය - 621 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1688 | දිනුම් වාරය - 3366 | දිනුම් වාරය - 1208 | දිනුම් වාරය - 1051 | දිනුම් වාරය - 1036 | දිනුම් වාරය - 1611 | දිනුම් වාරය - 013 |
| 01 03 34 49 | 05 06 09 10 | 21 37 45 59 | 05 15 40 45 | 22 23 40 | 07 31 35 43 | 31 34 60 64 | 25 43 48 66 | 6 4 8 3 9 6 | 07 12 39 48 | 10 11 37 57 | 04 12 33 63 |
| අක්ෂරය G | සුපිරි අංකය -04 | ලග්නය-මිතුන විශේෂිත අංක | ඉංග්‍රීසි අක්ෂරය- Q | දෛව අංකය - 02 අක්ෂරය- L | අක්ෂරය-A | අක්ෂරය - D | අක්ෂරය - U | අක්ෂරය -K | අක්ෂරය - K | අක්ෂරය - Z | අක්ෂරය - U |
| | | රු 500 තෘතීය සඳහා-9609 | | | | | | | රු 500 තෘතීය සඳහා-2169 | | |
| | | රු 100 තෘතීය සඳහා-757 | | | | | | | රු 100 තෘතීය සඳහා-786 | | |

# නිලන්ත ජයවර්ධනගේ දුරකථනය කොමිසම භාරයට ගන්න

## කොමිසමේ සභාපති නියෝග කරයි

**සුභාෂිණී සේනානායක**

රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතාගේ ජංගම දුරකථනය ආදාළ පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන කොමිසම භාරයට ගන්නා ලෙස කොමිසම භාරව සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහේෂ් වැලිකන්න මහතාට කොමිසමේ සභාපති විනිසුරුවරයා ඊයේ 14 නියෝග කළේය.

මෙම දුරකථනය ඔහුගේ නිවසේ ඇති බවට නිලන්ත ජයවර්ධන මහතා සිදු කළ දැනුම් දීමෙන් අනතුරුව එම දුරකථනය නිලන්ත මහතාගේ නිවසට ගොස් ලබා ගෙන කොමිසම වෙත ඉදිරිපත් කරන ලෙසටද සභාපති විනිසුරුවරයා නියෝග කළේය.

එමෙන්ම මෙම සීඩී තැටියේ එමෙන්ම එම දුරකථනය භාවිත කරන තැනැත්තා ඉදිරියේ මුද්‍රා තබා භාරගන්නා ලෙසටත් මුද්‍රා හැරීම එම තැනැත්තා, සාක්ෂිකරු මෙන්ම සාක්ෂිකරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා සහ රජයේ අධිනීතිඥවරයකු ඉදිරියේ සිදු කරන ලෙසත් සභාපති විනිසුරුවරයා පොලිසියට දැනුම් දුන්නේය.

# නීතිපතිට එරෙහිව පියවර ගන්න

## ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක්

**කුමුදු හෙට්ටිආරච්චි**

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සකස් කිරීමේදී නීතිපති දප්පුල ද ලිවේරා මහතා වැරැදි ලෙස නීති උපදෙස් ලබා දීමෙන් නීතිඥ වෘත්තීය ආචාර ධර්ම සහ රීති උල්ලංඝනය කර ඇති බැවින් ඒ පිළිබඳ පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ගයන් ගන්නා ලෙස ඉල්ලා නීතිඥ අරුණ ලක්සිරි උණවටුන මහතා ශ්‍රේෂ්ඨාධිකරණයට ඊයේ (14) ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

එම පැමිණිල්ලේ මෙසේද සඳහන් වේ.

2002 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ 19 වැනි ආණ්ඩුක්‍රම සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එවකට සිටි අගවිනිසුරු සරත් නන්ද සිල්වා මහතා ඇතුළු සත් පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70.1 අනු ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා, එනම් පාර්ලිමේන්තුව වසරක කාල සීමාව තුළ විසුරුවා හැරීම වෙනස් කිරීම සඳහා ජනමත විචාරණයක් සහ විශේෂ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකගේ අනුමැතිය ලබා ගැනීම කළ යුතු බවට ඒකමතිකව තීන්දු කර ඇත.

# 20 අධ්‍යයන කමිටු වාර්තාව අද අගමැතිට

**චන්දිමා කරුණාරත්න**

20 වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධව ඉදිරිපත්වී තිබෙන අදහස් ගැඹුරින් අධ්‍යයනය කිරීමට පත් කළ කමිටුවේ නිගමන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට අද (15) ලබාදීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සභාපති සහ අධ්‍යාපන අමාත්‍ය ජී.ඇල්.පීරිස් මහතා පැවැසී ය. 16 වන බදාදා සවස කැබිනට් මණ්ඩල රැස්වීමේදී එම කමිටු නිර්දේශ හා නිගමන කැබිනට් මණ්ඩලයටද ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් පසුව ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පියවර ගැන අවධානය යොමු කරන බවත් ඒ මහතා අනාවරණය කළේ ය. ඒ මහතා මේ බව පැවැසුවේ බත්තරමුල්ල නෙළුම් මාවත ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂ මූලස්ථානයේදී ඊයේ (14) පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමිනි.

# 01 වැනි පිටුවෙන්...

## පාස්කු දා ප්‍රහාරය...

සිදු විය හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් අප්‍රේල් 04 වැනිදා ලද තොරතුර සම්බන්ධයෙන් එම බුද්ධි සේවය විසින් යොමුකරන ලද තොරතුර සහිත ඇමුණුමක් සමඟ තමන් වෙත අප්‍රේල් 08 වැනිදා උදෑසන යොමු කර තිබුණු බව හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා කොමිසම හමුවේ පැවසුවේය.

එම තොරතුරෙහි වැදගත්කම පිළිබඳ සලකා තමන් 08 වැනිදා පස්වරුවේ හිටපු ආරක්ෂක ලේකම්වරයා වෙත පෞද්ගලිකව හමුවී සාකච්ඡා කළ බවද ඔහු කොමිසම හමුවේ සාක්ෂි ලබා දෙමින් පැවසුව අවස්ථාවේ ආරක්ෂක ලේකම්වරයා කුමන ප්‍රතිචාරයක් දක්වුයේද යන්න කොමිසම විමසූ අතර එම ප්‍රශ්නයට පිළිතුරු දෙමින් සිසිර මෙන්ඩිස් මහතා පැවසුවේ පසුවදා (09 )බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම පැවැත්වෙන හෙයින් එහිදී මෙය සාකච්ඡා කරන ලෙස නිලන්තට කියමු යනුවෙන් එවකට ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පැවසූ බවය.

ඒ අනුව පසුවදා පැවැත්වෙන බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී මෙම කරණය සාකච්ඡා කරන ලෙස නිලන්ත ජයවර්ධන මහතාව තමන් විසින් දැනුවත් කළේද යන්න පිළිබඳ කොමිසම විසින් සිසිර මෙන්ඩිස් මහතාගෙන් ප්‍රශ්න කරන ලදී.

ඊට පිළිතුරු දෙමින් මෙන්ඩිස් මහතා පැවසුවේ එම තොරතුර ලැබුණේ නිලන්ත ජයවර්ධන මහතාට වන හෙයින් ඒ සම්බන්ධයෙන් ඔහු කතා කළ යුතු අතර තමන්ට ඒ මොහොත වන විට පැවැති අසනීප තත්ත්වය මත තමන් කලින් කාර්යාලයෙන් පිටව ගිය බවයි.

තමන් නිලන්ත ජයවර්ධන මහතාට එලෙස පසුවදා බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී ඔහු වෙත ලැබුණු තොරතුර සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන ලෙස පූර්ව දැනුම්දීමක් නොකළ බව මෙන්ඩිස් මහතා කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පවසන ලදී.

09 වැනිදා පැවැති බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී නිලන්ත ජයවර්ධන මහතා විසින් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා නොකළ අතර රැස්වීම අවසන් වන විට ඔහු විසින් තමන් වෙත යොමුකර තිබූ ලිපිය ඉවතට ගෙන "නිලන්ත මේ ගැන කතා කරන්නේ නැද්ද ? කියා අසන විට, "ආ සර් තාමත් ඔය දෙක අතේ තියාගෙන ඉන්නවද? මම පොලිස්පතිටත් කිව්වා" යනුවෙන් නිලන්ත ජයවර්ධන මහතා පැවැසූ අතර ඒ සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම්වරයාද විමසූ අවස්ථාවේ නිලන්ත ජයවර්ධන මහතා විසින් පැවසුවේ මම තව ටිකක් බලලා කියන්නම් යනුවෙන් බව මෙන්ඩිස් මහතා කියා සිටියේය.


# "ඔබට නිවන් සුව"

උපත : 1970.09.27 විපත : 2020.09.13

## ටී. එම්. එම්. කුමාර මහතා

සොයුර, ඔබ අපගේ සාර්ථකත්වයේ
කොටස්කරුවෙක් විය.
ඔබගේ හදිසි වියෝව අප කම්පා කරවීය.

**අපි ඔබගේ පවුලේ සාමාජිකයන් සමග සංවේගය බෙදා ගන්නෙමු.**

**ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල,**
**කටුනායක.**


# 01 වැනි පිටුවෙන්...

## කුරුණෑගල නගරාධිපති...

අභියාචනාධිකරණ සභාපති විනිසුරු ඒ. එම්. එම්. ඩී. නවාස් සහ සෝභිත රාජකරුණා යන මහත්වරුන්ගෙන් සමන්විත අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම ඊයේ (14) කැඳවිණි. කුරුණෑගල පොලිස් ස්ථානාධිපති ඒ. ඇම්. කපිල අධිකාරි, කුරුණෑගල විශේෂ ඒකකයේ ස්ථානාධිපති රංජිත් කුලතුංග, වැඩබලන පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායක, කුරුණෑගල මහේස්ත්‍රාත් සම්පත් හේවාවසම් සහ නීතිපතිවරයා මෙම පෙත්සමෙන් වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. කුරුණෑගල නගරාධිපති තුෂාර සංජීව විතාරණ මහතා ඇතුළු පස්දෙනෙකු අත්අඩංගුවට ගැනීමට කුරුණෑගල මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කළ වරෙන්තුව ක්‍රියාත්මක කිරීම වළකාලමින් පසුගිය මස 25 වැනි දා අභියාචනාධිකරණය මගින් අතුරු නියෝගයක් නිකුත් කරන ලදී.

එම අතුරු නියෝගය මෙම පෙත්සම් විභාගය අවසන් වනතුරු බලපැවැත්වෙන පරිදි නිකුත් කර ඇත.

## 2012 බන්ධනාගාර...

අධිකරණ ඇමැතිනියව සිටි සමයේදී කිසිදු නඩු කටයුත්තක් සම්බන්ධයෙන් ඇඟිලි ගැසීමක් කර නොමැති බවත්, අතුකෝරල මහත්මිය සඳහන් කළාය. බොරු සාක්ෂි මත නඩු පවරමින් දේශපාලන පළිගැනීමක් කර ඇති බවට හිටපු බන්ධනාගාර කොමසාරිස් එම්ල් රංජන් ළමාහේවා මහතා පැවරූ පැමිණිල්ලේ වගඋත්තරකාරියක ලෙස සාක්ෂි දෙමින් හිටපු ඇමැතිනිය එසේ පැවසුවාය.

දේශපාලන පළිගැනීම පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න, හිටපු අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රසිරි ජයතිලක හා හිටපු පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහත්වරු ඉදිරියේ සාක්ෂි මෙහෙයවිය.

හිටපු අධිකරණ ඇමැතිනි නීතිඥ තලතා අතුකෝරල මහත්මිය සාක්ෂි දෙමින් මෙසේද පැවසුවාය.

මෙම පැමිණිලිකාර එම්ල් රංජන් මහතා මාව දිනක් හමුවීමට පැමිණියා. ඇප ලබා ගත් පසු වැඩ තහනම ඉවත් කරන්න කියලා ඉල්ලීමක් කළා. මා එම කරුණ පිළිබඳව සොයා බැලීමට විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කළා. අමාත්‍යාංශ ලේකම්වරයාට මා කිසිදු බලපෑමක් ඒ සම්බන්ධයෙන් කර නැහැ.

කිසිම බන්ධනාගාර අධිකාරිවරයෙක් එම්ල් රංජන් මහතා පිළිබඳව මා සමඟ සාකච්ඡා කර නැහැ.

බන්ධනාගාර සිද්ධියට ගෝඨාභය මහතා පටලවන්න කියා මම කිසිදාක කියලා නැහැ. කිසිදු නඩු කටයුත්තක් පිළිබඳව මා ඇඟිලි ගැසීම් කර නැහැ. එම්ල් රංජන් මහතා සමඟ මම කිසිදු රාජ-

## රවීගේ පෙත්සමට...

අභියාචනාධිකරණ සභාපති ඒ. එම්. එම්. ඩී. නවාස් සහ සෝභිත රාජකරුණා යන මහත්වරුන්ගෙන් සමන්විත අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම ඊයේ (14) කැඳවිණි.

පෙත්සම සම්බන්ධයෙන් නීතිපතිවරයාට විරෝධතා ගොනු කිරීමට අභියාචනාධිකරණය ඊයේ (14) තෙක් දින ලබා දී තිබුණු අතර, එම විරෝධතා ගොනු කිරීමට නැවතත් ලබන 21 වැනිදා තෙක් කල් ලබාදෙන ලදී.

තමන්ට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණය මගින් නිකුත් කළ වරෙන්තුව ක්‍රියාත්මක කිරීම වළක්වන අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන්නැයි හිටපු මුදල් අමාත්‍ය රවී කරුණානායක, පර්පචුවල් ටෙෂරිස් සමාගමේ සමූහ අධ්‍යක්ෂ අර්ජුන් ඇලෝසියස්, එම සමාගමේ විධායක අධ්‍යක්ෂ කසුන් පලිසේන, එම සමාගමේ සභාපති ජෙෆ්රි ඇලෝසියස්, චිත්ත රංජන් හුළුගල්ල, මහ බැංකුවේ හිටපු නිලධාරියකු වන සංගරපිල්ලෙයි පද්මනාදන් සහ බදුගොඩ හේවා ඉන්දික සමන් කුමාර නමැත්තන් විසින් මෙම රිට් පෙත්සම ගොනු කර තිබුණි.

කොටුව මහේස්ත්‍රාත්වරයා රවී කරුණානායක මහතා ඇතුළු හත්දෙනා අත්අඩංගුවට ගැනීමට නිකුත් කළ වරෙන්තුව ක්‍රියාත්මකවීම අත්හිටුවමින් අභියාචනාධිකරණය පසුගිය ජූලි 7 වැනි දා අතුරු නියෝගයක් නිකුත් කළේය.

2016 වසරේදී සිදු වූ බැඳුම්කර වෙන්දේසි දෙකකදී රජයට රුපියල් බිලියන 52කට වැඩි පාඩුවක් සිදුකළේ යැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් මෙම සැකකරුවන් 07 දෙනා අත්අඩංගුවට ගන්නා ලෙසට ඉකුත් මාර්තු 06 වැනිදා නිකුත් කළ වරෙන්තුවට අදාළව මෙම රිට් පෙත්සම ගොනු කර තිබුණි.

## කුඩු ජාවාරමට සම්බන්ධ...

සැකකාර පොලිස් නිලධාරීන් 13දෙනා අතරින් 9 දෙනකුට එරෙහිව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ දීර්ඝ ලෙස විමර්ශන සිදු කරන බව මෙම සිද්ධිය ඊයේ (14) කැඳ වූ අවස්ථාවේ නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා අතිරේක මහේස්ත්‍රාත්වරයාට දැන්වීය.

එම සැකකරුවන් එලෙස මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකෙරෙන රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක් පරීක්ෂා කිරීමට රහස් පොලිසියට අවසර දෙන ලෙස ද අතිරේක මහේස්ත්‍රාත්වරයා ඊයේ (14) එම රාජ්‍ය බැංකුවේ කළමනාකරුට නියෝග කළේය.

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා අධිකරණයෙන් කළ ඉල්ලීමක් සලකා බලමින් අතිරේක මහේස්ත්‍රාත්වරයා එම නියෝගය නිකුත් කළේය.

සිද්ධියේ 14 වන සැකකරු ලෙස නම් කර සිටින දැනට ඩුබායි රටේ සිට මෙම මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදී සිටින උදාර සම්පත් නැමැත්තා අත්අඩංගුවට ගැනීමට කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (14) වරෙන්තු නිකුත් කළේය.

එම සැකකරුගේ මෙහෙය වීම යටතේ දුරකථන සන්නිවේදන ආයතනයකින් සිම් කාඩ්පත් 55ක් මිලදී ගෙන ඉතා සංවිධානාත්මක ලෙස සැකකරුවන් මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරතව ඇති බවට කරුණු අනාවරණය වන බවද නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා ඊයේ (14) අධිකරණයට දැන්වීය.

නඩුව ඊයේ (14) කැඳ වූ අවස්ථාවේ අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවා සිටින සැකකරුවන් තිදෙනා අධිකරණයට ඉදිරිපත් කර නොතිබුණු අතර, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය ආරක්ෂිත පියවරක් ලෙස එම සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් නොකරන බව බන්ධනාගාර නිලධාරීහු අධිකරණයට දන්වා සිටියහ.

රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබූ සැකකාර නිලධාරීහු 13 දෙනාට අමතරව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයට අනුයුක්ත තවත් නිලධාරීහු 12 දෙනෙක් රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා ගෙන ප්‍රශ්නකරමින් සිටින බව ද නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා අතිරේක මහේස්ත්‍රාත්වරයාට ඊයේ (14) දැන්වීය.

## මත් ජාවාරමින් - කප්පම්වලින්...

අතුරුගිරිය පොලීසියට ලැබුණු බුද්ධි තොරතුරක් මත පෙරේදා (13) කළ වැටලීමේදී සුපෝහබෝගී බස් රථ දෙකක් හා ලේලන්ඩ් බස් රථයක් මෙලෙස පොලිස් බාරයට ගෙන ඇති අතර, අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනා ලඩියා නැමැත්තා සමඟ කුමන ආකාරයේ සම්බඳතා පවත්වා ඇති ද යන්න වැඩිදුර විමර්ශන සිදු කෙරේ.

මෙම බස් රථ රුපියල් කෝටි එකහමාරකට අධික වටිනාකමකින් යුතු වන අතර එම බස් රථවලින් ලැබෙන ආදායම ලඩියාගේ බිරියගේ බැංකු ගිණුමකට බැරවන බවද විමර්ශනවල දී හෙළිව තිබේ.

අතුරුගිරිය ජයන්ති මාවතේ දී එක් සැකකරුවකු බස් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර, නවගමුව වඳුරම්මුල්ල ප්‍රදේශයේදී තවත් බස් රථයක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත. හෝමාගම ප්‍රදේශයේ දී ද සැකකරුවකු සමඟ තවත් බස් රථයක් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් ඊයේ (14) කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. අතුරුගිරිය පොලීසිය වැඩිදුර විමර්ශන කරයි.

## දිනක වැටලීම්වලින්...

මෙම විශේෂ වැටලීම බස්නාහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් පරිදි පෙරේදා (13) උදේ 6 සිට ඊයේ (14) උදේ 5 දක්වා සිදු කර ඇත. ඒ අනුව බස්නාහිර පළාත තුළ පමණක් හෙරොයින් ග්‍රෑම් 183 මිලි ග්‍රෑම් 239ක් සමඟ සැකකරුවන් 156ක්, ගංජා ග්‍රෑම් 468 මිලි ග්‍රෑම් 120ක් සමඟ සැකකරුවන් 110ක්, අයිස් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 3185ක් සමඟ සැකකරුවන් 12ක් අත්අඩංගුවට ගෙන ඇත.

තව ද නීති විරෝධී මත්පැන් බෝතල් 735ක් සමඟ සැකකරුවන්114ක්, ගෝඩා බැරල් 8ක් සමඟ සැකකරුවන් 7දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

තිරුබදු රහිත සිගරට් 87ක්, මාවා කිලෝ 5ක්, මත්පෙති 168ක්, මදන මෝදක ග්‍රෑම් 29ක්, ප්‍රසිද්ධ ස්ථානයක මත්පැන් පානය කිරීම සම්බන්ධ සැකකරුවන් 11ක්, සුදු සෙල්ලම් කිරීම සම්බන්ධව සැකකරුවන් 7ක් ඇතුළු සැකකරුවන් 23ක් අත්අඩංගුවට ගෙන තිබේ.

හෙරොයින් සම්බන්ධව කළ වැටලීම් වලදී මීගොඩ පොලිස් ස්ථානයෙන් හෙරොයින් ග්‍රෑම් 5ක් සමඟ සැකකරුවකු ද, හෝමාගම පොලිස් ස්ථානයෙන් හෙරොයින් ග්‍රෑම් 10 බැගින් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනකු ද අත්අඩංගුවට ගෙන තිබේ.

## කොළඹ පොත්...

එම ප්‍රදර්ශනය 27 වැනි දා දක්වා පැවැත්වේ.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙවර සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් පොත් ප්‍රදර්ශනය සංවිධාන කර ඇත.

## මහාධිකරණ විනිසුරන්...

දිසා විනිසුරු ඩබ්ලිව්.ඒ. පෙරේරා මහතා, දිසා විනිසුරු සී. මීගොඩ මහත්මිය, දිසා විනිසුරු ඒ.අයි.කේ. රණවීර මෙණෙවිය ප්‍රධාන මහේස්ත්‍රාත් කේ.එස්.එල්. ජයරත්න මෙණෙවිය, මහේස්ත්‍රාත් ආර්. එස්.ඒ.දිසානායක මහතා, දිසා විනිසුරු ඩබ්ලිව්.එම්.එම්. තල්ගොඩපිටිය මහතා, දිසා විනිසුරු ඩී.ඩබ්ලිව්. ඩබ්ලිව්.එම්.ආර්.සී.පී. කුමාරි දැල මෙණෙවිය, දිසා විනිසුරු එච්.එස්. පොන්නම්පෙරුම මහතා, අතිරේක දිසා විනිසුරු එස්.අයි. කාලිංගවන්ස මෙණෙවිය, මහේස්ත්‍රාත් ඩී.ඒ.ආර්. පතිරණ මහතා, රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ එන්.ටී. වික්‍රමසේකර මිය, රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ඒ.ජී.යූ.එස්.එන්.කේ. සෙනෙවිරත්න මිය මේ අනුව නව මහාධිකරණ විනිසුරුවරුන් ලෙස පත්වීම් ලැබූහ.

## දහනවය රැකගැනීමේ...

මීට අමතරව පක්ෂයේ සංවිධාන කටයුතු විශේෂ මුහුණුවරකින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව සමඟි ජන බලවේගයේ ජාතික සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා ඊයේ (14) පැවති මාධ්‍ය හමුවකදී පැවසීය.

## 19 රැකගන්න...

19 වැනි ව්‍යවස්ථාව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් නීතිය ඉදිරියට යෑමට, පාරට බැස අරගල කිරීමට හෝ ජනතාවගේ පැත්තෙන් සිටගෙන කළ හැකි ඕනෑම දෙයක් කරන බව වටගල මහතා කියා සිටියේය.

20 වැනි ව්‍යවස්ථා සංශෝධනය 2/3 මගින් අනුමත කර ගැනීමට නොහැකි බවත් එය ජනතාවගේ පරමාධිපත්‍යයට සම්බන්ධ බැවින් නිසැකවම ජනමත විචාරණයකට යා යුතු බවත් කීවේය.

## වෙලේ සුදාගේ මස්සිනා...

මෙසේ රිමාන්ඩ් බන්ධනාගර ගත කරනු ලැබුවේ අඟුලුතහ ජාගොඩගේ වසන්ත පුෂ්ප කුමාර නමැති සැකකරුවෙකි.

හෙරොයින් මිලි ග්‍රෑම් 1330ක් මුදල් රුපියල් 37500ක් ජංගම දුරකතන හතරක් සහ බැංකු ගිණුම් පොතක් ද සමඟ ඉකුත් (09)රාත්‍රී ඉමදුව පොලිසිය විසින් සැකකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු රඳවුම් නියෝග මත පොලිසිය විසින් රඳවා තබාගෙන විමර්ශන කරනු ලැබීය.

පොලිසිය ඊයේ වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරමින් අධිකරණයට කියා සිටියේ සැකකරු තම මස්සිනා නිදහස් වේවායි ප්‍රාර්ථනා

කරමින් ගවයින් විස්සක් නිදහස් කර ඇති අතර කරාපිටිය රෝහලේ පිළිකා වාට්ටුවේ රෝගින්ටද මුදල් පරිත්‍යාගද කර ඇති බවය.

## 13 වැනි කොරෝනා...

බහරේන් සිට මෙරටට පැමිණි මෙම පුද්ගලයාට හෘදයාබාධයක් වැළඳීම හේතුවෙන් හලාවත මූලික රෝහලට ඇතුළත් කළ පසුව පෙරේදා (13) මරණයට පත්ව ඇත. වයස අවුරුදු 60ක් වූ එම පුද්ගලයා කොවිඩ් ආසාදිත රෝගියකු ආදාහනය කරන ආකාරයේ නීති-රීතිවලට යටත්ව ආදාහනය කිරීමට නියමිත ය. හලාවත අඹකඳවිල සංචාරක හෝටලයේ පවත්වාගෙන යන නිරෝධායන මධ්‍යස්ථානයේ රැඳී සිටි අතරතුර මෙම සිද්ධියට මුහුණ දීමට ඔහුට සිදුව තිබේ.

නිරෝධායනයට ලක් වෙමින් සිටින අතරතුර මෙම පුද්ගලයා පසුගිය 09 වැනිදා ඇති වූ හදිසි හෘදයාබාධය හේතුවෙන් හලාවත මූලික රෝහලට ඇතුළත් කර ඇත.

## දියර කිරි...

ඉදිරි දශකය තුළ දියර කිරි නිෂ්පාදනය නැංවීමට පියවර ගන්නා බව "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් ජනාධිපතිවරයා ප්‍රතිඥා දී තිබේ.

රටේ විවිධ ප්‍රදේශවලට ගැලපෙන කිරි ගව ප්‍රභේද හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ පුළුල් කිරීමට රජය අපේක්ෂා කරයි. කිරි නිෂ්පාදනය නැංවීම සඳහා ඉහළ ගුණාත්මක අගයෙන් යුත් තෘණ වර්ග වගා කිරීම සහ ගව ආහාර නිෂ්පාදනය පිළිබඳ දීර්ඝව සාකච්ඡාවට ලක් කෙරිණ.

සමස්ත දියර කිරි නිෂ්පාදනයෙන් සියයට 85ක් කුඩා පරිමාණ කිරි ගොවීන් විසින් සපයනු ලැබේ. ඔවුන් ශක්තිමත් කර ප්‍රතිශතය වැඩි කිරීමට පියවර ගත යුතු යැයි ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතා පැවැසීය.

කිරි ලීටරයක නිෂ්පාදන පිරිවැය ඉහළ යාමෙන් ගොවීහු අධෛර්යවත් වී සිටිති. තෘණ ඇතුළු ගව ආහාර සහන ක්‍රමයකට කිරි ගොවීන්ට සැපයීමේ අවශ්‍යතාව බැසිල් රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය. රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයට අවශ්‍ය සත්ව ආහාර නිෂ්පාදනය සඳහා ගොවීන් දිරිමත් කිරීම ආයතනික මට්ටමින් කළ යුතු බව පෙන්වා දෙනු ලැබිණ.

සත්ව ගොවිපොළ ආශ්‍රිත පරිසර ගැටලු විසඳීමට මධ්‍යම පරිසර අධිකාරිය මැදිහත්වීමේ වැදගත්කම පෙන්වා දුන් ජනාධිපතිවරයා එය ගොවියාට බරක් නොකළ යුතු බව අවධාරණය කළේය.

පාරම්පරිකව පවත්වාගෙන යන සත්ව ගොවිපොළ ජනතා පැමිණිලි පදනම් කර ගනිමින් විමර්ශනයකින් තොරව වසා දැමීම නොකළ යුතු බව ද බැසිල් රාජපක්ෂ මහතා පැවැසීය.

කිරි නිෂ්පාදනය වර්ධනය අරමුණු කොට ගෙන වතු සමාගම් 15ක් දායක කර ගනිමින් කිරි ගවයන් 15,000ක් ඇති කිරීමට පියවර ගෙන ඇතැයි කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අළුත්ගමගේ මහතා පැවැසීය.

කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම හා මහා පරිමාණ නිෂ්පාදකයන් අපනයන වෙළෙඳපොළට යොමු කිරීම පිළිබඳ ද සාකච්ඡා කෙරිණ. බිත්තර, කුකුළු මස් සහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් 2020 වසරේ දී අමෙරිකානු ඩොලර් මිලියන 16ක විදේශ විනිමයක් ඉපැයීමට අපේක්ෂා කරන බව පෞද්ගලික අංශයේ ආයෝජකයෝ කීහ.

රාජ්‍ය අමාත්‍ය ඩී. බී. හේරත්, ජනාධිපති ලේකම් පී. බී. ජයසු-

# ආණ්ඩුවේ ඉදිරි ගමනට සහාය වන්න

## ජනපති වියත්මඟ සංවිධානයේ වියතුන්ගෙන් ඉල්ලයි

ආණ්ඩුවේ ඉදිරි ගමනට සහාය වන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා "වියත්මඟ" සංවිධානයේ වියතුන්ගෙන් ඉල්ලා සිටියි. ජනාධිපති ධූරයට පත් වීමෙන් පසු "වියත්මඟ" සභාපතිවරයා ලෙස පෙරේදා (13) පස්වරුවේ ඇතුල්කෝට්ටේ වියත්මඟ කාර්යාලයේදී පළමු වරට සාමාජිකයන් හමු වූ අවස්ථාවේ දී ජනාධිපතිවරයා මෙසේ ඉල්ලා සිටියේය.

"වියත්මඟ" විවිධ ක්ෂේත්‍ර ඇතුළත් පුළුල් පරාසයක විහිදුණු, උගතුන්ගෙන් බුද්ධිමතුන්ගෙන් සහ ව්‍යවසායකයන්ගෙන් සැදුම්ලත් සංවිධානයකි. 2016 වසරේ අප්‍රේල් මස ඇරඹි "වියත්මඟ" ක්‍රියාකාරීත්වය ජනතාවගේ දේශපාලන සමාජ චින්තනයේ ගැඹුරු වෙනසක් ඇති කිරීමට සමත් විය.

දේශපාලන අධිකාරිය මැදිහත් විය යුතු තැන් හඳුනාගෙන ඊට සම්බන්ධ නොවී රටේ ඉදිරි ගමන වෙනුවෙන් සැලසුම් හා ප්‍රතිපත්ති සැකසීමේ වගකීම "වියත්මඟ" ඉදිරියේ ඇතැයි ජනාධිපතිවරයා පෙන්වා දෙයි.

ග්‍රාමීය, නාගරික ඇතුළු සියලු ජන කොටස් ආර්ථික සහ සමාජීය වශයෙන් නඟා සිටුවීමට ප්‍රමුඛත්වය දෙමින් රාජ්‍ය අමාත්‍යාංශ ස්ථාපිත කර තිබේ. එකී අරමුණු ජයගැනීමට දායක විය හැකි ආකාරය ජනාධිපතිවරයා "වියත්මඟ" විධායක සභාවට පෙන්වා දුන්නේය.

උප කමිටු සකස් කර යෝජනා සහ සැලසුම් ඉදිරිපත් කර රාජ්‍ය අමාත්‍යාංශවල ඉදිරි ක්‍රියාකාරීත්වයට මඟ පෙන්වීමටත්, අමාත්‍යවරයා හමුවේ ඇති අභියෝගාත්මක අවස්ථාවලදී උපදෙස් දෙමින් සහාය වීමටත් හැකි බව ජනාධිපති රාජපක්ෂ මහතා පැවසීය. සියලු සංවර්ධන ක්‍රියාදාම පරිසරය ආරක්ෂා වන අයුරින් කරගෙන යෑමට වග බලා ගත යුතු යැයිද ජනාධිපතිවරයා පැවසීය. වියත්මඟ විධායක සභාවේදී ගත් තීරණ සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයන්ට පැහැදිලි කළ ජනාධිපතිවරයා ප්‍රාදේශීය මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීමේ හැකියාවද අවධාරණය කළේය. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කෙරෙන පරිදි නව සාමාජිකයන් බඳවා ගැනීමේ අවශ්‍යතාව කෙරෙහිද අවධානය යොමු කෙරිණි.

රාජ්‍ය අමාත්‍යවරුන් වන අජිත් නිවාඩ් කබ්රාල්, ආචාර්ය නාලක ගොඩහේවා, සරත් වීරසේකර, සීතා අරඹේපොළ මහත්ම මහත්මීහු සහ පාර්ලිමේන්තු මන්ත්‍රී උපුල් ගල්ප්පත්ති මහතා ඇතුළු පිරිසක් සාකච්ඡාවට එක්ව සිටියහ.

# 20 රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීමේ ප්‍රථම පියවරයි

## අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.ඇල්.පීරිස්

**චන්දිමා කරුණාරත්න**

20 වන ව්‍යවස්ථා සංශෝධනය රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීමේ ප්‍රථම පියවරයැයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපති සහ අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.ඇල්. පීරිස් මහතා පැවැසීය.

වත්මන් යුගයට ගැළපෙන පරිදි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළ යුතු බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

අංග සම්පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සංකීර්ණ කාර්යයක් බවත් එහිදී සියලු දෙනාගේම මත විමසන්න අවශ්‍ය බවත් පෙන්වා දෙන ඒ මහතා ඒ සඳහා යම් කාලයක් ගත වන බවත් ක්ෂණිකව විසඳිය යුතු ප්‍රශ්න පසෙකට දමා ඒ සම්පූර්ණ කාලය අපට බලා සිටීමට නොහැකි නිසා 20 වන සංශෝධනය අවශ්‍ය කරන බවත් පැහැදිලි කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ බත්තරමුල්ල නෙළුම් මාවත ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පක්ෂ මූලස්ථානයේ ඊයේ (14) පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් ඒ මහතා මෙසේ ද කීය.

20 වන සංශෝධනය ගැසට් කරන්න යෙදුණේ මේ මස 02දායි. පසුව එහි නොයෙක් වගන්ති ගැන විවිධ මත පළවුණා. පක්ෂ විපක්ෂව යම් යම් අදහස් විවේචන පළ වුණා. එය හොඳ දෙයක්. මහජන සංවාදය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක වැදගත් ලක්ෂණයක්. ඒ වගේම අපේ රජය සංවේදී රජයක්. ජනතා අදහස්වලට අප ඉඩ දෙනවා.විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම සම්බන්ධව අප ජනතා අදහස්වලට ඉඩ දෙනවා. ඒ නිසා යෝජිත 20 වන සංශෝධනය සම්බන්ධව ඉදිරිපත් වී තිබෙන අදහස් ගැඹුරින් අධ්‍යයනය කර කැබිනට් මණ්ඩලයට වාර්තාවක් ලබාදීම සඳහා අගමැතිවරයා විසින් කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ සභාපති ලෙස මම කටයුතු කරනවා. නීතීඥ අලි සබ්‍රි, නිමල් සිරිපාල ද සිල්වා, උදය ගම්මන්පිල, විමල් වීරවංශ, සුසිල් ප්‍රේමජයන්ත, එස්. වියාලේන්ද්‍රන්, ඩිලාන් පෙරේරා සහ ප්‍රේමනාත් සී දොළවත්ත මහත්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කළා.

මේ කමිටුව රැස්වී 20 වන සංශෝධනය සමස්තයක් ලෙස ගෙන විශ්ලේෂණය කරනවා. පසුව අපේ නිගමන හෙට අඟහරුවාදා අගමැට ලබාදෙනවා. බදාදා සවස කැබිනට් මණ්ඩලය රැස්වෙනවා. එහිදී කැබිනට් මණ්ඩලයට ඒ කමිටුවේ නිර්දේශ හා නිගමන ඉදිරිපත් කරනවා. පසුව මේ සම්බන්ධය අනුගමනය කළයුතු පියවර ගැන අවධානය යොමු කරනවා.

20 වන සංශෝධනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව අවසානය නොවේ. ඉතා ඉක්මනින් විසඳිය යුතු ප්‍රශ්න තිබෙනවා කියා අප විශ්වාස

කරනවා. ඒවා දීර්ඝ කාලයක් කල් දමන්න පුළුවන්කමක් නැහැ. ජනාධිපතිවරයාට ආරක්ෂක ඇමැති ධූරය දරන්න පුළුවන්ද? ඒ ගැන අවිනිශ්චිතකමක් තිබෙන්න බැහැ. ඒ පිළිබඳ ඉතාම පැහැදිලි නීතිමය තත්ත්වයක් තිබෙන්න අවශ්‍යයි. එවැනි කරුණු ඉතාම ඉක්මනින් නිරාකරණය කළ යුතුයි. ඒ ගැන අප ජනතාව විශාල වශයෙන් දැනුවත් කළා. මැතිවරණ වේදිකාවලදී 19වැනි සංශෝධනය ඉවත් කරන බව අප නිරන්තරයෙන් ප්‍රකාශ කළා.

ඒ සඳහා තුනෙන් දෙකක බහුතර බලය අවශ්‍ය බවත් අප ප්‍රකාශ කළා. 20 වන සංශෝධනය ගෙන එන්න නම් එය නීතිමය අවශ්‍යතාවක් නිසා අප ඒ බව දැනුම් දුන්නා. ඒ සඳහා ජනතාව ඉතාම හොඳ ප්‍රතිචාරයක් ලබාදී තිබෙනවා.ඒ සඳහා අප කටයුතු කරමින් සිටිනවා. වත්මන් ව්‍යවස්ථාව ජේ.ආර්. ජයවර්ධන යුගයේදී වසර ගණනාවකට පෙර සකස් කළ ව්‍යවස්ථාවක්. වත්මන් යුගයට ගැළපෙන පරිදි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළ යුතුයි.

මැතිවරණ ක්‍රමය එහි ප්‍රධාන කරුණක්. වර්තමාන මැතිවරණ ක්‍රමය නුසුදුසු බව අප පිළිගන්නවා. විශේෂයෙන්ම මනාප ඡන්ද ක්‍රමය නිසා විශාල හානියක් වෙනවා, එය අපේ රටට ගැළපෙන්නේ නැහැ, එය වෙනස් කළ යුතුයි කියන මතය රටේ මුල් බැසගෙන තිබෙනවා. ඒ නිසා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමේදී මිශ්‍ර ක්‍රමයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වෙනවා. එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කොටසක් ඡන්ද කොට්ඨාස නියෝජනය කරනවා. අනික් කොටස සමානුපාතික ක්‍රමයට පාර්ලිමේන්තුවට ප්‍රවිෂ්ට වෙනවා.

අද පවතින මැතිවරණ ක්‍රමයට අනුව මන්ත්‍රීවරයා හා ඡන්දදායකයා අතර තිබෙන සමීප සම්බන්ධතාව නැහැ. එය අද මැතිවරණ ක්‍රමයේ තිබෙන ප්‍රධාන දුර්වලතාවක් වෙනවා. මන්ත්‍රීවරුන් නියෝජනය කරන්නේ සම්පූර්ණ දිස්ත්‍රික්කයයි. ඡන්ද දායකයාට යම් ප්‍රශ්නයක් පවතීනම් එය විසඳා ගැනීමට ඒ ඡන්ද කොට්ඨාසය නියෝජනය කරමින් විශේෂ වගකීමක් දරන මන්ත්‍රීවරයෙක් හඳුනා ගැනීමේ හැකියාව වත්මන් මැතිවරණ ක්‍රමයේ නැහැ. ඒ වගේම අතුරු මැතිවරණ නැහැ. අතුරු මැතිවරණ තිබීමේ ප්‍රායෝගික වැදගත්කම වන්නේ ආණ්ඩුවේ ජනප්‍රියබාවය උරගා බැලීමට අවස්ථාව ලැබීමයි. නමුත් එයට අද ඉඩකඩ නැහැ.

මැතිවරණවලදී වියදම් කරන මුදල් හුඟක් රටවලදී සීමා වී තිබෙනවා. මැතිවරණයකදී අසීමිත ධන ස්කන්ධයක් භාවිතා කරන්න පුළුවන්කමක් නැහැ. මැතිවරණයකදී සෑම අපේක්ෂකයකුටම සමාන අවස්ථා තිබෙනවා. විශාල ධනයක් යොදා ගන්න පුළුවන් අපේක්ෂකයකුට විශේෂ වාසියක් ලැබීම ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයකට සුදුසු දෙයක් නොවේ. එ නිසා හුඟක් රටවල මැතිවරණයට වියදම් කරන මුදල් සම්බන්ධයෙන් නීති පනවා තිබෙනවා. ඒවාගම විනිවිදභාවය පිළිබඳ සොයා බලනවා. ඒ ගැන විස්තර වාර්තා මැතිවරණ කොමිෂන් සභාවට ලබාදිය යුතුව තිබෙනවා.

තොරතුරු ලබාගැනීමේ පනත යටතේ විස්තර ලබාගැනීම ජනතාවට හැකි වන ආකාරයට අප නීති සකස් කළ යුතුයි.

සමස්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීමේදී මේ සියල්ලම සම්බන්ධයෙන් අවධානය යොමුකරනවා.

අංග සම්පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම බොහොම සංකීර්ණ කර්තව්‍යයක්. සියලු දෙනාගේම මත විමසන්න අවශ්‍යයි, ගැඹුරින් සිතා බලන්න අවශ්‍යයි. ඒ සඳහා යම් කාලයක් ගත වෙනවා. ක්ෂණිකව විසඳිය යුතු ප්‍රශ්න පසෙකට දමා ඒ සම්පූර්ණ කාලය අපට බලා සිටින්න බැහැ. 20 වන සංශෝධනය අවශ්‍ය වන්නේ ඒ නිසයි. එහිදී ඉක්මනින් විසඳිය යුතු දේවල් සම්බන්ධව අවධානය යොමු කර දෙවැනි අදියර විදිහට රජයක් ලෙස සමස්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඒ සඳහා තුනෙන් දෙකක බහුතරයක් ලබාගැනීමට බලාපොරොත්තු වෙනවා.

**මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන් මහාචාර්ය ජී.ඇල්. පීරිස් මහතා -**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් කරන්නේ ආණ්ඩුවයි. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සහිතව පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් කරනවා.

ඒ සම්බන්ධයෙන් මුළු ආණ්ඩුවම වගකීම බාරගන්නවා. එය රජයේ නිර්මාණයක්. තනි පුද්ගලයකුගේ නිර්මාණයක් නොවේ.

20 වන සංශෝධනයට අදාළ කෙටුම්පත මේ වනවිට ගැසට් කර තිබෙනවා. නමුත් තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැහැ. අපේ නීතියට අනුව පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න පුළුවන් වන්නේ ගැසට් කිරීමෙන් පසුව සති 02කින් පසුවයි. ඉන් සතියක කාලයක් ඇතුළතදී ජනතාවට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන්. සති 03ක කාලයක් ඇතුළත ඒ නඩු විභාග කර කතානායකවරයාට හා ජනාධිපතිවරයාට දැනුම් දෙන්න ශ්‍රේෂ්ඨාධිකරණයට පුළුවන්.

විවාදවලට සහභාගි වීමට, ප්‍රශ්නවලට පිළිතුරු දීමට මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට පැමිණෙන්න අවශ්‍යයි. ඒ නිසා මහජන දිනය බදාදා තිබියදී මන්ත්‍රීවරුන්ට ඇමැතිවරුන්ට එ සඳහා පාර්ලිමේන්තුවට සහභාගි වෙන්න බැහැ. එවැනි ප්‍රායෝගික දුෂ්කරතාවක් තිබුණා. ඒ වගේම කැබිනට් මණ්ඩලය රැස්වීම් බදාදා සවස 04ට රැස් වෙනවා. එයට විසඳුම් ලෙස මහජන දිනය වෙනස් කිරීම සිදු කළා. එය අත්හදා බැලීමේදී ප්‍රායෝගික ප්‍රශ්න තිබේ නම් ඒ සඳහා රජය නම්‍යශීලීව කටයුතු කරනවා. ඒවගේම පාර්ලිමේන්තුව රැස්වෙන වෙලාවේද වෙනස්කම් සිදු කළා.

පළාත් සභාවලට සම්බන්ධ කිසිදු ප්‍රශ්නයක් යෝජිත 20 වන සංශෝධනයට ඇතුළත් කර නැහැ. ඒවා වැදගත් කාරණා. නමුත් ඒවා සලකා බලා තීරණ ගැනීම සුදුසු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන අවස්ථාවේදීයි. 20 වන සංශෝධනය රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීමේ ප්‍රථම පියවරයි. පළාත් සභා නැතිව මේ රට අවුරුදු 02ක් පාලනය කළා. එමගින් වෙනසක් තිබුණාද කියා බොහොමයක් දෙනා අහනවා. එයට වගකිව යුත්තේ දම්ළ සන්ධානයයි. පළාත් සභා දින නියමයක් නොමැතිව කල් දමන්න හේතුවුණේ ඒ අයයි. මොකද පළාත් සභා මැතිවරණය පැවැත්වූවා නම් අන්ත පරාජයකට පත් වන බව පැවැති රජය දැන සිටියා. ඒ නිසා මැතිවරණය කල් දමන්න කටයුතු කළා. එයට තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍ය වුණා. ඒ සඳහා යහපාලන රජයට තුනෙන් දෙකක් ලබාගැනීමට උදව් කළේ දම්ළ සන්ධානයයි. ඒ සහාය දුන්නේ මැතිවරණය නොපැවැත්වීමටයි. අවුරුදු 02ක් රට ගෙනයන්න පුළුවන් නම් එහි කවුරුත් වෙනසක් දැක්කේ නැතිනම් ඒවා පැවැතීමේ ප්‍රායෝගික අවශ්‍යතාව කුමක්ද කියා පැන නගිනවා. රජය ඒ සම්බන්ධයෙන් තීරණයකට ඇවිත් නැහැ. නමුත් ජනතාවගෙන් එවැනි ප්‍රශ්නයක් පැන නැඟී තිබෙනවා. ඒ ප්‍රශ්නය පැමිණියේ යහපාලන යුගයේ දම්ළ සන්ධානය සිදු කළ කටයුතු නිසයි.

## මනාප ඡන්ද ක්‍රමය කඩිනමින් වෙනස් කර:

# ආසනයේ ජනතාවට වගකියන මන්ත්‍රීවරයකු පත් කර ගත හැකි මැතිවරණ ක්‍රමයකට අවධානය

## විදේශ සබඳතා ඇමැති දිනේෂ් ගුණවර්ධන

**මහින්ද අලුත්ගෙදර**

මනාප ඡන්ද ක්‍රමය කඩිනමින් වෙනස් කර ඒ ඒ ආසනයේ ජනතාවට වගකියන මන්ත්‍රීවරයකු පත් කර ගතහැකි ආකාරයේ මැතිවරණ ක්‍රමයක් මේ රටේ ක්‍රියාත්මක කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ඇතුළු වත්මන් රජයේ අවධානය යොමුව ඇති බව විදේශ සබඳතා ඇමැති හා පාර්ලිමේන්තුවේ සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා සඳහන් කරයි.

මනාප ක්‍රමයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වන ඇතැම් මන්ත්‍රීවරුන් තමන්ට ඡන්දය දුන් ජනතාව හා ඔවුන්ගේ ප්‍රදේශයේ හෝ නිවැරැදිව හඳුනා නොගන්නා බවද ඒ මහතා පෙන්වා දෙයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ මහරගම, ගොඩිගමුව ජයමාවතේ පිහිටි අභිනවයෙන් ඉදි කළ ප්‍රජාශාලා ගොඩනැඟිල්ලක් විවෘත කිරීමේ උත්සව සභාවකදීය. ඇමැතිවරයාගේ විමධ්‍යගත මුදලින් රුපියල් ලක්ෂ 15ක් වැය කර ඉදි කළ මේ ප්‍රජාශාලාව ජය මාවතේ එකමුතු සුබසාධක සමිතියට පවරා දීම ද මෙහිදී සිදු කෙරිණි.

එහිදී වැඩිදුරටත් දිනේෂ් ගුණවර්ධන මහතා මෙසේද කීය.

වත්මන් ඡන්ද ක්‍රමය අනුව තමන්ට ඡන්දය දුන් ජනතාවගේ ගම්බිම් ගැන මන්ත්‍රීවරු දන්නේ නෑ. මේ නිසා ජනතාවට අසාධාරණයක් වෙනවා. මොකද තමන් ඡන්දය දුන් මන්ත්‍රීවරයාගෙන් ගමට හෝ තමන්ට වැඩක් කරගන්න බැරිව යනවා. අප මේ ඡන්ද ක්‍රමය වෙනස් කරන්න දීර්ඝ කාලයක පටන් සටන් කරනවා. වත්මන් ජනාධිපතිවරයා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න එකඟව සිටිනවා. ජනතාවට සෘජුව වගකියන මන්ත්‍රීවරයකු පත් කරගත හැකි ඡන්ද ක්‍රමයක් අපේ රටේ ස්ථාපිත කරන්න ඕනෑ.

ඒ වගේම ගමේ වැඩට රජයෙන් වෙන් කරන මුදල් ප්‍රයෝජනයට ගෙන ගමේ වැඩේ ගමට ඕනෑ විදියට කර ගන්න ගමේ සමිතිවලට කොන්ත්‍රාත්තුව බාර දෙන්න ඕනෑ. එහෙම නොවුණාම වැඩේට යොදා ගන්න තියෙන මුදල් අතරමඟ අනවශ්‍ය ලෙස වැය කරනවා. එයින් රජයට විශාල පාඩුවක් සිදුද වෙනවා. ගමේ වැඩේ ගමේ සමිතියට බාර දුන්නාම ඒ ගමේ මානව සම්පත්වල ප්‍රයෝජනයත් අරගෙන ගමේ හැමදෙනා එකතුව ශ්‍රමදානයෙන් වැඩට හවුල් වී ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකමටත් වඩා වටිනා වැඩක් නිමකර ගමට දායාද කරනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම නිසි පරිදි ක්‍රියාවට නංවා උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට නම් ගමේ ව්‍යාපෘති ගමේ සමිතියට කොන්ත්‍රාත් දීම කළයුතුම දෙයක් වෙනවාවැයි පැවසීය.

ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල නියෝජිතයන් ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

# ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දුන්

# තොරතුරු ගැන ආරක්ෂක මණ්ඩලය කිසිදු පියවරක් ගත්තේ නෑ

## ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර

**සුභාෂණී සේනානායක**

රාජ්‍ය බුද්ධි ප්‍රධානී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා දුන් තොරතුරු සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය කිසිදු පියවරක් නොගත් බව නීතිය, සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම්, වත්මන් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර මහතා පාස්කු ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හමුවේ පසුගියදා (12) අනාවරණය කළේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'මුස්ලිම් ඇමැතිවරුන්ගේ බලපෑම් මත මෙසේ සිදු කළ බව මට ඒත්තු ගියා. එය මා කෙළින්ම පැවැසුවේ නෑ. යහපාලන රජයේ මුස්ලිම් ඇමැතිවරුන් ගෙන්වා අරලියගහ මන්දිරයේදී එවකට අගමැති රනිල් වික්‍රමසිංහ, සාගල රත්නායක මහත්වරුන්, මන්ත්‍රීවරුන් පිරිසක් අන්තවාදය ගැන සාකච්ඡාවක් කළ බව මට දැනගන්නට ලැබුණා.

අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසු කලකිරීමක් මෙන්ම දුකක් ඇති වුණා. මා හිටියා නම් මෙය වෙනස් කර ගන්න තිබුණා කියා හිතුණා. උපදෙස් ලැබී තිබුණේ මේ සිද්ධිය සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරීව ඉන්න කියලා. පොලිස් විශේෂ කාර්ය බළකායවත් තීරණයක් ගත්තා නම් මේ දේ සිදු වන්නේ නෑ.'

ජනාධිපති කොමිසමේ සභාපති විනිසුරුවරයා ප්‍රමුඛ සාමාජික විනිසුරු මඩුල්ල හමුවේ සාක්ෂි කැඳවනු ලැබූ අතර රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා ජගත් පී. විජේවීර මහතාගෙන් ප්‍රශ්න කිරීම සිදු කළේය.

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ඔබ අමාත්‍යාංශ ලේකම් ධුරය දැරුවේ කුමන කාලයේද?

**සාක්ෂිකරු -**

'2015.01.11 දින සිට 2017.12.11 දින දක්වා'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ඊට පෙර ඔබ රාජ්‍ය සේවයේ කටයුතු කළාද?

**සාක්ෂිකරු -**

'එහෙමයි ස්වාමිනි. පරිපාලනය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ඇතුළු ස්ථාන 15ක රාජකාරි කර තිබෙනවා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ඔබ නීතිය හා සාමය සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කළ කාර්යය කුමක්ද?

**සාක්ෂිකරු -**

'ලේකම්වරයා ලෙස අනෙකුත් දෙපාර්තමේන්තු මෙහෙය වීම සිදු කළා. ශ්‍රී ලංකා පොලීසිය, දකුණු පළාත් සංවර්ධන ව්‍යාපෘති සහ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය ආදියේ කටයුතු කළා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ශ්‍රී ලංකා පොලීසිය සිදු කළ නිල කාර්යය කුමක්ද?

**සාක්ෂිකරු -**

'පරිපාලන කටයුතු, ප්‍රවර්ධන කටයුතු, මාරු වීම් සිදුකිරීමේදී පොලිස් කොමිසම හරහා සිදු කිරීම වැනි දේවල්.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

රටේ ආරක්ෂාවට පැවරුණේ මොන වගේ විෂයයන්ද?

**සාක්ෂිකරු -**

'පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් විමධ්‍යගත කර තිබූ බලයන් යටතේ රටේ යම් සිද්ධියකදී මෙහෙය වීම ඇමැතිවරයා හරහා සිදු කළා. මගේ කාර්යභාරය වුණේ රටේ ආරක්ෂාව සම්බන්ධ සිද්ධියකදී ඉතා ඉක්මනින් ඇමැතිවරයා දැනුවත් කිරීම, පොලිස්පති අදාළ අංශ විමසීම, ඔවුන් මෙහෙය වීමයි.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

රටේ ආරක්ෂාවට අදාළ විමර්ශන කරන්න කියා පොලිස්පතිට පවරන්න බලය තිබුණද?

**සාක්ෂිකරු -**

'සාමාන්‍යයෙන් එහෙම කරන්නේ ඇමැතිවරයා. යම් යම් අවස්ථාවලදී මටත් එසේ කරන්න බලය තිබෙනවා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

2015 සිට 2017 දක්වා සිටි ආරක්ෂක ඇමැතිවරුන් කවුද?

**සාක්ෂිකරු -**

'ආරක්ෂක ඇමැතිවරයා ලෙස තිලක් මාරපන මහතා කෙටි කලක් සිටියා. එයින් අනතුරුව සාගල රත්නායක මහතා ආරක්ෂක රාජ්‍ය ඇමැතිවරයා ලෙස පත් වුණා. ඒ මහතා සහ මා අතර සමීප අවබෝධයක් තිබුණා. මුලින් පොලිස්පති ඉලංගකෝන් මහතා ද පසුව පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා ද කටයුතු කළා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

පොලිස්පතිවරුන් සමග තිබූ සම්බන්ධතාව කොහොමද?

**සාක්ෂිකරු-**

'පොලිස්පති ඉලංගකෝන් මහතා සමග පහසුවෙන් සමීපව කටයුතු කරන්න හැකි වුණා. පූජිත් ජයසුන්දර මහතා සමග පොඩි පොඩි හැලහැප්පිලි තිබුණත් කටයුතු කළා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

මේ හැලහැප්පිලි රටේ ආරක්ෂාවට බලපෑමක් වුණාද?

**සාක්ෂිකරු -**

'නෑ. ඔවුන්ගේ කතා සහ පරිපාලනමය ගැටලු එන විට සාකච්ඡා කිරීමේදී ගැටලු ඇති වුණා. නමුත් අප එකට වැඩ කළා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

රාජ්‍ය බුද්ධි සේවාවේ සම්බන්ධය කුමන ආකාරයෙන් ද තිබුණේ?

**සාක්ෂිකරු -**

'සෘජු සබඳතා පැවතුණේ නෑ. බොහෝ අවස්ථාවල රාජ්‍ය බුද්ධි ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතා දුරකථනයෙන් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍ය හරහා යම් දැනුම් දීම් කර තිබෙනවා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

බුද්ධි තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාවෙන් ලිඛිතව ලැබෙනවාද?

**සාක්ෂිකරු -**

'නිරන්තරයෙන් සැපයුණේ නෑ. අවස්ථා දෙකකදී විමසීමක් කර තිබූ බව මට දැනගන්න ලැබුණා. බුද්ධි තොරතුරු මට ලැබෙන්න පෙර ඇමැතිවරයාට සහ පොලිස්පතිවරයාට ලැබෙනවා. මට ලැබෙන ඒවා ගොනු ගත කර දැනුම් දෙන ලෙස පොලිස්පතිට දැනුම් දෙනවා. බැරෑරුම් දෙයක් සම්බන්ධ වාර්තාවක් ලැබූ විට ක්ෂණිකව ඇමැතිවරයාට දැනුම් දෙනවා. පොලිස්පතිවරයා විමසීමක් කරනවා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් රැස්වීම් තිබුණද?

**සාක්ෂිකරු -**

'සඳුදා දිනවල ඇමැතිවරයා අදාළ පාර්ශ්වය සමග සාකච්ඡා කළා. මේ සාකච්ඡා සඳහා පොලිස්පතිවරයා නැති විට නියෝජ්‍ය පොලිස්පතිවරයා ඇතුළු නිලධරයන් කැඳවනවා. බුද්ධි අංශයේ, ත්‍රස්ත අංශයේ නිලධාරීන් සහභාගී වන බව දැන ගත්තා. පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වන කරුණුවලට මා සහභාගි වෙනවා.'

**පාස්කු ප්‍රහාරය ගැන සොයන ජනපති කොමිසම**

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

බුද්ධි රැස්වීම් තිබුණේ කොහේද?

**සාක්ෂිකරු -**

'අරලියගහ මන්දිරයේ. ඇමැති සාගල රත්නායක මහතාගේ කොටුවේ පිහිටි වයිට් වේ කාර්යාල ගොඩනැඟිල්ලේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍ය අවස්ථාවල තිබුණා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ජාතික ආරක්ෂාව සහ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුමක් තිබුණද?

**සාක්ෂිකරු -**

'කුඩු උවදුර, ISIS උවදුර ගැන විටින් විට සාකච්ඡා කර තිබුණා. කෙළින්ම මට දැනගන්න ලැබෙන්නේ නෑ. මගේ මැදිහත් වීම අවශ්‍ය අවස්ථාවක ඇමැතිවරයා සහ පොලිස්පතිවරයා මාව දැනුවත් කරනවා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ආරක්ෂක මණ්ඩල රැස්වීම සඳහා ඔබ සහභාගි වී තිබෙනවාද?

**සාක්ෂිකරු -**

'පත්වීම ලැබුණු මුල් මාස පහේ ආරාධනා ලැබුණේ නෑ. රාජ්‍ය ආරක්ෂක ලේකම් හරහා ජනාධිපතිවරයාට දැනුම් දී නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම් ලෙස සහභාගි වෙන්න මට අවසරය ලැබුණා. 2016, 2017 සඳහා මාත් සහභාගි වුණා. මේ රැස්වීම්වලට ජනාධිපතිවරයා, අගමැතිවරයා, ආරක්ෂක රාජ්‍ය ඇමැතිවරයා, ලේකම්වරයා, විදේශ මුදල් ලේකම්වරුන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීන්, ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්, පොලිස්පති, රාජ්‍ය බුද්ධි ප්‍රධානී, ජාතික බුද්ධි ප්‍රධානී ඇතුළු පිරිසක් සහභාගී වුණා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ආරක්ෂක මණ්ඩලය ජාතික ආරක්ෂාව ගැන ගැටලු සාකච්ඡා කළාද? රැස්වුණේ කොහොමද?

**සාක්ෂිකරු -**

'ඔව්. සහරාන් ගැන සාකච්ඡා කළා. මාසයකට, මාස එක හමාරකට සාකච්ඡා දීර්ඝ වූ අවස්ථා තිබුණා. සතිපතා රැස්වීම් ආරම්භයේ තිබුණාට කෙටි කාලයක් යන විට එහෙම වුණේ නෑ. මා මාරුවී යන විට මාස දෙකකට හෝ තුනකට සැරයක් රැස්වීම් පැවති බව මතකයි.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

රාජ්‍ය බුද්ධි සේවයෙන් බුද්ධි වාර්තා දෙකක් ලැබුණාද?

**සාක්ෂිකරු -**

'ඔව්. 2017 කාත්තන්කුඩි අන්තවාදී මූලධර්මවාදී අන්තර්ජාතික සම්බන්ධයක් තිබෙන සිදුවීමක් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතා ලිපියක් එවා තිබුණා. ජාතික තවුහිද් ජමාත් සංවිධානය එම සංවිධානය නිවැරදි බවට ප්‍රකාශ කරමින් ඉස්ලාම් රාජ්‍යයක් බිහි කිරීම, මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්, ඔහුගේ සොහොයුරු මොහොමඩ් සහරාන්, මොහොමඩ් සෙයිනි යන දෙදෙනා ISIS මතවාද පතුරවමින් ඉස්ලාම් රාජ්‍යයක් නිර්මාණය කිරීමට තරුණ පිරිස්වලට ISIS මතවාදය කාන්දු කරන බවට සමාජ ජාලා වෙබ් අඩවිවල ඇති බවත්, රහසිගත දේශන පවත්වන බවටත් නිලන්ත ජයවර්ධන මහතා 2017 ලිපියක් යොමු කළා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ඒ ලිපිය කියෙව්වාද?

**සාක්ෂිකරු -**

'එසේය. ඒ වන විට මෙවැනි කණ්ඩායමක් තිබූ බව නැඟෙනහිර ප්‍රදේශයේ ආරංචි ලැබෙමින් තිබුණා. මේ සම්බන්ධයෙන් ඇමැතිවරයාව දැනුවත් කළා. පොලිස්පතිවරයා නිලන්ත ජයවර්ධන මහතා සමග කතා කළා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ගත් ක්‍රියාමාර්ග මොනවාද?

**සාක්ෂිකරු -**

'අප සැහැල්ලුවට ගත්තේ නෑ. ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස මා උපදෙස් දුන්නා. මේ සම්බන්ධයෙන් විශේෂ සටහන් යෙදුවා. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට සහ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාට මේ ගැන වැටහී තිබුණා. යම්කිසි සිද්ධියකට නැඟෙනහිර පළාතේ මුස්ලිම් ජනතාව අත්අඩංගුවට ගතහොත් මැදපෙරදිග සහ අනෙකුත් රාජ්‍ය රාජ්‍යතාන්ත්‍රිකව මේ සඳහා මැදිහත් වීමක් ඇති වෙයි කියලා ඔවුන් සිතුවා. නිතරම ඇලට් එකේ සුපරීක්ෂාකාරීව ඉන්න ලෙස ඔවුන් උපදෙස් දුන්නා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

මේ ලිපියට ලේකම්වරයා ලෙස ගත් ක්‍රියාමාර්ග මොනවාද?

**සාක්ෂිකරු -**

'මට කරන්න තිබෙන්නෙ ඇමැතිවරයා, පොලිස්පතිවරයා දැනුවත් කරන එක. ඒ වන විටත් මේ තොරතුරු ඒ දෙපළට ලැබී තිබුණා. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා කරන බව මට දැනගන්නට ලැබුණා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ඇමැතිවරයා පැවැත්වූ බුද්ධි රැස්වීම්වලදී ISIS ශ්‍රී ලාංකික නැඟුරුව සහරාන් බවත්, ජාතික තවුහිද් ජමාත් සංවිධානය නැඟෙනහිර පළාතේ ව්‍යාප්ත කර යම් පියවර ගත් බවටත් දැනගන්න තිබුණාද?

**සාක්ෂිකරු -**

'දන්නේ නෑ. 2019. 04. 21 බෝම්බ පුපුරුවා හැරි සහරාන් ගැන නිලන්ත ජයවර්ධන මහතා ආරක්ෂක මණ්ඩලයට නිතරම කරුණු ඉදිරිපත් කළා. තරුණයන් පොළඹවා ගැනීම්, පල්ලිවල දේශනා සිදු කිරීම්, ඉස්ලාම් අන්තවාදී මත පළ කිරීම් ගැන මේ දැනුවත්වීම් සිදු කළා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ආරක්ෂක රැස්වීම්වලට හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා එනවාද?

**සාක්ෂිකරු -**

'බොහෝ විට සහභාගී වෙනවා. සමහර වෙලාවට කාර්යබහුල බව නිසා නොයන බව දැනුම් දෙනවා. සමහර අවස්ථාවල ඇවිත් කෙටි වේලාවකින් පිටව යනවා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

පොලිස්පති එනවාද?

**සාක්ෂිකරු -**

'මුලින් පැමිණියා. පසුව ආවේ නෑ.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

පොලිස්පති මේ රැස්වීමට අවශ්‍යමද?

**සාක්ෂිකරු -**

'අත්‍යවශ්‍යයි. ඒ ගැන ලේකම්වරයා ලෙස සොයා බැලුවා. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සමග පොලිස්පති ගෙන්වා නොගත් බව දැන ගත්තා.'

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා -**

ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරිය සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කළාද?

**සාක්ෂිකරු -**

'ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කළේ නෑ.'

**කොමිසම -**

ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගැන නියෝග කිරීමක් සිදු වුණාද?

**සාක්ෂිකරු -**

'නෑ.'

**කොමිසම -**

මෙහෙම පියවර නොගත්තේ අන්තර්ජාතික ප්‍රශ්න නිසාද?

**සාක්ෂිකරු -**

'මතකයේ හැටියට එහෙමයි.'

**කොමිසම -**

දේශීය බලපෑම මත එහෙම තීරණ ගත් බවට හැඟී ගියාද?

**සාක්ෂිකරු -**

'මුස්ලිම් ඇමැතිවරුන්ගේ බලපෑම් මත මෙසේ සිදු කළ බව ඒත්තු ගියා. කෙළින්ම කිව්වේ නෑ.'

**කොමිසම -**

යහපාලන රජය මුස්ලිම් ඇමැතිවරුන් ගෙන්වා අන්තවාදය ගැන සාකච්ඡාවක් කළ බව දන්නවාද?

**සාක්ෂිකරු -**

'අරලියගහ මන්දිරයේදී මෙහෙම සාකච්ඡාවක් තිබූ බව දන්නවා. එවකට අගමැති රනිල් වික්‍රමසිංහ, මුස්ලිම් ඇමැතිවරුන්, මන්ත්‍රීවරුන් සහ සාගල රත්නායක මහතා සිටි බව දැනගන්නට ලැබුණා.'

**කොමිසම -**

අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසු මොනවද හිතුණේ?

**සාක්ෂිකරු -**

'කලකිරීමක් දුකක් ඇති වුණා. මා හිටියා නම් වෙනස් කර ගන්න තිබුණා කියා හිතුණා. උපදෙස් ලැබී තිබුණේ මේ සිද්ධිය සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරීව ඉන්න කියලා. පොලිස් විශේෂ කාර්ය බළකායවත් තීරණයක් ගත්තා නම් මේ දේ සිදු වන්නේ නෑ.'

**කොමිසම ඊයේ (14) පෙරවරු 10.00ට යළි රැස් විය.**

---

# අගමැතිගේ තීරණයට ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගෙන් පැසසුම්

**ඇඩ්ලිපිටිය සමූහ - සේන වී. ගමගේ**

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ගව ඝාතනය නතර කිරීමට පියවර ගන්නා බව ඉකුත් දින ප්‍රකාශ කිරීමත් සමග ත්‍රෛනිකායික මහා සංඝරත්නය ඇතුළු දිවයිනේ බෞද්ධ ජනතාව ඒ කෙරෙහි සිය ප්‍රසාදය පළ කර ඇත. එසේම ඉතාලියේ මිලානෝවල වෙසෙන අනුර උපාලි අබේගුණවර්ධන මහතාගේ මූලිකත්වයෙන් යුතු ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාව එම තීරණයට සිය ස්තුතිය පළ කර අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා වෙත ලිපියකින් ඒ බව දන්වා එවා තිබේ. එම ලිපියෙහි මෙසේ ද සඳහන් වේ.

'විශේෂයෙන් මම මේ ලිපිය ලියා ඔබතුමාටත්, ශ්‍රී ලංකා රජයටත් මාගේ අවංක ස්තුතිය පුද කරමි. ඒ මුළු රටටම බලපවත්වන පරිදි ගව ඝාතනය නතර කිරීම පිළිබඳව ඔබතුමා ගත් දැඩි තීරණය සම්බන්ධයෙනි. ශ්‍රී ලංකාව ධර්මද්වීපයකි. උදේ සවස පිරිත් කියන, බණ අහන රටක දිනපතා ගව ඝාතනය සිදුවීම අවාසනාවකි. නමුත් දැන් අප වාසනාවන්තය.' එහි ගෞරවය හිමි වන්නේ ඔබතුමාටය.

---

# පොදු ප්‍රවාහනයේ අක්‍රමිකතා ඉවත් කර නවීන තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමට පියවර

## රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම

**නිමල් රාජපක්ෂ**

පොදු ප්‍රවාහනයේදී ජනතාවට සිදු වන අක්‍රමිකතා ඉවත් කර නවීන තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමටත්, මෙතෙක් පැවති දුම් පරීක්ෂාව අවලංගු කරනවා වෙනුවට යෝග්‍යතා පරීක්ෂණයක් හඳුන්වා දීමටත් රජය තීරණය කර ඇතැයි ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

රාජ්‍ය ඇමැතිවරයා මේ අදහස් පළ කළේ ප්‍රවාහන අමාත්‍යාංශයේ පසුගියදා පැවති සාකච්ඡාවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'මේ ක්‍රමවේදය හරහා රථයේ නිෂ්පාදිත වර්ෂය තුළ අවශ්‍ය තිරිංග පද්ධති, විදුලි පද්ධතිය, බොඩියේ තත්ත්වය සහ වාහනයේ ඇතුළත තත්ත්වය, මාර්ගයේ ධාවනය කිරීමට සුදුසුද යන්න පරීක්ෂා කිරීමට නියමිතයි. සමහරක් වාහනවල අධිබලැති ලයිට් යොදා තිබෙනවා. අධිබලැති නලා භාවිත කරනවා. රජයේ වාහනවල නලා, සිග්නල් ලයිට් වැඩ කරන්නේ නෑ. ඒ පරීක්ෂාව ඇතුළත දුම් පරීක්ෂාවත් ඒ ස්ථානයෙන්ම සිදු කළ හැකි වැඩපිළිවෙළක් ආරම්භ කරනවා. රජයේ වාහන ඇතුළු සියලු වාහන මේ ක්‍රමවේදවලට ඇතුළත් විය යුතුයි. මේ වාහන කුමන ආයතනයේද තිබෙන්නේ කියා බැලිය යුතුයි. මෙරටට වාහන ආනයනය කිරීමට තිබෙන තහනම නිසා රථවාහන ගෙන්වන ඒජන්තවරුන් අසරණවී තිබෙනවා. එනිසා ඔවුන්ට මේ පරීක්ෂණය දෙන්න පුළුවන්ද කියා සොයා බලන්න යැයි ජනාධිපතිවරයා උපදෙස් දුන්නා. ඒජන්තවරුන් තිස් දහසක් පමණ සිටින නිසා ඔවුන්ට මේ යෝග්‍යතා සහතිකය ලබාදීමේ පරීක්ෂණය කරන්න දෙන්න පුළුවන්ද කියා මේ දිනවල පරීක්ෂා කරමින් සිටිනවා.

ත්‍රීරෝද රථ අලංකරණය කරන කොටස්වලට තහනමක් පනවා තිබුණා. නමුත් මෝටර් රථ දෙපාර්තමේන්තුව එම තහනම් කළ කොටස් මොනවාද කියා සොයා බලා ඉදිරි සතියේ ගැසට් කිරීමට කටයුතු කරනවා. ෆෝවීල් රථ, සෆාරි ජීප් රථ සහ ජීප් රථවලට යම් යම් කොටස් එකතු කිරීමට අවසර දී තිබෙනවා. නමුත් තහනම් කොටස් භාවිතයට එක කාණ්ඩයකට අවසර දෙනවා. ඒ ක්‍රීඩා සමාජයක් ලෙස ලියාපදිංචි වී ඒ වාහනය අතිශය දුෂ්කර පැතිවල ධාවනය කරනවා නම් පමණයි. අදාළ ක්‍රීඩා සමාජයේ ඉල්ලීම මත එහි වගකීමත් එම ක්‍රීඩා සමාජයට පවරමින් ඉදිරියේදී අනුමැතිය ලබාදීමට කටයුතු කරනවා. සී. සී. 450 හේ සිට 1000 දක්වා එන්ජින් ධාරිතාව තිබෙන මෝටර් සයිකල් පසුගිය කාලයේ පොලිසියෙන් අත්අඩංගුවට ගත්තා. නීත්‍යානුකූලව කැබිනට් තීරණය ගැනීමට පෙර ඒවා ලියාපදිංචි කිරීමට අවසර දෙනවා. හැබැයි ඒ සඳහා රුපියල් ලක්ෂ අටක අධිභාරයක් ඒ රථ ලියාපදිංචි කිරීමට අය කරනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට වාහන ලියාපදිංචියේදී අය කරන මුදල දැනුවත් කර තිබෙන නිසා මින් ඉදිරියට තැරැව්කරුවන්ට මුදල් දීමට අවශ්‍ය නෑ. විශේෂයෙන් වෛද්‍ය සහතික ගැනීමේදී ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සිදු කරන ප්‍රමාදය යම්කිසි මට්ටමකට අඩු කරගැනීමට හැකියාව ලැබුණා. මෙහිදී ඇස් පරීක්ෂාව ප්‍රධාන වෙනවා. එක්ස්රේ කිරීම මේ වන විට නතර කර තිබෙනවා. සීනි කොරොස්ටරෝල් පරීක්ෂාව කළත් එයින් කිසි කෙනෙක් අසමත් කරන්නේ නෑ. එයින් රියැදුරු බලපත්‍රය අවලංගු කරන්නේ නෑ. මගී සහ භාණ්ඩ ප්‍රවාහනය කරන රියැදුරන්ටත් සෞඛ්‍ය පරීක්ෂණය අවශ්‍යයි. සෞඛ්‍ය තත්ත්වයේ අඩුවක් තිබෙනවා නම්, ඇස් පෙනීම දුර්වල නම් රියැදුරු බලපත්‍රය ගන්න බෑ. කොමර්ෂන් නොවන රියැදුරු බලපත්‍රයක් ඒ අයට ලබා ගන්න පුළුවන්. රැකියාවක් හැටියට කරන්න නොව ඇස් පෙනීම අඩු නම්, ඇඟිල්ලක් නැතිනම් ඒ අයට සාමාන්‍ය වාහනයක් ධාවනය කළ හැකියි. නමුත් පොදු වාහනයක් ධාවනය කළ නොහැකියි. එක කකුලක ආබාධයක් තිබුණත් ඉදිරියේදී රියැදුරු බලපත්‍රය ලබා දෙන්න පුළුවන්ද කියා බලනවා. මන්ද අද එක කකුලක් තිබුණත් ඇති අලුත් වාහන ධාවනය කරන්න.'

ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඩී. අල්විස්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජෙනරාල් සුමිත් අලහකෝන් මහත්වරුන් ඇතුළු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීහු මේ අවස්ථාවට සහභාගි වුහ.

---

**සමස්ත ලංකා සංස්කෘතික පරිසර සුරැකීමේ පදනමෙන් සංවිධාන කළ 'ජාතික ගෞරව සම්මාන උලෙළ' පෙරේදා (13) කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.**

**එහිදී ජාතික ගෞරව සම්මාන වෛද්‍යවරුන්, කලාකරුවන් සහ ව්‍යාපාරික ප්‍රජාවට පිරිනැමීම සිදු කෙරිණි. ඩබ්. එම්. සිදත් ප්‍රසන්න විජේසුන්දර මහතා 'මානව හිතවාදී කීර්ති ශ්‍රී දේශමාන්‍ය' ජාතික ගෞරව සම්මාන සන්නස් පත්‍රය ලබා ගත් අයුරු.**

**ඡායාරූප - ගයාන් පුෂ්පික**

---

# මත්තල ගුවන් තොටුපොළ භාණ්ඩ ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් කරනවා

## ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ අධ්‍යක්ෂ **ෂෙහාන් සුමනසේකර**

**සූරියවැව විශේෂ - නුවන් ජයසේකර**

ගුවන් භාණ්ඩ ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් ලෙස මත්තල මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපොළ සංවර්ධනය කරන බව ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ අධ්‍යක්ෂ ෂෙහාන් සුමනසේකර මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ පසුගියදා (11) මත්තල රාජපක්ෂ ගුවන් තොටුපොළේ සිදු කළ විශේෂ නිරීක්ෂණ සංචාරයකින් පසු මාධ්‍යයට අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද කීය.

'මත්තල ගුවන් තොටුපොළ යොදාගෙන ගුවන් භාණ්ඩ මෙහෙයුම් කරන සමාගම්වලට දෙන්න පුළුවන් සියලුම සහන ලබාදීමට අප ඉදිරියේදී කටයුතු කරනවා. මේ ගුවන් තොටුපොළ යොදා ගනිමින් පසුගිය 16 වැනි දින අප ප්‍රථම වරට ගුවන් භාණ්ඩ තොගය ඕමානයේ මස්කට් නුවරට රැගෙන ගියා. එහිදී අපට මත්තල ගුවන් තොටුපොළෙන් ලැබුණු සහයෝගය ඉතා විශාලයි. කිසිදු තදබදයකින් තොරව ඉතා පහසුවෙන් අපට එම කටයුත්ත කරන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා තායි ගුවන් සේවය ඉදිරියේදී සිදු කරන සියලු ගුවන් භාණ්ඩ මෙහෙයුම් කටයුතු මත්තලින් සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා.'

මේ සංචාරයට ගුවන් භාණ්ඩ ප්‍රවාහනකරුවන්, අපනයනකරුවන්, ලොව ප්‍රමුඛ පෙළේ ගුවන් සේවා සමාගම් 25කට අයත් නියෝජිතයන් ඇතුළු පිරිසක් පැමිණ සිටියහ.

ඉදිරියේදී දේශීය එළවළු, පලතුරු සහ දේශීය ඇඟලුම් ඇතුළු විවිධ භාණ්ඩ මත්තලින් විදෙස් රටවලට අපනයනය කිරීමට කටයුතු කරන බව සංචාරය සඳහා එක්ව සිටි පිරිස් පැවැසුහ.

මෙහිදී සංචාරයට පැමිණ සිටි නියෝජිතයන් සහ ගුවන් තොටුපොළ බලධාරීන් අතර විශේෂ සාකච්ඡා කිහිපයක්ද පැවැත්විණි.

ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ අලෙවි කළමනාකරණ හා සන්නිවේදන ප්‍රධානී සුමිත් ද සිල්වා, ගුවන් භාණ්ඩ කළමනාකරණ ප්‍රධානී රජත මැදවැව, මත්තල රාජපක්ෂ ගුවන් තොටුපොළේ ප්‍රධාන කළමණාකරු උපුල් කලංසූරිය, ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් භාණ්ඩ ප්‍රධානී චාමර මහත්වරුන් ඇතුළු ගුවන් සමාගම් නියෝජිතයෝ ද, ගුවන් භාණ්ඩ ප්‍රවාහන නියෝජිතයෝ ද, එළවළු පලතුරු අපනයනකරුවන්ගේ සංගමයේ නියෝජිතයෝ ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

**ඡායාරූපය - සූරියවැව විශේෂ**

# 20 බහුතර ජනතාවටයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා

විසිවන ව්‍යවස්ථා සංශෝධනය ගැන මතු වන විවිධ මතවාද දහනවවන සංශෝධනයේ දුර්වලතා මොනවාද? සහ තවත් දේශපාලන කරුණු පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා සමඟ සිදු කළ සාකච්ඡාවකි.

ඡායාරූපය - රුක්මල් ගමගේ

**● 19 වන සංශෝධනය ඉවත් කර නව රජය 20 වන සංශෝධනය ගෙන එනවා. ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක් ද?**

20 වන සංශෝධනය සමගි ජන බලවේගය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. හේතුව තමයි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට 19 වන සංශෝධනය ගෙනාවේ ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් ගෙන එන්නටයි. 19 වන සංශෝධනයේ තාක්ෂණික අඩු පාඩු කිහිපයක්ම තිබෙනවා. එය අපිත් පිළිගන්නවා. ස්වාධීන කොමිෂන් සභාවල ගැටලු එහි සාමාජිකයන් ඉවත් කිරීම, ඔවුන්ගේ ක්‍රියාවල අඩු පාඩු අපිත් දුටුවා. ඒවා සම්බන්ධයෙන් සංශෝධන ගෙන ඒමේ වරදක් නැහැ. මැතිවරණ කොමිසමේ සාමාජිකයන් ප්‍රමාණය ගණපූරණය පිළිබඳව ප්‍රායෝගික ගැටලු තිබෙනවා. ඒ නිසා කළ යුතුව තිබෙන්නේ ඒ අඩු පාඩු සකස් කිරීම මිසක් 19 වන සංශෝධනය විසික් කර 20 වන සංශෝධනය ගෙන ඒම නෙමෙයි. 19 වන සංශෝධනය ඉවත් කරලා 20 වන සංශෝධනය ගේන එක ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් අතුගා දැමීමක් බවයි කියන්න තිබෙන්නේ. ඒ වෙනුවට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඒකාධිපති මුහුණුවරක් සවි කරන්න යන බව පෙනී යනවා. 1978 ව්‍යවස්ථාව එපා කිවු අය එම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව බහුතර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් බව හඳුන්වපු දේශපාලන පක්ෂය යළි වතාවක් එහි තිබෙන කාරණාවලට යන්න උත්සාහ කිරීම හාස්‍යයට කරුණක්.

**● එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම්වරයා හැටියට එක්සත් ජාතික පක්ෂය අද වැටී තිබෙන තත්ත්වය ගැන ඔබේ මතය කුමක් ද?**

එක්සත් ජාතික පක්ෂය මේ රටේ පැරණිතම සහ ශක්තිමත්ම දේශපාලන ව්‍යාපාරයයි. නමුත් පසුගිය වසර ගණනාව තුළ හෙමින් හෙමින් එක්සත් ජාතික පක්ෂය දියවීමකට පත් වුණා. ඒකට හේතු ගණනාවක් තිබ්බා. ජනතාවගේ හැඟීම් නිවැරැදිව හඳුනා නොගැනීම එක් හේතුවක්. එමෙන්ම කාලයට අවශ්‍ය පරිදි නායකත්වය වෙනස් නොකිරීම තවත් හේතුවක්. එක්සත් ජාතික පක්ෂයට හරියාකාරව ඉදිරියට යන්න සැලසුමක් නොතිබීමත් තවත් හේතුවක්. පක්ෂය කඩා වැටීමට හේතු වුණේ මේ කාරණා. මේ කරුණු නිසා එක්සත් ජාතික පක්ෂය බිඳවැටුණා. දැන් පක්ෂය ගොඩගන්න නම් නව මාවතකට යොමු විය යුතුයි. මේ යන ක්‍රමයට නම් ඒ සඳහා ඉඩක් නැති බවයි පෙනී යන්නේ. එක්සත් ජාතික පක්ෂය වටා රොක් වී සිටින ජනතාව බොහෝ දෙනා කිව්වෙ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සජිත් ප්‍රේමදාස මහතාට භාරදෙන්න කියලා. නමුත් ඒ ඉල්ලීම ඉටු කරන්න එක්සත් ජාතික පක්ෂයේ නායකයා රනිල් වික්‍රමසිංහ මහතා

**● එක්සත් ජාතික පක්ෂය කඩාවැටීමට බැඳුම්කර ගනුදෙනුව සහ පාස්කු ප්‍රහාරය හේතු වුණා නේද?**

එක්සත් ජාතික පක්ෂය බිඳවැටීමට කාරණා ගණනාවක් බලපෑවා. 2015 බලය ලැබුණේ හොරකම, දූෂණය, වංචාව පිටු දකින්නයි. හොරුන්ට වංචාකාරයන්ට දඬුවම් දෙන්න ජනතාව වරමක් දුන්නා. අවාසනාවට වගේ ඒ ජනවරම එක්සත් ජාතික පක්ෂයේ පාලකයන්ට අමතක වුණා. මිනිසුන් කතාවට කිව්වෙ හොරු අල්ලන්න ආපු ආණ්ඩුව හොරු විසින් අල්ල ගත්තා කියලා. ඒ නිසා බරපතළ ලෙස මේ සිදුවීම් සියල්ලම බලපෑවා. මහජන විශ්වාසය බිඳ වැටුණා. බැඳුම්කර ගනුදෙනුවේ ක්‍රියාකාරිත්වයේ රහසක් නැතිව යහළු මිත්‍රයෝ ආරක්ෂා කරන්න ගත් පියවර නිසා අවසානයේදී දුක් විඳලා ගොඩනගපු ආණ්ඩුව බිඳවැටුණා. ඒ වගේමයි බැඳුම්කරයේ පමණක් නොවෙයි පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයත් තදබල ලෙස ආණ්ඩුවට එරෙහිව බලපෑවා.

**● ආණ්ඩුවේ ගමන ගැන ඔබේ මතය කුමක් ද?**

ආණ්ඩුවේ ප්‍රමුඛතම පරමාර්ථය ඉලක්කය විය යුත්තේ රටේ ආර්ථිකය නංවාලීමයි. මේ වනවිට රට අභියෝග ගණනාවකට මුහුණදී තිබෙනවා. ලෝකයේ බලපෑම වගේම අපිට පාස්කු ප්‍රහාරයත් බලපෑවා. රටේ ප්‍රධාන ආර්ථික මාර්ගයක් තමයි සංචාරක ව්‍යාපාරය. පාස්කු ප්‍රහාරයත් සමඟ එය නැවතුණා. ඒ වගේමයි කොවිඩ් 19 සමඟ අපිට විවිධ බලපෑම් එල්ල වී තිබෙනවා. මේ බරපතළ අභියෝග ජයගන්න ආණ්ඩුවට සැලසුමක් තිබෙන බව පෙනෙන්න නැහැ. අපි මේ බව කියන්නෙ කාරණා ඇතිව. ලෝකය පුරා කොවිඩ් හේතුවෙන් කඩා වැටුණු ආර්ථිකය ගොඩගන්න රටවල් අනුගමනය කරන ක්‍රියාමාර්ග අපිත් අනුගමනය කළ යුතුයි. ඒ වගේම නාස්තිය දූෂණය හොරකම පිටු දැකීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. කොවිඩ් වසංගතය නිසා කඩාවැටුණු ආර්ථිකය ගොඩගන්න ජාතික සැලසුමක් අවශ්‍යයි. ඒක කොටස් කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක කළ යුතුයි. කෙටිකාලීන, මධ්‍යකාලීන, දීර්ඝකාලීන ව්‍යාපෘති ඉදිරිපත් කළ යුතුයි. අපි දැන් විනිමය අර්බුදයකට මුහුණ දී තිබෙනවා. අපේ ආර්ථිකය ණය සහ පොලී ගෙවන්නත් ප්‍රමාණවත් නැහැ. ණය සහ පොලී ගෙවන්න ආදායම දෙගුණයකින් වැඩි කරන්න ඕන. අපිට ලැබෙන ආදායම අඩු වෙමින් තිබෙනවා.

**● වත්මන් ආණ්ඩුව ගෙන යන යහපත් කාරණාවලදී සමගි ජන බලවේගයේ සහාය ලබා දෙනවා ද?**

> එක්සත් ජාතික පක්ෂය පාක්ෂිකයන්ව අත්හැරලා දැම්මා. ඒ හේතුව නිසාමයි පක්ෂය දියාරු වුණේ. තමන්ට අත දුන් ජනතාව ආරක්ෂා කරනවා වෙනුවට එක්සත් ජාතික පක්ෂය සිදු කළේ වෙනත් දේවල්. එක්සත් ජාතික පක්ෂයේ නායකයන් පාක්ෂිකයන් ආරක්ෂා කරන යුතුකම පැහැරහැරියා. මම අදත් උත්සාහ කරන්නෙ එක්සත් ජාතික පක්ෂය සහ සමගි ජන බලවේගය එකතු කරන්නයි. ඒ වෙනුවෙන් මම රනිල් වික්‍රමසිංහ මහතා හා කරු ජයසූරිය මහතා යන දෙදෙනාම මුණ ගැසුණා.

# අපි 20ට විරුද්ධයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක

ආණ්ඩුව හදිසියේ සිදු කිරීමට උත්සාහ කරන ව්‍යවස්ථා සංශෝධනය ප්‍රජාතන්ත්‍රවාදයට බාධාවක් ද? යහපාලන රජය ඇති කළ ව්‍යවස්ථා සංශෝධන රට අස්ථාවර තත්ත්වයකට පත් කිරීමට හේතු වීද? යන කරුණු ගැන පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා සමඟ සිදු කළ සාකච්ඡාවකි.

ඇතුළු කිහිපදෙනෙක් ඉඩ දුන්නෙ නැහැ. එක්සත් ජාතික පක්ෂය දියවීමේ සම්පූර්ණ වගකීම එම කණ්ඩායම භාරගත යුතු බවයි මගේ මතය. සමගි ජන බලවේගයේ දේශපාලන ව්‍යාපාරය වටා ජනතාව එකතු වුණා. එක්සත් ජාතික පක්ෂයට දැන් කරන්න තියෙන්නෙ සමගි ජන බලවේගයට එකතු වීම පමණයි. එහෙම කළොත් විතරයි එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා වෙන්නෙ. විශේෂයෙන්ම පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී එක්සත් ජාතික පාක්ෂිකයන් 250000 ක් පමණ එක්සත් ජාතික පක්ෂයට ඡන්දය ලබාදී තිබුණා. ඔවුන් සියලු දෙනා යළි සමගි ජන බලවේගය වටා එකතු කර ගන්න දේශපාලන වශයෙන් දැනටමත් අපි කටයුතු කරමින් සිටිනවා.

**● එක්සත් ජාතික පක්ෂයේ ඔබ මහ ලේකම්වරයා ලෙස සිටියා නම් මෙවැනි තත්ත්වයක් එක්සත් ජාතික පක්ෂයට උදා නොවේවි යැයි ඔබ විශ්වාස කරනවා ද?**

ඉතා සරලව කියන්න තියෙන්නෙ මම පක්ෂයේ මහ ලේකම්ව සිටියා නම් පක්ෂයට මේ දේ සිදු වන්නෙ නැහැ කියලයි. හොඳම උදාහරණය තමයි එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා සහ සජිත් ප්‍රේමදාස මහතා 2014 දී දෙවරක්ම එකට එකතු කළේ මමයි. බෙදුණු පක්ෂය යළි එකතු කරපු මම මේ ආකාරයෙන් වීමට ඉඩ නොදෙන බව එක්සත් ජාතික පාක්ෂිකයන් හොඳින් දන්නවා. අවාසනාව වන්නේ පාක්ෂිකයන් ගැන නොසලකා කණ්ඩායම් බලයට එක්සත් ජාතික පක්ෂය පත් වීමයි. එක්සත් ජාතික පක්ෂය පාක්ෂිකයන්ව අත්හැරලා දැම්මා. ඒ හේතුව නිසාමයි පක්ෂය දියාරු වුණේ. තමන්ට අත දුන් ජනතාව ආරක්ෂා කරනවා විනා එක්සත් ජාතික පක්ෂය සිදු කළේ වෙනත් දේවල්. එක්සත් ජාතික පක්ෂයේ නායකයන් පාක්ෂිකයන් ආරක්ෂා කරන යුතුකම පැහැර හැරියා. මම අදත් උත්සාහ කරන්නෙ එක්සත් ජාතික පක්ෂය සහ සමගි ජන බලවේගය එකතු කරන්නයි. ඒ වෙනුවෙන් මම රනිල් වික්‍රමසිංහ මහතා, කරු ජයසූරිය මහතා යන දෙදෙනාම මුණ ගැසුණා සාකච්ඡා කළා. ඒත් යහපත් ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. සුපුරුදු මඟහැරීම නම් සිදු වුණා. ඉන් සිදු වන බරපතළ ප්‍රතිවිපාක වත්මන් පක්ෂයේ නායක වික්‍රමසිංහ මහතා තේරුම් ගත යුතුයි. අනාගතයේ මේ පක්ෂ දෙක එකට එකතු කර වැඩක් කරන්න පුළුවන් කෙනෙක් නායකත්වයට පත් කරන්න මම මැදිහත්ව කටයුතු කරන්න සූදානම්.

ඇත්තටම ඔව්. ආණ්ඩුව රටේ පොදු ජනතාව වෙනුවෙන් ඉටු කරන සෑම සාධනීය පියවරකටම සමගි ජන බලවේගය සහාය දෙනවා. ආණ්ඩුව ගන්නා යහපත් ක්‍රියාමාර්ගවලට අපි හරස් වෙන්නෙ නැහැ. ඉතා පැහැදිලිව කියන්න ඕන රටේ ජාතික ආරක්ෂාව පොදු යහපත වෙනුවෙන් අපි ආණ්ඩුව සමඟ ඉන්නවා. ආණ්ඩුව කරන කුඩු, පාතාලය ඉවත් කිරීම වැනි පොදු ඕනෑම ක්‍රියාවකට අපේ සහාය ලබා දෙනවා. පසුගිය කාලයේ ජාතික ආණ්ඩු සංකල්පය ගෙන කළ විනාශය අපි දුටුවා. තවදුරටත් එවැනි විනාශ කිරීම අප අනුමත කරන්නේ නෑ. අපි හැමවිටම පොදු ජනතාවගේ යහපත වෙනුවෙන් අදහස් උදහස් ලබා දෙන්න සූදානම්. එවැනි ක්‍රියා සම්බන්ධයෙන් උදව්කරන්න අප පසුබටවන්නේ නෑ.

**සුභාෂිණී සේනානායක**

**● දහනව වන සංශෝධනයට ඔබ ඇතුළු පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරුන් අති බහුතරය සහාය දුන්නා. අවුරුදු හතරකට පෙර එයට සහාය පළ කළ ඔබ ඇතුළු පිරිස විසිවන සංශෝධනයට කොන්දේසි විරහිතව සහය පළ කරන බවක් පෙනෙනවා. ඒ ගැන ඔබේ අදහස කුමක් ද?**

දහනව වන සංශෝධනය ඇති කිරීමේ මූලික අරමුණ වුණේ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කර නැතිනම් විධායක ජනාධිපතිවරයා නාමික ධූරයක් බවට පත් කර පාර්ලිමේන්තුවට වගකියන ආණ්ඩු ක්‍රමයක් ඇති කිරීමයි. ඒත් දහනව වන සංශෝධනයේ ඇතැම් අංගවලට අධිකරණයෙන් අනුමැතිය ලැබුණේ නැහැ. ඒ නිසා දහනව වන සංශෝධනය පූර්ණ වශයෙන් ඉදිරිපත් කරන්න එවක පැවැති ආණ්ඩුවට හැකියාව ලැබුණේ නැහැ. ඒ තත්ත්වය නිසා ආරම්භයේ ඉඳන්ම දහනවය අංග විකල සංශෝධනයක් බවට පත් වුණා. එදා සිටි ජනාධිපතිතුමාට ෂර්ට් එක අයිති වුණා එදා සිටි අගමැති තුමාට කලිසම අයිති වුණා. මෙහි ප්‍රතිඵලය වුණේ රටම විකට චිත්‍රපටයක් වීම. රටේ බලය කේන්ද්‍ර දෙකක් වටේ කැරකුණා. ඇත්තෙන්ම ඒ තත්ත්වය රටක් විදිහට කිසිසේත්ම හොඳ තත්ත්වයක් නොවෙයි. ජනාධිපති අගමැති රණ්ඩුව නිසා රට අනාරක්ෂිත වුණා. සහරාන් වැනි අන්තවාදී නිදහසේ වැඩ කළේ මේ තත්ත්වය නිසයි. අපිට දවස් පනස් දෙකේ ආණ්ඩුව වෙලාවේ තේරුණා කථානායකවරයාටත් විධායක බලය බෙදී ගිහින් කියල. මේ හැම දෙයක්ම තහවුරු කළ ප්‍රධාන කරුණ වුණේ දහනවය සංශෝධනය අසාර්ථකයි කියන කරුණයි. ඇත්තෙන්ම රටක් මේ විදිහට අයාලේ යෑම හොඳ දෙයක් නොවෙයි. මේ හැම දෙයක්ම ගැන සාධාරණව සලකා බලා තමයි අප තීරණය කළේ විසිවන සංශෝධනයට සහය දී දහනවය අහෝසියට දායක වෙන්න ඕනෑ කියල.

**● ඔබ කියන්නේ විසිවන සංශෝධනය කියන්නේ රටේ ඇතිව තිබෙන හැම ප්‍රශ්නයකටම විසඳුක් කියල ද?**

මම එහෙම කියන්න ඉක්මන් වෙන්නේ නැහැ. ඒත් ජනතාව මුලින් ජනාධිපතිතුමාට වැඩි ඡන්ද ලක්ෂ දාහතරක ජයග්‍රහණක් ලබා දුන්නේ දහනවවන සංශෝධනය අහෝසි කිරීමටයි. ඉන් පසු ජනතාව මහ මැතිවරණයේ දී තුනෙන් දෙකක බලයක් දුන්නා මේ ව්‍යවස්ථාව සංශෝධනය කරන්න කියල. ඒ නිසා විසිවන සංශෝධනය සිදු කිරීමට රටේ විශාල ජනමතයක් ලැබිල තියෙනවා. අපි ඒ ජනමතයට ගරු කර විසිවන සංශෝධනයට සහාය දිය යුතුයි කියන තැන අපි ඉන්නේ.

ජනාධිපතිතුමාව විශ්වාස කර තමයි ජනතාව ඡන්දය ලබා දුන්නේ ඒ නිසා අප ඔහුට වැඩ කිරීමට අවශ්‍ය බලය පැවරිය යුතුයි. එහෙම නැතිනම් වෙන්නේ රට ගොඩ ගන්න ලැබී තිබෙන මේ අවස්ථාවත් නිකරුණේ නාස්ති වී යාමයි.

**● ඒත් විපක්ෂය නඟන ප්‍රධාන තර්කය බවට පත්වන්නේ මෙම සංශෝධනය නිසා රට තුළ ඒකාධිපති තත්ත්වයක් ඇති වෙයි කියල?**

විපක්ෂයට අවශ්‍ය වෙලා තියෙන්නේ රට ඉස්සරහට රැගෙන යෑමට උදව් කිරීම නොවෙයි. රට අස්ථාවරව කඩා වැටෙන රටක් බවට පත් කිරීමයි. ඒකට දහනවවන සංශෝධනය හොඳට අඩුම කුඩුම සපයනවා. අද විපක්ෂය දුර්වල නිසා ඒක ඔවුන්ට වාසියක්. දහනවවන සංශෝධනය මඟින් දියාරු ආණ්ඩුවක් පවත්වා ගෙන ගොස් ජනතා අප්‍රසාදය ඇති කර අවුරුදු පහකින් බලය ලබා ගැනීමයි විපක්ෂයේ කූට සැලසුම වෙලා තියෙන්නේ. එහෙම නැතිව ඒ අය කියන ප්‍රජාතන්ත්‍රවාදය වැනි අදහස් බොරු. ජනාධිපතිතුමා අලුත් අදහස් ඇති රටට අවංකව වැඩක් කරන්න ඕනෑ කමක් ඇති නායකයෙක්. ජනතාවට දෙවරක්ම ඔහුට ජනවරම ලබා දී තියෙනවා ව්‍යවස්ථා සංශෝධනයටත් ඉදිරියේ අලුත් ව්‍යවස්ථාවක් ඇති කිරීමටත්. අප වැඩ කරන්නේ බහුතර ජනමතයට අනුව මිසක් ඒකාධිපති විදිහට නොවෙයි.

**● අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම ගැනත් ආණ්ඩු පාර්ශ්වයෙන් අදහසක් මතුව තිබෙනවා ද?**

හැත්තෑ අට ව්‍යවස්ථාව දැනට දහනව වතාවක් සංශෝධනය වෙලා තියෙනවා ඉදිරියේ දී එය විසි වතාවක් බවට පත් වෙනවා. ඇත්තෙන්ම මෙම ව්‍යවස්ථාවට තවත් අණ්ඩ දමන්න බැහැ, පැච් දමන්න බැහැ ඒ තරමටම මේ ව්‍යවස්ථාව විකාරයක් වෙලා තියෙන්නේ. ඒ හින්දා අනිවාර්යයෙන්ම අලුත් ව්‍යවස්ථාවක් රටට අවශ්‍ය වෙනවා. ඒ ව්‍යවස්ථාව කඩිනම්ව ඉදිරිපත් කිරීම සුදුසු නැහැ එයට පක්ෂ විපක්ෂ සැමගේ අදහස් සිවිල් සංවිධානවල අදහස් ඇතුළත් විය යුතුයි. දාහත දහඅට දහනවය විස්ස ඇතුළු සෑම සංශෝධනයකටම ප්‍රගතිශීලී යෝජනා එක් කළ යුතුයි.

> විපක්ෂයට අවශ්‍ය වෙලා තියෙන්නේ රට ඉස්සරහට රැගෙන යෑමට උදවු කිරීමට නොවෙයි; රට අස්ථාවරව කඩා වැටෙන රටක් බවට පත් කිරීමටයි. ඒකට දහනව වන සංශෝධනය හොඳට අඩුම කුඩුම සපයනවා. අද විපක්ෂය දුර්වල නිසා ඒක ඔවුන්ට වාසියක් දහනවවන සංශෝධනය මඟින් දියාරු ආණ්ඩුවක් පවත්වා ගෙන ගොස් ජනතා අප්‍රසාදය ඇති කර අවුරුදු පහකින් බලය ලබා ගැනීමයි විපක්ෂයේ කූට සැලසුම වෙලා තියෙන්නේ.

ඉදිරි අවුරුදු දෙක තුළ අලුත් ව්‍යවස්ථාව ඇති කර ජනතාටත් රටටත් හොඳ ආරම්භයක් දිය යුතුයි. මම විශ්වාස කරනවා ඒ කාර්යයට පක්ෂ විපක්ෂ සියල්ලන්ගේ සහාය ලැබෙයි කියලා.

**● විසිවන සංශෝධනය කෙරෙහි එල්ල වන අනෙක් ප්‍රධානම චෝදනාවක් බවට පත්ව තිබෙන්නේ ද්විත්ව පුරවැසියයන්ට නැවත මැතිවරණවලට තරග කිරීමට අවස්ථාවක් ලබා දීම යන වගන්තියයි.මෙය එක් පුද්ගලයකු ගැන අවධානය යොමු කර ඇති කළ වගන්තියක් විදිහට චෝදනා එල්ල වෙනවා?**

ඒ චෝදනාව සම්පූර්ණයෙන්ම වැරැදියි. හැත්තෑ අට ව්‍යවස්ථාවේ 26 ,2 කොටසේ සඳහන් වෙනවා "ශ්‍රීලංකාවේ පුරවැසියකුට සිය පුරවැසි භාවය හිමි වුයේ පරම්පාරාවෙන් වුවද පුරවැසි භාවය පිළිබඳ නීතියට අනුව ලියාපදිංචියෙන් වුවද සියලු කාර්ය සඳහා ශ්‍රීලංකාවේ පුරවැසියකු ලෙස පමණක් විස්තර කරනු ලබන්නේය." විදිහට. ද්විත්ව පුරවැසියකු ට රටේ ඡන්දය භාවිතා කරන්න පුළුවන්නම් ඔහුට ඡන්දය ඉල්ලීමට ඇති බාධාව කුමක් ද. යුද කාලයේ දී ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්වරයා විදිහට විශාල කාර්යක් කළා. එදා ඔහු විශාල සේවයක් කළා රට වෙනුවෙන්. ද්විත්ව පුරවැසියන් නොවුණු රනිල් වික්‍රමසිංහලා මංගල සමරවීරලාට වඩා රටට ආදරයෙන් වැඩ කළා. රටට ආදරය කරන රටට වැඩ කරන්න කැමැත්තෙන් ඉන්න ද්විත්ව පුරවැසියන් දහස් ගණනක් ඉන්නවා. එවැනි අයට රටට සේවයක් කරන්න අවස්ථාවක් ලබා දීම වරදක් නොවෙයි. දහනවවන ව්‍යවස්ථා සංශෝධනය ඇති කළේ එක පුද්ගලයකු එක් පවුලක් ඉලක්ක කර ගනිමිනුයි. ඇත්තෙන්ම එදා පැවැති යහපාලන ආණ්ඩුවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමට තිබුණේ රාජපක්ෂ භීතිකාවක්.

**● මරණ දඬුවමට ලක් වූ ප්‍රේමලාල් ජයසේකර මහතා මන්ත්‍රීවරයකු විදිහට පාර්ලිමේන්තුවේ දිවුරුම් දීම නිසා මෙරට නීතිය මෙන්ම අන්තර්ජාතික පිළිගැනීම බාල්දු වූ බවට විපක්ෂය සඳහන් කරනවා. ඒ චෝදනාව ගැන ඔබේ අදහස කුමක් ද?**

ප්‍රේමලාල් ජයසේකර මහතා වරදකරුවකු බවට අධිකරණය විසින් නම් කළ පසු ඔහු අභියාචනාධිකරණයට පෙත්සමක් යොමු කළා උසාවි තීන්දුව සලකා බලා තමන්ට සාධාරණයක් කරන්න කියල. අභියාචනාධිකරණයට මේ පෙත්සම යොමු කළ මොහොතේ සිට ඔහු වරද කරුවකු විදිහට සැලකෙන්නේ නැහැ. අභියාචනාධිකරණය ලබා දෙන තීන්දුව අනුව තමයි ඔහු වරද කරුවකුද නිවැරැදිකරුවකුද යන්න තීරණය වන්නේ. ඒ තත්ත්වය තුළ ප්‍රේමලාල් ජයසේකර මහතාට මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් දීමේ නෛතික වරදක් නැහැ.

**● දේශීය ආර්ථිකය නැවත පණ ගැන්වීමේ කාර්ය භාරය පිළිබඳව ආණ්ඩුව විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ උත්සාහය කෙතෙක් දුරට සාර්ථක වෙයිද.?**

කොළඹ සිට බලන අය මේ අමාත්‍යාංශ බෙදීම විහිළුවක් විදිහට දකිනවා. ඒත් ජනාධිපතිතුමා ඉතා නිවැරැදිව විෂය තෝරා ගෙන පුළුල් විදිහට ඇමැති මණ්ඩලයක් පත් කර තිබෙනවා. මීට කලින් සම්ප්‍රදායිකව ඇමැතිවරුන් පත් කළත් මෙවර ජනාධිපතිතුමා නව දැක්මකින් අමාත්‍යාංශ බෙදා තිබෙනවා. මෙම නව රටාව රටේ අනාගත ආර්ථික දැක්මට ලොකු ශක්තියක් වේවි.

**උදිත ගුණවර්ධන**

# අංගසම්පූර්ණ අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍යයි

## ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස්

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පමණක් නොව, රටට අංගසම්පූර්ණ අලුත් ව්‍යස්ථාවක් අවශ්‍ය බවත්, කරුණු ගැඹුරින් අධ්‍යයනය කර එම ව්‍යවස්ථාව සකස් කළ යුතු බවත් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පවසයි.

ජනතාව විසින් පත් කරන ලද ජනාධිපතිවරයා ජනතාවට වගකිව යුතු බවද ඇමැතිවරයා සඳහන් කරයි.

එසේම, මේ වන විටත් පාසල්වල පවතින විසමතා, විෂය මාලා නවීකරණය, පිරිවෙන් අධ්‍යාපනය ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගතිය සම්බන්ධයෙන් සොයා බැලීමටත්, අඩු පාඩු හඳුනාගැනීමටත් දිනවකවානු සැලසුම් කර තිබෙන බවද අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා සඳහන් කරයි.

බෙල්ලන්විල රාජමහා විහාරාධිපති ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නාහිමියන් බැහැදැකීමට ගිය අවස්ථාවේ අදහස් දක්වමින් ඇමැතිවරයා මේ බව පැවැසීය.

මානව සම්පත් සංවර්ධනයට අවශ්‍ය ආයතන පහක් සම්බන්ධීකරණය කර එක් අමාත්‍යාංශයක් යටතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පියවර ගෙන ඇති බව ද ඇමැතිවරයා පැවසීය.

20 වන සංශෝධනයෙන් ජනාධිපතිවරයාට වැඩි බලතල ලබා දෙන බවටත්, එමඟින් ප්‍රජාතන්ත්‍රවාදයට හානියක් සිදු වන බවටත් පවතින මතය සම්පූර්ණයෙන් වැරදි බවත්, මුළු රටේ ම වැඩි ඡන්දයෙන් පත් වූ කෙනකුට රටේ යන්ත්‍රණය සකස් කිරීමට තීරණ ගැනීමේ ශක්තියක් තිබිය යුතු බවත් එහි දී අදහස් දක්වමින් බෙල්ලන්විල ධම්මරතන නාහිමියෝ සඳහන් කළහ.

"මෑතක දී අප පසුකළේ අතිශයින් ම අකර්මණ්‍ය පාලනයක්. අලුත් රජයෙන් ඉක්මනින් ලොකු සේවාවක් සිදුවේවි කියලා ජනතාව බලාපොරොත්තු වෙනවා. අලුත් සංශෝධනයක් ලැබුණේ නැතිනම් ජනාධිපතිතුමාට ඒ සේවාව කරන්න අමාරුයි. සමහරු මේ සංශෝධනය හොඳ නෑ කියලා ප්‍රජාතන්ත්‍රවාදී රාමුවට මුවාවෙලා මේක අවුල් කරන්න හදනවා..." යනුවෙන් ද උන් වහන්සේ පැවැසූහ.

# ඉතාලි තානාපතිනිය අගමැති මහින්ද හමු වෙයි

ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපතිනි රිටා ජුලියානා මැනෙල්ලා මහත්මිය අරලියගහ මන්දිරයේදී ඊයේ (14) අගමැති මහින්ද රාජපක්ෂ මහතා හමු වූවාය.

ඉතාලිය හා ශ්‍රී ලංකාව අතර සහයෝගයෙන් කටයුතු කළ හැකි ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ මෙහිදී සාකච්ඡා කෙරිණි.

ඉතාලි රජය මේ වන විටත් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන හා කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා ආධාර දී ඇති නමුත් ආහාර සැකසීම, ජලජීවී වගාව සහ පාරිසරික සංචාරක ව්‍යාපාරය ඇතුළු විශේෂ ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ අනාගත සහයෝගීතාව වර්ධනය කිරීමට උනන්දුවක් දක්වන බව තානාපතිනිය පැවැසුවාය.

ඉතාලියේ සමාගම් රැසක් ශ්‍රී ලංකාවේ සංචාරක ආශ්‍රිත ආයෝජන කෙරෙහි වැඩි උනන්දුවක් දක්වන බව ද තානාපතිනි ජුලියානා මැනෙල්ලා මහත්මිය පෙන්වා දුන්නාය.

සංචාරක ප්‍රවර්ධනය සඳහා තවදුරටත් ශ්‍රී ලංකාවේ සංවර්ධනය කළ හැකි ප්‍රදේශ කිහිපයක් පිළිබඳව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මෙහිදී තානාපතිනියගේ අවධානය යොමු කළේය.

ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර විධිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා 1952 දී පිහිටුවන ලද අතර 2016 දී මිලාන්හි කොන්සල් ජනරාල්වරයකු පත් කිරීම ඔස්සේ මෙම සබඳතා තවත් වර්ධනය කෙරිණි.

# කිලෝමීටර් ලක්ෂයක මාර්ග සංවර්ධනයේ ප්‍රගතිය ගමටම ගොස් සොයා බලනවා

## ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**සුභාෂිණී සේනානායක**

කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය තමා පෞද්ගලිකව සෑම දිස්ත්‍රික්කයකටම ගොස් සොයා බලන බවත් එහි අඩුපාඩු සකස් කරන බවත් මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පවසයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය පරිදි ආරම්භ කරන ලද කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවරධන ව්‍යාපෘතියේ ප්‍රගතිය සොයා බැලීම සඳහා තමා පෞද්ගලිකවම සෑම දිස්ත්‍රික්කයකම නිරීක්ෂණය කරන ඒ මහතා පවසයි.

ඇමැති වරයා මේ අදහස් පලකලේ මහාමාර්ග අමාත්‍යශයේ පැවති රැස්වීමකට එක් වෙමිනි.

දිවයිනේ මහාමාර්ග කිලෝමීටර් ලක්ෂයක් ඇමැතිවරයා ලෙස තම ධුරකාලය අවස්වීමට ප්‍රථම උසස් ප්‍රමිතියෙන් යුතුව සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බව මහාමාර්ග ඇමැතිවරයා මෙහිදී ප්‍රකාශ කරන ලදී.

කිලෝමීටර් ලක්ෂයේ ව්‍යාපෘතිය මගින් කාපට් අතුරා සංවර්ධනය කිරීමට මේවන විට හඳුනාගත් ග්‍රාමීය මාර්ගවල ඇති අබලන් බෝක්කු, පාලම්, කානු පද්ධතීන් ,මාර්ග සංඥා පුවරු යනාදිය ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස ඇමැතිවරයා මෙහිදී නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

කැඩිබිදී අබලන්ව වල්වැදී තිබෙන අතිදූෂ්කර ග්‍රාමීය මාර්ග වැඩි දියුණුකර ගම හා නගරය යා කිරීම කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ බව පැවසූ ඇමැතිවරයා එම මාර්ග ආශ්‍රිතව ජීවත් වන ජනතාව මුණ ගැසී ඔවුන් සමග සාකච්ඡා කර කඩිනමින් මෙම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තමන් කටයුතු කරන බව පැවසීය.

# නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කළා

## අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දිනයට පණිවිඩයක් නිකුත් කරමින් අගමැති කියයි

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම අප රජය බලයට පත් වූ සෑම අවස්ථාවකම සිදු කර තිබෙන බව අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දිනයට පණිවුඩයක් නිකුත් කරමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා පවසයි.

එම නිවේදනයේ මෙසේද සඳහන් වේ.

"අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දිනය ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදයේ තත්ත්වය සමාලෝචනය කිරීමට අවස්ථාවක් සපයයි" ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කළ රටක අග්‍රාමාත්‍යවරයා වශයෙන් අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දිනයට සමගාමීව පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම ප්‍රථමයෙන් සතුටට පත් වෙමි.

ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා තහවුරු කිරීම සඳහා ලොව රටවල් දිරිමත් කරමින් 2007 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සෑම වසරකම සැප්තැම්බර් 15 වන දා අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දිනය ලෙස නම් කළේය.

වත්මන් මිනිස් සමාජය තුළ සියල්ලෝම තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් තහවුරු විය යුතු බව විශ්වාස කරති. ඔවුන්ගේ ජීවිතය නිදහස හා සතුට ලැබීමේ අයිතිය රැක දීම ප්‍රජාතන්ත්‍රවාදයේ පරමාර්ථය විය යුතු බව අපි විශ්වාස කරමු.

අපේ රටේ ජනතාවගේ ජීවත්වීමේ අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමට ජීනීවා මානව හිමිකම් කවුන්සලයට පිය නැගූ අතීතය මේ මොහොතේදී ද මාගේ සිහියට නැගේ. ත්‍රස්තවාදය නිමා කරමින් රටට සාමය උදාකොට අපි එදා ප්‍රාර්ථනා කළේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමයි.

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අප බලයට පත් වන සෑම අවස්ථාවකම පෙනී සිටීමට හැකි වීම රටක් ලෙස ආඩම්බර විය හැකි කරුණකි. මැතිවරණ නොපවත්වන ආණ්ඩුවලට එරෙහිව පෙළ ගැසෙමින් රටේ ජනතාව සමඟ ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණය උදෙසා අපි කටයුතු කළෙමු.

ඉදිරියටත් නිදහස් හා සාධාරණ මැතිවරණ නියමිත කාල තුළ පවත්වමින් ජනතාව අප කෙරෙහි තැබූ ප්‍රජාතන්ත්‍රවාදයේ උතුම් හරයන් රැකීමට රජයක් ලෙස අපි කැප වන බව ප්‍රකාශ කරමු.

ප්‍රජාතන්ත්‍රවාදය රැක ගනිමින් නිදහස්, නිවහල්, ස්වෛරී රාජ්‍යයක් ලෙස අනාගත ලොවට පිය නගන්නට ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී දිනය යෙදෙන අද දිනයේ මම සියලු ශ්‍රී ලාංකිකයන්ට ආරාධනා කර සිටිමි.

# අමරසේන වඩුගේ අභාවප්‍රාප්ත වෙයි

ප්‍රවීණ ටෙලිනාට්‍ය සහ වේදිකා නාට්‍ය නිෂ්පාදක අමරසේන වඩුගේ මහතා පෙරේදා (13) අභාවප්‍රාප්ත විය.

මිය යන විට වයස අවුරුදු 63ක් වූ ඒ මහතා ටෙලි නිර්මාණවේදී සංසදයේ විධායක සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අයෙකි.

වසර 35ක් පමණ වේදිනා නාට්‍ය නිෂ්පාදකවරයෙකු ලෙස කටයුතු කර ඇති ඒ මහතා වසර 20ක් පමණ ටෙලි නාට්‍ය නිෂ්පාදකවරයෙකු ලෙස කටයුතු කර ඇත. ඒ මහතා 1978 දී සවිස්වන්ද්‍ර එදිරිසිංහ මහතා අධ්‍යක්ෂණය කළ අපායේ අවුරුදු වේදිකා නාට්‍යයේ නිෂ්පාදකවරයා ලෙස ඒ මහතා කටයුතු කර ඇත.

සුදු මල් කන්ද, අරුණලු කිරණ, ධරණි යන ටෙලි නාට්‍ය නිෂ්පාදනය සඳහා ඒ මහතා දායක වී ඇත. දේහය පිළිබඳ අවසන් කටයුතු අද (15) දින පන්නිපිටිය සුසාන භූමියේදී පස්වරු 6.00ට සිදුකෙරේ.

# නාවික හමුදාවේ නව මාණ්ඩලික ප්‍රධානි රියර් අද්මිරාල් කපිල සමරවීර

**මහින්ද අලුත්ගෙදර**

නාවික හමුදාවේ නව මාණ්ඩලික ප්‍රධානියා වශයෙන් රියර් අද්මිරාල් කපිල සමරවීර මහතා පත්කර තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පසුගිය 12 දා සිට ක්‍රියාත්මක වන පරිදි මේ පත්කිරීම සිදුකර තිබෙන අතර නාවික හමුදාපති, වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා අතින් අදාළ පත්වීමේ ලිපිය රියර් අද්මිරාල් කපිල සමරවීර මහතා වෙත නිල වශයෙන් ප්‍රදානය කිරීම ඊයේ (14) සිදුවිය. එහිදී නාවික හමුදාපතිවරයා විසින් නව තනතුරේ වැඩ භාරගත් රියර් අද්මිරාල් කපිල සමරවීර මහතා වෙත සිය සුභපැතුම් එක්කළේය.

රියර් අද්මිරාල් කපිල සමරවීර මහතා දෙහිවල මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වන අතර 1985 වර්ෂයේ 13 වන ශිෂ්‍යභට බඳවා ගැනීමට අයත් ශිෂ්‍යභට නිලධාරියෙකු වශයෙන් නාවික හමුදා විධායක අංශයට එක්ව තිබේ. නාවික හා සාගරික විද්‍යාපීඨයෙන් මූලික පුහුණුව සාර්ථක ලෙස අවසන් කර 1987 වසරේ අප්‍රේල් 07 වන දින උප ලුතිනන් වරයෙකු වශයෙන් අධිකාරියට පත්වන ඒ මහතා සිය තාක්ෂණික උප ලුතිනන් පාඨමාළාව 1987 දී පාකිස්තානයේ දීද එතැන් සිට ක්‍රමානුකූලව උසස් වීම් ලබමින් පසුගිය 2016 වසරේ අගෝස්තු මස 23 දා රියර් අද්මිරාල් නිලයට ද උසස් වීම් ලැබ ඇත.

සිය සේවා කාලය තුළ ශ්‍රී ලංකා නාවික හමුදාවේ විවිධ භාරධූර නිලතල රාශියක් දරා ඇති රියර් අද්මිරාල් කපිල සමරවීර මහතා වේග ප්‍රහාරක මුර යාත්‍රාවන්හි අණභාර නිලධාරි ලෙස සහ ශ්‍රී ලංකා නාවික නෞකා සමුදුර, උදාර, රණධීර, හංසයා ආදී නෞකාවන්හි අණදෙන නිලධාරි වශයෙන් ද රාජකාරි සිදුකොට ඇත. වැලිසර නාවික අණභාර නිලධාරි, අධ්‍යක්ෂ ජෙනරාල් (සම්බන්ධීකරණ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා නාවික නෞකා නිපුණ ආයතනයේ ආඥාපති, දකුණු නාවික විධානයේ නියෝජ්‍ය ආඥාපති, අධ්‍යක්ෂ නාවික පුද්ගල, ධජ නිලධාරී නාවික දියත් විධානය, දකුණු නාවික විධානයේ ආඥාපති, වශයෙන් රාජකාරි සිදුකර තිබෙන ඒ මහතා නාවික හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී හා උතුරු නාවික විධානයේ ආඥාපති වශයෙන් කටයුතු කර තිබේ.

රියර් අද්මිරාල් කපිල සමරවීර මහතා අවස්ථා කිහිපයකදිම ඉන්දියාව, පාකිස්තානය, බංගලාදේශය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල්වලදී උසස් නාවික පුහුණු පාඨමාළාවන් හදාරා ඇති අතර, දියයධ සංග්‍රාම පිළිබඳ විශේෂඥයකු ලෙස සැලකෙන ඔහු ඒ සඳහා වැඩිදුර පුහුණුව පාකිස්ථානයේ කරච්චි පිහිටි පාකිස්ථාන නාවික හමුදාවේ දියයට සංග්‍රාමික පාසලේදී හදාරා ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ යෝක් ටවුන් හි පිහිටි ඇමරිකානු වෙරළාරක්ෂක පුහුණු මධ්‍යස්ථානයේ දී ජාත්‍යන්තර නාවික නිලධාරීන්ගේ පුහුණු පාඨමාළාව හදාරා ඇති අතර බංගලාදේශ ජාතික ආරක්ෂක විද්‍යාලයේ ද විද්‍යාර්ථයෙකි.

1987 වර්ෂයේ සිට ත්‍රස්තවාදය මැඩලීම සඳහා මුහුදින් සහ ගොඩබිමින් සක්‍රීයව දායකත්වය ලබාදුන් ඒ මහතා මවිබිම වෙනුවෙන් ඉටුකළ අනගිභවනීය මෙහෙවර වෙනුවෙන් රණශූර පදක්කම තෙවතාවක් දිනා ගැනීමට සමත්වී ඇත. සේවා කාලය මුළුල්ලේ පෙන්නුම් කල නොකැළැල් චරිත ස්වාභාවය වෙනුවෙන් විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කමෙන් ද පිදුම් ලබා ඇති අතර මනා කැපවීම සහ මඟපෙන්වීම ඇගයීම සඳහා නාවික හමුදාපතිතුමන් විසින් අවස්ථාවන් 06ක දීම ප්‍රශංසාත්මක ලිපි ප්‍රදානය කර ඇත.

ඉතා දක්ෂ ක්‍රීඩකයෙකු මෙන්ම අතිශූර ක්‍රීඩා පරිපාලන නිලධාරියෙකු වන ඔහු 2003 සිට 2013 දක්වා වන කාලය තුල ශ්‍රී ලංකා නාවික හමුදා මල්ලව පොර සහ ජූඩෝ සංවිතයන්හි සභාපතිත්වය දරා ඇති අතර, 2004 සහ 2009 වර්ෂයන්හි සිට 2012 වර්ෂය දක්වා ශ්‍රී ලංකා නාවික හමුදා වුෂු සහ කරාතේ සංවිතවල ආරම්භක සභාපතිත්වය දරා තිබේ.

# රිෂාඩ් බදියුදීන්, එම්.එච්.ඒ. හලීම් පාස්කු කොමිසමේ පොලිස් ඒකකයට එති

**සුභාෂිණී සේනානායක**

යහපාලන රජයේ හිටපු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමැති රිෂාඩ් බදියුදීන් සහ තැපැල් හා මුස්ලිම් ආගමික කටයුතු ඇමැති එම් එච් ඒ හලීම් යන මහත්වරුන් පාස්කු ප්‍රහාරය සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසමේ පොලිස් ඒකකය වෙත ඊයේ 14 පැමිණියේය.

කොමිසමේ පොලිස් ඒකකයෙන් සිදු කළ දැනුම් දීමකට අනුව ප්‍රකාශයක් ලබා දීමට ඔවුන් දෙදෙනා පෙරවරු 9.30ට පොලිස් ඒකකය වෙත පැමිණ තිබුණි. හිටපු අමාත්‍ය හලීම් මහතා පොලිස් ඒකකයෙන් පස්වරු 3.30ට පිටත්ව ගිය අතර රිෂාඩ් බදියුදීන් මහතා පස්වරු 5.45ට පමණ කොමිසමේ පොලිස් ඒකකයෙන් පිටව ගියේය.

# ඩුප්ලිකේෂන් උත්සව ශාලාව පුරපතිනිය අතින් අද විවෘත කෙරේ

**මැදකොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**

නාගරික මන්ත්‍රී අමිල ප්‍රමිත් පෙරේරා මහතාගේ යෝජනාවකට අනුව නවීකරණය කරන ලද කොල්ලුපිටිය ආර්.ඒ. ද මැල් මාවතේ පිහිටි ඩුප්ලිකේෂන් උත්සව ශාලාව කොළඹ පුරපතිනි රෝසි සේනානායක මහත්මිය අතින් අද (15) ප.ව.5.00ට විවෘත කෙරේ. නියෝජ්‍ය පුරපති අල්හාජ් එම්.ටී.එම්. ඉක්බාල් මහතා ඇතුළු නාගරික මන්ත්‍රීවරු රැසක් මේ අවස්ථාවට සහභාගි වෙති.

# ඉදිරියේදී එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සඳහා ඉදිරිපත් වනවා

## නියෝජ්‍ය නායක රුවන් විජේවර්ධන

**ශිරෝමි අබයසිංහ සහ හිරන්ත ගුණතිලක**

ඉදිරියේදී එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සඳහා ඉදිරිපත් වන බව අභිනවයෙන් පත් වූ එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පැවසීය.

නියෝජ්‍ය නායකත්වයට පත් වීමෙන් පසු සිරිකොත පක්ෂ මූලස්ථානය ඉදිරිපිටදී මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා මේ බව පැවසීය. පාක්ෂිකයින්ගේ විශ්වාසය යළි දිනා ගෙන පක්ෂය වැටී සිටින තත්ත්වයෙන් යළි ගොඩ ගෙන යළි නිසි තැනට ගෙන ඒමට තමාට ශක්තිය ඇති බව විශ්වාස කරන බවද විජයවර්ධන මහතා පැවසීය. පාක්ෂිකයින්ද ඒ සඳහා කැප වී ක්‍රියා කරනු ඇති බව තමාට විශ්වාස බව පැවසූ ඒ මහතා ඉතාමත් කෙටි කලකින් පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු සිදු කර අලුත් මුහුණුවරකින් පක්ෂය රටට ඉදිරිපත් කරන බවද ජනතාවගේ විශ්වාසය සහ හදවත දිනා ගෙන ඉදිරි මැතිවරණ ජයග්‍රහණය කරා ගෙන යන බවද අවධාරණය කළේය.

නියෝජ්‍ය නායකත්වය ලබා ගැනීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සහයෝගය තමාට ලැබෙනු ඇතැයි විශ්වාසයෙන් සිටි බවත් තමා සමග තරඟ වැදුණු රවි කරුණානායක මහතා සමග සුහදව කටයුතු කරන බවද කීය.

ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රී පුරප්පාඩුවට රනිල් වික්‍රමසිංහ මහතා පත් කළ යුතු බව පක්ෂයේ බොහෝ දෙනාගේ අදහස තිබෙන බවත් 20 වැනි සංශෝධනය සහ මරණීය දණ්ඩනය නියම වූ අය පාර්ලිමේන්තුවේ දිවිරුම් දීම වැනි ආණ්ඩුවේ ඒකාධිපති ක්‍රියාවන්ට විරෝධය දැක්වීමට රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුවේ සිටිය යුතු බව පැවසූ විජේවර්ධන මහතා වික්‍රමසිංහ මහතා තවම ඒ ගැන තීරණයක් ගෙන නොමැති බවද කීය.

# මව්වරුන් සමඟ සිරගතව සිටින දරුවන් සම්බන්ධ වාර්තාව අගමැති අතට

මව්වරුන් සමග සිරගතව සිටින අවුරුදු 05ට අඩු දරුවන් සම්බන්ධ නිරීක්ෂණ වාර්තාව අද (15) අගමැති මහින්ද රාජපක්ෂ මහතාට භාරදීමට නියමිතය.

මව්වරුන් සමග සිරගතව සිටින අවු.5ට අඩු දරුවන් සම්බන්ධව සොයා බලන ලෙස අගමැතිවරයා විසින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය වෙත සිදු කළ දැනුම්දීම මත ඒ පිළිබඳ සොයා බලා රාජ්‍යඇමැතිවරිය විසින් සිය නිරීක්ෂණ ඇතුළත් වාර්තාව අගමැතිවරයාට අරලියගහ මන්දිරයේදී බාරදීමට නියමිතය.

විවිධ අපරාධ සම්බන්ධයෙන් සිරගතව සිටින අවුරුදු 5ට අඩු දරුවන් සහිත කාන්තා රැඳවියන් 47 දෙනෙකු සිටින අතර ඉන් රැඳවියන් 5 දෙනෙකු වැරදිකාරියන් ලෙස දඬුවම් විඳින අයවලුන්වේ. දෙදෙනෙකු අභියාචනා මත හා 40 දෙනෙකු රිමාන්ඩ් සිරකාරියන් ලෙස බන්ධනාගාරගතව සිටී. මොවුන් සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් විශේෂයෙන් දරුවන් සම්බන්ධව ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳවත් විවිධ ආයතන හා පුද්ගලයන් සමග සාකච්ඡා කල රාජ්‍ය ඇමැතිවරිය සිය මූලික නිරීක්ෂණ ඇතුළත් වාර්තාව සකස්කර තිබේ.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය, පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව, අන්තර්ජාතික රතුකුරුස සමාජය (ICRC), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEP), මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳඑක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) ආදී ආයතන සමග අගමැතිවරයා සහ රාජ්‍ය ඇමැතිවරිය සාකච්ඡා කිරීමටද නියමිතය.

# පුත්තලම වන විනාශ සොයන්න විශේෂ කමිටුවක්

**අසේල ලියනගේ**

පුත්තලම දිස්ත්‍රික්කයේ සිදු වන මහාපරිමාණ වන විනාශයන් පිළිබඳ තොරතුරු සැපයීම සඳහා දිස්ත්‍රික් රාජ්‍ය ආයතන කීපයක ප්‍රධානීන්ගෙන් සමන්විත විශේෂ කමිටුවක් වනජීවි හා වනසංරක්ෂණ ඇමැති සී.බී රත්නායක මහතා පත්කළේය. ඒ මහතා එම විශේෂ කමිටුව පත් කළේ ඊයේ (14) දින පුත්තලම දිසාපති කාර්යාලයේ පැවති විශේෂ සාකච්ඡාවකට එක් වෙමිනි. සාකච්ඡාවෙන් අනතුරුව වන සංහාරයට ලක්වූ ආනවිලුන්දාව රැම්සා තෙත් බිම බිමේ සහ සිමෙන්ති සංස්ථාවේ සතු ඉඩමේ නිරීක්ෂණ චාරිකාවක් සඳහා එක්විය.

එම කමිටුව සඳහා පුත්තලම දිසාපතිවරයා, පුත්තලම දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පති, පුත්තලම දිස්ත්‍රික් අඩවි වන නිලධාරී, දිස්ත්‍රික් වන සංරක්ෂණ නිලධාරී, සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ පරිසර සංවිධාන කැඳවුම්කරුවන් නියෝජනය වේ.

මෙම නිලධාරීන් දිස්ත්‍රික්කය තුළ සිදුවන වන විනාශයන් පිළිබඳව පොලිස් නිලධාරීන් සඳහා ඉක්මනින් තොරතුරු සැපයිය යුතු අතර නැවත පුත්තලම දිස්ත්‍රික්කයේ වන විනාශයන් නැවැත්වීමට පියවර ගතයුතු ඇමැතිවරයා එම නිලධාරීන්ට උපදෙස් දුන්නේය. පරිසර කමිටු සහ ප්‍රජා පොලිස් ඒකකය හරහා වන විනාශයන් පිළිබඳව තොරතුරු ලබාගන්නා ලෙස පුත්තලම් දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට විශේෂ නියෝගයක් ඇමැතිවරයා එහිදී ලබාදුන්නේය.

# එකම ජාතික පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 123ට ජාතික පාසලක්

**සිතාරා සේනානි,**

මෙරට ජාතික පාසල් සංඛ්‍යාව 1,000 දක්වා ඉහළ නැංවීමේ රජයේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී දැනට එකම ජාතික පාසලක් හෝ පිහිටුවා නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 123 සඳහා පළමුව ජාතික පාසල් පිහිටුවීම කෙරෙහි අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතාගේ අවධානය යොමු වී තිබේ.

මෙම කොට්ඨාසවල අඩු පහසුකම් යටතේ දැනට ක්‍රියාත්මක පාසල් තෝරා ගෙන ඒවාට අවශ්‍ය සියලු පහසුකම් ලබා දී ජාතික පාසල් තත්ත්වයට පත් කිරීම අධ්‍යාපන ඇමැතිවරයාගේ අදහස බව මේ සම්බන්ධයෙන් දිනමිණ කළ විමසුමකදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා පැවැසීය.

සමාන හා ගුණාත්මක අධ්‍යාපනයක් සෑම දරුවකුටම ලබා දීම අරමුණු කර ගනිමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම පහසුකම්වලින් අංගසම්පූර්ණ පාසල් 03 බැගින් සංවර්ධනය කර එම පාසල්, ජාතික පාසල් ලෙස උසස් කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000 දක්වා ඉහළ නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කර ඇති අතර, ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ද හිමිය.

# කොළඹ රිමාන්ඩිහි යළි ජංගම දුරකතන හමු වෙයි

**බුද්ධිකා ඉඹුලාන**

කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ ඊයේ (14) දහවල් සිදු කළ සෝදිසි මෙහෙයුමකදී එහි 'ඩී' සිරමැදිරියේ තිබී ජංගම දුරකතන 7ක්,චාජර් 03ක්, හෑන්ඩ් ෆ්‍රී 02ක්, ඩේටා කේබලයක් ඇතුලු උපාංග සොයාගැනීමට එම බන්ධනාගාර නිලධාරීන් සමත්වී තිබේ.

මෙම ජංගම දුරකථන අතර ස්මාර්ට් වර්ගයේ දුරකථන 03ක් ද තිබී ඇත.

එම ජංගම දුරකථන ඇතුළු උපාංග 'ඩී' සිරමැදිරියේ බිත්තිවල කුහර සාදා ඉතා සූක්ෂ්ම ලෙස රඳවා තිබූ බව වාර්තා වේ. මෙම ජංගම දුරකථන ඇතුලු උපාංග වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා බොරැල්ල පොලිසියට භාර දී ඇත.

එම බන්ධනාගාර අධිකාරි සමන්ත අලහකෝන් මහතාගේ උපදෙස් පරිදි ප්‍රධාන ජේලර් කේ.බී.ඒ. උදයකුමාර මහතාගේ මෙහෙයවීමෙන් මෙම සෝදිසි මෙහෙයුම සිදු කර තිබේ

# 20 වැනි සංශෝධනය ගැන ආණ්ඩුව ඇතුළේ මත ගැටුමක් තිබෙනවා

## සමඟි ජන බලවේගය අවධාරණය කරයි

**ශිවන්ති ප්‍රනාන්දු**

විසි වැනි සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුව තුළ මතගැටීම් නිර්මාණය වී ඇති බවත් ඒ අනුව එම කෙටුම්පත පරාජය කිරීමට සියලු බලවේග ඒකරාශී කර ගැනීමට කටයුතු සැලසුම් කර ඇති බවත් සමඟි ජන බලවේගය අවධාරණය කරයි.

කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (14) පැවති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන තිස්ස අත්තනායක සහ නලීන් බණ්ඩාර යන මහත්වරු මේ බව අවධාරණය කළහ.

එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා මෙසේ පැවසීය.

සමගි ජන බලවේගයේ සංවිධාන කටයුතු මේ සතියේ ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. පසුගිය මැතිවරණයට අපිට සම්බන්ධ වෙන්න ලැබුණේ කඩිමුඩියේ. සංවිධාන ජාලය සකස් කර ගන්න අපිට වැඩි කාලයක් තිබුණේ නෑ. ඉදිරි වැඩපිළිවෙළ නියාමක ව්‍යුහයක් වශයෙන් ගාල්ලෙන් සහ මාතරින් සැප්තැම්බර් 19 සහ 20 අපි ආරම්භ කරනවා. ඡන්ද මධ්‍යස්ථාන මට්ටමින් ශාඛා ජාලය ගොඩ නගන්න අපි කටයුතු කරනවා. මේ සඳහා අපේ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල හිටපු මන්ත්‍රීවරුන් සම්බන්ධ වෙනවා. සමගි ජන බලවේගයේ සාමාජිකයන් බඳවා ගැනීමේ ව්‍යාපාරය 2021 වර්ෂය සඳහා ආරම්භ කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. එය මේ මාසය අවසන් වීමෙන් පසුව දීපව්‍යාප්ත වැඩසටහනක් හැටියට ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ආණ්ඩුව පළාත් සභා මැතිවරණය පැරණි ක්‍රමයටද අලුත් ක්‍රමයටද කියා කුමන ආකාරයට පවත්වනවා දැයි අපි තවම දන්නේ නෑ. පළාත් සභා මැතිවරණය පැරණි විදිහට පවත්වනවා නම් සමඟි ජන බලවේගය ඒ සඳහා සූදානම් වෙනවා. මේ වෙද්දි පළාත් සභා අහෝසි වෙලා සෑහෙන්න කාලයක් ගත වෙලා තියෙනවා. පළාත් සභා යළි ක්‍රියාත්මක කරන්නට ආණ්ඩුව සූදානම් බව ආණ්ඩුව පවසනවා. ඒ නිසා පළාත් සභා මැතිවරණයට සමඟි ජන බලවේගය නියෝජනය කරමින් ඉදිරිපත් වීමට කැමති තරුණ, විද්වත් ව්‍යක්තිකයන්ට අවකාශය දෙන්න අපි කටයුතු සූදානම් කරලා තිබෙනවා. විශේෂයෙන් අපේ පක්ෂයේ නායක සජිත් ප්‍රේමදාස මහතා ඉල්ලා සිටියා පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට සහභාගි වී පරාජයට පත් වූ සියලු සංවිධායකයන්ගෙන් ඉදිරියේදී පළාත් සභා මැතිවරණයට තරග කරන ලෙස. සමඟි ජන බලවේගය ඒ සඳහා බිම් මට්ටමින් කටයුතු සංවිධානය කර තිබෙනවා.

ඊළඟ සාකච්ඡාව තමයි ආණ්ඩුවේ 20 වැනි සංශෝධනය ගැන කතිකාව දැන් වෙනත් පැත්තකට ගිහින් තිබෙනවා. ආණ්ඩුව රටේ සියලු ප්‍රශ්න විසඳලා ඉවරයි වගේ සලකා, 19 වැනි සංශෝධනය ඉවත් කරලා, 20 වැනි සංශෝධනය කැබිනෙට්ටුවට ඉදිරිපත් කරලා එය ගැසට් එකටත් ඇතුළත් කළා. නමුත්, දහනව වැනි සංශෝධනයට ඇතුළත් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 20 වැනි සංශෝධනයෙන් යටපත් කර තිබීම ඉතා භයානක තත්ත්වයක්. 19 වැනි සංශෝධනයේ ඇති අඩුපාඩු අපි පිළිගන්නවා. ආණ්ඩුව කරන්න ඕනෑ එහි ගැටලු සංශෝධනය කිරීම විනා ප්‍රජාතන්ත්‍රවාදී මූලික ලක්ෂණ යටපත් කිරීම නොවෙයි. දැන් මේකට එල්ල වෙන ජනතා විරෝධය නිසා ආණ්ඩුවට රිදීමක් වෙලා තියෙනවා. අගමැතිතුමා නියෝග කරලා තියෙනවා 20 ගැන කමිටුවක් පත් කරන්න. ආණ්ඩුව කවුරු විරුද්ධ වුණත් මේක ගේනවා කිව්වා. අපිට පේන හැටියට ආණ්ඩුව ඇතුළේ මේ ගැන මතගැටීම් ඇති වෙලා තියෙනවා. ආණ්ඩුවේ ඇතැම් මන්ත්‍රීවරුන් කියනවා ව්‍යවස්ථා සංශෝධනයකින් ජනතාවගේ බඩකට පිරෙන්නේ නැහැ කියා. අපිත් කියන්නේ ඒක. රටේ ණය බර වැඩි වෙලා. ආර්ථිකය කඩන් වැටිලා. කොරෝනා නිසා රටේ ලක්ෂ 10ක රැකියා අහිමි වී තිබෙනවා. විනිමය අනුපාතය පහළ බැස තිබෙනවා. ජී.එල්. පීරිස් ඇමැතිවරයා ප්‍රකාශයක් කරලා තියෙනවා 20 වැනි සංශෝධනය නැවතත් කැබිනට් එකට යවන්න ඕනෑ කියලා. ඒ අපි ඒ ගැන දැක්වූ විරෝධය නිසා. 20 වැනි සංශෝධනයෙන් ඇත්තටම වෙන්නේ ජනාධිපතිවරයා ශක්තිමත් කරමින් අගමැතිවරයා පියන් කෙනෙක් බවට පත් කිරීමයි. විස්ස කවුද ගෙනාවේ කියන එක දැන් කවුරුත් දන්නේ නෑ. අධිකරණ ඇමැතිවරයා 20 වැනි සංශෝධනය තමන් ඉදිරිපත් කළාට සකස් කෙළේ කවුද දන්නේ නැහැ කියනවා. විමල් වීරවංශ ඇමැතිවරයාත් කියනවා මේකේ පිතෘවරයෙක් දන්නේ නැති බව. 20 වැනි සංශෝධනය දැන් පියෙක් නැති දරුවෙක් වගේ. ලංකාවේ කිසිම දවසක මෙවැනි පනතක්, සංශෝධනයක් ගෙනල්ලා නැහැ. මේකේ තියෙන භයානක කාරණා අපි දිහින් දිගටම කිව්වා. මේ 20 වැනි සංශෝධනයෙන් කැබිනට් එක වැඩි කරන්න ජනතාව ඉඩ දීලා නෑ. ජනාධිපතිවරයාගේ බලය වැඩි කරන්න ජනතාව ඉඩ දීලා නෑ. ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට පත් වීමේ අයිතිය ජනතාව තහවුරු කරලා නෑ. කොමිෂන් සභා අහෝසි කරන්න නොවෙයි ජනතාව රාජ්‍ය පාලනයට ඉඩ දුන්නේ. රාජ්‍ය ආයතනවලට අයත් සමාගම් 120ක විගණනය මේ 20 වැනි සංශෝධනයෙන් බැහැර වෙනවා. මේක ද ජනතාව බලාපොරොත්තු වූ වෙනස?

සමගි ජන බලවේගය 19 රැක ගැනීමේ ජනතා ව්‍යාපාරය ආරම්භ කළා. දහනවය ප්ලස් මූලික කරගනිමින් සම්මන්ත්‍රණ මාලාවක් ක්‍රියාත්මක කිරීමට අප කටයුතු යොදා තියෙනවා. 19 වැනි සංශෝධනය විසි කරලා, 20 වැනි සංශෝධනය ගේන්න ආණ්ඩුවට සහාය දෙන්න මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට හරි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හරි පුළුවන්ද? .ඔවුන් 19 ගේන්න යහපාලනය එක්ක එකට එකතු වෙලා වැඩ කෙළේ. අලි සබ්බි ඇමැතිවරයාගේ කතාවෙන් පේනවා ආණ්ඩුව අසරණ වී ඇති ආකාරය. තවත් මේ 20 වැනි සංශෝධනය ගැන කතා කර වැඩක් නෑ. ඒ නිසා වහාම මේ 20 වැනි සංශෝධනය එරෙහිව මැදිහත් වන්නැයි ඉල්ලා සිටිනවා.

ආණ්ඩුව රටේ ආර්ථික තත්ත්වය බාල්දු කරනවා. රටේ ප්‍රධාන ආදායම් මාර්ගය වන සංචාරක කර්මාන්තයට පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ බලපෑමක් වුණා. ඉන් පස්සේ කොරෝනා නිසා බලපෑමක් වුණා. සංචාරක කර්මාන්තයෙන් ජීවිකාව කරගත් වක්‍ර සහ සෘජු රැකියා කළ ලක්ෂ 20කට බලපෑමක් වෙලා තියෙනවා. මේවා ගොඩනගන්න වෙන්නේ කොහොමද? රටේ ආර්ථිකයෙන් තුනෙන් 01ක් කඩන් වැටිලා වගේම දිගුකාලීනව මේ ගැන නරක බලපෑමක් වෙලා තියෙනවා. සංචාරක හෝටල් හිමියන්, මග පෙන්වන්නන්, ප්‍රවාහන නියෝජිත ආයතන, ආදායම් ලැබූ මැණික් හා ස්වර්ණාභරණ, හස්ත කර්මාන්ත, රෙදි වෙළෙඳාම් කළ අයට මෙය බලපා තිබෙනවා. ආර්ථික විශේෂඥයකු වන ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර මහත්තයා කියනවා සංචාරක කර්මාන්තය කඩන් වැටීම ගණන් ගන්න දෙයක් නෑ කියලා. 83 කළු ජූලියේදී, 87-89දී, 2004 සුනාමිය ආ කාලයේදී, 2019 පාස්කු ප්‍රහාරය, 2020 කොවිඩ් නිසා මේ වගේ සංචාරක කර්මාන්තය බිඳ වැටුණා. කොවිඩ් මුල් කාලයේ ආණ්ඩුව ජනතාවට කෙටිකාලීන සහනයක් දුන්නා. අපි කියන්නේ මූලික ප්‍රාග්ධන, ජල හා විදුලි බිල්පත්වලට සහන දෙන්න. මෙම කර්මාන්තකරුවන්ට ගොඩ යෑමට දස වසරක දීපව්‍යාප්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. රට ගොඩගැනීමට ආණ්ඩුව තවමත් වැඩ ආරම්භ කර නෑ. ඒ වෙනුවට මීඩියා සංදර්ශන පවත්වනවා. රටට ආදරේ, අවංක වුවමනාව තියෙනවා නම් තුනෙන් දෙකේ බලයත් අරගෙන දේශපාලන කණිනාඩි නොදා අලුත් වැඩපිළිවෙළක් ආරම්භ කරන ලෙස මම ඉල්ලනවා.

මන්ත්‍රී නලීන් බණ්ඩාර මහතා ද අදහස් දැක්වීය.

**ඡායාරූපය- සාලිය රූපසිංහ**


JETECH
ස්කුරුප්පුව
උසස් තත්වයේ නිපැයුම්
Sole Distributor රු. 175/- සිට
සී/ස. ජෙනරල් ඉක්යුප්මන්ට්ස් (පුද්) සමාගම
316 & 400, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 12.
දුරකථනය: 011 2327264, 011 2343822, 011 2343823, 011 2345046, 011 2430799, ෆැක්ස්: 011 2434637. ඊ-මේල්: gel@itmin.net

ESNA විදුලි ජෙනරේටර්
6000 වැඩිසෙන් ශ්‍රී ලංකාවේ භාවිතාවේ
3kva සිට 4200kva
මිල රු. 180,000/= සිට ඉහළට
0768 232 305
0773 116 611
ෆැක්ස්: 011 2694013
ඊමේල්: ceo@esnaallied.com වෙබ්: www.esnaallied.com

129

**ටයර් සහ ටියුබ්**

සේවා

ටයර් ටියුබ් එකම වහලක් යටදී. සියලුම ටයර් වර්ග ෆෝක්ලිෆ්ට් හුලං සහ ගල් ටයර් 600x9, 700x12, 650x10, 28x9x15 700x15 සියලුම ක්‍රෙඩිට් කාඩ් භාරගනිමු. විශේෂ මිලට. 1000x20ARP Dag Tyres, 155, ක්‍රව්න් ටයර් කොළඹ 14. 0773134060, 0759889881. *053165*

322

**ඇබෑර්තු**

මේසන්වරු/වඩුබාස්වරු

ඇබෑර්තු - කඩුවෙල පිහිටි EnTec ඉදිකිරීම් සමාගමේ නිවාස ව්‍යාපෘතීන්ට පළපුරුදු පෙදරේරුවරු, ජලනල කාර්මිකයන් සහ අත්උදව්කරුවන් වහාම අවශ්‍ය වී ඇත. එම ව්‍යාපෘතීන් මීගමුව, ජා-ඇල, අත්තිඩිය, කැළණිය, පානදුර සහ කොළඹ ප්‍රදේශවල පිහිටා ඇත. නවාතැන් පහසුකම් සහිතව පළපුරුද්ද සහ දක්ෂතාවය අනුව ක්ෂේත්‍රයේ තරගකාරී වැටුප් සහ දීමනා සති දෙකකට වතාවක් ගෙවනු ලැබේ. විමසීම් : 076-5370707 / 077-5801402 *054879*

## නිවැරදි කිරීමකි

**වැවිලි අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව**
**ඇබෑර්තු**

2020 සැප්තැම්බර් මස 09 දින දිනමිණ පුවත්පතේ 19 පිටුවේ පළවූ දැන්වීමේ **"අභ්‍යාසලාභී"** ලෙස සඳහන්වන තනතුරු **"පුහුණු"** යනුවෙන් නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න. පෙර පළකරන ලද දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

- **පුහුණු ලිපිකරු**
- **පුහුණු කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී,**
- **පුහුණු කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී**
- **පුහුණු සුබසාධන නිලධාරී**

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**කොළඹ 12.**

## ධන නිධානය නිල ප්‍රතිඵල

NLB NATIONAL LOTTERIES

**දිනය - 2020/09/13**

**දිනුම් වාරය - 315**

F — ඉංග්‍රීසි අක්ෂරය

18 39 57 65 — ජයග්‍රාහී අංක

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 04 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 61 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 108 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 2,970 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 2,005 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 50,383 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 9,527 |

**දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,306,500.00**
**බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 65,058**

**මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය**
**116,580,205.44**

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

## 2020-09-13 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 588,854

## ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 24,748,720.00

**රු. 2,000,000.00 ත්‍යාග 01 රු. 1,000,000.00 ත්‍යාග 02 රු. 100,000.00 ත්‍යාග 26**

www.nlb.lk

**දිනුම් වාරය - 4244 නිල ප්‍රතිඵල**

## මහජන සම්පත

**දිනය: 2020-09-13**

ජයග්‍රාහී අක්ෂරය: E ජයග්‍රාහී අංක: 5 6 8 9 7 8

**ත්‍යාග රටාව - අග සිට මුලට**

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 5 6 8 9 7 8 | රු. 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | 6 8 9 7 8 | රු. 100,000/- | 07 |
| 3 වැනි ත්‍යාගය | 8 9 7 8 | රු. 10,000/- | 95 |
| 4 වැනි ත්‍යාගය | 9 7 8 | රු. 1,000/- | 906 |
| 5 වැනි ත්‍යාගය | 7 8 | රු. 100/- | 9,170 |
| 6 වැනි ත්‍යාගය | 8 | රු. 20/- | 90,404 |

**ත්‍යාග රටාව - මුල සිට අගට**

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 5 6 8 9 7 | රු. 10,000/- | 10 |
| 8 වැනි ත්‍යාගය | 5 6 8 9 | රු. 1,000/- | 86 |
| 9 වැනි ත්‍යාගය | 5 6 8 | රු. 100/- | 920 |
| 10 වැනි ත්‍යාගය | 5 6 | රු. 50/- | 9,071 |
| 11 වැනි ත්‍යාගය | E | රු. 20/- | 36,193 |

**දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 8,736,490.00**

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

**මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය**
**රු.36,359,732.00**

NLB ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

**නිල ප්‍රතිඵල**

## සෙවන

ඔබට ගෙවල් - අතට මුදල්
செவன உங்களுக்கு வீடு - கைகளில் காசு

**දිනය 2020/09/13**
**දිනුම් වාරය 295**

ඉංග්‍රීසි අකුර: Z
ජයග්‍රාහී අංක: 02 40 43 52

| | සංයෝග | තෑගි | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000/- | බැගින් | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000/- | බැගින් | 01 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 1,000/- | බැගින් | 60 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 200/- | බැගින් | 118 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100/- | බැගින් | 3,214 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 50/- | බැගින් | 1,845 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20/- | බැගින් | 45,558 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20/- | බැගින් | 7,242 |

- ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම් පත අනිවාර්ය වේ.

**ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය** රු. 14,000,000/-

**මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල** රු. 1,653,250/-

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථනය: 011 460 70 00 | 011 232 43 24
ෆැක්ස්: 011 4669416
වෙබ්: www.nlb.lk

**දිනුම් වාරය 611**

## නිල ප්‍රතිඵල

**දිනය: 2020.09.13**

මීපල් ගෝල්ඩ් මෙගා පවර් Mega POWER

ඉංග්‍රීසි අකුර: V
සුපිරි අංකය: 12
ජයග්‍රාහී අංක: 25 26 39 71

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | 01 |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 07 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 120 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 254 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 6,904 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 4,553 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 112,793 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 20,583 |

ලංකාවේ විශාලම සුපිරි ත්‍යාගය
**මීළඟ මෙගා සුපිරි ත්‍යාගය**
**රු. 234,587,915.15**

**මීළඟ පවර් සුපිරි ත්‍යාගය** රු. 11, 422,882.00

**මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය** රු. 14,814, 361 .20

**දිනා ඇති මුළු මුළු මුදල**
**රු.5,487,040.00**

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

## ගොවි සෙත

**නිල ප්‍රතිඵල**

| දිනුම් වාරය | 2539 | දිනුම් අදින ලද දිනය | 2020.09.13 |
|---|---|---|---|

ඉංග්‍රීසි අක්ෂරය: Z
ජයග්‍රාහී අංක: 53 70 75 79

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | 01 |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 07 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 154 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 334 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 8142 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 5420 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 134823 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 24799 |

**මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 173,680**

**මෙවර දිනා ඇති මුළු තෑගි මුදල**
**රු. 6,565,440.00**

**ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය**
**රු. 60,171,585.60**

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

සුජිත්

සමන්ත

ඩිෂාන්ත

සංජීව

උපුල්

නිෂාන්ත

ඩී.නිෂාන්ත

සුනිල්

සුමනසිරි

ලාල්

සනත්

රංජිත්

# අපේ ටයර්වලින් අංජනම් එළි බලන්න පුළුවන්!

නිලාන්

ලාල්

මහේෂ්

ජනප්‍රිය

නන්දික

ඉසුරු

චන්දිම

ප්‍රියන්ත

චමින්ද

මිල්රෝයි

නිහාල්

ජයතිලක

චින්තක

නන්දසිරි

ශාන්ත

## බලපිටියේ ත්‍රී වීලර්

බලපිටිය, ගාල්ල මාර්ගයේ හමුවන සුප්‍රසිද්ධ නගරයකි. නිරතුරුවම සංචාරකයන් ගැවසෙන බලපිටිය නගරය ශීඝ්‍ර වශයෙන් සංවර්ධනය වෙමින් පවතී. මෙම නගරයේ ප්‍රධාන ප්‍රවාහන අවශ්‍යතාවය සපුරන ත්‍රිරෝද රථ රියැදුරන් බලපිටියේ ජනතාවට දක්වන සහය ඉමහත්ය. අද අප හමුවන්නේ බලපිටිය ත්‍රිරෝද රථ රියැදුරන් පිරිසයි. ඔවුන්ගේ ප්‍රශ්න, ගැටලු සහ ජීවිත පිළිබඳ අද අපි කතා කරමු.

කෙසේ වෙතත් ඔවුන් සමඟ කතාබහ කිරීමේදී අපට දැනගන්නට ලැබුණු දුක්බරම කාරණාව වූයේ මුව පුරා සිනහසෙමින් සිටිය ද ඔවුන් නිරතුරුව හදවතින් හඬා වැටෙනා පිරිසක් බවයි. ත්‍රීවීල් රථ සිය ගණනකින් බහුතරයක් දෙනා තම ජීවිතය ගැටගසා ගත්ත ද, කිව යුතුම කාරණාව වන්නේ ඔවුන්ගේ ගැටලුවකදී හෝ කතා කිරීමට ත්‍රීවීල් සංගමයක් පිහිටුවා නොමැති වීමයි. එහෙත් ඔවුන් බොහෝ දෙනෙක් විවෘතව අප සමඟ කතාබහ කිරීමට මැළි වුව ද තවත් පිරිසකගේ තර්ජනාත්මක වචන මාලාවන්ට මැදිවන්නට ද අපට සිදු විය. ඒ කෙසේ වෙතත් මේ අතරින් කිහිපදෙනකු අප හා එක්වූයේ ඔවුන්ගේ ජීවනෝපායේ අමිහිරි බව අප සමඟ පැවසීමටය. අපිළිවෙළට ගාල් කර තිබූ ත්‍රීරෝද රථ අතුරින් ඔවුන් වචනවලට පෙරළුවේ එකම පිළිවෙළට ඇති තම ජීවිතයේ කටුක බවයි. මේ අතුරින් බොහෝ දෙනෙක් පවසා සිටියේ අලුතින් පත් වූ රජය මඟින් හෝ මේ සඳහා සහනයක් ලැබේය යන විශ්වාසය ඔවුන්ගේ සිත් තුළ පවතින බවයි.

**ඒ. ඩී. සමන්ත සොයිසා මහතා**

"මෙතන කිසිදු ත්‍රීවිල් රථයක් ලියාපදිංචි කරන්න බලධාරීන් කටයුතු කර නෑ. ඕන කෙනකුට දුවන්න පුළුවන්. කොරෝනා නිසා හෝටල් ළඟ දුවපු අයත් දැන් මෙතනට ඇවිල්ලා. ඉතින් අපි වේලෙනවා. අපිත් දරු පැටව් ජීවත් කරවන්නේ මේ රස්සාවෙන්. සමහර දවසට ආදායම රුපියල් පන්සීයයි. ඕක තමයි අපේ ජීවිතේ.

තවත් එකක් කියන්න ඕනෑ. ඇතැම් රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදාවේ අය පවා අමතර සේවා කාලයක් වැඩ කරන්නේ මෙතන. ඉතින් අපිට කොයින්ද හයර්. ඒ වගේම තමයි අපිට යුතුකම් ඉටු කරන්නත් තියෙනවා. මොනව උනත් අපි කිසිවකුට අසාධාරණයක් කරන්නේ නෑ. දවසක් මගේ ත්‍රීවීල් එකේ රුපියල් විසිදාහක් දාලා ගිහින් තිබුණා. එය මම අයිතිකාරයා සොයලා ගෙදරටම ගිහින් දුන්නා. මට ඒ අය රුපියල් දාහක් දුන්නා. මම ඒක ගත්තෙ නෑ. හයර් එකේ රුපියල් 200 විතරක් ඉල්ලගෙන ආවා.

මගේ දරුවො 04 දෙනෙක් පාසල් යනවා. ඒ සියල්ල කරන්නෙ මේකෙන්.

**දුනුසිංහ දිනේෂ් ද සිල්වා මහතා**

මීට අවුරුදු ගානකට කලින් තිබුණු හයර් එකේ ගානමයි අදත්. අද බඩු මිල වැඩි වෙනවා. හයර් මිල වැඩි වෙන්නේ නෑ. දරු දෙන්නෙක් ඉන්නවා. අපට කරදරයක් වුණොත් දරු පැටවුන් අනාථයි. ඒ නිසා අප කියන්නේ අපි වෙනුවෙන් මේ නව රජය ඉදිරිපත් වෙලා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරන්න කියලයි. අපෙන් මාසයකට ගානක් අය කරගෙන හරි විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදලා දෙන්න කටයුතු කළොත් ලක්ෂ දහයකට හා ඉන් යැපෙන ලක්ෂ පනහකට විතර පිරිසකට සහනයක් ලැබෙනවා.

**උපුල් සොයිසා මහතා**

මම අවුරුදු 25 ක් තිස්සේ මේ රැකියාව කරනවා. කුඩු, පාතාලය වගේ අය අඩුවීම නිසා අපිට හයර් දුවන්න පහසුයි. ඉස්සර චන්ඩි පාට පෙන්නලා හයර් යනවා. ඒ වගේම අපිටත් හරි හරි වැඩ වෙනවා. දවසක් හයර් එකක් ආවා උණවටුනට. ගාල්ලෙන් නවත්තලා බිස්කට් ටින් එකක් ගේන්න කියලා කඩයක් ඇතුළට ගියා. මම බලාගෙන හිටියා ආවෙ නෑ. පස්සේ බලන කොට ඔහු පස්ස දොරෙන් මාරු වෙලා. මම හිස් අතින් ගෙදර ආවා. මේවයෙ කරදර අනන්තයි.

**ඩබ්ලිව්. සුමිත් මහතා**

සමහර වෙලාවට අපට ලොකු ගණන් ගෙවන්නම් කියල කුඩු, ගංජා වගේ දේවල් ගෙනියන්න කතා කරනවා. ඒත් අප ඒවට යන්නෙ නෑ. ඒ සල්ලි වලින් අපට, දරු පැටවුන්ට කන්න බැහැ. සමහර වෙලාවට අපට තර්ජනය කරනවා. ඒ වෙලාවට නම් බයකුත් දැනෙනවා. මිනිස්සු හිතන තරම් මේ රැකියාව සුන්දර නෑ.

**එස්. එච්.නිශාන්ත මහතා**

මම මෙතන අවුරුදු විසිහතක් ඉන්නවා. අපි අමාරුවෙන් දරුවන් නඩත්තු කරන්නෙ. ලෝන් එකක් ගන්න බැංකුවට ගියාම පඩි වාර්තා ඉල්ලනවා. පොලීසියෙන් අපි පස්සෙම එලවනවා. බ්‍රේක් ලයිට් නැතත් ලියනවා. කුඩු මුදලාලිලා ගැන නිකමට වත් බලන්නෙ නෑ. ඕක තමයි ඇත්ත.

**ඒ.පී.කේ. ද සොයිසා මහතා**

මගේ දරුවො තුන්දෙනා නඩත්තු කරන්නේ මේ රෝද තුනට පින් සිද්ධ වෙන්නයි. මෙතැන තියෙන්නෙ හයර් පොරයක්. එකෙක් අනිත් එක්කෙනාගෙ හයර් එක උදුර ගන්න පොර කනවා. සමඟිය අඩුයි. ඔළුව වනනවා. හිනාවෙනවා. කතාකරනවා. පාරේ යන මගීන්ටත් කරදරයි. එහෙම හොඳ නෑ. දරුවන්ගේ පන්තිවලට රුපියල් හත්දාහක් විතර යනවා. උදේට කන්න විතරක් දෙසීයයි. ඉතින් දවසකට දාහක් හම්බ කරන්න බෑ. ඉතින් අපිට අමාරුයි. ඒ වගේම මාසෙකට ලීසින් 17100 ක් ගෙවන්න ඕනෑ. මම විතරක් නෙවෙයි අපේ වැඩි දෙනා ලීසිං ගෙවනවා.

**එම්. සුනිල් ද සිල්වා මහතා**

මම මේ රැකියාව කරන්න ඇවිත් අවුරුදු 30 ක් වෙනවා. අගමැතිතුමා මීට පෙර ත්‍රීවිල් සංගම් කැඳවලා කිව්වා වේග සීමාව 50 දක්වා වැඩි කරනවා කියලා තාම කළේ නැහැ. හයි ස්පීඩ් දඬය 3300ක් වෙනවා. එහෙම නැතුව 1000ටත් පුළුවන්. ක්‍රම තියෙනවා.

**ඩී.නිශාන්ත මහතා**

අපේ ටයර්වලින් අංජනම් එළි බලන්න පුළුවන්. ස්ර්විස් කරන්න ගියාම රුපියල් 7000ක් විතර යනවා. ටයර් එකක් දැම්මොත් අපි බඩගින්නෙ. මේවා ලියන්න පැමිණීම ගැන පිං දෙනවා. ලිව්වට මදි. අපට සහනයක් අරන් දෙන්න.

**එච්.එච්. කුලතිලක මහතා**

ගොඩක් හයර් යන්න එන්නෙ ප්‍රේමවන්තයො. අපි කීයක් දුන්නත් පාසල් දරුවො නම් හෝටල්වලට දාන්නෙ නෑ. ජෝඩු හෝටල්වලට දැම්මම දෙපැත්තෙන්ම සල්ලි ලැබෙනවා. ඒත් අපි කල්පනාවෙන් කරන්නේ. දවසක් ත්‍රීවීල් එකේ රු. 30,000ක් වැටිලා තිබුණ. අන්තිමට හයර් එක ගියේ බැංකුවට ආපු මහත්මයෙක්. මම එයා හොයාගෙන ගිහින් ඇහුවා. මුදල් නැති වුණා ද කියලා එයා කිව්වා එහෙම වුණේ නෑ කියලා. ගත්ත මුදල තියෙනවා කියලා කිව්වා. පස්සෙ බලලා දෙයියනේ 30ක් අඩුයි කිව්ව. පස්සෙ ඒ මුදල් දීල මම ආව. ඒක පත්තරෙත් ගියා. ඒ වගේ දේවල් ඕන තරම් වෙනවා.

**ඩබ්. මහේෂ් චාමර මහතා**

මේ මාදුගඟ අද්දර සුන්දර පරිසරයක අපි ඉන්නෙ. සංචාරකයො නෑ. අපි වේලෙනවා. ඒත් අපි පොදු හා සමාජ සේවා කටයුතු කරනවා. පොකට්කාරයකුටවත් අපේ ඇස් වහල යන්න බෑ. බස්වලින් මිනිස්සුන්ට අසාධාරණ වෙනවා. මේ කන්තෝරුවල වැඩ කරන නෝන කෙනෙකුට බස් කොන්දොස්තර මහත්වරු පාට දැම්මොත් අපි අත අරින්නෙ නෑ.

**සුදත් ප්‍රියන්ත මහතා**

මේවා කොච්චර දැම්මත් වැඩක් නෑ අපට සහන කිසිවක් දෙන්නෙ නෑ පෙට්‍රල් මිල අඩු කරන්නෙත් නෑ. රුපියල් සීයක් ගත්තත් කෑගහනවා. වේගය හතළිස් එකකට ගියොත් 1000 දුන්නම ඒ ප්‍රශ්නෙ ඉවරයි. වේග සීමාව ඉවත් කරන්නෙ නෑ කියන්නේ සිය ගණනක් දාහේ කෑලි සාක්කුවලට යෑමට ඉඩ සැලසීමයි.

**දමින්ද අල්විස් මහතා**

ත්‍රීවිල් එකේ දෙන්නටයි යන්න පුළුවන්. තාම කොරෝනා නීතිය අයින් කරල නෑ. අපිට ත්‍රී වීල් තියෙනවා කියලා සමෘද්ධිය දෙන්නෙත් නෑ. අපි පිකට්වින් උද්ඝෝෂණ කරන්නෙ නෑ. අපිට සහනයක් දෙන්න කියා බලධාරීන්ගෙන් ඉල්ලනවා.

**චන්දිම කුමාර මහතා**

ත්‍රීවීල් එකට නගින කෙනෙක් අපිට චෙක් කරන්න බෑ. එයාලා ළඟ කුඩු ගංජා තිබුණොත් අපිත් කූඩුවේ ලගිනවා. මේ වගෙ ප්‍රශ්න සෑහෙන්න තියෙනවා.

**එච්.එච්. ජයතිලක මහතා**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට පොඩි ඉඩක තමයි අපි ඉන්නෙ. වැස්ස වෙලාවට වතුර පිරිලා මඩ වෙනවා. මෙතන තාර ටිකක් හරි දාල දෙන්න කියලයි අපි ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලන්නෙ.

**නම සඳහන් නොකළ රියැදුරකු පැවසූවේ මෙවැන්නකි:**

වෙනත් රැකියාවල් කරන අය මෙතන ත්‍රීවීල් දුවන එක ප්‍රශ්නයක් තමයි. ඒත් විශ්‍රාම ගියා කියල පෙන්ෂන් එකෙන් කරන්න පුළුවන් මොකක්ද? ඒ වගේම රණවිරුවෙක් ත්‍රීවීල් එකක් දිව්වම ඒකට විරුද්ධ වෙන එක හරි නෑ. රජයේ නිධාරීන් පොත අත්සන් කරල ඇවිල්ල වැඩ කරන එක වැරදියි. ඒක ආයතනවලින් දැනගත යුතුයි.

ත්‍රීවිල් රථ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් **බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති සමන් ද සිල්වා මහතාගෙන්** විමසූ විට ඔහු පැවසූයේ ලියාපදිංචි කළ නොහැකි බවත් පනතේ මේ ගැන විධිවිධාන නොමැති බවත්ය. වෙනම අතුරු ව්‍යවස්ථාවක් මඟින් මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බවත් ඒ ගැන ඉදිරියේදී සලකා බලන බවත් හෙතෙම පැවසීය.

පොලිසිය සම්බන්ධයෙන් ඇති චෝදනා ගැන පොලිස් අධිකාරිවරයාගෙන් විමසූ විට ඔහු කියා සිටියේ, ඔය වගේ දේවල් ගැන අපිට පැමිණිලි ලැබිලා නෑ. කෙනෙක් කිව්වා කියල විශ්වාස කරන්න බෑ. එහෙම නිලධාරීන් ඉන්නව නම් අපෙන් කිසිම සමාවක් නෑ.

එහෙම දේවල් වෙනවනම් මට පෞද්ගලිකව කෝල් කරන්න. නැතිනම් 119 කියන්න. බිලා ඉන්නවා නම් පගාව ගන්නව නම් එවෙලෙම කෝල් කරන්න. ඇතැම් නිලධාරීන් කරන වැරදි නිසා පොලිස් සේවයම අපකීර්තියට ලක් වෙනවා. එහෙම පැමිණිලි කරන්නේ නැතුව වැරදි කීම සාධාරණ නෑ. නැත්නම් පොලිස් ස්ථානාධිපතිවරුන්ට කියන්න කියල ඉල්ලනවා.

**සටහන සහ ඡායාරූප**
**ගාල්ල දිස්ත්‍රික් සංචාරක**
**ධර්මදාස සිරිවර්ධන**

> "මෙතන කිසිදු ත්‍රීවිල් රථයක් ලියාපදිංචි කරන්න බලධාරීන් කටයුතු කර නෑ. ඕන කෙනකුට දුවන්න පුළුවන්. කොරෝනා නිසා හෝටල් ළඟ දුවපු අයත් දැන් මෙතනට ඇවිල්ලා. ඉතින් අපි වේලෙනවා. අපිත් දරු පැටව් ජීවත් කරවන්නේ මේ රස්සාවෙන්. සමහර දවසට ආදායම රුපියල් පන්සීයයි. ඕක තමයි අපේ ජීවිතේ.

## LINK - දිනමිණ ත්‍රීවිලර් බොනැන්සා

දිනමිණ පුවත්පත සමග සෑම අඟහරුවාදා දිනකම පළවන මගතොට මිතුරෝ විශේෂාංග ලිපිය කියවන ත්‍රීවිලර් මිතුරන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගැනෙන ජයග්‍රාහකයන් දස දෙනකුට link ටැක්සි මීටර් දහයක් බැගින් දෙමසකට වතාවක් ලබා දීමට link lanka ආයතනය ඉදිරිපත් වී සිටී. ඒ සඳහා ඔබ කළ යුත්තේ සෑම අඟහරුවාදා දිනකම මගතොට මිතුරෝ පිටුවේ පළ කෙරෙන කූපන්පත පුරවා තැපැල්පතක අලවා link ටැක්සි මීටර් - දිනමිණ, ත්‍රීවිලර් බොනැන්සා, තැ.පෙ.1198, අලෙවි දෙපාර්තමේන්තුව, ඩී.ආර්.ජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ යන ලිපිනයට තැපැල් කිරීමයි. කූපනයේ ඡායා පිටපත් බාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

ප්‍රාදේශීය මාධ්‍ය සහෝදරවරුනි...පාඨකයිනි...ඔබේ ප්‍රදේශයේ ත්‍රීවිල් මිතුරන්ගේ වගතුග අපට කියන්න ඔබටත් පුළුවනි. ලිපිය සැකසීමට පෙර 0112429245 දුරකථන අංකය ඔස්සේ අපට දැනුම් දී , e-mail-magathota.dinamina@lakehouse.lk යන ඊමේල් ලිපිනයට හෝ දිනමිණ විශේෂාංග අංශය, ලේක්හවුස් මන්දිරය, ඩී.ආර් විජයවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනයට ලිපිය සහ පින්තූර (රියැදුරන් විසිපහකට වැඩි ප්‍රමාණයක් සහ ත්‍රීවිල් රථ ගාල්හි පින්තූර සහිතව) අප වෙත යොමු කරන්න.

# රසමංජරිය

## සතියේ රස මංජුසාව

## වේදිකා නාට්‍යයේ අභිෂේක මංගල්‍යය

# රාජ්‍ය නාට්‍ය උලෙළ 2020 සම්මාන ප්‍රදානෝත්සවය

මෙරට වේදිකා නාට්‍ය ශිල්පීන්ගේ අභිෂේක මංගල්‍යය වන රාජ්‍ය නාට්‍ය උලෙළ - 2020 සම්මාන ප්‍රදානෝත්සවය පසු-ගියදා (11) නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී අති උත්කර්ෂවත් අන්දමින් 48 වන වරටත් පැවැත්විණි.

මෙය පැවතියේ අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම යටතේ සංවිධානය කරන ලද ජාතික උරුම, ප්‍රාසංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය නාට්‍ය උලෙළ - 2020 හොඳම දිගු නාට්‍ය (සිංහල) සඳහා වන සම්මානය එච්.පී නිලංක නිසලාංජල් ධර්මදාසගේ අතරමැදියා නාට්‍යයට ද හොඳම දිගු නාට්‍ය (දමිළ) සිවරාසා ප්‍රදීප් සහ ඒ. සත්‍යනාදම් ගේ මාන්කුලිත්තු ද හිමි විය.

හොඳම අධ්‍යක්ෂණය සඳහා සම්මානය අතරමැදියා නාට්‍යයේ අධ්‍යක්ෂක එච්.පී නිලංක නිසලාංජල් ධර්මදාස දිනා ගත්තේය. එසේම හොඳම අධ්‍යක්ෂණය (දමිළ) සඳහා සම්මා-නය මාන්කුලිත්තු සිවරාසා ප්‍රදීප් සහ ඒ. සත්‍යනාදම් විසින් දිනා ගන්නා ලදී.

හොඳම නළුවා (සිංහල) සම්මානය මගුල් කපුවා නාට්‍යයේ මාරියෝගේ චරිතය නිරූපණය කළ තිලාන් වර්ණජිත් ද හොඳම නළුවා (දමිළ) සඳහා සම්මානය මාන්කුලිත්තු නාට්‍යයේ සම්පත් ලෙස රඟ පෑ ආර්. ශ්‍රී කාන්ත් ද හිමි කරගත්හ. හොඳම නිළිය (සිංහල) සඳහා සම්මානය අතරමැදියා නාට්‍යයේ අමන්දිගේ චරි-තය නිරූපණය කළ සිළිඳු රන්වල ද දමිළ අංශය සඳහා සම්මානය Flightless Butterfly නාට්‍යයේ මවගේ චරිතය රඟ පෑ ආර්. නිර්ජනාද දිනාගත්හ.

හොඳම කෙටි නාට්‍ය නිෂ්පාදනය සඳහා සම්මානය(සිංහල)පළමු ස්ථානය පොත්ගුල නාට්‍ය නිෂ්පාදනය කළ සුරේෂ් මධුෂාන් ද දමිළ අංශය සඳහා පළමු ස්ථානය අංගිගාරම් නිෂ්පාදනය කළ ආර්. ශ්‍රී කාන්ත් ද හොඳම කෙටි නාට්‍ය (සිංහල) අධ්‍යක්ෂණය සඳහා සම්මා-නය පොත්ගුල නාට්‍ය අධ්‍යක්ෂණය කළ සුරේෂ් මධුෂාන්ද (දමිළ) අංගිගාරම් අධ්‍යක්ෂණය කළ ආර්. ශ්‍රී කාන්ත් විසින් දිනා ගන්නා ලදී. හොඳම ස්වීය නොවන රචනය (සිංහල) සඳහා හස්තිරාජ මහත්තයා නාට්‍යය රචනා කළ රංජිත් ධර්මකීර්ති ද හොඳම ස්වීය රචනය (සිංහල) සඳහා පළමු ස්ථානය අතරමැදියා රචනා කළ එච්.පී නිලංක නිසලාංජල් ධර්මදාස ද හොඳම රචනය (දමිළ) සඳහා පළමු ස්ථානය මාන්කුලිත්තු නාට්‍ය රචනා කළ සිවරාසා ප්‍රදීප් ද හොඳම රචනය (කෙටි නාට්‍යය - සිංහල) සඳහා පළමු ස්ථානය පොත්ගුල නාට්‍ය රචනා කළ එම්. සුරේෂ් මධුෂාන් සහ පී. සුද-ර්ශන ක්‍රිෂාන්ත විසින් දිනා ගන්නා ලදී.

හොඳම රචනය (කෙටි නාට්‍ය - දමිළ) සඳහා පළමු ස්ථානය අංගිගාරම් රචනා කළ ආර්. ශ්‍රී කාන්ත්ද හොඳම සහය නිළිය සම්මානය (දිගු නාට්‍ය සිංහල) මගුල් කපුවා නාට්‍යයේ ඕස්ගේ චරිතය නිරූපණය කළ ඉමායා සෙව්වන්දිකාටද හොඳම සහය නළුවා සම්මානය (දිගු නාට්‍ය සිංහල) මම නෙවෙයි වෙන කෙනෙක් නාට්‍යයේ වත්තෙගේ චරි-තය නිරූපණය කළ සම්පත් ජයවීරටද දමිළ අංශයෙන් සම්මානය Flightless Butterfly නාට්‍යයේ තාත්තාගේ චරිතය නිරූපණය කළ ටී. කවිතරන්ටද, හොඳම නිළිය (කෙටි නාට්‍ය - සිංහල) සම සම්මානය පළමු ස්ථානය Female නාට්‍යයේ ෆාතිගේ චරිතය නිරූපණය කළ ඒ. එම් බුද්ධිමා අබේසිංහටද, එම නාට්‍යයේ තිලාගේ චරිතය නිරූපනය කළ ආර්.ජී තිලංකා වික්‍රමසිං-හටද හිමි විය.

හොඳම නිළිය (කෙටි නාට්‍ය - දමිළ) පළමු ස්ථානය Pennal නාට්‍යයේ ගැහැනු ළමයාගේ චරිතය රඟ පෑ ටී. ඉමජිනී ද හොඳම නළුවා සම සම්මාන (කෙටි නාට්‍ය - සිංහල) පළමු ස්ථාන පොත්ගුල නාට්‍යයේ සේල්වාගේ චරිතය නිරූපනය කළ ඩබ්.එම්. ඩී.බී වන්නිනායක ද එම නාට්‍යයේ භූමිගේ චරිතය නිරූපනය කළ ශානක උදාර රාජ-රත්න ද දමිළ අංශයෙන් හොඳම කෙටි නාට්‍ය නළුවා ලෙස පළමු ස්ථානය අංගිගාරම් නාට්‍ය යේ මෝසස් ප්‍රපන්ත ද, දිගු නාට්‍ය (සිංහල) කුලසතා සහතික විජ-යන්තිමාලා නාට්‍යයේ විජයන්ති චරිතය නිරූපණය කළ කසුනි ගනේවත්ත ද, ගලේ පිපුන මල් නාට්‍යයේ බොක්කි චරිතය නිරූපණය කළ තිළිණ පෙරේරා ද කෙටි නාට්‍ය කුසලතා සහතික බෝම්බ ගැහුවට කමක් නෑ සිංදු කියමු නාට්‍යයේ නිවේදකයාගේ චරිතය නිරූ-පණය කළ දුලාජ්ද, ඇවිත් බලන්න නාට්‍යයේ ප්‍රදීප් කොටුගොඩ චරිතය නිරූපණය කළ යසිඳු බිම්සරද, පශ්චාත්තාපය නාට්‍යයේ ඔපාත චරිතය නිරූපනය කළ ඩී.ඒ තරිඳු මධුශංක විසින් දිනා ගන්නා ලදී.

ජීවිතයේ එක් වරක් පමණක් පිරිනමන නාට්‍ය කීර්ති සම්මානයෙන් ප්‍රවීණ නාට්‍යවේදී නිශ්ශංක දිද්දෙණිය, ප්‍රවීණ නාට්‍යවේදිනී අනුලා බුලත්සිංහල, ප්‍රවීණ නාට්‍ය-වේදී බුද්ධදාස ගලප්පත්ති, ප්‍රවීණ නාට්‍යවේදී මරිය ජේවියර් පියතුමා පිදුම් ලැබූහ.

බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සංස්කෘතික කටයුතු දෙපාර්ත-මේන්තුව, රාජ්‍ය නාට්‍ය උපදේශක සභාව, ශ්‍රී ලංකා කලා මණ්ඩලය රාජ්‍ය නාට්‍ය උලෙළ සංවිධානය කරයි.

ඡායාරූප - තුෂාර ප්‍රනාන්දු

## 'චීස්' කෙටි නාට්‍ය උලෙළ

චීස් කෙටි නාට්‍ය උලෙළ මේ මස 16 දින ටවර් රඟහලේදී පැවැත්වේ. මෙහිදී චීස්, ලෝකා, ඔයාගේ කතාව නාට්‍ය ත්‍රිත්වය වේදිකා ගතවේ. ඒ සමගම පාසල් සිසුන් සඳහා සහභාගි විය හැකි අංගරචනය පිළිබඳ වැඩසටහනක් ද පැවැත්වේ. ප්‍රවීන රංග ශිල්පීන් සමග නාට්‍ය හා රංගකලා උපා-ධිධාරී ගුරුවරු පමණක් චීස් කෙටි නාට්‍ය උලෙළ සඳහා සහභාගි වෙති.

## දැකලා පුරුදු කෙනෙක්

මුදිත් හෑගොඩගේ නිර්මාණ අධ්‍යක්ෂ-ණයක් වන දැකලා පුරුදු කෙනෙක් සිනමා පටය ප්‍රදර්ශනය මේ මස 17 වැනිදා තෙක් දීර්ඝ කර ඇත. මෙහි තිර රචනය බූපති නලින් වික්‍රමගේය. බිමල් ජයකොඩි, සමාධි ලක්සිරි, ජගත් මනුවර්න දැකලා පුරුදු කෙනෙක් සඳහා රංගනයෙන් දායක වෙති. මෙම සිනමාපටය මේ දිනවල පී වී ආර් සිනමා ශාලාවේ තිරගත වේ.

## තේ කහට චිත්‍ර

කඳුකර දෙමළ ප්‍රජාවගේ ජන ජීවිත පිළිබඳ, කඳුකර තරුණ තරුණියන් 40 දෙනකු ඉදිරිපත් කරන ඡායාරූප ප්‍රදර්ශනය මේ මස 26 සහ 27 දෙදින පෙ.ව. 10.00 සිට ප.ව. 6.00 දක්වා ලයනල් වෙන්ටඩ් කලාගා-රයේ දී පැවැත්වේ.

කඳුකර දෙමළ ප්‍රජාව යනු මෙරට ආර්ථි-කය සුපෝෂණය කිරීම සඳහා ප්‍රබල දායක-ත්වයක් ලබා දෙන පුරවැසි කොට්ටාසයකි. 'ශ්‍රී ලංකා තේ' නිසා මුළු ලොවම ශ්‍රී ලංකාව හඳුනාගෙන සිටිය ද කඳුකර ප්‍රජාවට තවමත් යහපත් සමාජ ජීවිතයක් උදා වී නොමැත. තේ කහට චිත්‍ර ප්‍රදර්ශන මාලාවේ අරමුණ වන්නේ ඔවුන්ගේ ජන ජීවිත පිළිබඳ සමාජ කතිකාවක් ඇති කිරීමය.

කඳුකර දෙමළ ප්‍රජාව, කඳුකර තරුණ තරුණියන් හා එක්ව මෙම ප්‍රදර්ශනය සංවි-ධානය කරන්නේ 'ටස්' ආයතනය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ඌව ශක්ති පදනම විසිනි. ඇතුල්වීම නොමිලේ ය.

## 'සිනමාලංකාරය' මාසික සිනමා දැක්ම

සිනමාලංකාරය මාසික සිනමා දැක්ම හා කතිකාව සමාරම්භක වැඩසට-හන මේ මස 20 වැනි දින ප.ව. 2.30ට මාතලේ සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්වේ. මෙදින බොන් ජූන් අධ්‍යක්ෂ-ණය කළ PARASITE තිරගත වේ. මෙය දකුණු කොරියානු සිනමාපටයකි. මෙහිදී පැවැත්වෙන සිනමා කතිකාව සඳහා සිනමා නිර්මාපක සහ විචාරක එරන්ද මහගමගේ සහභාගි වනු ඇත. සමාරම්භක වැඩසට-හන මෙහෙයවනු ලබන්නේ නීල් ප්‍රියන්ත කරුණාරත්න විසිනි. මාතලේ සංස්කෘතික මධ්‍යස්ථානයේ බහු මාධ්‍ය පුස්තකාලය සහ ජනමාධ්‍ය හා රංගකලා අධ්‍යයන අංශය මෙය සංවිධානය කරයි.

# මම සිනමාවෙන් දේශපාලනය කරනවා

**විසාකේස චන්ද්‍රසේකරන්**

ආචාර්ය විසාකේස චන්ද්‍රසේකරන් නිර්මාණය කළ 'පාංශු' සිනමා පටය මේ දිනවල බොහෝ දෙනාගේ කතාබහට ලක් වන නිර්මාණයකි. මේ සිනමා පටය ශ්‍රී ලාංකේය සමාජයේ පස් අතර සැඟව ගිය අඳුරු යුගයක මතක ආවර්ජනය ඔස්සේ සමාජ කතිකාවක් ගොඩනඟයි. මේ 'පාංශු' සිනමා පටයේ අධ්‍යක්ෂ විසාකේස චන්ද්‍රසේකරන් සමඟ කළ කතාබහකි.

**● ඔබ සිනමාව තුළ ලැබූ උත්තේජනය ගැන මුලින්ම කතාබහ කරමු?**

මම නිර්මාණකරණයට ආදරෙයි වගේම සිනමාවේ මායාත්මක ස්වරූපයට ඉතාමත්ම කැමතියි.

නීති වෘත්තිකයෙක් විදිහට කටයුතු කරන කෙනෙක්. නමුත් නිර්මාණකරණය තුළ මම පෞද්ගලිකව විශාල ආස්වාදයක් ලබන තැනක්. එය ඉතාමත් මිල අධික විනෝදාංශයක්. ඒ නිසා මට හැමදාම චිත්‍රපට කරන්න බැහැ. නමුත් කලාතුරකින් කරන නිර්මාණයක් වගේම මිල අධික විනෝදාංශ-යක් වීමත් මෙය විශාල අභියෝගයක්.

ඒක මම අත්හරින්නේ නැතිව ඉන්න ප්‍රධාන හේතු දෙකක් තියෙනවා. එකක් මම එයින් ලබන ආශ්වාදය. කලාකරුවෙක් විදිහට විඳීම මට එයින් මුණ ගැහෙනවා. දෙවෙනි කාරණය තමයි නිර්මා-ණකරණයේදී අප හඳුනාගන්නා අනෙක් පිරිස. අපේ යහලුවන් බවට පත්වෙනවා. එක් පවුලක් විදිහට වැඩ කරන්න පෙලඹෙනවා. ඇතැම්විට අප අතර මත ගැටුම් ඇති වෙන්න පුළුවන්. ඒ තුළ අපේ මිත්‍රත්වයත් තවත් වැඩි වෙනවා. තවත් පැත්තකින් චිත්‍රපටයක් ඉවර වුණාට පස්සේ මට දැනෙන්නෙ හරියට උපාධියක් කරල ඉවර වුණා වගේ. කෙටි කාලයක් තුළ නිර්මාණ ක්‍රියාවලියකදී අප බොහෝ අත්දැකීම් ලබනවා.

ඉන්පස්සෙ අප කලින් හිටපු පුද්ගලය-න්ගෙන් වෙනස් වෙලා අත්දැකීම් තියෙන පරිනත චරිත බවට පත් වෙනවා. ඒ නිසා මේ අත්දැකීම

නැවත ලබන්න තියෙනවා නම් මම කැම-තියි. තවත් කාරණයක් තියෙනවා.

මම කැමතියි එළියේදී කරන්න බැරි දේශ-පාලනය සිනමාව මඟින් කරන්න.

ඕනෑම පුද්ගලයෙකුට දේශපාලනමය වගකීම් තියෙනවා. ඒ වගකීම කිසියම් ආකාරයක සාකච්ඡා-වකට ගෙන එන්න තිබෙන ඉඩකඩ සිනමා මාධ්‍ය සතුයි. මොකද සිනමාවත් එක්ක බොහෝ පිරිසක් එකතු වෙනවා.

ඒ තුළ ඉතාම ප්‍රබල ඉඩකඩක් තියෙන තැනක්. මම නැවත වතාවක් චිත්‍රපටයක් කරන්න හේතුව මේ චිත්‍රපටියට පසුබිම් වන කතා පුවත මගේ දෘෂ්ටිකෝ-ණයෙන් කියන්න සිනමාවේ භාෂාව වඩාත් සුදුසුයි කියලා මට හැඟීම.

**● සිනමා කෘතියක මතුපිට අර්ථයට එහා ගිය යටි පෙළක් සාකච්ඡා වෙනවා. නමුත් ඇතැම් චිත්‍රපට ප්‍රේක්ෂකාගාරයට නුහුරු ප්‍රහේලිකා ස්වරූපයක ගැඹුරු ආඛ්‍යාන ගෙන එනවා?**

මම එක් දෙයක් විශ්වාස කරනවා. හොඳ නිර්මා-ණයක කතාවකුත් තියෙන්න ඕනා. ප්‍රහේලිකාවකුත් තියෙන්න ඕනෑ. දෙකම නැත්නම් එය හොඳ සිනමා කෘතියක් නෙවෙයි. කිසියම් ප්‍රහේලිකාවක් තට්ටු පිටින් තියෙන්නත් පුළුවන්. ඒ තුළ පුංචි පුංචි මැණික් ගල් සැඟවිලා තිබිලා අපට මුණ ගැහෙන්න පුළුවන්. එවැනි නිර්මාණ පොහොසත් නිර්මාණ විදිහට මම දකින්නේ. ඒ වගේම මම කළින් කිව්ව කාරණාවට දෙයක් එකතු කරන්න ඕනා. මට අවශ්‍යයි නිර්මාණ-යක් තුළ දේශපාලන කතිකාවක් ඇති කරන්න.

අප කාටද ආමන්ත්‍රණය කරන්න ඕන. කොළඹ ඉන්න විශ්ව විද්‍යාල සිසුන්ටද ? එහෙම නැත්නම් චිත්‍රපට බලන විචාරකයන්ටද ? එහෙම නැත්නම් ලංකාවෙන් පිට ඉන්න චිත්‍රපට උලෙළවල් සංවිධා-නය කරන ඒ උදවියට ද? නැහැ. මට ආමන්ත්‍රණය කරන්න ඕන මගේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ට. ඔවුන්ව චිත්‍රපටයක් බලන්න ගෙන්න ගන්නයි මට අවශ්‍යය. අප ඔවුන්ට කතාවක් ඉදිරිපත් කරනවා. ඒ කතාව බලන්න එන්න කියලා ආරා-ධනා කරනවා.

ඔවුන් ආවට පස්සේ ඔවුන්ට ප්‍රහේලිකා පුරවන්න කියලා කියන්න මට බැහැ. පරීක්ෂණාත්මක නිර්මාණ සිනමාවේ උන්නතියට අවශ්‍යයි.

මං ඒ පිළිබඳව විශ්වාස කරනවා. නමුත් ඒ පර්යේක්ෂණ කරන්න වෙනත් අය ඉන්නවා. ඒ නිසා ඒ දේ කරන්න මට අදහසක් නෑ.

**● පුද්ගලයාගේ සංස්කෘතික ජීවිතය පිළිබඳව නිර්මාණකරුවා සංවේදී වුණත්, ගෙන එන නිර්මාණ සමග ප්‍රේක්ෂකයා බද්ධ නොවීම එක්තරා ආකාරයක අර්බුදයක් නේද?**

පළමු කාරණය තමයි අපේ ප්‍රේක්ෂකාගාරය අලුත් පරම්පරාවක්. විශේෂයෙන්ම ඔවුන්ට පොතක් කියවන්නවත් මේ ජීවන රටාව තුළ ඉඩක් වෙන්කර ගන්න අවස්ථාවක් නැහැ. පාසල් හා විශ්වවිද්‍යාල සිසුන් ගැන කල්පනා කරල බැලුවොත් ඔවුන් අධ්‍යාපනයට සම්පූර්ණ කාලය යොදවනවා. ලැබෙන ඉඩකඩ තුළ තවත් අධ්‍යාපන කටයුත්තක් සම්පූර්ණ කර ගන්න උත්සාහ කරනවා. අධ්‍යාපනය සමගාමීව අමතර විනෝදාංශයක් වත් ඔවුන්ට නෑ. මව්පියන් පවා මේ තරගයට යොමු වෙලා.

ඒ නිසා ඔහුන්ටත් වෙලාවක් නෑ. හැමෝම රේස් එකේ දුවනවා. අන්තර්ජාලය ඇසුරු කරන්න යොමු වීමත් එක්ක තාක්ෂණික මෙවලම් කිහිපයක්ම නිතර පරිහරණය කරන්නත් ඔවුන් පෙලඹෙනවා. ඒ නිසා නිර්මාණකරුවන්ට අභියෝගයක් තියෙනවා.

ඒ ප්‍රේක්ෂකාගාරය තමන් වෙතට කැඳවා ගන්න. හොඳ නිර්මාණ බිහිවීමත් අතිශයින් වැදගත්. හොලි-වුඩ් සහ බොලිවුඩ් චිත්‍රපට නරඹන්න අපේ අයත් කැමැත්තෙන් යනවා. ඒ වගේම ඉන්දියානු දෙමළ චිත්‍රපට නරඹන්නට අපේ රටේ දෙමළ මිනිස්සු පොර කන අවස්ථා අපි දැකලා තියෙනවා.

ප්‍රේක්ෂකයන්ට අත හරින්න බැරි නිර්මාණ කෙරෙනවා අඩුයි. අපේ බොහෝ චිත්‍රපට ප්‍රේක්ෂක ආකර්ෂණය ගිලිහිලා යන්න අනෙක් හේතුව තමයි නිවැරදිව සන්නිවේදනය නොවීම.මේ වගේ චිත්‍ර-පටියක් ඇවිල්ලා බලන්න එන්න කියන පණිවිඩය මිනිසුන් අතරට ගෙන යන්න ඕන. ප්‍රේක්ෂකයන්ගේ ප්‍රමුඛතාවය නම් අද ගොඩක් වෙනස් වෙලා තියෙ-නවා. ප්‍රේක්ෂකයන්ට හරියටම දැනෙන ඔවුන්ට ආරාධනා කරන නිර්මාණ සිනමාවේ බිහි වෙනවා නම් කිසිවෙක් සිනමාව අත-හරින්නේ නෑ.

අප චිත්‍රපට කරන්නේ අපේ තෘප්තිය ගැන හිතලා. නිර්මාණ ස්වාධීනත්වය ගැන හිතලා. එතකොට අප දැඩි මතවල ඉන්නවා. ඒකත් එක හේතුවක් අපෙන් ප්‍රේක්ෂකයො ගිලිහිලා යන්න.

**● 'පාංශු' චිත්‍රපටය ගොනු වන්නේ මවගේ භූමිකාව හරහා. එම චරිතය නිරූපණය කරන්නේ ප්‍රවීණ රංගන ශිල්පිනී නීටා ප්‍රනාන්දු. බබා නෝනාගේ චරිතයට ඇයව තෝරා ගන්නට ඔබ තීරණය කරනවා?**

නීටා ප්‍රනාන්දු රංගන ශිල්පීනිය නැත්නම් මේ චරිතයට තෝර ගන්න කවුද කියන ප්‍රශ්න මට තිබුණා.

ඒ චරිතයට එදා මම කිසියම් විකල්පයන් ගැන හිත හිතා හිටියත් අද මම චිත්‍රපටය දිහා නැවතත් බලද්දි මට කීයටවත් හිතාගන්න බෑ වෙන මූණක්. ඒ චරිතය වෙනුවෙන් ඉන්නවද කියලවත්. ඒ තරමටම නීටා ප්‍රනාන්දු තිරයට බද්ධ වෙලා කියලා මට හිතෙනවා. ඒ නිසා මට හිතා-ගන්න බෑ නීටා හැර මේ චරිතය කරන්නේ කවුද කියලවත්.

ඇත්තටම මගේ චිත්‍රපටය ප්‍රේක්ෂකාගාරයට කියන කතාවක්. ඒ සාකච්ඡාව මිනිසුන් අතරට ගෙන යන්න කවුරුත් නොදන්න ශිල්පිනියක් මේකට යොදා ගත්තා නම් මං හිතන්නේ නැහැ මේ තරම් අවධානයක් එයට ලැබෙයි කියලා.

ඒ නිසාම මම විස්වාස කරනවා ප්‍රේක්ෂකයෝ එක්ක අපට මේ ගමන යන්න පුළුවන් ලොකු ශක්තියක්. ඇය මේ චිත්‍රපටයේ චරිතයට කරන්නේ ඉතා ඉහල සාධාරණ-යක්. චිත්‍රපටය වෙනුවෙන් ඇය දක්වන දාය-කත්වය වචන-යෙන් විග්‍රහ කරන්න අමාරුයි. අනෙක් කාරණය තමයි මේ චිත්‍රපටය ශිල්පීය ධූරාවලියකින් තොරව හැම දෙනාම එකට කටයුතු කිරීම. පුංචිම දෙයක් කරන පුද්ගලයාගේ සිට සියලු දෙනා උස් පහත් භේදයකින් තොරව සහෝදරත්මක කටයුතු කිරීම. චිත්‍රපටය තුළ ඒ කාරණය වැඩ බිමකට ගෙන එන්න මට අවශ්‍ය වුණා. ප්‍රවීණ නිළියක් විදිහට නීටා ප්‍රනාන්දු එහිදී අතිශය ශක්තිමත් සුහදත්වයක් පළ කළ ශිල්පිනියක්.

මේ චිත්‍රපටයේ වැඩ කරපු සියලු දෙනාටම තමන්ගේ උපරිම ශක්තිය නිර්මාණයට යොදන්න එය පහසුවක් වුණා. එනිසා 'පාංශු' චිත්‍රපටයේ වැඩ කරන්නට ලැබීම මගේ ජීවිතේ මං ලබපු අතිශය තෘප්තිමත් කාලයක් විදිහට මට දැනෙන්නේ.

**හර්ලි සමරසිංහ**

# ජපානයේ හිටපු අගමැති ඉල්ලා අස් වීමෙන් පසු

# අනුප්‍රාප්තිකයා තෝරාගැනීමට ජන්දයක්

ජපානයේ හිටපු අගමැති ෂින්සෝ අබේ ඉල්ලා අස්වීමෙන් අනතුරුව පාලක පක්ෂය ඔහුගේ අනුප්‍රාප්තිකයා තෝරාගැනීමට ඊයේ ඡන්දයක් පැවැත්වීය. මේ ඡන්දයෙන් ජය ගන්නා තැනැත්තාට මිළඟ මැතිවරණයේ අගමැති ධුර අපේක්ෂකත්වය හිමිවීමට නියමිතය. වත්මන් පාලනයේ ප්‍රධාන කැබිනට් ලේකම් 71 හැවිරිදි යොෂිහිඩේ සුගාට ඡන්දයෙන් ජයගැනීමට වැඩි ඉඩක් තිබිණි.

ඔහු අබේගේ සමීප අනුගාමිකයකු වන අතර අබේගේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමට ප්‍රතිඥා දුන්නේය. කොන්සර්වේටිව් මතධාරී ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂයේ නායකත්වයට මෙසේ කෙනකු පත්වීම සිදුවන අතර බදාදා (16) පාර්ලිමේන්තුවේ දී අගමැතිවරයා තෝරයි. පාර්ලිමේන්තුවේ ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂයට වැඩි බලයක් හිමි බැවින් එහි අපේක්ෂකයාට අගමැති ධූරය නියත ලෙසම හිමි වේ.

මෙසේ ධුර කාලය අතරමැදදී අගමැති තනතුරට පත්වන තැනැත්තාට 2021 සැප්තැම්බර් දක්වා මැතිවරණය පැවැත්වෙන තෙක් එම ධූරය දැරීමට වරම් ලැබේ. ස්ට්‍රෝබෙරි ගොවියකුගේ පුතකු වන සුගා කෘතහස්ත දේශපාලනඥයෙකි.

# ග්‍රීන්ලන්තයේ විශාල අයිස් කන්දක් කැඩී යයි

ආර්ක්ටික් ප්‍රදේශයේ ඊසාන දිග ග්‍රීන්ලන්තයේ ගොඩබිමට සවි වී තිබූ 79N ලෙස හඳුන්වනු ලබන අති විශාල අයිස් පර්වතයක් කැඩී වෙන්වී ගොස් ඇති බව වාර්තා වේ. නියෝගල්ෆ්ජර්ඩ්සෆ්ජෝඩෙන් ලෙස එරට භාෂාවෙන් හඳුන්වනු ලබන මේ අයිස් පර්වතයේ කැඩී ගොස් ඇති කොටස වර්ග කිලෝ මීටර් 110ක විශාලත්වයෙන් යුක්තය. චන්ද්‍රිකා ඡායාරූපවලට අනුව මේ කොටස තවත් කුඩා කොටස්වලට කැඩී ඇති ආකාරය දැක ගැනීමට හැකිය.

මේ සිද්ධිය ග්‍රීන්ලන්තයේ වේගවත් දේශගුණික විපර්යාස සිදුවන බවට සාක්ෂියක් යැයි විද්‍යාඥයෝ පවසති. 1980ට වඩා මේ වන විට ප්‍රදේශයේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 3 කින් ඉහළ ගොස් ඇතැයි ආචාර්ය ජෙනී ටර්ටන් කීවාය. 2019 සහ 2020 දී හිම්හානයේ මෙහි වාර්තාගත උෂ්ණත්වයක් දක්නට ලැබී ඇතැයි ජර්මනියේ ෆ්‍රෙඩ්රිච් ඇලෙක්සැන්ඩර් විශ්ව විද්‍යාලයේ ධ්‍රැවීය පර්යේෂිකාවක වන ඇය වැඩිදුරටත් කීවාය.




## ලොව වටා

ජෝ බිඩන්ගේ මැතිවරණ ව්‍යාපාරයට

# අමෙරිකාවේ ප්‍රකෝටිපතියෙක් ඩොලර් මිලියන 100ක් දෙයි

අමෙරිකානු ඩිමොක්‍රටික් පාක්ෂික ජනාධිපති ධුර අපේක්ෂක ජෝ බිඩන්ගේ මැතිවරණ ව්‍යාපාරයට අමෙරිකාවේ ප්‍රකෝටිපති ධන කුබේරයකු වන මයික් බ්ලූම්බර්ග් කැලිෆෝනියා ප්‍රාන්තයේ දී අමෙරිකානු ඩොලර් මිලියන 100ක් ප්‍රදානය කර තිබේ. මේ ප්‍රදානය සිදු කර ඇති කැලිෆෝනියා ප්‍රාන්තය ජනාධිපති ධුර සටන ජය ගැනීමට අවශ්‍ය වැඩිම ඡන්ද විද්‍යාල ඡන්ද ගණනක් ලබාදෙන ප්‍රාන්තයයි. බ්ලූම්බර්ග් මීට පෙර ජෝ බිඩන් ඩිමොක්‍රටික් පක්ෂ අපේක්ෂක ධූරයට පත්වීම වැළැක්වීමට අමෙරිකානු ඩොලර් බිලියනයක් වියදම් කළේය. සැප්තැම්බර් 24 වැනිදාට නියමිත පෙර මැතිවරණ සමයේ දී තමන්ගේම මුදල් ප්‍රාන්තය සඳහා වැය කරන බවට ඩොනල්ඩ් ට්‍රම්ප් ඉඟි කළේය.

# ගෙවුණු පැය 24ට කොවිඩ් ආසාදිතයන් 307,930ක් හමු වෙලා

ලෝක සෞඛ්‍ය සංවිධානය

ගෙවුණු පැය 24 ඇතුළත ලොව පුරා 307,930ක වාර්තාගත කොවිඩ් ආසාදිතයන් ප්‍රමාණයක් හමුවී ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. තවද දෛනික මරණ 5,500ක් වාර්තා වීමෙන් සමස්ත මරණ සංඛ්‍යාව 917,417ක් වී ඇත. ආසාදිතයන් වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ ඉන්දියාව, අමෙරිකාව සහ බ්‍රසීලයෙනි. මේ වන විට කොරෝනා ආසාදිත බවට තහවුරු කළ පිරිස මිලියන 28ක් ඉක්මවා ගොස් ඇත. එයින් අඩක්ම අමෙරිකා කලාපයේ රටවල්වලින් හමුවීම විශේෂත්වයකි.

මීට කලින් එක් දිනක වැඩිම කොරෝනා ආසාදිතයන් ගණනක් ලෝක සෞඛ්‍ය සංවිධානයට වාර්තා වූයේ සැප්තැම්බර් 06 වැනිදාය, එය සංඛ්‍යාත්මකව 306,857කි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව ඉකුත් ඉරිදා ඉන්දියාවෙන් නව ආසාදන 94,372ක් ද, අමෙරිකාවෙන් 45,523ක්ද, බ්‍රසීලයෙන් 43,718ක් ද වාර්තා වී තිබේ. ගෙවුණු පැය 24 ඇතුළත අමෙරිකාවෙන් සහ ඉන්දියාවෙන් කොවිඩ් මරණ දහසකට වැඩියෙන් වාර්තා වී ඇති අතර බ්‍රසීලයේ 874 දෙනෙක් මියගොස් තිබේ.

මෙල්බර්න් නුවර වසා දැමීමට එරෙහිව උද්ඝෝෂණ කළ

# 70කට වැඩි පිරිසක් අත්අඩංගුවට

මෙල්බර්න් නුවර වසා දැමීම්වලට එරෙහිව නීති විරෝධී උද්ඝෝෂණයක නිරතව සිටි දෙසිය පනහකට ආසන්න පිරිසක් අතරින් හැත්තෑවකට වැඩි පිරිසක් අත්අඩංගුවට ගැනීමට ඕස්ට්‍රේලියානු පොලීසිය කටයුතු කර තිබේ. මේ විරෝධතාවය සති අන්තයේ පැවැත් වූ දෙවැනි උද්ඝෝෂණයයි. බොහෝ විරෝධතාකරුවන් ප්‍රකෝපකාරී ලෙස හැසිරී නිලධාරීන්ට එරෙහිව ප්‍රචණ්ඩ ලෙස කටයුතු කොට ඇතැයි පොලීසිය කියයි. මේ විරෝධතා පැන නැඟී ඇත්තේ වික්ටෝරියා බලධාරිහු වසා දැමීම් ලිහිල් කිරීමට කටයුතු කරමින් සිටියදීය. ජූලි මුල් භාගයේ දී එරට වසා දැමීම් නැවත පැනවිණි. ඕස්ට්‍රේලියාවේ කොවිඩ් 19 ආසාදනවල කේන්ද්‍රස්ථානය වී ඇත්තේ ආසාදනවලින් සියයට 75ක් සහ මරණවලින් සියයට 90ක් වාර්තා වී ඇති වික්ටෝරියා ප්‍රාන්තයයි.

# යේමනයේ ඒඩ්න් නුවර කොරෝනාවලට බියෙන් වෛද්‍යවරියක් හැර සියලු වෛද්‍යවරු පලා යති

මිලියනයකට වඩා පිරිසක් ජීවත් වන යේමනයේ ඒඩ්න් නුවර කොරෝනා වසංගතය හමුවේ එක් වෛද්‍යවරියක් හැරෙන්නට අනිකුත් සියලු වෛද්‍යවරුන් ප්‍රදේශයෙන් පලාගොස් ඇතැයි වාර්තා වේ. එම නගරයේ ක්‍රියාත්මකව පවතින්නේ එකම රෝහලක් පමණක් බව ද වැඩිදුරටත් පැවැසේ. කොරෝනා වසංගතයට බියෙන් සහ නිසි ආරක්ෂක උපාංග නොමැතිකමින් මේ වෛද්‍යවරු ප්‍රදේශය අත්හැර මෙසේ පලාගොස් තිබේ.

# සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන ජාතික ප්‍රතිපත්ති සැකසිය යුත්තේ මධ්‍යම ආණ්ඩුවෙන්

## පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය ඇමැති සරත් වීරසේකර

**ස්වර්ණා විජේකෝන්**

සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය මධ්‍යම රජය විසින් සිදු කළ යුතු බවත් එම තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් සභා වෙත පැවරිය යුතු බවටත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තමන්ගෙන් ඉල්ලා සිටි බව පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය ඇමැති සරත් වීරසේකර මහතා ප්‍රකාශ කළේය.

පළාත් සභා ක්‍රියාවලිය සම්බන්ධයෙන් තමන් විසින් සකස් කරන වාර්තාවට මේ සියලු කරුණු ඇතුළත් කරන බවද රාජ්‍ය ඇමැතිවරයා පැවසීය.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අතර ඊයේ (14) පැවැති සාකච්ඡාවෙන් පසුව මාධ්‍ය අමතමිනි.

එහිදී වැඩිදුරටත් පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය ඇමැති සරත් වීරසේකර මහතා මෙසේද කීය.

පළාත් සභා හා පළාත් පාලන ඇමැතිවරයා ලෙස මට වගකීමක් තිබෙනවා. පළාත් සභාවලින් රටට වැඩක් තිබෙනවා ද?.පළාත් සභාවලින් ජනතාව අපේක්ෂා කරන සේවාව නිවැරැදිව ඉටුවෙනවා ද?. පළාත් සභා ඔස්සේ මොන තරම් මුදලක් වාර්ෂිකව වැය කරනවාද?,ආදිය සම්බන්ධයෙන් සොයා බැලීමට. වසර දෙකකට ආසන්න කාලයක් පළාත් සභා මැතිවරණ පවත්වා නැහැ. එවැනි තත්ත්වයක් යටතේ තවදුරටත් පළාත් සභා අවශ්‍යද?, ඒවායින් ඉටුවන සේවා ආදිය සම්බන්ධයෙන් සොයා බැලීමේ වගකීම මා සතුයි.

ඒ නිසා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට විවිධ පාර්ශ්වයන් මා හමුවීමට පැමිණෙනවා. එවැනි ආකාරයට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයත් මාව හමුවුණා. ඔවුන් ඉල්ලා සිටියේත් සෞඛ්‍ය විෂය ක්ෂේත්‍රය මධ්‍යම රජය සතුව පවත්වාගත යුතු බවයි. විශේෂයෙන්ම සෞඛ්‍ය සේවයට අදාළව ප්‍රතිපත්තිමය තීන්දු තීරණ මධ්‍යම රජය විසින් ගතයුතු බවත් එම තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේ බලය පළාත් සභාවට ලබාදිය යුතු බවත් සංගමය ඉල්ලා සිටියා. විශේෂයෙන්ම සෞඛ්‍ය සේවය මධ්‍යම රජය යටතේ පැවතීමේ වටිනාකම අපට කොරෝනා ව්‍යසන තත්ත්වය හමුවේ පැහැදිලි වුණා. යම් හෙයකින් පළාත් සභා යටතේ මේ විෂය මුළුමනින්ම තිබුණානම් එක් පළාත් සභාවකින් අනුමැතිය ලැබෙනකම් අනෙක් පළාත් සභාව යටතේ තිබෙන කොටසට යමක් සිදුකිරීමේ හැකියාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ සියලු කරුණු පිළිබඳ අප සිදුකරන විමර්ශන වාර්තාවට ඇතුළත් කරනවා. ඒ වගේම පසුගිය දිනක මේ ආකාරයටම යම් යම් පිරිස් මාව හමුවුණා. ඒ ඒ අයගේ විවිධ ඉල්ලීම් තිබුණා.

පෙර රජ දවස පවත්වාගෙන ගිය ආකාරයෙන් රුහුණු, මායා, පිහිටි නමින් පළාත් සභා තුනක් පමණක් පවත්වාගෙන යාමට විද්වත් මණ්ඩලයක් විසින් යෝජනා ලබා දුන්නා. දැනට පවතින පළාත් සභා 09 වෙනුවට පළාත් සභා 03 පවත්වාගෙන යාමට යෝජනා කර තිබෙනවා. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් සිදුකරන ලද මේ යෝජනා පිළිබඳ සැලකිලිමත් වෙනවා. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කියන්නෙත් මේ රටේ මැදිහත්විය යුතු සෑම සිදුවීමක් වෙනුවෙන්ම සාධනීයව මැදිහත් වන සංගමයක්. අප එය අගය කළයුතුයි. කොරෝනා ව්‍යසනය ඇතිවූ අවස්ථාවේදි රජය නිවැරැදි තීන්දු තීරණ ගත්තා . පාදෙණිය මහතා සඳහන් කළ පරිදි මේ සම්බන්ධ බලය පළාත් සභා වෙත පැවරී තිබුණානම් කොරෝනා වසංගතය පාලනය කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වෙනවා. වෛද්‍යවරු, සෞඛ්‍ය කාර්ය මණ්ඩල, රණවිරුවන් ආදි මේ සියලු දෙනාගේ කැපවීම එක හා සමානව මෙය පාලනයට බලපෑවා.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා-

පළාත් සභා හා පළාත් පාලන විෂය ක්ෂේත්‍රයට තේරීපත්වූ විෂය භාර ඇමැති සරත් විරසේකර මහතාට අපගේ සුබපැතුම් පිරිනමනවා. සෞඛ්‍ය විෂය ක්ෂේත්‍රය පවත්වාගෙන යායුතු ආකාරය සම්බන්ධයෙන් අප දරන මතයමයි ඔබතුමාත් දරන්නේ. එයත් ඔබතුමාගෙන් අප දකින සුවිශේෂිත්වයක්. ඒ වගේම පළාත් සභා විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අප හිතන ආකාරයටමයි ඔබතුමාත් සිතන්නේ. සරත් වීරසේකර කියන්නේ රටට ආදරය කරන අවංක නිලධාරියෙක්. ඒ වගේම දේශපාලන කෝණයෙන් තොරව තමන්ගේ මතය නිර්භයව රටට ප්‍රකාශ කරනවා.

සෞඛ්‍ය යනු තාක්ෂණික විෂයක්. සෞඛ්‍ය සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නොවෙයි. අලුත් උපන් දරුවාගේ සිට මියයන තෙක්ම සෑම මිනිසකුටම සෞඛ්‍ය ප්‍රයෝජනවත් වෙනවා. සෞඛ්‍ය සේවය කියන්නේ මේ රටේ සියලු පුරවැසියන්ට හිමිවිය යුතු අයිතිවාසිකමක්. සෞඛ්‍ය සේවයේ ගුණාත්මක බව ඉහළින් තිබිය යුතුයි.ඒ වගේම සෞඛ්‍ය සේවය විධිමත්ව පවත්වාගෙන යාම කියන්නේ එක් පිරිසකට පමණක් ඒ සේවාව ලබාගැනීම නොවෙයි. සෞඛ්‍ය සේවය සමානුපාතික ලෙස සියලු දෙනාට එකසේ බෙදී යායුතුයි. මේ සේවය ලබාදීමේදි දුප්පත්,පොහොසත් ආදි හැමෝටම එක හා සමානව සෞඛ්‍ය ඔස්සේ ප්‍රතිලාභ හිමිවිය යුතුයි. ජාති ආගම් වශයෙන් වෙනස් කොට සලකමින් සෞඛ්‍ය පහසුකම් ලබානොදී සිටීමේ හැකියාවක් නැහැ. සෞඛ්‍ය සේවය ජාතික ප්‍රතිපත්තියක් අනුව ක්‍රියාත්මක වීම සිදුවිය යුතුයි.

# පාරිභෝගිකයා දිනවීම

## අපේ ජයග්‍රහණයයි

**කොවිඩ්-19 ආර්ථිකයට කළ බලපෑම ඉමහත්ය. කොවිඩ්-19 බලපෑමෙන් මිදී සාමාන්‍ය තත්ත්වයට පත්වන ආර්ථිකයන් අතර ශ්‍රී ලංකාව ප්‍රමුඛ බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ පැසසුමට ලක් වී තිබේ. එහෙත් සියල්ල සාමාන්‍ය තත්ත්වයට පත් වීමට සැලකිය යුතු කාලයක් ගත වනු ඇතැයි ආර්ථික විශ්ලේෂකයන් අනතුරු අඟවන්නේ කලාපීය ප්‍රබලයන් මෙන්ම ගෝලීය ආර්ථිකයේ ප්‍රබලයන් තවමත් කොවිඩ් -19 පීඩාවේ ගොදුරු බවට පත්වී සිටින හෙයිනි. මේ පිළිබඳත් දුෂ්කරතා හමුවේ ආර්ථික අභියෝග ජය ගැනීම සඳහා බැංකු ක්ෂේත්‍රයේ සූදානම පිළිබඳත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී ටී. කුහන් මහතාගෙන් විමසීමු.**

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී ටී. කුහන්**

In conversation with...

● **කොවිඩ්-19 හමුවේ RDB ක්‍රියාකාරිත්වය කෙබඳු ද ?**

සංවර්ධන බැංකුවක් ලෙස අප බැංකුව හා ගනුදෙනු කරන ව්‍යවසායකයන් අතරින් වැඩි පිරිසක් දැඩි පරිශ්‍රමයකින් යුතුව ආර්ථිකය පවත්වාගෙන යන පිරිසක්. කොවිඩ්-19 පැමිණෙන විට අප බැංකුව වෙතින් ණය ලබා සිටි පිරිස ලක්ෂ පහක් පමණ වුණා. ඒ අය අතරින් තුන්ලක්ෂ පනස් දෙදහසක පිරිසක් මහ බැංකුව වෙතින් ප්‍රකාශයට පත් කළ ණය සහන ඉල්ලුම් කර තිබුණා. ඒ අනුව අපගේ සාමාජිකයන් 70%ක ප්‍රතිශතයක් බැංකුව වෙතින් ණය සහන අයදුම් කර තිබුණා. මහජනතාවගේ පොලිය මත යැපෙන බැංකුවක් ලෙස මෙවැනි තත්ත්වයක් කළමනාකරණය කිරීම අභියෝගයක් වුවත් අපි එම තත්ත්වය මැනවින් කළමනාකරණය කරගත්තා. පසුගිය වසරේ පාස්කු ප්‍රහාරය හේතුවෙන් වැඩි වශයෙන් පසුබෑමට ලක්වූණේ සංචාරක කර්මාන්තය. ඒ ක්ෂේත්‍රයේ පහළම ස්ථරය නියෝජනය කරන්නේ අපගේ පාරිභෝගිකයන්. හෝටල්වලට එළවළු, පලතුරු සැපයීම, බිත්තර මස් මාළු සැපයීම පමණක් නොවේ සංචාරක වාහන ත්‍රිරෝද රථ මිලදී ගැනීම කුඩා හෝටල් ආදිය පවත්වාගෙන යෑමට ඒවා ඉදිකිරීම, නවීකරණය වැනි කටයුතු සඳහා මෙන්ම බතික් ආදී කර්මාන්ත සඳහාත් වැඩි පිරිසක් අප වෙතින් ණය ලබාගෙන තිබෙනවා. ඒ හේතුව නිසයි පසුගිය වසරේ රජයේ මැදිහත්වීමෙන් සංචාරක පොඩ්ඩෝ නමින් අප බැංකුව වෙතින් ලක්ෂ පහක ණය මුදලක් වසර තුනක කාලසීමාවකට ලබා දුන් ණයක්. වසරක කාලයක් සඳහා අය නොකරන ණයක් මෙන්ම ඒ සඳහා සහන පොලියක් රජය වෙතින් බැංකුව වෙත ලබා දීමේ අනුමැතියක් තිබුණා. මේ අන්දමින් ණය ගත් පිරිසට හෝ ඉන් නිසි ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබෙනවා පමණක් නොවෙයි. එම ණය ගෙවීම් තවමත් ආරම්භ කොට නෑ. ඒ අය පිළිබඳත් නැවත සිතා බැලීමට සිදු වෙනවා.

● **ණය ගනුදෙනුකරුවන්ගේ වාරික සහ පොලිය අය නොකිරීමෙන් මූල්‍ය අස්ථාවරත්වයක් ඇති වී තිබෙනවා ද?**

අප බැංකුවේ මුඛ්‍ය ආදායම් මඟ පාරිභෝගිකයන්ගෙන් ලබා ගන්නා ණය පොලියයි. වාරික සහ පොලිය මාස තුනකට වැඩි කාලයක් අය නොකිරීම හේතුවෙන් බැංකුවේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු බලපෑමක් සිදු වී තිබෙනවා. ඔබ එසේ විමසන්නේ පසුගිය මාසයේ මූල්‍ය ප්‍රකාශයේ සඳහන් වූ බදුවලට පසු අලාභය සලකා වෙන්නට ඇති. නමුත් අප බැංකුවේ ද්‍රවශීලතාවය මෙන්ම මූල්‍ය ස්ථාවර බව මහ බැංකුවේ නිර්ණායකයන්ට අනුව ඉහළින් පවතින්නේ. මෙවැනි ව්‍යසනකාරී ජාතික ගැටලුවක් අවස්ථාවේදී ලාභය ස්ථාවරව පවත්වා ගැනීම පසෙක දමා අපගේ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම පිළිබඳයි අපි සැලකිලිමත් වුණේ. බැංකුව මෙන්ම පාරිභෝගිකයා ජයග්‍රහණය කරන අසමසම තත්ත්වයක් ඇති කිරීමයි මෙවැනි අවස්ථාවක උචිතම ක්‍රමවේදය. පවතින කොවිඩ්-19 නිසා අසරණ වී පසුබෑමට පත්වී සිටින ජනතාවගේ අවශ්‍යතා පිළිබඳ අපි පූර්ව නිගමනයන් කිහිපයකට එළඹී තිබෙනවා ඒ අනුවයි 'පුනර්ජීවන' ණය යෝජනාවක් සැලසුම් කර තිබෙන්නේ.



● **'පුනර්ජීවන' පිළිබඳ තවදුරටත් විස්තර කළොත්?**

බිඳවැටුණු ආර්ථිකයට නව පණක් දීමටයි පුවර්ජීවන යෝජනාව ඉදිරිපත් කිරීමේ මුඛ්‍ය පරමාර්ථය. මෙවැනි ණයක් ලබා ගැනීම සඳහා උනන්දු වන පිරිස අපි කාණ්ඩ කිහිපයකට බෙදා හඳුනාගෙන තිබෙනවා. ඒ අතර විවිධ ආකාරයෙන් අප වෙතින් දැනටමත් ණය ගෙන ඒවා යොදා කරන ලද ව්‍යාපාරයන් අඩපණවීම හේතුවෙන් ණය වාරික හෝ ගෙවීමට නොහැකිව අසීරු තත්ත්වයකට පත් පිරිසක් සිටිනවා. එවැනි අයගේ ණය ගෙවීමේ කාලය දීර්ඝ කර දීම, ඇතැම් ව්‍යාපාරවලට පඩි ගෙවීමට නොහැකි වීම මෙන්ම නිෂ්පාදන කටයුතු නැවත සක්‍රිය කිරීමට යම් ප්‍රාග්ධනයක අවශ්‍යතාව මතු වී තිබෙනවා. මෙවැනි අයට දැනට ගෙවා ඇති ප්‍රතිශතයට අනුව නැවත වරක් ලේබන අලුත් කර ඒ සඳහා තවත් ණය මුදලක් දීම සඳහා කටයුතු කෙරෙනවා.

මීට අමතරව මෙතෙක් අප වෙතින් ණය ගෙන නැතත් පත් වී ඇති දුෂ්කරතාව හේතුවෙන් ණය මුදලක් අපේක්ෂා කරන පිරිස් සිටිනවා. බොහෝ අයගේ ආදායම් මාර්ග විවිධ ආකාරයෙන් අහිමි වී තිබෙනවා. ඒ වෙනුවට නව ආදායම් මඟක අවශ්‍යතාව උද්ගත වී තිබෙන්න පුළුවන්. එවැනි අයත් ණය මුදලක් බලාපොරොත්තු වෙනවා. මීට අමතරව ව්‍යාපාර නොකළත් වැටුප් ලබන අයටත් විවිධ මුදල් අවශ්‍යතා තිබෙනවා. පෞද්ගලික ණයක් ලෙස එවැනි අය වෙනුවෙනුත් ණය මුදලක් දීමේ සැලසුමක් තිබෙනවා. මීට අමතරව මේ වකවානුවේ වුණත් නිවාස අලුත් වැඩියා, ඉඩම් මිල දී ගැනීම් වැනි කටයුතු සඳහාත් මුදල් අවශ්‍යතාව ඇති පිරිස් සිටිනවා. පවතින ආර්ථික තත්ත්වය කෙබඳු වුණත් පොලී අනුපාත අඩුවීම නිසා මෙවැනි අවස්ථාවක ආයෝජන කිරීමට සුදුසු බවට තීරණය කරන පිරිස් සිටින බව ආර්ථික විද්‍යාවේ නියමයන්ගෙන් එකක්. එවැනි පිරිස් සඳහාත් මේ 'පුනර්ජීවන' ණය යෝජනාවෙන් ණය ලබා දෙනවා.

● **ණය අයදුම් කිරීමේ විශේෂ ක්‍රියා පටිපාටියක් තිබෙනවා ද?**

අපගේ ශාඛා සියල්ලම වාගේ පසුගිය සති දෙකෙහි මේ වෙනුවෙන් ස්වේච්ඡාවෙන් කටයුතු කළා. මේ සඳහා වන අයදුම්පත් මේ වන විටත් ශාඛා වෙත ලැබෙමින් තිබෙනවා. හැකි උපරිමයෙන් පාරිභෝගිකයා වෙත සහන සැලසීමයි අපගේ අරමුණ. ඒ වෙනුවෙන් ශාඛා සියල්ලටම උපදෙස් හා අවශ්‍ය දිරිගැන්වීම් ලබාදී තිබෙනවා.

**සටහන**
**බුද්ධිකා බ්‍රාහ්මණගේ**

## Bosch ඩීසල් පොම්ප සේවා මධ්‍යස්ථානයක් පංචිකාවත්තට

Ideal First Choice ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බහු සන්නාම (Multibrand) මෝටර් රථ සහ සැහැල්ලු ට්‍රක් රථ සඳහා පුළුල් පරාසයක සේවා සපයන මධ්‍යස්ථාන ජාලයකින් සහ සියලු වර්ගයේ අමතර කොටස් බෙදා හැරීමේ ජාලයකින් සමන්විත වේ.

IFC වෙතින් පසුගිය දා පංචිකාවත්ත ප්‍රදේශයේ විවෘත කරනු ලැබූ BOSCH ඩීසල් පොම්ප සේවා මධ්‍යස්ථානය, අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුතු ඩීසල් පොම්ප අලුත්වැඩියා කිරීමේ සහ නඩත්තු කිරීමේ සේවාවන් රැසක් සපයනු ලබන අතර, එමඟින් පාරිභෝගිකයන්ට අවශ්‍ය BOSCH අමතර කොටස් ලබා ගැනීමේ අවස්ථාවද සලසා ඇත.

නව සේවා මධ්‍යස්ථානයේ සමාරම්භක උත්සවය අයිඩියල් සමූහ ව්‍යාපාරයේ සභාපති නලීන් පේ. වෙල්ගම මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණු අතර, මේ අවස්ථාවට අයිඩියල් සමූහ ව්‍යාපාරයේ නීතිමය හා ආයතනික කටයුතු අධ්‍යක්ෂිකා නිමිෂා වෙල්ගම, අයිඩියල් මෝටර්ස් අධ්‍යක්ෂ (මෝටර් රථ), චම්න්ද වනිගරත්න සහ ශ්‍රී ලංකාවේ BOSCH කළමනාකාර අධ්‍යක්ෂ ස්වාමිනාදන් ආර්. යන මහත්වරු ද සහභාගි වූහ.

අභිනවයෙන් දියත් කරන ලද BOSCH ඩීසල් පොම්ප සේවා මධ්‍යස්ථානය පසුගිය මාර්තු මසදී Ideal First Choice විසින් දියත් කරනු ලැබූ BOSCH ඩීසල් පද්ධති සහ අමතර කොටස් බෙදාහැරීමේ සේවා නියෝජිත දිගුවක් ලෙසින් ක්‍රියාත්මක වීමට නියමිත අතර, මේ මඟින් දිවයින පුරා විසිරී ඇති Ideal First Choice අලෙවි නියෝජිත ජාලය තවදුරටත් ශක්තිමත් කිරීම ද අරමුණුකොට ඇත. එමෙන්ම දිවයින පුරා BOSCH ඩීසල් පොම්ප එකතු කිරීමේ මධ්‍යස්ථාන 24ක් ද පිහිටුවා ඇති නිසා පාරිභෝගිකයන්ට වඩාත් පහසුවෙන් තමන්ට ළඟම පිහිටි මධ්‍යස්ථානයක් හා සම්බන්ධ වීමේ හැකියාව නවතී.

## LANKAPAK 2020 වෙතින් දේශීය කර්මාන්තවලට ඇසුරුම්කරණ සහ මුද්‍රණ විසඳුම්

ශ්‍රී ලංකාවේ එකම ඇසුරුම්කරණ සහ මුද්‍රණ විසඳුම් සම්බන්ධ ප්‍රදර්ශනය වන LANKAPAK 2020 හරහා දේශීය කර්මාන්තකරුවන්ට සහ නිෂ්පාදකයන් හට විසඳුම් රැසක් හිමි වීමට නියමිතය. ශ්‍රී ලාංකේය සමාගම්වලට සිය නිෂ්පාදන සහ සන්නාම ඇසුරුම්කරණය යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය විසඳුම් ලබාදෙමින් දේශීය සහ ජාත්‍යන්තර සන්නාම සමඟ තරග කිරීමේ අවස්ථාව උදාකර දීම එම ප්‍රදර්ශනයේ අරමුණයි. සාර්ථකව 22 වන වරටත් සංවිධාන කෙරෙන එම ප්‍රදර්ශනය ඔක්තෝබර් මස 9, 10 සහ 11 යන දිනවලදී පෙ.ව. 10 සිට ප.ව. 7 දක්වා BMICH හිදී පැවැත්වීමට නියමිතය. ශ්‍රී ලංකා ඇසුරුම්කරණ ආයතනය සහ CDC Events and Travels ආයතනය විසින් ලෝක ඇසුරුම්කරණ සංවිධානය, ආසියානු ඇසුරුම්කරණ සම්මේලනය සහ රාජ්‍ය හා පුද්ගලික අංශයේ සහයෝගයෙන් යුතුව ප්‍රදර්ශනය සංවිධාන කරනු ලබයි.

ඇසුරුම්කරණය, මුද්‍රණය, ප්ලාස්ටික් සහ කඩදාසි සඳහාම වෙන්වූ එකම ශ්‍රී ලාංකේය ප්‍රදර්ශනය වන LANKAPAK 2020 ප්‍රදර්ශනය ප්‍රාථමික සහ ද්විතීයික ඇසුරුම්කරණ විසඳුම් සඳහා වන ප්‍රමුඛතම උලෙළ ද වෙයි. මීළඟ ව්‍යාපෘතිය හෝ විසඳුම සඳහා සැපයුම් දාමයේ සියලු ගැනුම්කරුවන්ට සහ විකුණුම්කරුවන්ට විසඳුම් ලබාගත හැකි මධ්‍යස්ථානයක් ලෙස ද එම ප්‍රදර්ශනය හැඳින්විය හැකිය. සමස්ත ඇසුරුම්කරණ ක්ෂේත්‍රයම නියෝජනය කරමින් ප්‍රදර්ශනකරුවන් මේ සඳහා සහභාගීවන බැවින් දේශීය සහ විදේශීය පාරිභෝගිකයන් හට අවශ්‍ය විසඳුම් ලබාගැනීම සඳහා මේ ප්‍රදර්ශනය මනා අවස්ථාවක් ද වෙයි. දේශීය මුද්‍රණ සහ ඇසුරුම්කරණ ව්‍යවසායකයන් හට සැපයුම්කරුවන් සහ ගැනුම්කරුවන් අතර හුවමාරු ප්‍රවර්ධනය කිරීමට මෙන්ම අන්තර්ජාතික හුවමාරු සිදුකිරීම, නව තාක්ෂණය හුවමාරුව සවිබල ගැන්වීම සහ බෙදාහැරීම සවිබලගැන්වීම හරහා මුද්‍රණ කර්මාන්තයේ තාක්ෂණික වැඩිදියුණු කිරීම් සඳහා නව වේදිකාවක් ගොඩනැගීමට ද මේ ප්‍රදර්ශනය අනගි අවස්ථාවක් නිර්මාණය කරයි.

## පැල්වත්ත නිපැයුම්වලට ඉහළ වට්ටම්

දිවයිනේ දැවැන්තම කිරි අහාර නිෂ්පාදකයා වන පැල්වත්ත සමාගම වෙතින් (Pelwatte Dairy Industries) මෙරට ප්‍රමුඛතම සුපිරි වෙළෙඳසල් ජාලය හරහා පාරිභෝගිකයන් ගෙවන මුදලට ඉහළ වටිනාකමක් එක් කරමින් මේ මාසය පුරාවට ආකර්ෂණීය වට්ටම් රාශියක් පිරිනමයි.

පැල්වත්ත සමාගම විසින් ගෘහස්ථ පරිභෝජනයට සහ විවිධ ආහාර නිෂ්පාදන අවශ්‍යතා සඳහා අවශ්‍ය සෞඛ්‍ය සම්පන්න, නැවුම් හා ප්‍රනීත කිරි, යෝගට්, අයිස්ක්‍රීම් සහ බටර් (ලුණු සහිත සහ රහිත) ඇතුළු කිරි ආහාර නිෂ්පාදනය කරනු ලබයි. සෑම තරාතිරමකම සෑම පුද්ගලයකුගේම අවශ්‍යතා සපුරාලන සන්නාමයක් ලෙස පැල්වත්ත ඩේරි නිරන්තරයෙන්ම සිය කිරි නිෂ්පාදන සියලු ශ්‍රී ලාංකිකයන්හට මිලට ගත හැකි වන පරිදි සකස් කිරීමට කැපවී සිටී. රටම වෙළාගත් කෝරෝනා සමයේදී පැල්වත්ත සිය පාරිභෝගික ජනතාව වෙනුවෙන් ඉටු කළ කාර්යභාරය ඉතා ඉහළ පැසසුමට ලක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පාරිභෝගිකයන් වෙත තවදුරටත් සහන සලසමින් පැල්වත්ත සමාගම මේ වට්ටම් පිරිනැමීමේ වැඩසටහන දියත් කර ඇත.

## නිත්‍යකල්‍යාණි ජුවලරි වැල්ලවත්ත වෙරළ පිරිසුදු කරයි

වැල්ලවත්ත නිත්‍යකල්‍යාණි ජුවලරි අඛණ්ඩව පස් වැනි වරටත් සංවිධාන කළ වෙරළ පිරිසුදු කිරීමේ සමාජ සත්කාරය පසුගියදා විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් වැල්ලවත්ත වෙරළ තීරයේදී පැවැත්විණි. වැල්ලවත්ත පොලීසියේද සහයෝගය ඇතිව සංවිධාන කරන ලද මේ වැඩසටහනට වැල්ලවත්ත නිත්‍යකල්‍යාණි කාර්ය මණ්ඩලය, පාරිභෝගිකයන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ. පසුගිය දා (16) වැල්ලවත්ත වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහන පැවැති අතර, කැළි කසළ නිසා අපවිත්‍රව පැවැති වෙරළ තීරය සියලු දෙනාගේ සිත් සතන් ඇද ගන්නා දර්ශනීය හා පිරිසුදු වෙරළ තීරයක් බවට නැවත පත් කිරීමට මේ සමාජ සත්කාරය හරහා හැකි විය. මේ අවස්ථාවට සම්බන්ධ වෙමින් වැල්ලවත්ත නිත්‍යකල්‍යාණි ජුවලරි ප්‍රධාන විධායක නිලධාරී ඒ. පී. ජෙයරාජා මහතා සඳහන් කළේ පරිසරය ආරක්ෂා කර ගැනීම සිය ආයතනික සමාජ වගකීම්වල ප්‍රධාන කොටසක් ලෙස සලකන බවත් ඉදිරියේදීත් මෙවැනි වැඩසටහන් සංවිධාන කරන බවත්ය.

අතීතයේ පටන් සුන්දර පරිසරයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කර ගැනීම පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්විය යුතු බවත් තම ආයතනය මෙවන් වැඩසටහන් හරහා සිදු කරන්නේ එම කර්තව්‍යයට ආයතනික මට්ටමින් සහයෝගය දැක්වීම බවත් වැල්ලවත්ත නිත්‍යකල්‍යාණි ජුවලරි සම හවුල්කරු දිවාකර් බාලසුබ්‍රමනියම් මහතා පැවැසීය.

# බංග්ලාදේශ ක්‍රිකට් පිලේ ශ්‍රී ලංකා සංචාරය නිරෝධායන නීති හේතුවෙන් ඇන හිටියි

**ප්‍රින්ස් ගුණසේකර**

ටෙස්ට් තරග තුනකින් සමන්විත බංග්ලාදේශ ක්‍රිකට් පිලේ ශ්‍රී ලංකා සංචාරය කොරෝනා නිරෝධායන නීති හේතුවෙන් අවිනිශ්චිත තත්ත්වයකට පත්ව ඇත. විදෙස් රටක සිට පැමිණ ශ්‍රී ලංකාවට ඇතුළු වන සෑම පුද්ගලයකුම කොරෝනා ආසාදනය වී ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා දින 14 ක නිරෝධායනයක් පවත්වා ගත යුතු වුවද, බංග්ලාදේශ ක්‍රිකට් කළමනාකාරිත්වය එම කාල සීමාව දින හතක් දක්වා අඩු කරන ලෙස කරන ලද ඉල්ලීම හේතුවෙන් බංග්ලාදේශ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ පැමිණීම අවිනිශ්චිත තත්ත්වයකට පත්ව තිබේ.

බංග්ලාදේශ ක්‍රිකට් ආයතනය කළ මෙම යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුකූල නොවන හෙයින් එරට ක්‍රිකට් කළමනාකාරිත්වය අපේක්ෂා කරන පිළිතුර ලබාදීමට නොහැකි වනු ඇතැයි ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම් මොහාන් ද සිල්වා මහතා 'දිනමිණ' කළ විමසීමකදී පැවැසීය.

"බංග්ලාදේශ පිල ශ්‍රී ලංකාවට පැමිණෙනවා නම් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කළ යුතුයි. ක්‍රිකට් නිසා කොරෝනා අවදානම අපට ගන්න බෑ. අප මේ තත්ත්වය බංග්ලාදේශ ක්‍රිකට් ආයතනයට දන්වා තිබෙනවා. ඔවුන් අපේ රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුකූල විය යුතුයි. නමුත් දැන් තියෙන තත්ත්වය අනුව බංග්ලාදේශ ක්‍රිකට් පිලේ පැමිණීම පිළිබඳ විශ්වාස කරන්න අපහසුයි" ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම්වරයා පැවැසීය.

**ක්‍රීඩකයන් දින 14ක් හෝටලයේ ඉන්න බෑ කියලා**

මෙම තරග සංචාරය පසුගිය අගෝස්තු මාසයේදී පැවැත්වීමට නියමිතව තිබුණද කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් දින නියමයක් නැතිව කල් දැමිණි. එහෙත් ශ්‍රී ලංකාවේ කොරෝනා තත්ත්වය යම් දුරකට පාලනය වී ඇති හෙයින් බංග්ලාදේශ පිලේ තරග සංචාරය සැප්තැම්බර් - ඔක්තෝබර් අතරතුර පැවැත්වීමට දෙරට ක්‍රිකට් පාලක මණ්ඩල එකඟතාවකට පැමිණියහ.

ඒ අනුව බංග්ලාදේශ ක්‍රිකට් පිල මේ මස 21 වැනිදා ශ්‍රී ලංකාවට පැමිණ 27 වැනිදා සිට තරගාවලියේ පුහුණුවීම් ආරම්භ කිරීමට අවසර ඉල්ලා තිබිණි. අයිසීසී ටෙස්ට් ශූරතාවලියට අයත් මෙම ටෙස්ට් තරග සංචාරය පැවැත්වීමට නම් බංග්ලාදේශ පිල මේ මස 21 වැනිදා පැමිණ ලබන මස 5 වැනිදාට පසුව පුහුණුවීම් හා තරගාවලිය ආරම්භ කිරීමට කැමැති විය යුතු වේ.

බංග්ලාදේශ පිල අවසන් වරට ටෙස්ට් තරගාවලියක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණ ඇත්තේ 2017 වසරේ මාර්තු මාසයේදී වන අතර එහිදී පැවැත්වූ එකම ටෙස්ට් තරගයෙන් ශ්‍රී ලංකාව කඩුලු 4ක ජයක් ලැබීය. පී. සරා ඕවල් පිටියේ පැවැති එම තරගය බංග්ලාදේශය ශ්‍රී ලංකාවට එරෙහිව ලැබූ පළමු ටෙස්ට් ජයග්‍රහණය ලෙස ඉතිහාස පොතට එක්විය.

කොරෝනා වයිරසය හේතුවෙන් ශ්‍රී ලංකා - බංග්ලාදේශ ටෙස්ට් තරගාවලිය පැවැත්වීමට නොහැකි වුව හොත් මේ වසරේ ශ්‍රී ලංකාවේදී කිසිදු ජාත්‍යන්තර ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීමේ අවස්ථා අහිමි වී යනු ඇත. විදෙස් ක්‍රීඩකයන් විශාල පිරිසක් සහභාගී වීමට නියමිත ලංකා ප්‍රීමියර් ලීග් තරගාවලිය පමණක් ශ්‍රී ලංකාවේ මේ වසරේදී පැවැත්වෙන එකම තරගාවලිය බවට පත් වනු ඇත.

# නව සැලසුම් අතැතිව රග්බි ආයතනය අද අනුග්‍රාහකයන් හමු වෙයි

**ෆවුස් මොහොමඩ්**

මෙරට රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් සුපුරුදු පරිදි ඩයලොග් ආසියාටා ආයතනය නව පරිපාලනය සමග අත්වැල් බැඳ ගනු ඇතැයි රග්බි සභාපති රිස්ලි ඉල්යාස් මහතා විශ්වාසය පළ කළේය.

රග්බි ක්‍රීඩාව ඉදිරියට ගෙන යෑමේ නව සංකල්පයට ඩයලොග් ආයතනයේ එකඟත්වය ලැබෙනු ඇතැයි 'දිනමිණ' කළ විමසුමකදී ඉල්යාස් මහතා සඳහන් කළේය. නව සංකල්පය සමග මෙරට රග්බි ක්‍රීඩාවේ අනාගත සැලසුම් පිළිබඳ සාකච්ඡා කිරීමට ඉල්යාස් මහතා ඇතුළු රග්බි ආයතනයේ අනුග්‍රාහකත්ව පිළිබඳ කටයුතු කරන කමිටුව අද (15) ඩයලොග් ආසියාටා ආයතනය සමග සාකච්ඡා කිරීමට නියමිතය.

ඩයලොග් ආසියාටා ආයතනය වසර 2012 සිට ජාතික රග්බි කණ්ඩායමේ ප්‍රධාන අනුග්‍රාහක ලෙස කටයුතු කරන අතර, මේ වසරේදී පාසල් රග්බි පිටියටත් එක්වෙමින් රුපියල් මිලියන 65ක අනුග්‍රාහකත්වයක් ලබා දුන්නේය.

ශ්‍රී ලංකාවට සත් සාමාජික රග්බි ක්‍රීඩාවෙන් ආසියාවේ පළමු කණ්ඩායම් 3 අතරට එක්වීමේ කදිම අවස්ථාවක් ඇති බවත්, එම ජයග්‍රහණය අත්පත් කරගැනීමට ඩයලොග් ආසියාටා ආයතනයේ අනුග්‍රාහකත්වය විශාල රුකුලක් වනු ඇති බවත් ඔහු පැවැසීය.

අවුරුදු 21න් පහළ තරගාවලියක්, අවුරුදු 24න් පහළ තරගාවලියක් සමග සත් සාමාජික තරගාවලි 4ක් සංවිධාන කිරීමට රග්බි ආයතනය පියවර ගෙන ඇති අතර, 'බී' කාණ්ඩයේ ක්‍රීඩා සමාජ ප්‍රවර්ධනය කිරීමට ද අවධානය යොමු කර තිබේ.

රග්බි ආයතනය ක්‍රීඩාව යළි ආරම්භ කිරීමට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් අනුමැතිය බලාපොරොත්තු වන අතර, ඊට පෙර ඒ සඳහා නිශ්චිතව සූදානම් විය යුතු බැවින් මේ මස 17 වැනිදා ක්‍රීඩකයන් සහ සෙසු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු යොදා තිබේ.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

## 42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : .....

ඔබේ නම : .....

ලිපිනය : .....

ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**
1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-09-19 **අංකය** 28

UNLIMITED YouTube HD quality up to 25GB* මාසෙටම රු.249+බදු #170# අමතන්න Sri Lanka Telecom Mobitel 4G

# අන්තර් ක්‍රීඩා සමාජ එෆ්.ඒ. කුසලාන පාපන්දු තරගාවලිය ලබන මාසයේ සිට

## වැන්ටේජ් සමඟ අත්වැල් බැඳගැනීමට සම්මේලනය සූදානමින්

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මෙහෙයවන අන්තර් ක්‍රීඩා සමාජ එෆ්. ඒ. කුසලාන පාපන්දු තරගාවලිය ලබන මාසයේ ආරම්භ කිරීමට සූදානම් වෙයි. පාපන්දු ලීග් 63කින් ක්‍රීඩා සමාජ 926ක් මෙම තරගාවලියට ඇතුළත්ව සිටින අතර රටපුරා විවිධ ස්ථානවල ක්‍රීඩාංගණවලදී මූලික වටයේ තරග පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙවර තරගාවලියට සහභාගීවන කණ්ඩායම්වලින් අයැදුම්පත් ලබා ගැනීම ඊයේ සිට අවසන් කෙරිණි.

පසුගිය වසරේදී එෆ්. ඒ. කුසලාන පාපන්දු තරගාවලියට පාපන්දු ලීග් 63කින් ක්‍රීඩා සමාජ 826ක් සහභාගීවී සිටි හෙයින් මෙවර කණ්ඩායම් 100ක වැඩිවීමක් ඇතිව තිබේ. පිළිමලුන් පිටුදැකීමේ ක්‍රමයට පැවැත්වෙන මෙම තරගාවලියේ දිස්ත්‍රික් තරග වටය ඔක්තෝබර් මාසයේ සිට ආරම්භවන අතර කලාපීය තරග වටය නොවැම්බර් මාසයේ සිට පැවැත්වේ. ජයග්‍රහණය ලබන ක්‍රීඩා සමාජ 32 අතර වටය ලබන වසරේ මුල් සතියේ සිට හා අවසන් වටය පෙබරවාරි මාසයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මේ පිළිබඳව 'දිනමිණ' කළ විමසීමකදී ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සභාපති අනුර ද සිල්වා මහතා පැවැසුවේ මෙවරත් එෆ්. ඒ. කුසලාන පාපන්දු තරගාවලියට ඊබෝනි හෝල්ඩිංග්ස් 'වැන්ටේජ්' අනුග්‍රහය පිරිනැමෙනු ඇති බවට තමන් විශ්වාස කරන බවය. එසේ වුවහොත් මෙම තරගාවලිය විශාල ශක්තියකින් පවත්වා ගැනීමේ හැකියාව ලැබෙනු ඇතැයි පාපන්දු සභාපතිවරයා පැවැසීය.

"මේ තරගාවලියට ඊබෝනි හෝල්ඩිංග්ස් 'වැන්ටේජ්' අනුග්‍රහය පසුගිය වසරේ සිට පිරිනැමුණා. එයින් තරගාවලියට විශාල ශක්තියක් ලැබුණා. එෆ්. කුසලාන පාපන්දු තරගාවලිය ගම් වලින් බිහි වන පාපන්දු කණ්ඩායම්වලට සහභාගී විය හැකි තරගාවලියක්. ඒ නිසා මේ තරගාවලිය නැගී එන පාපන්දු ක්‍රීඩකයින්ට විශාල ශක්තියක්. සම්මේලනය ලෙස සියලු ශක්තීන් යොදා මේ තරගාවලිය සාර්ථක කරනවා" සිල්වා මහතා පැවැසීය.

එෆ්.ඒ. කුසලාන පාපන්දු තරගාවලියේ ජයග්‍රාහකයන්ට රුපියල් ලක්ෂ 7.5ක් හා අනු ශූරයන්ට රුපියල් ලක්ෂ 5ක මුදලක් පිරිනැමීමට පාපන්දු සම්මේලනය කටයුතු යොදා ඇත. එයට අමතරව වැඩිම ගෝල් වාර්තා කළ ක්‍රීඩකයා, දක්ෂතම ගෝල් කීපර් ඇතුළු විවිධ අංශවලින් දක්ෂතා දක්වන ක්‍රීඩකයන්ට තෑගි හා සම්මාන ප්‍රදානය කිරීමටද සූදානම්න් සිටී. පසුගිය වසරේ එෆ්. ඒ කුසලාන පාපන්දු තරගාවලියේ ශූරතාව වසර 12කට පසු ශ්‍රී ලංකා පොලිස් පිල දිනා ගත් අතර අනු ශූරතාව සෝන්ඩර්ස් පිලට හිමි විය. රිඩ් මාවත තුරඟ තරග පිටියේදී විදුලි ආලෝක ධාරා මැද සෝන්ඩර්ස් හා පොලිස් ක්‍රීඩා සමාජ අතර පැවැති අවසන් මහා තරගයේදී දඬුවම් පහර 5-4කින් පොලිස් පිල ජයග්‍රහණය වාර්තා කළේය. සෝන්ඩර්ස් පිල එෆ්.ඒ. කුසලාන පාපන්දු ඉතිහාසයේ අවස්ථා 17කදී කුසලානය රැගෙන ගියද පසුගිය අවස්ථා දෙකකදීම අනු ශූරයන් බවට පත් විය.

# ෆින්චිගේ උත්සාහය අපතේ යයි

සටන්කාමී ඉනිමක් ක්‍රීඩා කළ ආරොන් ෆින්චිගේ අර්ධ ශතකය අපතේ හරිමින් මැන්චෙස්ටර් නුවර පෙරේදා පැවැති දෙවැනි එක්දින තරගයෙන් ලකුණු 24ක ජයක් අත් කර ගැනීමට එංගලන්තය සමත් විය.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහරදුන් එංගලන්ත පිල ඕවර 50 අවසානයේ කඩුලු 9කට රැස් කළ ලකුණු 231ක හඹා ගිය සංචාරක ඔස්ට්‍රේලියානු පිලේ ඉනිම ජොෆ්රා ආචර් ඇතුළු පන්දු යවන්නන් විසින් ලකුණු 207කට සීමා කිරීමෙන් ජයග්‍රහණය සපුරා ගත් එංගලන්තය 1-1ක් ලෙස එක්දින තරගාවලිය සමකර ගැනීමට ද සමත් විය. ඉලක්කය හඹා ගිය ඔස්ට්‍රේලියානුවන්ගේ පළමු කඩුලු 2 ලකුණු 37කදී බිඳ වැටුණු අතර, පසුව නායක ෆින්ච් සහ මානස් ලබුස්චැන්ග් එක්ව තුන්වැනි කඩුල්ලට ලකුණු 107ක සම්බන්ධතාවක් ගොඩ නගමින් ඉනිම පිළිසකර කිරීම කැපී පෙනුණි. හතරේ පහර 8ක් සහ හයේ පහරක් සමග ලකුණු 73ක් රැස් කිරීමට ෆින්ච් සමත්වූ අතර, ලබුස්චැන්ග් ලකුණු 48ක් රැස් කළේය. එහෙත් ඉන් අනතුරුව පසුපෙළ පිතිකරුවන් අසරණ කළ එංගලන්ත පිලේ පන්දු යවන්නෝ තරගයේ වාසිය සිය කණ්ඩායම දෙසට හරවා තැබූහ.

ආචර්, ක්‍රිස් වෝක්ස් සහ සෑම් කරන් කඩුලු 3 බැගින් දවාලූහ.

# හොකී තොටිල්ල කැලෑ වැදිලා

**උකුවෙල සංචාරක ප්‍රියන්ත සුමනසේන**

මෙරට හොඳම හොකී ක්‍රීඩාංගණය හොකී ක්‍රීඩාවේ තොටිල්ල ලෙස විරුදාවලිය ලැබූ මාතලේ පුරවරයේ ක්‍රීඩාව වර්තමානය වනවිට දැඩි පසුබෑමකට ලක්වී ඇතැයි පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ කුමාර දිසානායක මහතා ප්‍රකාශ කළේය.

වාර්තාගත ඉලක්ක කරා යෑමට බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩාංගණය එකල ජාතික ක්‍රීඩා උලෙළ පැවැත්වීම සඳහා ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ ද, වර්තමානයේ එහි ක්‍රීඩාවක් පැවැත්වීමට පවා නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇතැයි ද ඒ මහතා කීවේය.

පසුගිය වසර 5ක කාලයක් එම ක්‍රීඩාංගණය වසා තැබීමෙන් මාතලේට එම තත්ත්වය උදා වූ බව ද, මාතලේ ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන් අද වනවිට සිය පෞද්ගලික වියදමින් ක්‍රීඩාව යළි නඟා සිටුවීමට කටයුතු කරමින් සිටින බව රෝහණ කුමාර දිසානායක මහතා කියා සිටියේය.

මාතලේ තානායමේදී පසුගියදා පැවැති ක්‍රීඩකයන් සහ ක්‍රීඩා නිලධාරීන්ගේ හමුවේ ප්‍රධාන ආරාධිතයා ලෙස එක් වෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතා මේ අදහස් පළ කළේය.

'මාතලේ ක්‍රීඩකයන් අද කිසිවක් කරකියාගත නොහැකිව අසරණ තත්වයට පත් වෙලා අතරමංවෙලා ඉන්නවා. ක්‍රීඩාව බිංදුවට වැටිලා. 2012දී එවකට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගෙන් හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රීඩාව නැංවීමට අතිවිශාල මුදලක් ලැබී තිබුණා. බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමටත්, පිහිනුම් තටාකය හා ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහාත් ඒ මුදල් ලැබී තිබුණා. මේ මුදල් මධ්‍යම ආණ්ඩුවෙන් අනුමත වූවත්, පළාත් සභාව හරහා ලබාගත යුතුව තිබුණා. මහින්දානන්ද අලුත්ගමගේ ක්‍රීඩා ඇමැතිවරයාගෙන් ඒ මුදල් අනුමත වුණා. නමුත් 2015දී රජය වෙනස් වීමෙන් පසු එය නවතා දැමුවා.' මන්ත්‍රීවරයා සඳහන් කළේය.



පිහිනුම් තටාකය

මාතලේ නගරයේ සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රය යළි නඟා සිටුවීම සඳහා කටයුතු කරන බව ද මන්ත්‍රීවරයා කියා සිටියේය.

වසර 5ක් පුරා බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩාංගණය වසා දමා ඇති අතර, එහි ගෘහස්ථ ක්‍රීඩාංගණය අද වනවිට ගිනි නිවීමේ හමුදාවේ නවාතැන බවට පත්වී ඇතැයි මාධ්‍ය හමුවට පැමිණ සිටි පුහුණුකරුවෝ චෝදනා එල්ල කළහ.

එහි පිහිනුම් තටාකය හා ගෘහස්ථ ක්‍රීඩාංගණය මෙතෙක් ජනතා අයිතියට පවරා නැති බවද මෙහි දී අනාවරණය විය.

ඡායාරූප – උකුවෙල සංචාරක

2020 සැප්තැම්බර් 15 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

■ සීගිරිය විශේෂ

# අලි බලන්න ළඟට යන්නෙ පරිස්සමෙන්...

දඹුල්ල හබරණ ප්‍රධාන මාර්ගයේ දඹුල්ල දිගම්පතහ ප්‍රදේශයේදී ප්‍රධාන මාර්ගය හරහා වන අලින් නිරන්තරයෙන් මාරු වීම හේතුවෙන් එම අලින් නැරඹීමට වන අලින් ආසන්නයට ගමන් කිරීම, වාහන නවතාගෙන සිටීම සිදු නොකරන්නැයි වනජීවී නිලධාරීහු මහජනතාවගෙන් ඉල්ලා සිටිති. අවස්ථා ගණනාවකදීම මෙම ස්ථානයේ මිනිස් ජීවිත කිහිපයක් අහිමිව වාහන කිහිපයකට ද වන අලින් පහර දී විනාශ කර දමා ඇතැයි වනජීවී නිලධාරීහු පෙන්වා දෙති. ප්‍රධාන මාර්ගය හරහා ගමන් කිරීමේදී ජනතාවට සිදුවන අනතුරු දැන්වීම, අවවාද දැන්වීම් පුවරු රක්ෂිත දෙපස සවි කර තිබුණත් ඒවා මේ වන විටත් ඇතැම් පුද්ගලයන් කඩා බිඳ දමා ඇතැයිද වනජීවී නිලධාරීහු වැඩිදුරටත් පවසා සිටිති.

මේ දිනවල පවතින වියළි කාලගුණික තත්ත්වය සහ ආහාර හිඟය හේතුවෙන් නිරන්තරයෙන් දිගම්පතහ රක්ෂිතයේ සිටින වන අලින් ප්‍රධාන මාර්ගය හරහා දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේ ද ගමන් කරන බැවින් වන අලින් කිට්ටුවට ගොස් නැරඹීම, අලින්ට ආහාර දීමට යෑම මෙන්ම වන අලින් සමඟ ඡායාරූප ගැනීමට උත්සාහ නොකරන මෙන් වනජීවී නිලධාරීහු මහජනතාවගෙන් ඉල්ලා සිටිති.

■ සෝමදාස සමර ගුණරත්න - ගිරාඳුරුකෝට්ටේ සමූහ, රංජිත් කරුණාවීර - මාපාකඩවැව සමූහ, හාලිඇළ සමූහ, දෙමෝදර සමූහ සහ මහියංගණ සමූහ

# හරවත් දෙයක් පාඨකයාට දීම දිනමිණ අපගේ අපේක්ෂාවයි

## බදුල්ල-මොනරාගල ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුවේදී කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම් කියයි

"ආණ්ඩුවේ හොරණෑව ලෙස අලවා තිබූ ලේබලය මුළුමනින්ම ගලවා දමා පක්ෂ විපක්ෂ සැමගේ මෙන්ම පාඨක ජනතාවගේ ද විශ්වාසය දිනාගත් පුවත්පතක් ලෙසට 'දිනමිණ' පුවත්පත ඉදිරියට ගෙනයෑමේ අභියෝගය අප ජය ගන්නවා. ඒ සඳහා කාර්ය මණ්ඩලයේ කැපවීම අගය කරනා අතර ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වන ඔබගෙන් ද ලැබෙන සහයෝගය අප අගය කොට සලකනවා."

**ලංකාවේ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම් මහතා** එසේ කියා සිටියේ ලේක්හවුස් ආයතනයට සම්බන්ධ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා බදුල්ලේදී පැවති වැඩමුළුවකදීය. ඌව පළාත් සභා ශ්‍රවණාගාරයේදී පසුගියදා (12) පැවති මෙම වැඩමුළුව සඳහා බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්කයන්හි ලේක්හවුස් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් 25 දෙනෙක් පමණ සහභාගි වී සිටියහ. ධර්ම ශ්‍රී කාරියවසම් මහතා එහිදී වැඩිදුරටත් මෙසේද පැවසීය.

පසුගිය කාලයේ 'දිනමිණ' පුවත්පත ගමන් කළේ එක්තරා සීමිත මාර්ගයකයි. රජයේ හොරණෑව පමණක් නොව විරුද්ධ පක්ෂවලට මඩ ගහන පත්තරයක් බවටත් පත් වී තිබුණා. දේශපාලන ගැති භාවයට වැටීම නිසා පත්තරය ජනතාවගෙන් දුරස් වුණා. පුවත්පත් අලෙවිය පහතටම වැටුනා. ජනතාවගෙන් දුරස් වූ පුවත්පත නව ආරකට සංවර්ධනය කොට පාඨක ජනතාවට දැනුම, ප්‍රවෘත්ති විනෝදාස්වාදය මෙන්ම හරවත් දෙයක් පාඨකයාට දීම අපේ අපේක්ෂාවයි. මෙතෙක් පාඩු ලබන ආයතනයක් බවට පත්වෙමින් පැවති මෙම ආයතනය ඉදිරි මාස තුනක් ඉක්මවා යන විට ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීම අපේ ඉලක්කයයි."

**දිනමිණ ප්‍රධාන කර්තෘ ගාමිණී ජයලත් මහතා,**

"කුමන ආකාරයේ තාක්ෂණික ක්‍රම ශිල්ප අලුතින් එකතු වුණත් ප්‍රාදේශීය මාධ්‍යවේදියා පත්තරය වෙනුවෙන් කරන සේවය අනුව ඔවුන්ගේ අගය වෙනස් වෙන්නේ නෑ. ඔබ ඉහළට පහළට අදින හුස්ම පොද පවා අපට බලපානවා. වසර පහමාරක පමණ කාලය තුළදී පසුගිය රජයේ වැඩපිළිවෙළෙහි අවධිමත් හා අදූරදර්ශී බව හේතුවෙන් පාඨක ජනතාවගෙන් 'දිනමිණ' පුවත්පත දුරස් වී ගියා. අපේ ඇතැම් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් පවා සක්‍රිය බවෙන් ඉවත් වී තිබෙනවා. දැන් අපි අලුත් ගමනක් යනවා. ඊට අවශ්‍ය නායකත්වය හා උපදේශකත්වයත් සහයෝගයත් ලැබී තිබෙනවා. ආණ්ඩුවේ හොරණෑව ලෙස ජනතාව අතරට ගිය මතය මේ වන විට වෙනස් කරමින් සිටිනවා. මෙවර මැතිවරණයේදී අසාධාරණයක් නොවන පරිදි පක්ෂ විපක්ෂ සැමටම 'දිනමිණ' පුවත්පතේ ඉඩ ලබා දුන්නා. තව දින 100කින් ලබන්නා වූ 111 වැනි 'දිනමිණ' උපන්දිනය අපි සමරන්නේ ශ්‍රී ලංකාවේ පුවත්පත් අතුරින් ජනතා විශ්වාසය දිනාගත් අංක එකේ පුවත්පත ලෙසටයි. ඒ සඳහා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වන ඔබ සැම ලබා දෙන දායකත්වය ද අපි අගය කරනවා."

මෙම වැඩමුළුව සඳහා සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රී හා බදුල්ල දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති මේජර් සුදර්ශන දෙණිපිටිය මහතා,

"වසර 77ක්ම ශ්‍රී ලංකාව හැඳින්වූයේ සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස වුවත් සංවර්ධනය වූ රටක් බවට පත් කිරීමට ජනාධිපතිතුමා ගන්නා උත්සාහයට අපේ දායකත්වය ලබා දිය යුතු වෙනවා. පසුගිය වසර පහ තුළදී සිදු වූ අකටයුතුකම් හේතුවෙන් සංවර්ධන වැඩ සියල්ල අසාර්ථක වුණා. හැම ක්ෂේත්‍රයක් ගැනම මුල සිට අගටම හොඳින් දන්නා රාජ්‍ය නායකයෙක් අපට සිටිනවා. මේ තරම් ශක්තිමත් රාජ්‍ය නායකයෙක් වර්තමානයේ මොන රටකවත් නෑ. අපි මේ රට හදන්න ලොකු උත්සාහයක් ගන්නා මේ අවස්ථාවේදී මාධ්‍යවේදී ඔබගෙන් ලොකු දායකත්වයක් අපි බලාපොරොත්තු වෙනවා. ධනාත්මකව සිතන පතන පරපුරක් ඇති කරන්නට ඕනෑ. 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' කියන මට්ටමට අප යා යුතු වෙනවා. හදවතට එකඟව ජාතික ගීය ගායනා කිරීමට කුඩා කාලයේ සිටම දරුවන් යොමු කරවීම ඉතාම වැදගත්. ත්‍රස්තවාදයෙන් අප රට බේරගත්තා වගේම දැන් කළ යුතුව ඇත්තේ හොරුන්ගෙන් රට බේරා ගැනීමයි."

මෙම වැඩමුළුව සඳහා 'දිනමිණ' ප්‍රාදේශීය කර්තෘ ආසිරි මල්ලවආරච්චි, සම කර්තෘ ධනුෂ්ක ගොඩකුඹුර, විශේෂාංග කර්තෘ චතුර ගීතනාත් බණ්ඩාර, ඡායාරූප සම කර්තෘ විමල් කරුණාතිලක හා ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති සුසිල් කුමාර යන මහත්වරු ද සහභාගි වී සිටියහ. බදුල්ල දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨතම ලේක්හවුස් මාධ්‍යවේදී සෝමරත්න මහතා එහිදී ලේක්හවුස් ආයතනය පිළිබඳව දිගු කලක තොරතුරු දක්වමින් කියා සිටියේ තමාගේ ආර්ථික මට්ටම ඉහළ නංවා ගැනීමට මෙන්ම තමාව සමාජයේ ඉහළ පිළිගැනීමකට ලක් වීමට ලේක්හවුස් ආයතනය ද හේතු වූ බවයි.

ඡායාරූප
**විමල් කරුණාතිලක**

# පක්ෂ විපක්ෂ සැමටම 'දිනමිණ' පුවත්පතින් ඉඩක් ලැබුණා

## 'දිනමිණ' ප්‍රධාන කර්තෘ ගාමිණී ජයලත්

ලේක්හවුස් කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම්, දිනමිණ ප්‍රධාන කර්තෘ ගාමිණී ජයලත්, ප්‍රාදේශීය කර්තෘ ආසිරි මල්ලවආරච්චි, සම කර්තෘ ධනුෂ්ක ගොඩකුඹුර, විශේෂාංග කර්තෘ චතුර ගීතනාත් බණ්ඩාර, හා ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති සුසිල් කුමාර යන මහත්වරුන් වැඩමුළුවට සහභාගී වූ අයුරු.

■ ගයාන් සංජය

# සුරූපී කතක් බයිසිකලේ දාගෙන කුඩු බිස්නස් කරලා

දොම්පෙ පොලිස් වසමේ කළුකොඳයාව ප්‍රදේශයේදී සුරූපී කතක සමඟ යතුරුපැදියක හෙරොයින් ජාවාරමේ නිරත වූ සඳුන් මධුසංක නොහොත් 'සූකිරි' නමැත්තකු අත්අඩංගුවට ගැනීමට පසුගියදා දොම්පෙ පොලීසිය සමත් වී තිබේ.

දොම්පෙ පොලීසියට ලැබුණු තොරතුරක් මත හෙරොයින් ජාවාරමේ නිරත වූ සැකකාර පුද්ගලයා අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී කඩවත ප්‍රදේශයේ සිදුවූ ඝාතන සිද්ධියක සැකකරුවකු බවට ද පොලීසිය මඟින් අනාවරණය කරගෙන ඇත. කලක සිට මොහු සුරූපී කාන්තාවන් යතුරුපැදියේ දමාගෙන සූක්ෂ්ම ලෙස හෙරොයින් ජාවාරම සිදු කර ඇති අතර අත්අඩංගුවට පත්වන අවස්ථාවේ හෙරොයින් ග්‍රෑම් 3ක් ළඟ තිබී සොයා ගත් බව දොම්පෙ පොලීසිය ප්‍රකාශ කළේය. සැකකරු දැනට බන්ධනාගාරගතව සිටිනා ආම් අසංකගේ සමීපතමයකු බවට ද පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි iii චින්තක පීරිස් යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් දොම්පෙ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සංජීව, ප්‍ර.පො.ප. ගුණවර්ධන, උ.පො.ප. එදිරිසිංහ, පො.සැ. (19334) අඹේරත්න, පො.කො.වරුන් වන (70567) තරංග, (79964) සම්පත් (84253) ලක්මාල් (94466) තරිඳු කා.පො.සැ (1769) පුෂ්පා යන නිලධාරීහු පරීක්ෂණ සඳහා එක් වූහ.

■ බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# වස්ගමුවේ අනවසරයෙන් රැඳී සිටි 5කට දඩ

වස්ගමුව ජාතික වනෝද්‍යානයේ ජලගැලුම් නිම්නයට අනවසරයෙන් ඇතුළු වී කරපල විල්ලුව ආසන්නයේ සැකසහිතව රැඳී සිටි පුද්ගලයන් දසදෙනකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එක් අයකුට රුපියල් පහළොස්දහස බැගින් රුපියල් 150,000ක දඩ මුදලක් ගෙවන ලෙස පොලොන්නරුව දිසා මහෙස්ත්‍රාත් අසේල ද සිල්වා මහතා නියෝග කළේය.

පොලොන්නරුව වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලයේ නිලධාරීන් විසින් සිදු කළ වැටලීමකදී සැකකරුවන් දසදෙනා අත්අඩංගුවට පත් වී ඇති අතර ඔවුන් අධිකරණය හමුවේ වරද පිළිගැනීමෙන් දඩ මුදල් නියම කිරීමට විනිසුරුවරයා නියෝග කර තිබිණි. මෙලෙස දඩ මුදල් ගෙවීමට නියම වූයේ මනම්පිටිය පුදුර් හා තඹාල යන ප්‍රදේශවල පදිංචිකරුවන් පිරිසකටය.

පොලොන්නරුව වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලයේ අඩවි ආරක්ෂක ස්ථානා භාර නිලධාරි පී. ඩී. සුනිල් ශාන්ත, අඩවි ආරක්ෂක ජී.ඒ.පී. මනහර, අඩවි සහකාර නිලධාරීන් වන අමිත ශ්‍රී නාලක, සුසන්ත තිලකරත්න ජේ. එන්. ජයරත්න, එස්. ඒ. වික්‍රමරත්න යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු පිරිසක් වැටලීමට එක් වූහ.

■ කේ. විජේසිරි නිශ්ශංක - කරල්ලියද්ද සමූහ

# කුඩුත් එක්ක කාන්තාවක අල්ලයි

හෙරෝයින් ගෑම් දහයක් සමඟ මැණික්හින්නදී අත්අඩංගුවට ගන්නා ලද සැකකාර කාන්තාවක් බී වර්තාවක් මඟින් තෙල්දෙණිය අධිකරණයට පෙරේදා (13) ඉදිරිපත් කළ අවස්ථාවේදී එම සැකකාරියගෙන් වැඩි දුරටත් රඳවා තබාගෙන ප්‍රශ්න කිරීමට තෙල්දෙණිය වැඩබලන මහෙස්ත්‍රාත් නීතිඥ කුමාරි කරල්ලියද්ද මහත්මිය විසින් නියෝග කර තිබිණි.

මෙම සැකකාරිය හෙරෝයින් ගෑම් දහයක් සිය සන්තකයේ තිබියදී මැණික්හින්න පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකාරියගෙන් මහෙස්ත්‍රාත්වරිය රඳවාගෙන ප්‍රශ්න කිරීමට නියෝග කිරීමෙන් අනතුරුව මැණික්හින්න පොලීසියේ නිලධාරීහු මෙම සැකකාර කාන්තාවගෙන් වැඩිදුර ප්‍රශ්න කිරීම් සිදු කරති.

■ පී. ජී. ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

# වයිරස් රෝගයකින් ලොකු ලූනු වගාව විනාශයි

මාතලේ දිස්ත්‍රික්කයේ මේ දිනවල ලොකු ලූනු අස්වැන්න නෙළමින් පවතින අතර දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය මඟින් ලොකු ලූනු මිල දී ගන්නේ කිලෝව රුපියල් 120ට බව ගොවීහු පවසති.

දේශීය ලොකු ලූනු වගාවට පෙර නොවූ විරූ වයිරස් රෝගයක් වැලඳීම හේතුවෙන් මෙවර අස්වැන්නේ අඩුවක් පවතින අතර ලොකු ලූනු හෙක්ටයාර 1200ක වගාවෙන් තුනෙන් දෙකක් පමණ විනාශ වී ඇතැයි දඹුල්ල මූලස්ථාන කෘෂිකර්ම උපදේශක ඒ. එම්. සුනිල් බණ්ඩාර මහතා පැවසීය.

මෙවර ලොකු ලූනු වගාවෙන් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත් ගොවීන්ද සිටිනා අතර ගලේවෙල පට්ටිවෙල පදිංචි එස්. ඒ. රත්නපාල ගොවි මහතා පැවසුවේ තමන් අක්කර 15ක පමණ ලූනු වගා කර ඇති බවත් ඒ සඳහා රසායනික පොහොර වෙනුවට 90%ක්ම යොදා ඇත්තේ කාබනික පොහොර බවත්ය. ඒ නිසාම තම වගාවට වෛරස් රෝගයෙන් සිදු වූ හානිය අවම වූ බවද වැඩිදුරටත් හෙතෙම පවසා සිටියේය.

ජී.අයි. ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

# බුත්තල දුටුගැමුණු ජාතික පාසලට නවක උසස්පෙළ සිසුන් පැමිණිදා...

බුත්තල දුටුගැමුණු ජාතික පාසලට 2021-2022 වර්ෂය සඳහා නවක උසස්පෙළ පංති සඳහා දරුවන් හාරසිය දෙනෙකු ඇතුළත් කරගැනිම ඓතිහාසික බුත්තල යුධගනාව චෛත්‍යය අබියසදි ඉකුත්දා සිදුවුණි.ආගමික වත්පිළිවෙත් මැද නවක දරුවන් හාරසියයක් පිළිගැනිම විදුහල්පති ආර්. එම්. සෙනවිරත්න මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය හා විද්‍යලීය ශිෂ්‍ය නායක මණ්ඩලයේ සහභාගීත්වයෙන් දරුවන්ට නෙලුම් මලක් ලබා දෙමින් සිදුකළ අතර ඔවුන් ඒවා යුධගනා චෛත්‍යයට පුජා කරන ලදි. ආගමික වතාවත් සිදු කිරිම යුධගනා රාජමහා විහාරාධිපති විහාරාධිකාරි මොනරාගල මහා දිසාවේ ප්‍රධාන සංඝනායක ගල්ටැම්වත්තේ නන්දරතන හිමියන්ගේ ප්‍රධානත්වයෙන් වැල්ලවායේ අරියධම්ම ස්වාමින් වහන්සේ,මාවරල්ලේ සත්තින්ද්‍රිය ස්වාමින් වහන්සේ, ඔක්කම්පිටියේ සුමනරතන හිමියන් හා අතලේ අමිතරතන ස්වාමින් වහන්සේ විසින් සිදු කළහ.

ගාල්ල දිසා සමූහ

## ලක්ෂ 5ක කේරළ ගංජා සමඟ අයෙක් දැලේ

රුපියල් ලක්ෂ 05කට අධික වටිනාකමින්යුතු කෙරළ ගංජා තොගයක් ළඟ තබාගෙන සිටියදි අත්අඩංගුවට ගත් සැකකරුවකු බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරිමෙන් පසු රඳවාගෙන ප්‍රශ්න කිරිම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් පොලීසියට අවසර දී තිබිණි. බටපොළ පොලීසිය මඟින් මේ සැකකරු කේරල ගංජා කිලෝ 03ක් හා ග්‍රෑම් 200ක් සමඟ උඩුවිල ප්‍රදේශයේ දි අත්අඩංගුවට ගෙන තිබිණි.

ප්‍රාර්ථනා ලියනගේ - හිනිඳුම සමූහ

## ගිනි අවියක් සන්තකයේ: අයෙක් දැලේ

මෙරට නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් සමඟ ඒ සඳහා යොදන පතරොම් 5ක් හා සැකකරු වෙක් ඌරගස්මංහන්දිය පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මෙසේ අත්අඩංගුවට පත්ව ඇත්තේ වයස අවුරුදු 43ක් පමණ වන ඌරගහ යටගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඌරගස්මංහන්දිය පොලීසිය පරීක්ෂණ මෙහෙයවයි.

ඒ.ටී. කහඳුගොඩ - වීරකැටිය සමූහ

## අපරාධ රැසක් කළ 'තැඹිලි අජිත්' අසුවෙයි

දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු වූ අපරාධ රැසක් සම්බන්ධයෙන් පොලීසියට අවශ්‍යව සිටි තැඹිලි අජිත් නමැති සැකකරු ටී 56 උණ්ඩ යොදන මෙරට සාදන ලද ගිනි අවියක් ජීව පතරොමක් මන්නා පිහියක් හෙරෙයින් ග්‍රෑම් 1යි මිලිග්‍රෑම් 850ක් සමඟ ඉකුත්දා (11) මිද්දෙණිය ජුලම්පිටියේ දී අත්අඩංගුවට ගැනීමට තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ පොලිස් නිලධාරීන්ට හැකිවිණි.

අත්අඩංගුවට පත් මෙම සැකකරු තංගල්ල, කහවත්ත, මිද්දෙණිය, වීරකැටිය, වලස්මුල්ල, ඇඹිලිපිටිය සහ ගම්පහ යන පොලිස් වසම්වල සිදු වූ මිනීමැරීමට තැත්කිරිම් සොරකම් මංකොල්ලකෑම් ඇතුළු අපරාධ රැසකට සම්බන්ධ අයකු බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. 35 හැවිරිදි මෙම සැකකරු වැඩිදුර පරීක්ෂණ සඳහා මිද්දෙණිය පොලිසියට බාර දී ඇති අතර පොලීසිය විසින් ඔහු වලස්මුල්ල මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු යොදා තිබිණි.

දිනමිණ දිසා දස අත ම එක තැන

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

# අනුරාධපුර ආයුර්වේදයේ 2ක් අසරණ ලෙඩුන්ට හිස් බෝතල් විකුණලා

ප්‍රතිකාර ලබා ගැනිම සඳහා පැමිණෙන රෝගින් සඳහා මුදලට හිස් බෝතල් අලෙවි කළ බව කියන අනුරාධපුර ආයුර්වේද රෝහලේ ඖෂධ සංයෝජක නිලධාරිනියන් දෙදෙනකුට විරුද්ධව විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇතැයි උතුරු මැද පළාත් ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය එල්.යු.සි. කේ.අල්විස් මහතා ඊයේ (13) සඳහන් කර සිටියේය. අනුරාධපුර ආයුර්වේද රෝහලට පැමිණෙන රෝගින් වෛද්‍යවරයා හමුවිමෙන් අනතුරුව වෛද්‍යවරයා ලබාදෙන බෙහෙත් වටටෝරුවට අදාළ බෙහෙත් ගැනිමට රෝහලේ ඖෂධාලයට ඉදිරිපත් කරන අවස්ථාවේදි රෝගියා අත බෙහෙත් ලබා ගැනීමට බෝතල නොමැති වුවහොත් ඔහුට බෝතල් ලබාදී බෝතලයකට රුපියල් දහය බැගින් ලබා ගන්නා බවට මේ ඖධවේදිනියන් හට චෝදනා එල්ල වී තිබේ.

මේ සම්බන්ධයෙන් රෝගින් විසින් පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාට සිදුකළ පැමිණිලි මත මෙම නිලධාරිනියන්ට විරුද්ධව විනය පරීක්ෂණයක් ආරම්භ කොට ඇත. මේ සම්බන්ධයෙන් ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය එල්.යු.සි.කේ.අල්විස් මහතාගෙන් සිදුකළ විමසුමේදි කොමසාරිස්වරයා මෙසේ කීය. රෝගින්ගෙන් ලැබුණ පැමිණිල්ල මත මම එම ස්ථානය තවත් වෛද්‍යවරු දෙදෙනකු සමඟ පරීක්ෂා කරනු ලැබුවා.එහිදි අලෙවි කරන්නට තිබු බෝතල් මා විසින් ගෝනියක දමා මුදා කොට තිබෙනවා.කාලයක් තිස්සේම එකක් රුපියල් දහය බැගින් දිනකට බෝතල් සීයක් පමණ විකුනනවා කියලා තමයි පැමිණිලි ලැබිලා තිබුණේ. මේ චෝදනාවට ලක්වූවන් කියන්නේ රෝහලේ සුබ සාධන කටයුතු සඳහා බෝතල් අළෙවි කර මුදල් ලබාගත් බවයි.නමුත් ආධාර එකතු කළ පෙට්ටියේ තිබුණේ රුපියල් තුන්සිය හතක මුදලක් පමණයි.

කොහොම වුණත් රජයේ ආයතනයක මුදල් එකතු කිරිම නිති විරෝධියි.මේ සම්බන්ධයෙන් රජයෙන් චක්‍ර ලේඛණයක් පවා නිකුත් කරලා තියෙනවා. ආධාර වශයෙන් හෝ වෙනත් කිසිවකට මහජනයාගෙන් මුදල් එකතු කිරිම සඳහා මගෙන් හෝ රෝහල් අධ්‍යක්ෂකවරියගෙන් අනුමැතියක් අරන් නැහැ. ඒ කෙසේ වෙතත් ආධාර එකතු කිරිමට තරම් රෝහලේ අඩුපාඩුවක් නැහැ.අවශ්‍ය සියල්ලම රජයෙන් රෝහලට සපයා තිබෙනවා.

එම්.පී. කුමාර - කොටදෙණියාව සමූහ

## දේශීය කපුරෙදි කර්මාන්තයෙන් දිවි රැකගත් ජනතාවට යන-එන මං නැතිවෙලා

දේශීය කපු රෙදි හා සාරි නිෂ්පාදන කර්මාන්තය සම්පූර්ණයෙන්ම බිඳවැටී යනඑන මං නැති තත්ත්වයක් උද්ගතව ඇතත් කිසිදු බලධාරියකු තමන්ගේ ගැටලු සඳහා විසඳුම් ලබාදීමට පියවර ගෙන නැතැයි එම රෙදි නිෂ්පාදන කර්මාන්තකරුවෝ පවසති. මෙසේ කඩා වැටුණු රෙදි නිෂ්පාදන කර්මාන්තය අසීරුවෙන් කරගෙන යද්දී උද්ගත වූ කොරෝනා වසංගතය නිසා තවදුරටත් රෙදි කර්මාන්තය කරගෙන යාමට බැරිව ඇතැයිද ඔවුහු පෙන්වා දෙති. මේ වනවිට වැටුප් ගෙවා ගැනීමට නොහැකිවීම නිසා තම නිෂ්පාදන කරගෙන යෑමට සේවක හිඟයක් ඇතිව ඇතැයිද ණය ගෙවීමේ අවස්ථා ඇණ හිටීම හා අර්ථ සාධක ගෙවීමේ අවස්ථාවන් ගිලිහි යෑම නිසාද තමන් නීතිය හමුවේ වරදකරුවන් වී හිරේ විලංගුවේ යන දිනය අත ළඟටම පැමිණ ඇතැයිද ඔවුහු පවසති. මේ ගැටලු උද්ගතවීමට පෙර තමන්ගේ නිෂ්පාදන රාජ්‍ය ආයතන කරා ගෙන ගොස් කොටස් වශයෙන් ගෙවීමේ පදනම මත ලබා දුන්නත් කොරෝනා සමයේ එසේ මුදල් එකතු කර ගැනීමේ අවස්ථාව නැතිවී යාමෙන්ද ඔවුහු අසීරුවට පත්ව සිටිති. මිරිගම පල්ලෙවෙල ප්‍රදේශයේ දේශීය අත් යන්ත්‍ර රෙදි නිපදවීමේ යෙදී සිටින ගාමිණී අනුර කුමාර ජයවර්ධන මහතා මෙසේ කීය.

අපේ කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. ගත් ණය වගේම අර්ථ සාධක ගෙවා ගන්න විදියක් නැහැ. සේවකයන්ට පඩි ගෙවීමේ හැකියාව නැත්තටම නැතිවෙලා. ප්‍රබල ආර්ථික අපහසුතා මැද මේ කර්මාන්තය කරගෙන යන්නේ දේශීය දේ රැක ගන්න ඕන නිසයි. මගේ සේවකයෝ පහළොවක් විතර හිටියා. දැන් ඉන්නේ දෙන්නයි. ඒ අයගෙන් විතරක් මේක දිගටම කරගෙන යන්න අමාරුයි. ආදායම් ඇත්තේම නැහැ. වාහනවලට ගෙවන්න තියෙනවා. ඒ මදිමට නූල් මිලත් තව තවත් ඉහළ යනවා. අත් යන්ත්‍ර දේශීය කපු සාරිවලට හුරු වූ කාන්තාවන් වෙනුවෙන් මේ කර්මාන්තය දිගටම කරගෙන යන්න අවශ්‍යයි. අපේ නිෂ්පාදන විකුණන්නේ ගෙවීමේ පදනම මත නිසා විශාල මුදලක් යට කරන්න වෙනවා. ඒ සඳහා රජය මැදිහත්ව අප වැනි සුළු ව්‍යාපාරිකයන්ට සහනයක් ලබා දෙනවා නම් වටිනවා. රුපියල් ලක්ෂ හය හතක ණය මුදලක් සාධාරණ ක්‍රමයක් මත ලැබුනොත් සේවකයන් රැකගෙන දේශීය කපු සාරි ඇතුළු නිෂ්පාදන ආරක්ෂා කරගෙන රටෙන් ඇදී යන විනිමය ඉතිරි කරගන්න පුළුවන්.

රෝහණ ආරියරත්න - හම්බන්තොට විශේෂ

## "සපිරි" ගමක් සංවර්ධන වැඩසටහනට මිලියන 1,152ක්

හම්බන්තොට දිස්ත්‍රික්කයේ "සපිරි" ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක වේ. ඒ සඳහා අනුමත කර ඇති ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන එක්දහස් එකසිය පනස් දෙකක් වන බව දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ එම්.බී. චන්ද්‍ර නිමල් මහතා පැවසීය.

දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති (1,022) එක්දහස් විසි දෙකක් ක්‍රියාත්මක වන අතර දැනට ව්‍යාපෘති (382) තුන්සිය අසූ දෙකක වැඩ අවසන් කර ඇත. කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ව්‍යාපෘති 105ක් ද වලස්මුල්ල 66, වීරකැටිය 108, ඕකෙවෙල 75, බෙලිඅත්ත 157, තංගල්ල 140, අඟුණුකොළපැලැස්ස 80, අම්බලන්තොට 123, හම්බන්තොට 41, සූරියවැව 35, තිස්සමහාරාමය 51, ලුණුගම්වෙහෙර 41ක් වශයෙන් ක්‍රියාත්මක වෙයි.

මෙහිදී පාසල් සංවර්ධනය, සෞඛ්‍ය මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, මහා මාර්ග හා මාර්ග සංවර්ධනය, වැව් අමුණු වැඩිදියුණු කිරීම, පානීය ජල ව්‍යාපෘති, අදායම් උත්පාදන වැඩසටහන් ඇතුළුව ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වන බව වැඩිදුරටත් චන්ද්‍ර නිමල් මහතා පැවසීය. ඒ මහතා මේ බව ප්‍රකාශ කර සිටියේ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය මඟින් ක්‍රියාත්මක ප්‍රගතිය ඉදිරිපත් කරමින්ය.

හැටන් මධ්‍යම විශේෂ

## පස්වලට යට වී පුද්ගලයෙක් මරුට

මස්කෙළිය බ්‍රවුන්සීක් වතුයායේ වළක් හැරිමට තැත් කිරිමේදී එහි පස් කඩා වැටිමෙන් අවුරුදු 29ක් වයැසැති ඒ.එස්. රාමයියා නමැති තරුණයකු මිය ගොස් තිබේ.

මෙම ප්‍රදේශයට පවතින අධික වැසි තත්ත්වයන් හමුවේ මෙම පුද්ගලයා පෙරේදා (13) වළක් හැරිමට තැත් කිරිමේදී එහි පස් කඩා වැටිමෙන් එම පස්වලට යටවී මෙම පුද්ගලයා මිය ගොස් ඇති බව මස්කෙළිය පොලීසියේ නිලධාරියකු පවසන ලදී.

මිය ගිය අයගේ මළ සිරුර පශ්චාත් මරණ පරීක්ෂණය හා අධිකරණ වෛද්‍ය පරීක්ෂණය සඳහා දික්ඔය ග්ලැන්කන් දිස්ත්‍රික් මූලික රෝහල වෙත ගෙන ගොස් ඇති බවද ඔහු පවසන ලදී.

මෙම මරණය පිළිබඳව මස්කෙළිය පොලීසිය විසින් වැඩිදුර පරීක්ෂණ මෙහෙයවන බවත් එම නිලධාරියා වැඩි දුරටත් පැවසීය.

දයාරත්න බණ්ඩාර - කෑගල්ල දිස්ත්‍රික් සමූහ

## දැදිගම පොත් පෙරහැරදා...

දැදිගම ප්‍රාථමික විදුහලේ දරු දැරියන්ගේ සහභාගීත්වයෙන් පසුගියදා පොත් ප්‍රදර්ශනයක් පැවැත්වුණු අයුරු.

ගාමිණී රම්‍යපාල - සබරගමුව සමූහ

# කොටියාකුඹුර සතිපොළ ප්‍රයෝජනවත් තැනක් කරන්න

## ගලිගමුව ප්‍රාදේශීය සභාව

අසංග පුෂ්ප කුමාර (ඒජාප)

දැන් දේශපාලන වැඩ කටයුතු හමාරයි .අපි සියලු දෙනාම එකතු වී ගම වෙනුවෙන්,රට වෙනුවෙන් වැඩ කරමු .ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති අපේ රටේ තිබුණු කළු පැල්ලම් මකමින් රටට රිදී රේඛාවන් මතු කරමින් ජනතාවගේ අපේක්ෂා ඉටුකරමින් සිටිනවා. ජනතාවත් ඒ දෙස බලා සිටිනවා. අපිත් ඊට දායක වෙමු යැයි ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති සමන් ජයසිංහ මහතා පසුගිය මාසික සභා රැස්වීමේ දි පැවැසිය. ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීම පසුගියදා එම සභා සංකීර්ණ රැස්වීම ශාලාවේදී පැවැත්විණි . මෙහිදී සභාපතිවරයා මෙසේද කීය. ගලිගමුව මැතිවරණ කොට්ඨාසයේ පොදුජන පෙරමුණේ ආසන සංවිධායකවරයා ලෙසින්මට පසුගිය මැතිවරණයට ඉදිරිපත් විමට අවස්ථාවක් ලැබුණා. එයින් ජය ගැනීමට නොහැකි වුවත් ජනාධිපතිවරයාට ශක්තිමත් රජයක් බිහිකර දිමට හැකිවීම පිළිබඳ සතුටක් මටත් තිබෙනවා .ඊට සහයෝගය දැක්වූ සැමටද ස්තුතිය පුදකර සිටිනවා.

උප සභාපති විල්බට් අප්පුහාමි මහතා - ගතවූ මාස කිහිපයේ මා ගලිගමුව ප්‍රාදේශීය සභාවේ වැඩබලන සභාපතිවරයා ලෙසින් කටයුතු කළ කෙටි කාළය ඇතුළත එම රාජකාරි ඉටුකිරිමට සහයෝගය දුන් මන්ත්‍රීවරුන්ට, රාජ්‍ය නිලධාරින් සහ ප්‍රදේශවාසීන්ටද ස්තුතිය පුද කරනවා.

ලලිත් රෝහණ පීරිස් මහතා (පො.ඒ.පෙ) - ගතවූ මැතිවරණයට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති ,විපක්ෂ නායක සහ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා ද අපෙක්ෂකයන් ලෙසින් ඉදිරිපත් වුණා. එහෙත් ගතවූ සියලුම මැතිවරණවලට වඩා හික්මීමකින්, සාමයත්, සමගියත් ආරක්ෂා කර ගනිමින් එහි කටයුතු නිමා කිරිමට හැකිවීම ගැන සතුටුයි.

අසංග පුෂ්ප කුමාර දසනායක මහතා (එ.ජා.ප. ) - කොටියාකුඹුර සතිපොළ භූමිය පිළිබඳ මේ සභාවට යෝජනාවක් ගෙන ඒම ගැන මම සභාපතිතුමාට ස්තුති කරනවා .මේ ස්ථානය සභාවටත් ආදායමක් ගෙන දෙන ප්‍රදේශයටත්, ජනතාවටත්, ප්‍රයෝජනවත් ස්ථානයක් බවට පත්කරනවා නම් එය ඉතා වැදගත්.

සභාපති - අභාවප්‍රාප්ත වයඹ සංවර්ධන ඇමැති ජයතිලක පොඩිනිලමේ මහතාගේ කාලයේ මෙම ස්ථානයේ කොටියාකුඹුර නගරයට බස් නැවතුම් පොළක් හැදුවා.බස් එතනට ආවේ නැති නිසා එතන බස්ගාල් කරන ස්ථානයක් වුණා. අපි මේ සභාවට ආවට පස්සේ සභාවේ හිටපු මංත්‍රීවරු පිරිස සාකච්ඡා කරල කොටියාකුඹුර නගරයේ ව්‍යාපාරික ප්‍රජාවත් එකතු කරගන සතිපොළ පටන් ගත්තෙ අපේ කාලයේදියි.එදා විශාල ව්‍යාපාරික ප්‍රජාවක් ආවා .රංඩු වෙවී පොළ කාමර ගත්තා .එතකොට ඔය සතිපොළ සම්පූර්ණ භූමියම තිබුණා .කාලයාගේ ඇවෑමෙන් පොළ වැසී ගියා. හිටපු සභාපති පොළ නවීකරණය කර ආරම්භ කරන්න උත්සාහ කළා. ඒ විතරක් නෙමෙයි. පසුගිය කාලයේ වැඩබලපු උපසභාපති ,කීප සැරයක්ම සාකච්ඡා කරමින් පොළ ආරම්භ කිරිමට උත්සාහ කළා. අපි කොමිස්වලට, පගාවට දේශපාලන කරණ මිනිස්සු නෙමෙයි. මේ ස්ථානයට ආරක්ෂක වැටක් ගැහුවා .ගේට්ටු දැම්මා. නමුත් නගරය මැද්දෙන් අඩුමිලට එළවළු ගන්න ව්‍යාපාරික ස්ථාන දෙක තුනක් ආරම්භ වුණාට පස්සෙ මේ සතිපොළ වැහිලා ගියා කොටියාකුඹුර සතිපොළ නව තක්සේරුවක් සිදුකර ටෙන්ඩර් කිරිමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

දිනමිණ දිසත දස අත ම එක තැන

■ දෙයියන්දර සමූහ

# දික්වැල්ලේ අඩු ආදායමිලාභී පවුලකට නිවෙසක්

නව නිවෙස

පැරණි නිවෙස

මාතර කෝට්ටෙගොඩ බෙලිවත්ත ශ්‍රී සුධර්මාශ්‍රමාධිපති ශාස්ත්‍රපති බුද්ධියාගම ධම්මසේන හිමිගේ ඉල්ලීම පරිදි නෝර්වේ පදිංචි ශ්‍රී ලාංකිකයකුගේ ධන පරිත්‍යාගයෙන් දික්වැල්ල හුන්නදෙණිය ප්‍රදේශයේ අසරණ පවුලක් වෙත නිවෙසක් ඉදිකර පරිත්‍යාග කිරීමේ පින්කමක් පසුගියදා සිදු කෙරිණි.
නෝර්වේ පදිංචි වෛද්‍ය සුමිත් ප්‍රනාන්දු මහතාගේ පවුලේ සැමගේ දායකත්වයෙන් මේ නිවෙස ඉදිකර පරිත්‍යාග කෙරිණි.

■ නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිස්ත්‍රික් සමූහ

## ගාල්ල සවුත්ලන්ඩ් බාලිකා විදුහලේ

# ගොඩනැගිලි දෙකක් කඩා වැටෙන්න ළඟයි

පාසලේ කටයුතු වරු දෙකකට

සජීවී ලෝක උරුමයක් තුළ පිහිටා ඇති එකම බාලිකා විදුහල වන සිසුවියන් 3000කට අධික පිරිසක් සිප්සතර ලබන ගාලු කොටුවේ සවුත්ලන්ඩ් බාලිකා විදුහලේ ගොඩනැගිලි දෙකක් කඩා වැටීමේ බරපතළ අවදානමකට ලක්වී ඇතැයි මවුපියෝ පවසති.

සිසුවියන්ගේ ජීවිතාරක්ෂාව වෙනුවෙන් මේ වනවිට එම විදුහලේ ඉගැන්වීමේ කටයුතු කොටස් දෙකකට බෙදා දෙවරුවක් ලෙසින් පවත්වා ගෙන යන්නට ගෙවී ගිය සති අන්තයේ සිට ක්‍රියාත්මක කර ඇති බව ද මවුපියෝ පෙන්වා දෙති.

කොරෝනා වසංගතයෙන් මාස හතරකට අධික කාලයක් පාසල වසා තිබිය දී මේ තත්ත්වය අවම කර ගැනීමට කටයුතු නොකිරීම පිළිබඳ මවුපියන් දැඩි සේ කළකිරීමකට පත් වී ඇති බවද පෙන්නා දෙන ඔවිහු මේ සම්බන්ධයෙන් ආදි සිසුවියන්, වගකිවයුතු සියලු දෙනා සහදේශපාලන අධිකාරියන්ද දැනුම්වත් කර ඇතත් මේ සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු පියවරක් ගෙන නැතැයි චෝදනා කරති. මේ සම්බන්ධයෙන් අප විදුහල්පතිනියගෙන් කළ විමසීමකදී පාසලේ ඉගැන්වීමේ කටයුතු දෙවරු ක්‍රමයට පවත්වා ගෙන යන්නට පියවර ගත් බවත් එය සිසුවියන් ඇතුළු සියලු දෙනාගේ ආරක්ෂාව සඳහා ගත් පියවරක් බවද ඒ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කර බව ද පැවැසුවාය. මේ පිළිබඳ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිමල් දිසානායක මහතාගෙන් අප කළ විමසුමකදී මෙසේ කිවේය.

පාසලේ ගොඩනැගිලි අබලන්වීම පිළිබඳ ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය ගොස් මේ ගැන පරීක්ෂා කළා. මේ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම්වත් කිරීමට කටයුතු කර තියෙනවා. අබලන්ව ඇති ඇතැම් ගොඩනැගිලිවල අලුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු පවා සකස් කරලා තියෙනවා.

■ රාගම සමූහ

# ඇමැති ලන්සා පෑලියගොඩ මග නැඟුම සමාගමේ නිරීක්ෂණ චාරිකාවක

රටේ ජනතාව ජනාධිපතිවරයාට ඔවුන් මුහුණ පා ඇති බොහෝ ප්‍රශ්න පසුගිය ජනාධිපතිවරණ හා මහ මැතිවරණ සමයේදී ලිඛිතවත් වාචිකවත් ඉදිරිපත් කළා. එහිදී ජනාධිපතිවරයා ජනතාවට පොරොන්දුවක් වුණා මම ඔබේ ගැටලු විසඳනවා කියලා. අද අපි මේ ඉටුකරන්න යන්නේත් ජනාධිපතිවරයා රටේ ජනතාවට දුන් එවැනිම පොරොන්දුවක්යැයි ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් ඇමැති නිමල් ලන්සා මහතා පැවැසීය.

පසුගිය 11වැනි දා එම අමාත්‍යාංශය යටතේ ඇති පෑලියගොඩ මග නැඟුම මාර්ග ඉදිකිරීම හා යන්ත්‍රෝපකරණ සමාගමේ නිරීක්ෂණ චාරිකාවක නිරතවූ රාජ්‍ය ඇමැති නිමල් ලන්සා මහතා මෙසේ ද කීය. ඕනෑම රාජ්‍ය හෝ පෞද්ගලික අංශයක් සාර්ථකත්වය කරා ගෙනයෑමට නම් ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා නිලධාරීන් සාමූහික හැඟීමෙන් යුතුව ක්‍රියා කළ යුතුයි.

කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ විශාල වගකීමක් පැවරී ඇති මග නැඟුම ආයතනය සිය ඉලක්කය සපුරාගැනීමට නම් නව ප්‍රතිසංවිධානයකින් යුතුව ක්‍රියාත්මක වියයුතුයි. කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීම දැවැන්ත ව්‍යාපෘතියක්.මෙය ඉදිරි වසර පහතුල සම්පූර්ණ කළ යුතුයි. එය සාර්ථක ලෙස නිමා කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය හා එක්ව සහෝදරත්වයෙන් බැඳී තමාට පැවරෙන වගකීම ඉටු කරන ලෙස මා ඔබෙන් ඉල්ලා සිටිනවා.

■ එන්. නවරත්න - මීගහකිවුල සමූහ

## මුතියංගණ නෙළුම් මල් පූජාව 18 -19

ඓතිහාසික මුතියංගණ රාජමහා විහාරස්ථානය අභියසදී වාර්ෂිකව පැවැත්වෙන නෙළුම් මල් පූජාව සහ කිරි ආහාර පාත්‍ර පන්සීයක් පූජා කිරීමේ පින්කම මේ මස 18 වැනි දින සවස සහ 19 දින අලුයම මුතියංගණ සෑරඳුන් අභීයසදී පැවැත්වේ.

මුතියංගණ සීල භාවනා පින්කම් සංවිධානය මඟින් සංවිධාන කරන මේ පින්කමට සමගාමීව අද (15), හෙට (16) සහ අනිද්දා (17) මුතියංගණ මහා සෑ රදුන් උදෙසා පිදෙන පහන් පූජාවක් ද පැවැත්වීමට කටයුතු සංවිධාන කර ඇත.

■ කේ. විජේසිරි නිශ්ශංක - කරල්ලියද්ද සමූහ

## ගෙවත්තේ කංසා වැවූ පුද්ගලයකුට දඩ

වත්තේගම පොලිස් වසමේ යටිරාවන ප්‍රදේශයේ ගෙවත්තක කංසා පැළ තුනක් වගා කළ පුද්ගලයකුට තෙල්දෙණිය මහෙස්ත්‍රාත් දිසා විනිසුරු ශානක කලන්සූරිය මහතා තරයේ හා දැඩි ලෙස අවවාද කරමින් රුපියල් දස දහසක දඩයක් පසුගිය 11දා නියම කෙළේය.

මේ පුද්ගලයා තම නිවස ගෙවත්තේ වෙනත් වගාවන් අතර මේ කංසා පැළ තුන වගාකර තිබුණු අතර

වත්තේගම පොලීසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පාලිත ඉලංගන්කෝන් මහතාගේ මෙහෙයවීමෙන් මේ ස්ථානය පරීක්ෂාකර සැකකරු අත්අඩංගුවට ගෙන තිබිණි.

■ මීගහතැන්න සමූහ

## වල්ලාපට්ට කැපූ සැකකරු රිමාන්ඩ්

බුලත්සිංහල - දෙල්මැල්ල සංවේදී රක්ෂිත කලාපයෙන් කැපූ රුපියල් ලක්ෂ හයක් පමණ වටිනා වල්ලාපට්ට කිලෝ 35ක් සමඟ අත්අඩංගුවට ගත් පුද්ගලයකු පසුගිය 12 දා මතුගම මහෙස්ත්‍රාත් ධම්මික උඩුවෙ විදාන මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලබන 21 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස නියෝග කළේය. රත්නපුර - කලවාන ප්‍රදේශයේ පදිංචි සැකකරු තවත් දෙදෙනකු සමඟ දෙල්මැල්ල සංවේදී රක්ෂිත කලාපයට ඇතුළුවී වල්ලාපට්ට කපා ඇතැයි ඉංගිරිය අඩවි වන නිලධාරීහු කියති. ඉංගිරිය අඩවි වන නිලධාරි ලක්ෂ්මන් රත්නවීර මහතාගේ මෙහෙයවීමෙන් වන සංරක්ෂණ නිලධාරින් පැය අටක් තිස්සේ කාලය තුල සිදුකල මෙහෙයුකින් පසු සැකකරු අත් අඩංගුවට ගෙන ඇති අතර තවත් සැකකරුවන් දෙදෙනකු පලාගොස් ඇතැයි අඩවි වන නිලධාරීහු සඳහන් කරති.

■ ආරියරත්න ගනේගොඩ - මැද කොළඹ සමූහ

# මට්ටක්කුලිය බහුවිධ කාර්ය මධ්‍යස්ථානයට මුල්ගල්

උතුරු කොළඹ මට්ටක්කුලිය නාගරික ආසනයට අයත් විස්ටවසික් ක්‍රීඩාංගණයේ එක් කොටසක බහුවිධ කාර්ය මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මුල්ගල් තැබීම පසුගියදා සිදු කෙරිණි. එහිදී හිටපු ඇමැති රවි කරුණානායක, කොළඹ පුරපතිනි රෝසි සේනානායක, විපක්ෂ නායක එම්. එච්. මන්සිල්, යෝජනාකරු රෝයි බෝගහවත්ත , නාගරික මන්ත්‍රීවරුන් වන චමින්ද අලුත්ගෙදර, කළණ සාගර දිසානායක මහත්ම මහත්මීන් ගොඩනැගිල්ලට මුල්ගල් තැබූ අයුරුයි මේ.

■ නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිසා සමූහ

## පින්නදූව පොලිස් මුරපොළේ මාසික පරීක්ෂණය දා...

දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව පොලිස් මුරපොළේ අනුපාලක ස්ථානයේ මාසික පරීක්ෂණය දක්ෂිණ අධිවේගී මාර්ගයේ සංචාරක කොට්ඨාසයේ වැඩ බලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරි කපිල අබේනායක මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (12) පින්නදූවේ දී පැවැත්විණි. එහිදී පොලිස් නිලධාරින්ගේ ආචාර පෙළපාළිය සහකාර පොලිස් අධිකාරිවරයාගේ නිරීක්ෂණයට ලක් විය.

■ ටී. එල්. ජවිෆර් කාන් - මඩකළපුව සමූහ

# මඩකළපුවේ ජනතාව බිය වැද්දූ 'ධනු' ඇතුළු තිදෙනෙක් කොටු

මඩකළපුවේ ජනතාව බිය වැද්දූ 'කඩු පහර' කණ්ඩායමේ නායක ධනු ඇතුළු තිදෙනකු කඩු හා අත් බෝම්බ සමඟ පසුගියදා අත්අඩංගුවට ගත් බව මඩකළපුව මූලස්ථාන පොලීසිය පවසයි.

මඩකළපුව මූලස්ථාන පොලිස් වසමේ නාටකේනී හා ඌරනී හි දීර්ඝ කාලයක් ගංජා ජාවාරමේ යෙදෙමින් මේ කණ්ඩායම විවිධ වැරදි ක්‍රියාවල යෙදෙන බවත් ජනතාව බිය වද්දා තර්ජනය කරමින් සිටින බවත් හේතුවෙන් තම ජීවිතවලට තර්ජනයක් ඇතිවෙයි යන බියෙන් ජනතාව පොලීසියට පැමිණිලි කිරීමට බියෙන් සිටි බව වාර්තාවී තිබුණි.

ඒ අනුව පසුගියදා සවස කඩු පහර කණ්ඩායමේ නායක ධනු නමැත්තා නාවටකේනී ප්‍රදේශයේ ජනතාව බිය වද්දමින් සිටින බවට පොලීසියට ලැබුණු තොරතුරකට අනුව මඩකළපුව මූලස්ථාන පොලිස් පරීක්ෂක බී. කේ. හෙට්ටියාරච්චි මහතා උපදෙස් මත අපරාධ විමර්ශන අංශයේ පොලිස් උප පරීක්ෂක මොහමඩ් පොලිස් සාජන් කිරුපා ඇතුළු කණ්ඩායම එම ස්ථානයට ගොස් ඔහුව අත්අඩංගුවට ගෙනීමට තැත් කිරීමේදී ඔහු පොලීසියට කඩු පහර එල්ල කිරීමට තැත් කළ විට පොලීසිය වටලා ධනු නමැත්තා සමඟ සාගාවාන් කාන්තන් යන දෙදෙනා ද අත්අඩංගුවට ගෙන තිබිණි. සැකකරුවන් සන්තකේ තිබූ අත් බෝම්බයක් සහ කඩුවක් පොලිස් භාරයට ගෙන ඇත.

■ නාඋල සමූහ

## මහතලා සාහිත්‍යකලා මහෝත්සවය 25සිට

මාතලේ දිස්ත්‍රික් සාහිත්‍යකලා සංසදය, මහතලා සාහිත්‍ය අනුකමිටුව, මාතලේ නගර සභාව සහ බෞද්ධ මන්දිරය යන ආයතනවල සහයෝගය ඇතිව වසර පහක සිට පවත්වාගෙන එනු ලබන මහතලා සාහිත්‍යකලා මහෝත්සවය මේ මස 25, 26, 27 දිනවල පැවැත්වේ.

25 දා පෙ. ව. 9 ට හේමලතා රාජගුරුගේ 'ඈ තුළ ඈ සහ ඒ ඇයයි මේ මමයි' නවකතා කෘති ජනගත කිරීම මාතලේ දිසාලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. මෙහිදී 'නවකතාවේ නව ප්‍රවණතා' මැයෙන් ආරාධිත දේශනය ප්‍රවීණ ලේඛක කපිල කුමාර කාලිංග මහතා විසින් සිදුකරනු ලබයි.

මේ උළෙලට සමගාමීව පහන් ටැඹ සාමූහිකය විසින් සංවිධාන කරන නිර්මාණ වැඩමුළුව සහ සාහිත්‍ය සම්මන්ත්‍රණය 26 දා පෙ.ව. 9 සිට මාතලේ මහත්මා ගාන්ධි ශාලාවේ දී සිදු කෙරේ. මහතලා සාහිත්‍ය කලා උළෙලේ සමාප්ති දින උත්සවය27 දා පෙ. ව. 10ට මාතලේ මහත්මා ගාන්ධි ශාලාවේදී පැවැත්වේ. මෙදින සිනමාව, රූපවාහිනිය සහ සාහිත්‍ය මැයෙන් ස්වාධීන රූපවාහිනි සංස්ථාවේ සභාපති ප්‍රවීණ සිනමාවේදී සුදත් රෝහණ මහතා ද රසවින්දය සහ මාධ්‍ය මැයෙන් ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි මහතා ද දෙසුම් පැවැත්වීමට නියමිතය.

■ ඩබ්ලිව්. විදානපතිරණ - ඇඹිලිපිටිය සංවාරක

# හොර සුරා ජාවාරමුන් 17කට රු.141,000ක් දඩ

ඇඹිලිපිටිය සුරාබදු නිලධාරීන් විසින් තම බල ප්‍රදේශයේ ඉකුත් දිනවල සිදුකළ වැටලීම්වලදී හොර සුරා ජාවාරමුන් 17ක් පෙරීමේ උපකරණ හා කසිප්පු මි.ලී. 26700 සමග ග්‍රහණයට ගෙන ඔවුන් නඩු භාණ්ඩ සමඟ 11 දින සිකුරාදා ඇඹිලිපිටිය අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ඔවුනට රු. 141,000 ක් දඩ නියම විය.

මෙම වැටලීම්වලදී කසිප්පු පෙරූ 06 දෙනාට එක් අයකුට රු. 15,000 බැගින් රු. 90,000 ක් ද, කසිප්පු විකුණූ 06 දෙනාට එක් අයකුට රු. 5,000 බැගින් රු. 30,000 ක් ද, රජයේ අනුමත අරක්කු සහ බියර් විකුණූ තිදෙනාට එක් අයකුට රු. 5,000 බැගින් 15,000 ක් ද, තීරුබදු රහිත සිගරට් විකුණු දෙදෙනෙකුට එක් අයකුට රු. 3,000 බැගින් රු. 6,000 ක් ද දඩ නියම කෙරිණි.

■ අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර

# සිවිල් ආරක්ෂක බළකායේ ධජයන්ට සෙත් පතති

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දාහතර වැනි සංවත්සරය නිමිති කරගනිමින් බළකායට අයත් සියලු ධජයන්ට සෙත්පැතීමේ පුන්‍ය කටයුත්ත අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියසදී (13දා) පැවැත්විණි.

මෙහිදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බළකා විසිතුනක(23) හා පුහුණු පාසල් හයක(06)ට අයත් සියලු ධජයන්ට සෙත් පැතීම සිදු කෙරිණි.

අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස,රුවන්වැලි චෛත්‍යරාමාධිපති පල්ලේගම හේමරතන යන නාහිමිවරුන් ප්‍රමුඛ අටමස්ථාන විහාරස්ථානයන්හි විහාරාධිපති නාහිමිවරු ඇතුළු මහාසංඝරත්නයේ ආශිර්වාද මධ්‍යයේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස සියලු ධජයන් තැන්පත් කිරීමෙන් අනතුරුව ආගමික වතාවත් සිදු කරමින් සෙත්පැතීම සිදු විය.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් රියර් අද්මිරාල් ආනන්ද පීරිස්, අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් උදේනි සේරසිංහ,සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවා වනිතා ඒකකයේ සභාපතිනි කුමුදුනී පීරිස් මහත්ම මහත්මීන් ඇතුළු නිලධාරිහු රැසක් එක්ව සිටියහ.

දිනමිණ දසන දස අත ම එක තැන

■ බණ්ඩාර රත්නායක - කුරුණෑගල අතිරේක

# නිවෙසක පවත්වාගෙන ගිය භූගත කසිප්පු නිෂ්පාදනාගාරයක් වටලයි

රිදීගම, මොරතිහ ප්‍රදේශයේ නිවෙසක රහසිගතව පවත්වාගෙන ගිය භූගත කසිප්පු නිෂ්පාදනාගාරයක් වටලා එහි තිබූ ගෝඩා ලීටර් 600 ක් සහ කසිප්පු නිෂ්පාදනයට යොදාගත් උපකරණ තොගයක් (12 දා) අත්අඩංගුවට ගත් බව රිදීගම පොලිසිය කියයි .

එම කසිප්පු නිෂ්පාදනාගාරය පවත්වාගෙන ගිය බව කියන අදාළ නිවෙසේ හිමිකරු ද පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. පොළොව මතුපිට සිට අඩි පහක් පමණ ගැඹුරින් ප්ලාස්ටික් බැරල් වලළා ගෝඩා පල්කිරීමට සකස් කර තිබූ බව පොලිසිය කියයි. භූගත බැරල්වලට ගෝඩා ඇතුළු කිරීමට සහ පිටතට ගැනීමට නළ පද්ධතියක් සහ විදුලි මෝටරයක් ද යොදාගෙන තිබිණි. සැකකරු විසින් දිගු කලක් තිස්සේ ඉතා සූක්ෂම අයුරින් මෙම ජාවාරම පවත්වාගෙන ගොස් ඇති බවත්, ඔහු කසිප්පු ජාවාරම සම්බන්ධයෙන් පෙර වැරදි ගණනාවක් ඇති අයකු බවත් මූලික පොලිස් පරීක්ෂණවලදී හෙළි වී තිබේ.

කුරුණෑගල සහකාර පොලිස් අධිකාරි නිශාන්ත හේරත් මහතාගේ අධීක්ෂණය යටතේ, රිදීගම පොලිසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක හේමන්ත සුබසිංහ මහතාගේ මෙහෙයවීමෙන්, දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රත්නායක, උප පොලිස් පරීක්ෂක අශෝක, පොලිස් සැරයන් ඉලංගකෝන් (58164), ලෙස්ලි (58605), ප්‍රියන්ත (32682) සහ ආනන්ද (48946) යන නිලධාරිහු වැටලීම සිදුකළහ.

■ එච්.එල් ද සොයිසා - ලංකාපුර සමූහ

# කුඹුරු පිටිවලට යෑමට පාරක් නැතිව

# මින්නේරිය දේවාලය යායේ ගොවියෝ අතරමං

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 58 බත්ගම්පත්තුව වසමේ පුරාණ මින්නේරිය දේවාලයට බටහිර සහ දකුණ දිසාවට වන්නට පිහිටා තිබෙන කුඹුරු වලට සහ ඉහළ වත්ත යන ගොඩ ඉඩම්වලට පුරාණ දේවාලය අසල සිට අංක 43 ඇළ රක්ෂිතය ඔස්සේ පසුගිය කාලයේ අපහසුවෙන් වුවත් යාම් ඊම් කළ නමුත් මැතක සිට එම ගමන් මාර්ගයට යාබද කුඹුරු හිමියන් විසින් බාධා පමුණුවා තිබීමෙන් තම කුඹුරු පිටිවලට සහ ගොඩ ඉඩම් වලට යෑමට නොහැකි තත්ත්වයක් උදාවී ඇතැයි ඔවහු මැසිවිලි නගති.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ එම යායේ ගොවි මහතකු වන බී19 , 16 1/2 මින්නේරිය ලිපිනයේ පදිංචි එච්.එම්.ගුණරත්න බණ්ඩා මෙසේ කීය.

මගේ කුඹුර තියෙන්නේ මින්නේරිය පුරාණ දේවාලයට බටහිර පැත්තේ. අවුරුදු 40ක් තිස්සේ බොහෝම අමාරුවෙන් කුඹුරු වගාකළා. ඒ කාලයේ අපි කුඹුරු කළේ හරකාගෙන්නේ.දැන් හාන්නේ ගොයම් කපන්නේ මැෂින් වලින් නිසා ඒ මැෂින් වලට යන්න එන්න පුළුවන් පාරක් ඔනෑබව කියන්න ඔන නෑ නේඉතින් අපේ කුඹුරු වලට ඒ මැෂින් ගෙනියන්න පාරක් තිබුණේ නැතත් අමාරුවෙන් වුණත් අපේ ඇළ රක්ෂිතය දිගේ අපි ඒ වාහන එදා කුඹුරු වලට ගෙනගියා.ඒත් අද වන විට එයට නොයෙක් බාධා උදාවෙලා තියෙනවා.ඇළ රක්ෂිතයට ලොකු ලොකු ගල් දාලා අවහිර කරලා තියෙන්නේ.මේ අපහසුතා ගැන ගොවි සංවිධානයට,ග්‍රාමනිලධාරිට, ප්‍රාදේශීය ලේකම්ට සහ ඉරිගේෂන් එකට දැනුම් දුන්නා.ඉරිගේෂන් එකේ ටී.ඒ.මහත්තයා කීවා කුඹුරකට ඇළක් යනවානම් අනිවාර්යයෙන් ඒකට ඇළ රක්ෂිතයක් වෙන්වෙනවා කියලා.ඒ නිසා ඇළ රක්ෂිතය වෙන් කර දෙන්න කියලා තවත් ලිපියක් නිපුන කියන ටී.ඒ මහත්තයාට දුන්නා. අපේ ඔප්පුවලත් තියෙනවා ඇළ කියන කොටස රජයට අයිතියි කියලා.ඒක රජයේ නම් නිලධාරින් කියන විදිහට ඒ කට රක්ෂිතයකුත් තියෙන්න ඕනෑ නේද? මේ දේවල් වහගෙන තමයි නිලධාරින් ඉන්නේ කියලා හිතෙනවා. බිම් සවියේ නිලධාරින්ටත් මේ ප්‍රශ්නය විසඳන්න තිබුණා.මොකද ඒ අය මේ ඉඩම් මනින කොට ඇළ රක්ෂිතය වෙන් කළේ නෑ. බිම්සවිය යටතේ ඉඩම් මනින්න ආපු මිනුම්දෝරු මහත්වරු නතර වෙලා හිටියේ අපිට මඟ අහුරන අයගේ ගෙවල්වල.ඒ නිසා ඒ අයට වාසි වන විදිහට තමයි ඒ නිලධාරින් කටයුතු කළේ.දේවාලය ඉදිරිපිටින් පාරක් වෙන්කරලා තියෙනවා. ඒකත් අර කියපු අයගේ ඉඩමක් ළඟට විතරයි තියෙන්නේ.ඒක රජයේ මුදලින් අලුත්වැඩියා කරලත් තියෙනවා.අපේ කුඹුරු වලට යන්න පාරක් ගැන හිතන්නවත් ඒ නිලධාරින්ට අරගොල්ලෝ ඉඩදීලා නෑ.මේ අපහසුතා ගැන මේ රජයෙන් වත් කඩිනම් විසඳුමක් බලාපොරොත්තු වෙනවා.

මින්නේරිය පුරාණ දේවාලය යායේ ඉහළවත්ත ගොඩ ඉඩමේ පදිංචිව සිටි අයි.ආර්.ධර්මසේන මහතා මෙසේ පැවසීය.මගේ ගොඩ ඉඩමේ ලොට් අංකය 26,ඒ ඉඩමේ මම ස්ථිර ගෙයක් හදලා ලයිට් ගන්න වයරිනුත් කළා.ඒත් අදවනතුරු ලයිට් දෙන්න විදුලි බල මණ්ඩලය කටයුතු කළේ නෑ.කොහොම හරි අපි කාලයක් ඒ ගෙදර පදිව්වෙලා හිටියා.ඒකාලේ ළමයි ඉස්කෝලේ ගියේත් බොහෝම අමාරුවෙන්.වහින කාලෙට නියරවල් උඩින් යන්න බැරි නිසා ඉස්කෝලේ යැවුවේත් නෑ.රෑකට හදිසියේ ලෙඩක් හැදුනත් බෙහෙත් ටිකක් ගන්න යන්නවත්, ඉස්පිරිතාලේ නතරවෙන්න යන්නවත් ලේසියක් නෑ.පාරක් නැතිනිසා රෑට නියරවල වැටි වැටි තමයි ගියේ.අන්තිමේ ඒ ගෙදර වහලා දාලා ලොකු දුවගේ ගෙදර පදිංචියට අවා.දුවගේ ගෙදර හිටියත් මම උදේට ඒ ඉඩමට ගිහින් මොනව හරි වැඩක් කරලා හවසට දුවගෙ ගෙදරට එනවා.අපේ ඒ ගේදොර වතුපිටි වලට වගේම අනික් ඉඩම් වලටත් යන්න එන්න පාරක් ලබා දෙන්න කියලා නව ඉඩම් ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා.

මෙම ගැටලු පිළිබඳව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් ගෙන් සහ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් ගෙන් ද විමසා බැලුවෙමු.

එහිදී ප්‍රාදේශීය ලේකම් ආර්.එම්.ඩී.පුෂ්පාකුමාරි මහත්මිය මෙසේ කීවාය.

මින්නේරිය බත්ගම්පත්තුව දේවාලය කොටසේ තිබෙන ඉඩම් සින්නක්කර අයිතිය තියෙන ඒවා නිසා අපිට ඒ ඉඩම් වල පාලනයක් නෑ.ඒ නිසා පාරවල් වෙන්කරන්න බලයක් නෑ.මේ ඉඩම්ගැටලු නිරවුල් කරන්නේ ඉඩම් නිරවුල් කිරීමේ දෙපර්තමේන්තුවෙන්.

ඉඩම් නිරවුල් කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් (හිඟුරක්ගොඩ )ටී.පබාශීලි ජයලත් මහත්මිය දේවාලය යායේ ඉඩම් පිළිබඳව සිදුකර තිබෙන කටයුතු මෙසේ පැහැදිලි කළාය. මෙම කොටසේ මැනුම් කිරීම් කළත් නිරවුල් නොමැති ඉඩම් කීපයකුත් තියෙනවා.ඇළ පද්ධතිය නම් මැනුම් කර තිබෙනවා.නමුත් ඇළ රක්ෂිතයක් කියලා වෙනම ලකුණු කිරීමක් කරලා නෑ.මේ ඇළ දැන් අයිති වෙන්නේ ගොවිජනසේවා දෙපාර්තමේන්තුවට.ඒ අයත් එක්ක තමයි පාර ගැන කතා කරන්න වෙන්නේ.අලුපදයාය,කලුදපිල්ලෑව කොටසේ ගොඩ ඉඩම් හතරක් විතර තියෙනවා.අංක 10 ඉඩමට මාර්ග ඉඩකඩක් දෙන බවට ලසන්ත උදලාගම යන අය වාචික එකඟතාවයක් පළකලා.හෝටලයක් ඉදිකිරීම ගැන අපිට අදාළ නැති නිසා ඒ ප්‍රශ්නය හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකර තිබෙනවා.

■ සබරගමුව සමූහ

# යතුරුපැදිය බෝක්කුවක ගැටී සූපවේදියා මරුට

කැගල්ල රඹුක්කන මාර්ගයේ හිරිවඩුන්න කෝපි වත්ත ප්‍රදේශයේ දී යතුරු පැදියක් බෝක්කුවක ගැටී සූපවේදියකු පසුගිය 11 දා රාත්‍රී මිය ගොස් ඇතැයි කැගල්ල මූලස්ථාන පොලිසිය කියයි.

මෙලෙස මිය ගොස් ඇත්තේ නුවරඑළිය ගැල්වේ ෆොරස්ට් හෝටලයේ සූපවේදියකු වූ අරණායක පොලිස් වසමේ, එගොඩවත්ත ග්‍රාමයේ පදිංචිව සිටි මේනම රාලලාගේ නවරත්න බණ්ඩාර නැමැති 28 හැවිරිදි අවිවාහක තරුණයෙකි.

මෙම තරුණයා කොළඹ දී සූපවේදි වෘත්තීය හදරා ඇති බව ද පොලිසිය කියයි.පසුව විවිධ හෝටල් කිහිපයක සේවය කර මීට වසර එක හමාරක පමණ ඉහතදී නුවරඑළිය ප්‍රදේශයේ හෝටලයක සහායක සූපවේදියකු ලෙස රැකියාව කරමින් සිටි බවද පැවසේ .

කොරෝනා වසංගතය හේතුවෙන් හෝටලය වැසීයෑමත් සමඟ තරුණයා නිවෙසට වී සිටියදී ඉකුත් 11 දා දහවල් හිරිවඩුන්න රංදෙණිය ප්‍රදේශයේ හිතවතකුගේ නිවෙසක පැවැති පස් ගොඩක් ඉවත් කර දීමට තවත් හිතවතුන් පිරිසක් සමඟ ගොස් තිබුණු බවත් ,පසුව

රාත්‍රී 7ට පමණ පස් ගොඩ ඉවත් කර සියලුම දෙනා නාගෙන වැඩඅවසන් කර සිටියදී මෙම තරුණයා හිරිවඩුන්න ප්‍රදේශයට දුරකථන කාඩ් පතක් මිලට ගැනීමට යන බව පවසා මිතුරාගේ යතුරු පැදියකින් ගොස් ඇති බවද පොලිස් පරීක්ෂණ වලදී අනාවරණය වේ.

එම යන අවස්ථාවේ යතුරු පැදිය බෝක්කුව ගැටී පෙරළී ගොස් තිබුණු බව කළ මූලික විමර්ශනවලදී අනාවරණය වූ බව පොලිසිය කියයි. පසුව මිතුරා නිවෙසට පැමිණීමට ප්‍රමාදවීම හෙතුවෙන් රංදෙණියේ මිතුරා ත්‍රිරෝද රථයකින් හිරිවඩුන්න දෙසට ගොස් ආපසු පැමිණෙද්දී මිතුරා අනතුරකට මුහුණ දී ඇති බව දැන ගෙන ඇති බවත් පොලිසිය කියයි. එම ස්ථානයේ සිටි පිරිසක් අනතුර සම්බන්ධයෙන් කැගල්ල මූලස්ථාන පොලිසියට දන්වා තිබුණු බවත් පොලිසිය කියයි.

■ සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ සමන්තා කංකානම්ගේ

# අයහපත් කාලගුණයෙන් බළන්ගොඩ හා ඉඹුල්පේ පවුල් 25ක පුද්ගලයන් සියයකට පීඩා

වැසි සහදැඩි සුළං සහිත අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් බළන්ගොඩ හා ඉඹුල්පේ බල ප්‍රදේශවල පුද්ගලයන් 100 කට ආසන්න පිරිසක් පීඩාව පත්ව ඇති බවට වාර්තාවෙයි. සුළං හා වැසි ත්තවය ඉවුරු හා ගස් කඩාවැටීම් හේතුවෙන් නිවාස අර්ධහානි සිදුව තිබේ. ඉකුත් 07 වැනිදා සිට 09 වැනිදා දක්වා බළන්ගොඩ ප්‍රාදේශීය මහලේකම් බල ප්‍රදේශයේ ටන්ජන්තැන්න නිවාස 08ක්, පොල්වතුගොඩ නිවාස 01ක්, මැදබැද්ද නිවාස 02 ක්, කල්තොට නිවාස 02 ක් ,කෝන්ගහමංකඩ නිවාස 01 ක්, නෙලුයාය නිවාස 02 ක්, අල්දොර නිවාස එකක් වශයෙන් පවුල් 17ක් සහ ඉඹුල්පේ ප්‍රාදේශීය බල ප්‍රදේශයේ බෙලිහුල්ඔය, පිඩලිගන්නාව, පාගල්ඕවිට, හල්පේ සහ වැගපිටිය යන ප්‍රදේශයන්හි පවුල් 08 ක් ලෙස පුද්ගලයන් 100කට ආසන්න පිරිසක් පීඩාවට පත්ව ඇති බව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් හේමන්ත බණ්ඩාර මහතා සහ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් භාග්‍ය බටුගෙදර මහතා සඳහන් කළහ.

■ සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ

# සංවර්ධන නිලධාරිනියගේ රන් බඩු උස්සලා

දෙල්ගොඩ උඩුපිල ප්‍රදේශයේ සංවර්ධන නිලධාරිනියක සතු ස්වර්ණාභරණ සොරාගත් මස්කෙළිය ප්‍රදේශයේ කාන්තාවක් මීගහවත්ත පොලිසිය විසින් (12) අත්අඩංගුවට ගෙන ඇත . එම සංවර්ධන නිලධාරිනියගේ නිවෙසේ මුළුතැන්ගෙයි අත්උදව්වට සහාය වීම සඳහා යෙහෙළියක මාර්ගයෙන් කැඳවා ගෙන ඇති මස්කෙළිය ප්‍රදේශයේ මෙම කාන්තාව නිවෙසේ වැඩට පැමිණ සතියක කාලයකින් පසුව තම ඥාතියකුගේ මළගෙයක් බව හඟවා එම නිවෙසින් පිටව ගොස් ඇත. ගෙහිමි කාන්තාව විසින් දිගින් දිගටම දුරකථන ඇමතුම් දුන්නත් ඇය පැමිණීම ප්‍රමාද වීමෙන් පසු ඒ ගැන සැක සිතී නිවෙසේ රන් භාණ්ඩ තබා තිබූ ස්ථානය පරීක්ෂා කර බැලීමේදී එම භාණ්ඩ අතුරුදන්ව ඇති බව හෙළිදරව් වී ඇත. ඒ අනුව එම සංවර්ධන නිලධාරිනිය මීගහවත්ත පොලිසියට පැමිණිලි කිරීමෙන් පසු මස්කෙළිය ප්‍රදේශයේ පිහිටි මෙහෙකාර කාන්තාවගේ නිවෙසට ගොස් ඇය අත්අඩංගුවට ගෙන පරීක්ෂා කිරීමේදී මස්කෙළිය ප්‍රදේශයේ රන් භාණ්ඩ උකස් හලකට රුපියල් දෙලක්ෂ පනස්දහසකට එම රන් භාණ්ඩ උකස් කර තිබියදී පොලිසිය විසින් සොයාගෙන ඇත . අත්අඩංගුවට පත් සැකකාර කාන්තාව මහර මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි . මීගහවත්ත පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හේරත් , අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එල්. ඒ. විමලරත්න . පොලිස් සැරයන් ( 5366 ) දුමින්ද , පොලිස් කොස්තාපල් වරුන් වන (92325 ) ජයසිංහ, (88789) රාජපක්ෂ ,(35434) සුමේද , යන නිලධාරිහු විමර්ශන කටයුතු වලට එක්වුහ .

■ එන් නවරත්න - මීගහකිවුල සමූහ

# වෙලඹය පාලමේ ඉදිකිරීම් අරඹයි

ඉකුත් යහපාලන රජයේ නව පාලම් ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර අතරමග නවතා දමා තිබූ කන්දකැටිය වෙලඹය පාලමේ ඉදිකිරීම් කටයුතු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත කඩිනමින් ආරම්භ කර ඇතැයි කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපති කමල් රාජපක්ෂ මහතා පැවසීය.

කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වෙලඹය , කන්දකැටිය ගල්කුඩය ගම, උල්පත් හා ඒ අවට ගම්මාන අතරින් ගලා බසින වෙලඹය හරහා පිහිටි අනාරක්ෂිත තොටුපොළ හරහා මෙම පාලම ඉදිකෙරෙන අතර එක්සත් රාජ්‍යධානියේ රුපියල් මිලියන 32.45 ක මූල්‍යමය ආධාර යටතේ පාලම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන බවද සභාපතිවරයා පැවසීය.

පදිකයන් සඳහා ගමන්කළහැකි මංතීරු දෙකකින් සමන්විත පාලම මීටර් විස්සක් දිගු වන අතර එහි පළල මීටර් 5.5 කි.

පාලම ඉදිකිරීමත් සමගම කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගල් කුඩගම උල්පත හා ඒ අවට ප්‍රදේශවල ගම්මාන රැසක ජනතාවට වෙලඹය හරහා පහසුවෙන් එගොඩ මෙගොඩ වීමට හැකිවනු ඇතැයි ද සභාපතිවරයා වැඩිදුරටත් පැවසීය.

කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපති කමල් රාජපක්ෂ මහතාගේ ඉල්ලීමක් මත මෙම පාලම් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත.

# බද්දරමල්ල

## සතියේ 'තුනපහ' මඩිස්සලේ

# සිංහල සාහිත්‍ය ගුරුවරයා ඔබට හමු වුණි ද?



## ගුරු දිවස සොඳුරුමය

සිංහල සාහිත්‍ය ගුරුවරයා හා පාසලේ සිංහල සාහිත්‍යය විෂයය ඉගැන්වීම පිළිබඳ අපූරු නාට්‍යමය ජවනිකාවක් ඇතුළත් වන්නේ ජයලත් මනෝරත්න විරචිත, ඔහු විසින්ම නිෂ්පාදනය කරන ලද ගුරු තරුව නම් අපූරු වේදිකා නාට්‍යයෙහිය. 1996 දෙසැම්බරයේ දී ප්‍රථම වරට වේදිකා ගත වූ ගුරු තරුව මනෝගේ නාට්‍යාවලියෙහි කැපී පෙනෙන නාට්‍යමය ගුණය නොඅඩු රංග කාර්යයකි. ගුරු තරුවෙහි ප්‍රධානම සාර්ථක ලක්ෂණය වන්නේ නාට්‍යකරු එමගින් කතාබහ කරන නාට්‍යානුභූතියෙහි කාලීන වටිනාකමයි. සාහිත්‍යය ඉගැන්වීමෙන් වියුක්ත පාසල් අධ්‍යාපනයෙහි නිසරු බව, එලෙස ඉගෙනුම ලබන්නන්ගේ රස වින්දනයෙහි මට්ටම, එබඳු ශිෂ්‍ය පරපුරකගෙන් සමාජයට කුමන ඵලක් ද යන්න වැනි සමාජ විඥානයෙන් හෙබි ගැටලු රැසක් පිළිබඳ ගුරු තරුව පාත්‍ර වර්ගයා වේදිකාව මත කතාබහ කරති. නාට්‍යමය අත්දැකීමක් ලෙස ප්‍රති නිර්මාණය කරති. මෙකී ගැටලු පිළිබඳ සමාජ දේශපාලනික පසුබිම් සාකච්ඡා කරති.

**මුල්ගුරු :** හරි හරි ඉතිං දැනුත් මහත්තයා ඒ විදියට උගන්වනවා ඇතිනේ?

**සාහිත්‍ය ගුරුවරයා :** ඔව්, උගන්වනවා, පොත්වල පිටු කැලි. එච්චර නෙ දැන් උගන්වන්ට තියෙන්නෙ. ගුත්තිලයෙන් පිටු හතරයි, සද්ධර්මරත්නාවලියෙන් පිටු දෙකයි, සැලලිහිණියෙන් පිටු බාගයයි..

**මුල්ගුරු :** (මඳක් සිතා බලා) ඇත්තටම මහත්තයෝ මටත් තියෙනව පොඩි ප්‍රශ්නයක්. දැන් මේ කාර්මික සංකීර්ණ සමාජයෙ , අනේ මේ අමනාප වෙන්ට එපා ඇහුවට. දැන් බලන්ට උදාහරණයක් ගත්තොත් ම්.. මැටි වැඩ .. ඔව්.. මැටි වැඩ ඉගෙනගත්තොත් අඩුම ගණනෙ මුට්ටියක් හරි හදා ගන්ට පුළුවන්... අනිත් අතට ඔය ශාරීරික අභ්‍යාස වගේ දෙයක් ඉගෙන ගත්තොත් කොන්ද හරි කෙළින් තියාගන්ට පුළුවන්.. ඒත් ඔය සාහිත්‍යය... ?

**සාහිත්‍ය ගුරුවරයා :** සාහිත්‍යයෙන් ද ? සාහිත්‍යයෙන් කරන්නෙ, ඔය කෙළින් කරපු කොන්ද උඩ තියෙන මැටි මුට්ටියට රත්තරං පුරවගන්නව ද අශුචි පුරවගන්නවද කියල තෝර බේර ගන්න එක...

පාසලක සාහිත්‍ය ගුරුවරයා හා මුල් ගුරුතුමා අතර සිදු වන සංවාදය තුළින් මනෝ පවසන කතාන්දරය කෙතරම් බෙදජනක ද? වර්තමාන අධ්‍යාපන රටාව තුළ සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සිංහල විෂයය හදාරන සිසු දරු දැරියන්ට උගන්වන විෂය නිර්දේශයන්හි නිස්සාරත්වය හා සාහිත්‍ය විෂය පිළිබඳ වැඩිහිටි පරම්පරාවෙහි පටු ආකල්ප පිළිබඳ නොවෙද මනෝ ප්‍රශ්න කරන්නේ? අදටත් නොවිසඳුණු කාලීන ප්‍රශ්නයක් බව බොහෝ දෙනා අමතක කොට තිබීම දුක්ඛ දායකය. හැට දශකය, හත්තැව දශකය තුළ සාමාන්‍ය පෙළ හෝ උසස් සිංහල විෂය නිර්දේශය විජයබා කොල්ලය හෝ විරාගය නවකතා මිස හෝ බුදුගුණ අලංකාරයේ කවි කිහිපයක්, උම්මග්ග ජාතකයේ කොටසක් පමණක් ඇතුළත්ව තිබූ බවක් මතක නැත. එසේ නම් කුමක් ද මේ අහුලා ගත් කැලිවලින් සැදි නිර්දේශ? එදවස නිර්දේශිත විජයබා කොල්ලය හෝ විරාගය ඉගෙන ගන්නා ශිෂ්‍ය පරපුර ඩබ්ලියු. ඒ. සිල්වාගේ හෝ මාර්ටින් වික්‍රමසිංහගේ අනෙක් නවකතා පිළිබඳව ද අවබෝධය ඇත්තෝ වූහ. එහෙත් අද දරුවන්ගේ තත්ත්වය කුමක් ද? නිර්දේශයට නියමිත මොනිකා හෝ පරාක්‍රමගේ එසේත් නැත්නම් කුමාරගම හෝ මානවසිංහගේ නිර්මාණය හැරෙන්නට ඔවුන් විසින් කරන ලද කිසිදු නිර්මාණයක් පිළිබඳ නොදන්නෝ වෙත්. ඒ පිළිබඳ කියාදීමට සාහිත්‍ය ගුරුවරයාට ද කාලයක් වේ ද කියා සැක සහිතය.

ඉහත පූර්විකාව කෙටියෙන් හෝ සටහන් කරන්නට සිදු වූයේ පසු ගිය සති අන්තයේ අගනුවරින් ඈත බිබිල හා බණ්ඩාරවෙල පාසල් රාශියක් ආශ්‍රිත උසස් පෙළ සිංහල විෂයය හදාරන දරු දැරියන් දහසකට වඩා වැඩි සංඛ්‍යාවක් හමු වී ඔවුන් සමග කතා බහක, සංවාදයක යෙදෙන්නට ලද අවස්ථා නිසාය. කැලණිය ගුරුකුල ජාතික පාසලෙහි උසස් පෙළ සිංහල විෂය භාර ගුරුතුමා, අනිල් මංජුල කුමාර සිංහල සාහිත්‍ය විෂයය දරුවන්ට නීරස නොවන අයුරින් ඉගැන්වීමේ අත්හදාබැලීමක් ලෙස දිනක වැඩ මුළුවක් තුළ දේශන සාකච්ඡා, සංගීතමය ඉදිරිපත්කිරීම් ද සහිතව සැලසුම් කොට තිබූ රස ගුළාව නම් වැඩ සටහනට බොහෝ දරු දැරියන් යහපත් ප්‍රතිචාර දැක් වූ බව හැඟිණි. එහෙත් දින දෙකක සහභාගීත්වයෙන් මා උගත් දෑ බොහෝය. ඒවා සිත කම්පාවට පත් කරන තත්වයන්ය. අනිල් මංජුල කුමාර ගුරුතුමාගේ නව සංකල්පය දරුවන් වෙත සමීප කරවීමට බිබිල යශෝධරා බාලිකා විද්‍යාලයේ සෙනරත් බණ්ඩාර ගුරුතුමා ද බණ්ඩාරවෙල ඉමේජ් හා නාසා උසස් අධ්‍යාපන ආයතනයන්හි ගුරු උපදේශක අනිල් උදේශ් ගීතදේව ගුරුතුමා ද ගත් උත්සාහය පැසසුම් සහගතය. බිබිල සෙනරත් බණ්ඩාර ගුරුතුමා මගෙන් ඉල්ලීමක් කළේ සෙනසුරාදා බණ්ඩාරවෙල විවේක ගමන අවලංගු කොට එදින පස්වරුවෙහි හෝ බිබිලට පැමිණෙන ලෙසය. මහනුවර සිට මා රැගෙන යෑමට වාහනයක් එවන බව දන්වමින් ඔහු මා ආසා කළ දුම්රිය ගමනෙහි මිහිර මගෙන් උදුරා ගත්තේය. අලුයම්න් කොටුවෙන් පිටත් වූ දුම්රිය මහනුවරට පෙරවරු නවයට ළඟා වන විට, නිලංක බණ්ඩාර හා මිහිරංග ලක්ෂාන් තරුණයෝ (හරිත විශ්වවිද්‍යාලයෙහි උපාධි අපේක්ෂකයන්) දහවල් දොළහ වන විට බිබිලට මා රැගෙන ගියහ. පස්වරු සැසිය නිමා කොට රාත්‍රියේම බණ්ඩාරවෙලට පැමිණියේ පසු දින අනිල් උදෙශ් ගුරුතුමාගේ වැඩමුළුවට සහභාගී වීමටය. බිබිල මෙන් නොව බණ්ඩාරවෙල මධ්‍ය විද්‍යාලයීය ශ්‍රවණාගාරය පිරිතිරී ගිය ශිෂ්‍ය ප්‍රේක්ෂාගාරයෙහි බණ්ඩාරවෙල හා ඒ අවට බොහෝ පාසල් නියෝජනයක් වීය. වෙල්ලස්ස බිබිල පානම, මොනරාගල, මහියංගණය ආදී ගම්වල දරුවෝ බිබිලට පැමිණ සිටියාක් මෙන් වැලිමඩ , හපුතලේ, දියතලාව, බදුල්ල හා ඒ අවට පාසල් රැසක දූ දරුවෝ බණ්ඩාරවෙලට පැමිණ සිටියහ. ශිෂ්‍ය ප්‍රජාව පිරි ඒ සා විශාල ශ්‍රවණාගාරයක් මා පළමුවර දුටුවේ උපුල් ශාන්ත සන්නස්ගල මිතුරාගේ ඇරියුමින් නුගේගොඩ රොටරියේ දේශනයක සහභාගී වූ අවස්ථාවෙහිය. එදවස නිර්දේශයෙහි වූ දෙදෙනාම දියණියෝ පිළිබඳ දරුවන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නාක් මෙන්, බිබිල හා බණ්ඩරවෙල දී මෙවර නිර්දේශයෙහි ඇති දුරු රට ගිය පුතු නිර්මාණයෙහි අත්දැකීම හා එහි පසුබිම පිළිබඳ දරුවන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට සිදු වීය. එහෙත් දුක්ඛදායක තත්වය වූයේ නිර්මාණයක අත්දැකීම පිළිබඳ මගේ කෙටි අදහස් දැක්වීමට පෙර බිබිල හා බණ්ඩාරවෙල ශ්‍රවණාගාර දෙකෙහිම සිටි දරුවන්ගෙන් මා විමසූ සාහිත්‍යයට හා කියවීමට අදාළ ඉතා සරල ප්‍රශ්නවලට ඔවුන්ගෙන් ලද ප්‍රතිචාරයි. ඒ පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව පහත දක්වමි.

සහභාගී වූ ශිෂ්‍යය ශිෂ්‍යාවන්ගෙන් බහුතරයක් පුවත්පත් කියවන්නෝ නොවූහ. ශ්‍රී ලංකාවේ සැප්තැම්බර් මාසයෙහි විශේෂත්වය (සාහිත්‍ය මාසය බව) ඔවුන් කිසිවෙක් දැන නොසිටියහ. සාහිත්‍ය මාසයෙහි අගනුවර පැවැත්වෙන එකදු සාහිත්‍ය උත්සවයක් පිළිබඳව හෝ ඔවුන් දන්නේ නැත. (ස්වර්ණ පුස්තක, රජත පුස්තක, රාජ්‍ය සාහිත්‍ය සම්මාන, ගොඩගේ ජාතික සම්මාන, විද්‍යෝදය සම්මාන) වාර්ෂික සම්මාන උලෙළ පිළිබඳ දැනුමක් නැත්තන්ගෙන් වාර්ෂිකව සම්මාන ලබන පොත් පිළිබඳ ඇසීමෙන් පලක් නොවන බැවින් කිසිවක් නො අසා සිටියෙමි. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ කවියා හා ගීත රචකයා ගේ නිර්මාණ පිළිබඳ එක් සිසුවියකගෙන් පමණක් පිළිතුරක් ලැබිණි. මහබෝ වන්නම හැර ගලන ගඟකි ජීවිතේ පිළිබඳ හෝ ඒ ගීතය ගායනා කළ නන්දා මාලිනී ගැන හෝ ඔවුහු නොදත්හ. නව නිර්දේශය ඇතුළත් අරිසෙන් අහුබුදු සූරින්ගේ ගීත රචනා ගැන ඔවුන් දැන සිටියේ නැත. ශෛලීගත නාට්‍ය සම්ප්‍රදාය හැර සංවාද හෝ තාත්වික (ලෝක ධර්ම) සම්ප්‍රදාය පිළිබඳ හෝ ඊට නිදසුන් සේ සැලකෙන නාට්‍ය නිර්මාණ පිළිබඳ නිසි අවබෝධයක් නොවිණ. සැබැවින්ම මේ නම් දුක්ඛදායක තත්වයක් නොවෙද? මේ නොදැනුමට පාසල් දරු දැරියන් වගකිවයුතු නැතැයි මට සිතේ. මනෝගේ ගුරු තරුවෙහි හමුවුණු, පෙර දා සිටි සාහිත්‍ය ගුරුවරයා, අද කොහිද? සාන්ත සර්වේෂසයේ පස්වන පංතියේ දී පංති පුස්තකාලයක් ආරම්භ කළ තල්පාවිල කංකානමගේ සෝමපාල ගුරුතුමා සිහිපත් වේ. අද දරුවන්ගේ සාහිත්‍ය දැනුම හා රසවින්දනය මොටවීමට හේතුව වර්තමාන අධ්‍යාපන හා විෂයමාලා සම්පාදකයන්ගේ වරද ද? නව සිතුම් පැතුම්වලින් තොර වෘත්තීයම පමණක් මුල් තන්හි ලා සේවය කරන ගුරුවරුන්ගේ ආකල්ප ද? අලුත් සාහිත්‍ය ගුරුවරයෙක් සොයා ගැනීමට සුදුසු කාලය නොවෙද මේ?

පිළිතුරු සොයාගත යුතු වූ ප්‍රශ්න රැසක් මැද වුව, අනිල් මංජුල කුමාර ගුරුතුමා ප්‍රමුඛ දේශක හා ගායන වාදන වෘන්ද, දේශක කථිකාචාර්ය ක.ක. ගනුෂ්ක රන්දුල,වාදන වෘන්දය මෙහෙය වූ සංගීතවේදී මනෝජ් කුමාර ප්‍රනාන්දු, රුවින්ද සත්සර,රන්දිමාල් ප්‍රනාන්දු, කළිඳු ප්‍රභාස්වර, ළහිරු දර්ශාන් හා ගායිකා අංජලී බණ්ඩාර, දවසක සැසි දෙකක්, නිර්දේශිත කාව්‍ය නිර්මාණ හා ඒවායේ පසුබිම් හා අර්ථ මතු කරමින් ගායන මගින් දරුවන්ට නීරස නොවන, කවිය පිළිබඳ ඇල්මක් අති කරවන නව සංකල්පයක් මගින් කරන ලද අත්හදා බැලීම තව දුරටත් නිර්මාණශීලීව ශක්තිමත් කොට ඉදිරියට ගෙන යා යුතු යැයි සිතමි.

**බුද්ධදාස ගලප්පත්ති**
bgalaps@gmail.com

# කවි ඇසක කඳුළක්...

මාර්ග තදබදය විසින් උදුරාගන්නා කාලය හේතුකොටගෙන රාගම බලා යෑමට හැකි වනු ඇත්දැයි මම ළතැවුලින් කල්පනා කළෙමි. මේ කොන්ක්‍රීට් වනාන්තරය හැර පියා මගේ කොළ පැහැ කොලනිය බලා යාමේ වුවමනාව ද බලවත් වේ. මා කිලෝමීටර් සිය ගණනක් දුරින් සිටිය ද මහ ඇළේ ජලය පෙර සේම ගලා යනවා ඇති. ඉවුරු දෙපස සදාහරිත තුඟු තුරකින් ගිලිහී වැටෙන වියළි පත් හා දිරා ගිය අතු ඉති කන්කෙඳිරියකින් තොරව බාරගන්නා මහ ඇළ කටියාව වැව වෙත ගලා බසින අතරේම කෙත් බිම් පා පවස සංසිඳුවාලයි.

මගේ පාසල් මිතුරිය චන්ද්‍රිකා විජේසිංහ මහ මඟ යම යුද්ධය ජය ගනිමින් රාගම පුනරුත්ථාපන රෝහල කරා අප කැටිව ආවාය.

ගිලන් යහන වැද හොවන ලාල් හැගොඩ කවියා දැකීම දුකක් වුවද මේ මොහොත මා සති කීපයක් මුළුල්ලේ අපේක්ෂා කළ එකකි.

අකාරුණික කාලය ද රුදුරු රෝ පීඩාවන් ද ඔහුගේ පියකරු හසරැල්ල උදුරා ගන්නට අපොහොසත් වූ බව පෙනිණි. කාරුණික දෙඇසම කවියක් විය. වසර ගණනාවකට පෙර තිස්ස ප්‍රේමසිරි සොයුරා සමඟ කොළොම් පුරවරයෙන් කොලනියට සපැමිණි, කලා ඔයේ නිල් දිය රළ රළි මධ්‍යයේ ගිලී සිහිලසක සුවය විඳි කවියා අද මෙලෙස රෝහල් ඇඳක වැතිර සිටීම හද පාරයි. කවියකු මෙන්ම අතිදක්ෂ ඡායාරූප ශිල්පියකු වන ලාල් හැගොඩ එදා කලා ඔයේ දිය කෙළින මගේ කොල්ලන් සිය කැමරා කාචයට හසු කර ගනිමින් වින්දේ ඉමහත් ප්‍රීතියකි.

"ඉක්මනට සනීප වෙන්න වැඩ ගොඩක් තියෙනවා කරන්න. තව කවි පොතක් ලියන්න ඕන. එතකොට තව ඡායාරූප ප්‍රදර්ශනයක්... තියන්න ඕන..." යි මම ගිලන් කවියා සමීපයේ හිඳ ගනිමින් කියා සිටියෙමි. ඔහු මහත් ආශාවෙන් සිහිපත් කළේ ඔහුගේ අභිනව කවි පොත 'කෝමලිනි' පිළිබඳවය. එය අන්තර්ජාලයෙන් බා ගත හැකි බව ද ඔහු අවධාරණය කළේය.

ලාල් හැගොඩයන් වරක් ඡායාරූපයක් ගැනීම උදෙසා කලා වැවට පැමිණියේය. එපමණක් නොව නවීකරණය නොවූ ඉපැරණි පාසලක පන්ති කාමරයක් ඡායාරූපගත කරන්නට ගංගොඩේ ඇවිදිමින් වෙහෙසුණේය.

බුල්නැව දොරවේරුව වෙද ගමේ නැවතී ප්‍රතිකාර ලබමින් සිටියදී විටින් විට ඔහු බලන්නට යාමෙන් පෑ ළෙන්ගතු බව යළි යළි සිහිකරමින් කෘතවේදීත්වයේ කඳුළකින් දෙනෙත තෙමා ගත්තේය. කඳුළු පිරුණ ඒ කවි ඇස් මා සිත දැවූ ශෝකය මැඩ ගනිමින් මම සිනාවක්ම පෑවෙමි.

රාගම පුනරුත්ථාපන රෝහලේ අංක 01 වාට්ටුවේ ප්‍රධාන හෙද නිලධාරිනි කේ. එම්. ඩී. ප්‍රදීපිකා සොහොයුරිය වෛද්‍ය ප්‍රතිකාර ලබාගනිමින් දිගු කලක් රෝහල්ගතව සිටින රෝගීන් උදෙසා අපූරු සත්කාර්යයක් අරඹා තිබේ. ඒ පුස්තකාලයක් ගොඩනැඟීමය.

කවියෙන් ද, ඡායාරූපයෙන් ද සුවහසක් සිත් සැනහූ ලාල් හැගොඩ කවියා කෙරෙහි කුලුණුබර වෙමින් ඇය රෝගීන් හට සුවය ලබන්නට ඔසු පමණක් නොසෑහෙන බව ද පහදා දුන්නාය.

"රෝගී වුණු ශරීරයට අපි ප්‍රතිකාර කරනවා. ඒත් ඒකෙන් විතරක් රෝගියෙක් සුව කරන්න බෑ. මම මේ එකේ වාට්ටුවට පුස්තකාලයක් පටන් ගත්ත හිතුවෙත් පොත පත කියවන එකත් ඔසුවක් නිසා... පවුලේ අයගෙ නෑ හිතමිතුරන්ගේ ආදරයත්, කරුණාවත් ඔසුවකට වඩා ප්‍රබලයි රෝගියකුට" යි ඇය කාරුණික හසරැල්ලක් සමග පවසා සිටියාය.

සෑම මිනිසකු තුළම සැඟවුණු කවියෙක් සිටියි. ඉඳින් එය එසේ නම් රාගම පුනරුත්ථාපන රෝහලට පත පොත පරිත්‍යාග කරන්නට කිසිවකු දෙවරක් කල්පනා කර බලන එකක් නැත.

ලාල් හැගොඩ කවිකාර කලණ මිතුරාගෙන් සමුගැනීම වේදනාකාරී විය. එහෙත් යළි හමුවන්නට හෝ සමුගත යුතුමය. ජීවිතය එයයි. හමුවීම් හා වෙන්වීම්!

"ආයෙත් එන්න"

ගිලන් කවියාගේ සෝබර පා දුබල හඬ යළි යළි අසමි. ඔහු දකින්නට ගිය උදවියගෙන් "ආයෙත් යන්න" යි ඉල්ලා සිටින්නට කැමැත්තෙමි. තවමත් යන්නට ඉසිඹුවක් නොලද්දන්ගෙන් ද "ඉක්මනින් යන්න" යි ආයාචනා කරමි. පොතක් පත්තරයකුත් ගෙන යන්නේ නම් කොතරම් අපූරු ද? දුර බැහැර සහෘදය සංවේදී හදට මේ ලිපිනය අස්වැසිල්ලක් වනවා නොඅනුමානයි.

**රාගම පුනරුත්ථාපන රෝහලේ කේ. එම්. ඩී. ප්‍රදීපිකා හෙද සොහොයුරිය, ස්තුතියි !**

**ශාන්ති දිසානායක**

# දේශන තැන්න

# චන්දෝ මා බලිඳේ

## අඹන්වල නිලමෙගේ දරු නැළවිල්ල

අමරදේව සූරීන්ගේ හා වංග ජාතික සුචිත්‍ර මිත්‍රා ගායිවකාවගේ ගායනයෙන් මධුරත්වයට පත්ව ඇති චන්දෝ මා බිලිඳේ නුඹ නාඬන් ගීතය පිළිබඳව විමසුමක් කිරීමට මෙහිදී මම ප්‍රයත්නයක යෙදෙමි.

අමරදේවයන් සුචිත්‍ර මිත්‍රා ගායිකාව සමඟ ගුවන්විදුලි LS තැටියකට මෙය ගයා ඇත්තේ 1976 අප්‍රේල් 7 වැනිදාය. ඉන් පෙර අඟල් 16 විසල් ගුවන්විදුලි තැටියකට මෙය කේවල ගායකයක් ලෙස අමරදේවයන් ගයා ඇත්තේ 1950 දශකයේදීය. පසුව මෙය සුහානී අමරදේව දියණිය සමඟද යුග ගීයක් ලෙස ගායනා කර ඇත.

චන්දෝ මා බිලිඳේ ගීතය වැදි ගීතයක් ලෙස සමහරු හුවා දක්වා ඇත. එමෙන්ම අන්තර්ජාලයේ තවත් අයකුගේ නමින් පළ වූ බවක් ද පෙනීයයි. වැදි සමාජයේ මෙය භාවිත වූවක් නොවේ.

දේවර් සූරියසේන සංගීඥයා තම බිරිය නෙළුම් දේවියගේ ද සහාය ඇතිව රටපුරා ඇවිද ගැමි ගී එකතු කර පර්යේෂණ ක්‍රියාවලියක යෙදුණ අයෙකි. ඔහු රැස් කළ නෙළුම් ගී, වන්නම්, සවිදම්, විරිඳු, පාරු ගී ආදී ගැමි ගී සම්භාරයක් ප්‍රස්ථාර කර ග්‍රන්ථ ගත කොට ඇත. ලංකා ගීතාවලිය ඉන් එක් කෘතියකි. මෙම ජන ගී මෙරට මෙන්ම පිටරටවල දී ද නිදර්ශන සහිතව ගායනා කර තිබේ.

අඹන්වල නිලමෙගේ දරුනැළවිල්ල යනුවෙන් හඳුන්වා දෙන "චන්දෝපම බිලිඳේ නුඹ නාඬන්" ගීතය ඔහුට ගායනා කර ඇත්තේ හත්දෙස්සෝ පදිංචි ජී. ජී. මුදියන්සේ විසින් බව සඳහන් වේ.

චන්දෝ පම බිළිඳේ නුඹ නාඬන් දරු නැලැවිලි ගීතය රචනා කල අඹන්වෙල රාල දෙවෙනි රාජසිංහ රජුගේ කවිකාර මඩුවේ සේවය කළ සුප්‍රසිද්ධ කවියෙකි.

උඩරට රදල පෙලපතකින් පැවත ආ ඔහු අඹන්වෙල නිලමේ යන නමින්ද හැඳින්වෙයි.

දෙවැනි රාජසිංහ රජුට විරුද්ධ පැන නැගුණු නිලබේ කැරැල්ලට නායකත්වය දුන් වරදට ඔහු දරුණු වද හිංසාවන්ට පත් කර මරා දමණු රිසියෙන් රජු විසින් ඔහු එදවස කොළඹ සිටි ලන්දේසීන් වෙත යැවුණු බව කියවේ.

කෙසේ වුවද සිදුවූයේ වෙනස් දෙයකි. නිලමේ මරා දමනු වෙනුවට ඔහුගේ සේවය නන් අයුරින් ලබාගනිමින් කොළඹ කොල්ලුපිටියේ පිහිටි ඉඩමක් පවා ලබා දී තිබේ. පොල් වගාවේ නියැලි වැවිලි කරුවකු ලෙස මෙන්ම ලන්දේසි සෙමනේරියේ සිංහල ඉගැන්වීමේ නියැළුණ වියතකු වශයෙන් ද කල්ගෙවා අඹන්වල රාල කොල්ලුපිටියේ දී මිය ගිය බවත් සඳහන් වේ.

අඹන්වෙල නිලමෙගේ අවසන් කටයුතු ගරු බුහුමනින් යුතුව සිදුකිරීමට ලන්දේසීහු කටයුතු කළහ.

අඹන්වල රාල වියත් බස මෙන්ම ශබ්දාලංකාරද ශූර ලෙස හසුරුවා ගත් කවියෙකි. මෙයට නිදසුනක් පහත සඳහන් පද්‍යයෙන් ද මතු වී පෙනෙයි.

පල කල පතල කල කත මගද යන කල
පල දල පතල එන තන රත මඩල බල
තල මල සඟල වත උවනත උර පලල
බල දල ලකල වමතට ගවසන වරල

නූතන ගීත රචකයාට ද කලාත්මත ගීත නිර්මාණයේ දී මෙය කදිම මඟපෙන්වීමකි.

අඹන්වල නිලමෙගේ දරු නැළවිල්ලේ නුවර යුගයේ පැවති ප්‍රශස්ති කාව්‍ය ලක්ෂණ කදිමට ඉස්මතු වේ. ජන වහර මෙන්ම සෙව් වහරද සම්මිශ්‍රණයෙන් ගලපාගන්නා ශිල්ප ක්‍රමය ද ප්‍රති ගවේෂණය කල යුත්තකි.

"චන්දෝ මා බිලිඳේ" අමරදේව ගායනා කරන ගීතයට අමතරව චන්දෝපම බිලිඳේ මෙන්ම චන්දෝ පම බිළිඳෙ යනුවෙන් පළවී ඇති ගීත ද මගේ පරිශීලනයේ දී හමු වී පවතී. මේ සියලු යෙදුම් අර්ථවත්ය. දෙවාර් සූර්ය සෙනයන්ගේ ශ්‍රී ලංකා ගීතාවලියේ එන ගීතයේ (ස්වර ප්‍රස්තාර සහිත) චන්දෝපම බිලිඳේ යන්නෙන් චන්ද්‍රයාට උපමා කිරීමක් සිදුකෙරේ. වෙනත් තැනක සඳහන් වන චන්දෝ පබ යන්නෙන් චන්ද්‍රයාට සමාන ප්‍රභාශ්වර දීප්තියක් මතුකර පෙන්වයි. ගායන සුඛනම්‍යතාව ගැන සලකා අමරදේවයන් ගයන ගීතයේ චන්දෝ මා බිලිඳේ යන්න යොදා ගත් බවක් සැලකිල්ලට ගත හැකිය. චන්දෝ මා බිලිඳේ යන්න රූප කාර්ථවත් යෙදුමකි.

අමරදේවයන් ගයන ගීතයේ
"පතර බලැති සිරි කුන්ද විදාරණ
විතර බලැති සිරිධර පංච තාලෙන"

ඇසෙන විටම අගට සිහිපත් වන්නේ උඩරට වන්නමක භාෂා ලක්ෂණ හා නාද රූපයයි.

අමරදේවයන් ගායනා කරන ගීතයත් දේවාර් සූර්ය සේනයන්ගේ ගීතයත් මෙහිලා අන්තර්ගත කරන්නේ සියුම් ලෙස ගැඹුරින් හඳුනන්නාගේ අවධානය සඳහාය.

1- දේවාර් සූර්ය සේනයන් ගායනා කළ ගීතය

චන්දෝ පම බිලිඳේ නුඹ නාඬන්
චන්දෝ පම බිලිඳේ

කොක්කන පයියක් උරයක එල්ලා
දික් සැඩ පළුදස අතට අවුල්ලා
සක් ගෙඩියක් පිට ඇවිද තුමුල්ලා
ලක්ගල ආඩි ගුරුන් යයි අල්ලා (චන්දෝපම)

බඩ නම් ඔහුගේ පොතු කොල මල්ලා
පිට නම් ඇද මහ පත්‍ර කිඳුල්ලා
කෝඩි සබුක් සහ විසුලු මහල්ලා
ගෙට ඒ විය දැන් පැන යයි අල්ලා (චංදෝපම)

පැන්න තැනම කුකු ලන් හඬලානා
කන්නට බත් ලැබ ඌ සැම තැනා
ගොන්න ගහේ ඉඳ හා හූ ගානා
ඔන්න ඇවිත් පැන පිලූ බකමුණා (චංදෝපම)

2- අමරදේවයන් ගයන ගීතයේ මුල් පෙළ

පතර බලැති සිරි කුන්ද විදාරණ
විතර බලැති සිරිධර පංච තාලෙන

චන්දෝ මා බිලිඳේ නුඹ නාඬන්
ඉන්දෝ කොමල නිරිඳුට දාවුන්
බාලොලි ලන් ලොලි ලන්න බිලින්දෝ....
නාඬන් දැන්

දැන් දෙවිඳුන් මට දුන් දරු රූපා
කුංකුම චන්දනයෙන් සැදි රූපා
රන් ගිරගින් පායයි මුළු දීපා
මම් වද දැන් දරු පෙම් බැඳි රූපා

චන්දෝ....

පැන පැන අතු අග සොඳ දළු කන්නා
ඉඟි බිහි කරමින් බැම නටවන්නා

වට සිටි පැටවුන් ළඟ කැඳවන්නා
ඔන්නු බිලිඳු රිළවුන් පැන යන්නා

උන්නු ගසේ ඉඳ ඌටම ජානා//
මෙන්න ගසේ ඉඳ හා - හූ ගානා
පැන්න කලට කුකුළන් අඬලන්නා
ඔන්න බිලිඳු බකමූණු හඬන්නා

ගිඩි ගිඩි ගාමින් බඩ ගොරවන්නා
ගස් බිඳ පොඩිකර ඇද එලවන්නා
වට සිටි පැටවුන් ළඟ කැඳවන්නා
ඔන්න බිලිඳු ඇත් රළ පන්නන්නා

අවර වෙන්ඩ පෙර ගසට පනින්නා
උදා වෙන්ඩ පළමුව අඬලන්නා
සදා පැටවි වට සාරා කන්නා
ඔන්න බිළිඳු සැවිළිඳු අඬලන්නා

දෙවැනි රාජසිංහ රජුට අන්තඃපුර වැදි බිසවක සිටි බවටත්, මෙම දරු නැළවිල්ල ඇය සතුටු කිරීමට ලියූවක් බවත්, ඇතැම් ප්‍රවාදවල පල වෙයි.

එය කෙසේ වුවද මහ වැදි රට ලෙස සැලකෙන මහියංගණය හා අවට ප්‍රදේශයට දෙවන රාජ සිංහරජුගේ සම්බන්ධයක් පැවතින මහියංගණය විහාරයට සමීපව පිහිටි (දැනට පවතින පොලිසිය ආසන්නයෙන්) විල්ලු පිටිය (විල්ලුපිටිය) රජු උපන් භූමිය ලෙසත් ඒ ආසන්නයේ පිහිටි රිදී කොට ලිය බිලිඳාගේ රෙදි සෝදා පවිත්‍ර කළ ස්ථානය ලෙසත් ජන ප්‍රවාදයේ ඇත. දෙවන රාජසිංහ රජුගේ යුද සේනාවේ වැදි පිරිසක් ද සිටි බව වාර්තා වේ.

අමරදේවයන් ගායනා කරන චන්දෝ මා බිලිඳේ ගීතය කලාත්මක ගීතයක මුහුණුවර හඳුනාගැනීමට අනුබලයකි.

**සුනිල් සරත් පෙරේරා**

# බද්දරමල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

# වැලි

## එකතුවක අපූරුව



මිනිසා සිය ජීවිත කාලය තුළ බොහෝ දෑ එකතු කරයි. ඉන් ඇතැම් දෑ විනෝදය පිණිස ය. කිසිවකුගෙන් ඔබගේ විනෝදාංශ මොනවාදැයි ඇසූ විට, එබඳු එකතු කිරීම් ගැන ද අසන්නට ලැබෙයි. එක් එක් වයස් මට්ටම් අනුව කුරුළු පිහාටු හෝ මුද්දරවල සිට, රථ වාහන හෝ මුතු මැණික් දක්වා වන විශාල පරාසයක් තුළ, එම එකතු කිරීමේ විනෝදාංශය පැතිර පවතී.

70 දශකයේ දී පැරිස් නුවර පැවති ප්‍රදර්ශනයක ද තේමාව වී තිබුණේ එබඳු එකතු කිරීම් ය. බෝතල් මූඩි, දුම්රිය ප්‍රවේශපත්‍ර, සීනු, නළා, බිම කරකවන බමර හා 'ටොයිලට් පේපර්' ඇසුරුම් ආදි විවිධ එකතු එහි දක්නට විය. ඒ අතර තිබූ වැලි එකතුවක්, බොහෝ දෙනාගේ කුහුලටත්, මවිතයටත් හේතු විය. ලෝකයේ නන් දෙසින් එකතු කරගත්, විවිධ වැලි වර්ග, වීදුරු බඳුන් තුළ දමා ප්‍රදර්ශනය කර තිබිණි.

දෙසින් දෙසට, පෙදෙසින් පෙදෙසට වැලි විවිධය. වෙනස්ය. අමුතුය. කැස්පියන් මුහුදු තීරයෙන් එකතු කරගත් වැලි, කළු සහ සුදු පැහැතිය. හංගේරියාවේ බැලටන් වැව් තීරයේ වැලි අළු පැහැතිය. බටහිර අප්‍රිකාවේ ගයනා, සෙනෙගල් හරහා ගලා බසිනා ගැම්බියා නදී තෙර වැල්ල, රතු පැහැතිය. කෙන්යාවේ මලින්දි අසල මුහුදු වෙරළේ වැලි, දම් පැහැති බෙලි කටු මිශ්‍රිතය.

ලෝකයේ විවිධ රටවලින් ලබාගත්, වැලි සහිත වීදුරු බඳුන් පෙළ දකින්නකුට, ලෝක සිතියමක් මතකයට නැඟෙනු ඇත. මෙම වැලි එකතුව අයත් පුද්ගලයා සංචාරකයකු විය යුතුය. ඔහු තම ගමන් බිමන්වලදී එක් එක් රටින් සිතෙන සිතෙන තැනකින් වැලි අහුරක් ගෙන වීදුරු බඳුනක බහා , ගමන් මල්ලේ දමා ගන්නට ඇත. ඒ හැම බඳුනකම ඊට අදාළ ලේබලයක් ද ඇත. එහෙයින් පසු කලෙක එම වැලි එකතුව ඔහුට තම සංචාර සිහි ගන්වන ඡායාරූප ඇල්බමයක් හෝ දින පොතක් හා සමාන වන්නට ඇත.

මිනිසා හින්න රුචිකය. මිනිසාගෙන් මිනිසාට ආශාවන් විවිධ ය. වැලි එකතු කළ පුද්ගලයාගේ විනෝදාංශය, තවත් කෙනකුට විකාරයක් විය හැකිය. එහෙත්, පසු කලෙක එය පැරිසිය වැනි කලා පුරයක ප්‍රදර්ශන භාණ්ඩයක් බවට පත්ව දහසක් රසිකයන්ගේ ආකර්ෂණය දිනා ගනීවි යැයි 'වැලි එකතු හිමියා' වත් සිතන්නට නැත.

ඉහත කී ප්‍රදර්ශනය නැරඹීමට පැමිණියවුන් අතර, ලෝක ප්‍රකට නවකතා කරුවෙක් ද සිටියේය. ඔහු ඉතාලි ජාතික ඉතාලෝ කැල්විනෝ (Italo Calvino) ය. වැලි එකතුව ඔහුගේ ද කුහුල අවුළුවාලන්නට හේතු විය. කැල්විනෝ නවකතාවට කෙටිකතාවට මෙන්ම, විවිධ විෂයයික ලේඛනයෙහිද (Essay) අති දක්ෂයෙකි. බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෙකු වන කැල්විනෝ, ජංගම විශ්වකෝෂයක් බඳු යැයි එක් මාධ්‍යවේදියකු සඳහන් කළේය. ඉතා සුළු දෙයක් සම්බන්ධයෙන් වුව, විවිධ කෝණයන්ගෙන් දකිමින් රසවත් ලිපි ලිවීමෙහි සමත් ඔහු, වැලි එකතුව ගැන ලියූ ලිපිය, "Collection of sand" නමැති නිබන්ධ සංග්‍රහයට එක් වූයේ, ඊට ග්‍රන්ථ නාමය ද ලබා දෙමිනි. එය, කැල්විනෝ ජීවතුන් අතර සිටියදී පළ වූ අවසන් ලිපි එකතුව ද වෙයි. (ඔහු මිය ගියේ 1985 සැප්තැම්බර් 19 වැනිදාය.)

මෙම ලිපි එකතු, ප්‍රධාන කොටස් හතරකින් යුක්තය. ඉන් පළවැන්න, "ප්‍රදර්ශන සහ ගවේෂණය" මැයින් යුතුය. 1980 - 84 කාලය තුළ, කැල්විනෝ පැරිසියේදි දුටු විවිධ ප්‍රදර්ශන පිළිබඳව ලියූ ලිපි දහයක් ඊට ඇතුළත් වෙයි. දෙවැනි කොටස, දෘශ්‍ය කලාව පිළිබඳව වන අතර, රෝලන්ඩ් බාත් ඡායාරූපකරණය පිළිබඳව ලියූ "කැමරා ලුසිඩා" කෘතිය පිළිබඳ ලිපියකින් එය ඇරඹෙයි. තෙවැනි කොටස, ග්‍රන්ථ විචාර පහකින්ද 17 වන සියවසේ ස්වීඩන සාහිත්‍යයේ එන සුරංගනා කතා පිළිබඳව ද ඩොනල්ඩ් එවන්ස් හා ලුයිජි සෙරෆානි නමැති චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ ගැනද කළ විමසුම් කීපයකින් යුතුය. "කාලයේ හැඩතල" නමැති, සිවු වැනි කොටස සමන්විත වන්නේ, ගමන් විත්ති ලිපි පසළොසකිනි.

පරිකල්පනාත්මක දෘශ්‍ය කලා පිළිබඳව බොහෝ දෑ ලියා ඇති කැල්විනෝ ඔහුගේ එක් ලිපියකදී මෙසේ සඳහන් කරයි. "The brain beging in th eye" ඔහු ඉන් අදහස් කළේ, සිතීම හෝ විඳීම ඇරඹෙන්නේ දැකීමෙන් බවය. එසේ නැතහොත්, ඇස කරන්නේ බැලීමය. සිත කරන්නේ දැකීමය.

පැරිස් ප්‍රදර්ශනයේදි දුටු තවත් විශේෂ එකතුවක් ගැන, කැල්විනෝ සඳහන් කරයි. එනම්, කැන්වස් හෝ රබර්වලින් නිෂ්පාදනය කළ, කොල සහ අළු පැහැති ගෑස් මුහුණු (Gas Masks) ය. ජීවිත කාලය පුරාම, ගෑස් මුහුණු එකතු කරන්නකු ඉන් විනෝදාස්වාදයක් ලබනවා විය හැකිය. එහෙත්, විශාල දෙනෙතකින් හා ඉදිරියට නෙරා ආ නාසයකින් යුත් එම විරූපී මුහුණු ආවරණ තුළින් මතුවන තවත් කරුණු දෙකක් ගැන කැල්විනෝ ඉඟි කරයි. පළමුවැන්න, තිරිසන් සත්ත්ව ලක්ෂණ හා කාර්මීකරණය එතුළින් සම්මිශ්‍රණය වී තිබීමය. දෙවැන්න යුද්ධයේ කුරිරු බව පිළිබඳ යටපත් වී ගිය මතකයන් යළි අවදි වීමය.

කෙනකු ගෑස් මුහුණු එකතු කරන අතරේ තවකෙක් වෝල්ට් ඩිස්නිගේ සුප්‍රකට කාටූන් නිර්මාණය "මිකී මවුස්" එක් රැස් කරයි. එය මිනිසාගේ විනෝදාස්වාදය පිළිබඳ සංකේත රූපයකි. ජනප්‍රියතම අමෙරිකානුවා සෙවීම සඳහා කළ සමීක්ෂණයකදී පළමු තැනට තේරුණේද "මිකී මවුස්" ය. මිනිසුන් එකතු කරන ඇතැම් භාණ්ඩ දකින විට එය කිසියම් උමතු බවක් ද - මේනියාවක් ද - යන සැකය ද මතුවන බව කැල්විනෝ කියයි. එහෙත් එය තමාට නම් පුදුමයට කාරණයක් නොවන බවද පවසන ඔහු ප්‍රංශ ජාතික කලාකාරිනියක වන ඇනෙට් මෙසාජර් (Annette Messager) දෙසට දිගු කරයි.

ඇනට් මෙසාජර් පැරිසියේදී හා මිලාන්හිදී ඒක පුද්ගල ප්‍රදර්ශන කීපයක්ම පැවැත් වූවාය. ඇය දෘශ්‍ය කලා මාධ්‍ය තුළ රැඩිකල් ශිල්පිනියක ලෙස ප්‍රකටය. ඇගේ නිර්මාණ අතර පුවත්පත්වලින් කපා ගත් කොටස්, වැකි සහිත පිටු, රේඛා සටහන් ආදිය ද වෙයි.

ඇනට් පවසන අන්දමට, මේ ඇගේ ජීවිතයේ එකතු කිරීමය. නැතහොත් ඉතිරි කිරීමය. අප දවස පුරා කරන්නේ මොනවාද? එකතු කිරීම් , ඇනවුම් කිරීම්, වර්ගීකරණයන්, ඉවත දැමීම් ආදී ක්‍රියාවන් නොවේද? අවසානයේදී ඉතිරි වන එකතු ජීවිතයම නිරූපණය කරයි.

ඇගේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ, නූතන දෘශ්‍ය කලාවට බහු භාණ්ඩික පරිභෝජන ජීවන රටාව විසින් කෙරෙන බලපෑමයි. නැතහොත් ඉන් ලබන නිර්මාණ ආභාසයයි.

කැල්විනෝ සඳහන් කරන අන්දමට ඇනට්ගේ ජීවිතය මිනිත්තුවෙන් මිනිත්තුවට, සිතිවිල්ලෙන් සිතිවිල්ලට කුඩා එකතුවක් බවට පත් වෙයි. ජීවිතය ක්‍රමයෙන් කුඩා කැබලි වෙමින් දූලි වළාවක් බවට හැරෙයි. අවසානයේදී යළිත් වරක් ඔහු පොළොවේ වැලි!

ඇනිටා මෙසාජර් සේම කැල්විනෝද සාමාන්‍ය තුළ ඇති අසාමාන්‍යය හඳුනා ගනී. ඔහු ලියා ඇත්තේ අප හොඳින් දන්නා දෙය ම වුව, ඔහු ඒවා ඉදිරිපත් කරන විලාශය නිසා, අප ඒ දේවල් එතෙක් නොදැන සිටියාක් මෙන් හැඟෙයි.

නූතන ඉතාලි සාහිත්‍යකරුවන්ගෙන්, වෙනත් භාෂාවන්ට වැඩිපුරම පරිවර්තනය වී ඇත්තේ ඉතාලෝ කැල්විනෝගේ කෘතීන්ය. සල්මන් රුෂ්ඩි, 'භක්තිමත්' කැල්විනෝ පාඨකයෙකි. විශ්වයේ පැවැත්ම තේමා කරගනිමින් කැල්විනෝ ලියූ 'ද කොම්ප්ලීට් කොස්මිකොමික්ස් (The Complete Cosmicomics) පිළිබඳ රුෂ්ඩි මෙසේ පවසයි' ඔබ මෙතෙක් කැල්විනෝගේ 'කොස්මිකොමික්ස්' කෘතිය කියවා නැත්නම් ඔබට මඟ හැරී ඇත්තේ ඔබේ ජීවිතයේදී කළ හැකි රසවත්ම කියැවීමයි.'

තවත් අවස්ථාවක රුෂ්ඩි පැවසුවේ ලෝකාවසානය අත ළඟ බව යම් හෙයකින් දැන ගැනීමට ලැබුණහොත් ඒ අවසාන පැය කීපයේ කියැවීම සඳහා තමා ළඟ තබා ගන්නේ ඉතාලෝ කැල්විනෝගේ නවකතාවක් බවය.

# ඩූපෙළ සහ යටපෙළ



ඉතාලෝ කැල්විනෝ

**කපිල කුමාර කාලිංග**

# බද්දරමල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

# අපරාදෙ... ඒ නිවාඩුව

## සංහිඳ පාවුල

ගෙවුණු අවුරුද්දේ අවසන් කාලයේ දී ලෝකයට එබිකම් කළ අවාසනාව නම් කොවිඩ් 19 හැර අන් කවරක් ද? චීනය පැත්තෙන් කොවිඩ් පැතිරෙන විට, ලාංකික අපි දැස් හයාගෙන විපතක තතු නැරඹුවෙමු. මගේ මුහුණුපොතේ මිතුරකු ඒ දිනවල චීනයේ වුහාන් ප්‍රදේශයේ කඳවුරක වෙසෙමින් වයිරසයට බිලි නොවී පෙරළා ලංකාවට පැමිණීම පිළිබඳ ලියූ සටහන් මා කියවූයේ ත්‍රාසයෙන් පිරි අතුදැකීමක් කියවන්නකු සේ ය. හිත මඳකට හෝ සැහැල්ලු කරන කාරණා ද තිබිණි. ශ්‍රී ලංකාව සමකාසන්න සර්ම කලාපීය දූපතකි. එබැවින් මහා පරිමාණ වෛරස ආසාදන අප කරා එළඹීමේ අවදානම අඩු ය. 1920, 1820 ලොව කැලඹූ වසංගත අපේ රටට පැමිණ තිබුණේ නැත. මෑත කාලීන සමහර වසංගත ද අපේ රට ආක්‍රමණය නොකිරීමට තරම් කාරුණික වී තිබිණි.

එහෙත් කොවිඩ් අපේ රටට ආවේ ය. අපි ලොක්ඩවුන් කිරීමට ලක් වීමු. එය ද අපේ අයට මෙතෙක් විඳින්නට නොවූ විරූ අත්දැකීමකි. ඇඳිරි නීතියේ වැඩට යන්නට ඉඩ නැති මව්පියෝ සහ පාසල් යන්නට ඉඩ නැති දූ දරුවෝ නිවෙසේ උදේ සිට රෑය දක්වා කාලෙකින් එකට විසූහ. උදේ නිවෙසින් පිට වී විඩාබර මනසින් හා කයින් රෑයේ ගෙට ගොඩවෙන අයට උදේ සිට ගෙදර ම ගත කරන්නට සලස්වන්නට තරම් වසංගතය කාරුණික වී තිබුණි. යන්තම් ඉසිඹුවක් ලැබෙන සති අන්තයේ ඉවර පවර නැතිව දරුවන් අමතර පන්ති කරා ගෙනයන මව්පිය ප්‍රජාව නිවසට කොටු කර තිබිණි. ළමා ළපටීන්ට පාසල් නැති, අමතර පන්ති නැති වාරාවසානයේ වත් නැති අපූරු නිවාඩුවක් ආවේ ය. ඒ හා ම අපූරු ක්‍රියාකාරකම් සමූහයක් ද කලඑළි බැස්සේ ය. වත්තේ ඉඩහසර ඇති අය වවන්නට ගත්හ. එසේ ඉඩකඩක් නැති අය රූපවාහිනියට දැස් අලවා සිටින්නට නැත්නම් ගෙවල් දොරවල්වල සුළු පිරියම් වැඩ පටන් ගත්හ. පොතපතට ලොල් වූවෝ කියවන්නට අතපසු වූ පොත් මෙන් ම කියවූ පොතපත නැවත කියවන්නට ද පටන් ගත්හ. "අපේ පැරණි අයට ලෙඩදුක් තිබුණේ නැත. අපට දරුවන්ට ලෙඩ." යයි විස්සෝප වූවන්ට මිනිස් ඇසුරේ නොගැටීම නිසා සෙම්ප්‍රතිශ්‍යාදී නිතර වැලඳෙන රෝ දුක් අහිමි වී දොස්තර ගෙදර නොගොස් සිටීමේ අවස්ථාව උදා විය.

වසංගත දුර්භාග්‍ය මැද යම් තරමකින් හෝ සෞභාග්‍යාවස්ථා උදා කරගත්තෝ ද සිටියහ. ජනතාවට වෙළඳපොළට යන්නට ඉඩහසර සලසා දී ඇඳිරිනීතිය තාවකාලිකව පැය ගණනකට ඉවත් වී ජනතාව යතුරුපැදි, ත්‍රිරෝද රථ, මෝටර් රථ ආදියෙන් අමතක කොට තිබුණු නගරයට කඩිනමින් එන සඳ මුහුණු ආවරණ මසා විකුණමින්, විලාසිතාවක් සේ කඩිනමින් හිත ඇඳුණු වගාවට පැල වර්ග හා බීජ වර්ග ආදිය විකුණමින්, ලොක්ඩවුන් වී තිබුණු පෙදෙස්වලට ආහාර ද්‍රව්‍ය විකිණීමේ ඇඳිරි නීති බලපත් යටතේ හාල්, කරවල, පාන්, කේක්, රසකැවිලි ආදිය සපයමින් සිය ඉපැයීම් සවිමත් කරගත් අය සිටියහ. පෙරුම්කායම් වසංගතයෙන් මිදීමට ප්‍රත්‍යක්ෂ ඔසුවකියි කී හෙයින් මිනිස්සු පෙරුම්කායම් හොයන්නට වූහ. කඩේ තිබූ පෙරුම්කායම් මිල අසීමිතව ඉහළ ගොස් කීප දෙනකුගේ කරල පැහුණි. තව කී නොකී දෑ බොහෝ ය.

පාසල් දරුවන්ගේ අම්මාවරුන් සිටියේ විස්සෝපයෙනි. දින නියමයක් නැතිව පාසල් වසා දමා තිබේ. වෙනදා ළමයින් කැටිව ගිය අතිරේක පන්ති ද වැසී ගොසිනි.

"අනේ අපේ ළමයින්ට තමා ඉගෙනගන්න නැති වුණේ." උහු මැසිවිලි නගන්නට වූහ.

කොරෝනා කාලේ පාසල් හා අතිරේක පන්ති වසා තැබීම එක් අම්මා කෙනෙකුන්ගේ හෝ කණ්ඩායමකගේ දරුවන්ට වන් විපතක් නොවේ. සමස්තයක් වශයෙන් මුළු මහත් ශ්‍රී ලංකාවේ ම දරුවන්ට මුහුණ දෙන්නට වූ ඇබැද්දියකි. පාසල් මතු නොවේ. රජයේ සරසවි හා පෞද්ගලික අංශයේ සරසවි වැසී ගිය නිසා උසස් අධ්‍යාපනයේ නිරතව සිටි දරුවන් ද ගෙදර ය. පොදුවේ සියල්ලන්ට වූ විපතක් තම දරුවන්ට පමණක් වූවක් සේ සලකන පුහුදුන් මිනිස් ගතියෙන් අම්මාවරුන් පෙළෙන හැටි මැනවින් දක්නට ලැබිණි.

ඔන්ලයින් අධ්‍යාපන ක්‍රමය කලඑළි බැස්සේ මෙකියන ප්‍රශ්නවලට උත්තරයක් සේ ය. සරසවි පවා ඔන්ලයින් ක්‍රමයට දේශන පැවැත්වීම මෙන් ම විභාග පැවැත්වීම ද ආරම්භ කළේ ය. පාසල් ළමයින්ට තහනම් භාණ්ඩයක් සේ පැවතුණු ස්මාට් ජංගම දුරකතනය උන් අතට පත් කරන්නට මව්පියන්ට සිදු විය. පාසල් මායිමට එන ජංගම දුරකතන අත්අඩංගුවට ගනිමින් පාසල් විනය අකුරට ක්‍රියාත්මක කළ ගුරු ප්‍රජාවට ඔන්ලයින් පාඩම් සිසු ප්‍රජාවට දුරකථන හරහා යවන්නට සිදුවිය. ගැටලු ද නොතිබුණා නොවේ. විවිධ ආර්ථික මට්ටම්වල ජීවත්වන ඇතැම් පාසල් සිසුන්ට හෝ දෙමාපියන්ට ස්මාර්ට් ජංගම දුරකථන නොවිණි. තිබුණ ද ඇතැම් දුෂ්කර පෙදෙස්වල ඊට ඇවැසි සිග්නල් සෙවීම කළුනික සොයන්නා සේ දුෂ්කර විය. එක් ගුරු මහත්මියක් මා හා කීවේ වට්ස්ඇප් වැනි සමූහ සාදා පාඩම් යවන්නට උත්සාහ කළත් එයට ළමයින් එකතු කර ගැනීමේ ගැටලු පැවති බවයි. අපේ රටේ විවිධ තරාතිරමේ පාසල්වල ඉගෙන ගන්නා ළමා ප්‍රජාවේ ආර්ථික හා සමාජීය විෂමතා මීට හේතු වෙයි. පසුව මේ ගැටලුවලට විකල්ප ක්‍රියාත්මක විය. පාසලට ආසන්නව ඇති කමියුනිකේෂන් හල් ඇසුරින් පාඩම් බෙදා දීමයි. ගුරුවරුන් කමියුනිකේෂණයට එවන පාඩම් උහු මුද්‍රණය කොට මව්පියන්ට බෙදා හරිති. මෙම ක්‍රියාවලිය කොරෝනා කාලේ ව්‍යාපාරික කටයුතු ඇනහිට තිබූ කමියුනිකේෂන් හල්වලට ද මඳ හෝ අස්වැසුමක් විය. කොරෝනා කාලේ ප්‍රින්ටර විකුණුණු බව මා හා කීවේ පරිගණක අලෙවිසල් හිමියෙකි. ළමයින්ට ලැබෙන පාඩම් විධිමත්ව මුද්‍රිතව දෙන්නට වියදම් කළ හැකි මව්පියෝ ප්‍රින්ටර මිලට ගත්හ.

මේ සියල්ල එක් පැත්තකි. එහෙත් අධ්‍යාපනය අරහයා අපේ සමාජයේ පවතින ආචාර්ණවාදී ආකල්ප එහි සෝබන සළු පිළි ඉවත ලා කවරදාකටත් වඩා කරළියට ආවේ ය. "අධ්‍යාපනය යනු හැකි ඉහළින් ලකුණු ගැනීමය. මව්පියන්ගේ තනතුරු හෝ ඊටත් ඉහළ තනතුරු කරා දරුවන් ගමන් කිරීම ය. උපාධි ආදිය හැකිතරම් ලබා ගැනීමය. අන් දරුවන් අබිබවා යෑම ය." යන පුහුදුන් ආකල්ප හිසින් දරා ගත් සමාජයකට අර්බුද සමයක කළ යුතු කටයුතු වැටහුණේ නැති.

නිවෙසේ සිටින අත්තම්මා, අත්තා ආදී වැඩිහිටියන් සතු පාරම්පරික දැනුම මුනුපුරු මිනිපිරියන්ට දෙන්නට ලොක්ඩවුන් කාලය මැනවින් යොදා ගත හැකිව තිබිණි. පැරණි විවිම්, පැදුරු පුරණ හැටි, විවිධ රටා, පරිසරයට අයත් දේ භාවිතා කරමින් ඉදලක් බඳින හැටි, විවිධ අත්වැඩ කියා දෙන්න ඉඩ තිබිණි. පැරණි තුන් තේරවිලි, ජනකතා, ජනකවි කියා දෙන්න තිබිණි. පවුලේ අය එකතු පහදු වී දැනුම මිනුම තරඟ තියන්නට ඉඩ තිබිණි. තව කෙතරම් දේ තිබුණි ද? අපරාදෙ... අම්මා මුත්තා කාලේ වත් නොලැබුණු පන්නයේ නිවාඩුවක් අප අත්හැරියා නොවේ ද?

**මහානාම දුනුමාල**

# බබාගේ බර වැඩි කරගන්න කැමැති ද?

## ගෙදර වෛද්‍ය

බබාගෙ බර කිරපු මිඩ් වයිෆ් බබාගෙ බර පොත සලකුණු කළා. 'අවුරුදු දෙකට බබාගෙ බර තියෙන්න ඕනෙ ගානට වඩා ටිකක් අඩුයි වගේ, අපි දොස්තර මහත්තයට පෙන්නමු' මිඩ් වයිෆ් මිස් කිවුවා.

බබාවත් වඩාගෙන ඇවිත් දොස්තර මහත්තයා ගාවින් වාඩි වුණ අම්මා මෙහෙම ඇහුවා. 'ඩොක්ටර්, බබාගෙ බර වැඩිකරගන්න හොඳ කිරිපිටි වර්ගයක් ලියලා දෙන්න පුළුවන් ද ?'

බබෙක්ගේ වයසට තියෙන්න ඕන බර නෑ කියන්නෙ අසනීපයක් නෙවෙයි. ඒත් බර අඩුවීම නිසා බබාට වෙන්න පුළුවන් ප්‍රශ්න ගොඩක් තියෙනවා. මොකද නීරෝගි දරුවෙක් ගෙ බර අඩුයි කියන්නෙ එයාගෙ පෝෂණයේ, ඒ කියන්නෙ එයා කෑම කන එකේ අඩුවක් තියෙනවා කියන එක. එහෙම වුණාම එයාට සාමාන්‍ය දරුවෙක් වගේ වැඩකරන්න අමාරුයි. ඒ වගේම ඉක්මනින් ලෙඩ වෙන්නත් පුලුවන්. ලෙඩ වුණාම කෑම කන එක තවත් අඩු වෙන හින්දා දරුවා තවත් දුර්වල වෙන්න පුළුවන්. අන්තිමට වෙන්නෙ බර විතරක් නෙවෙයි එයාගෙ වයසට එයාට උස යන්න පුළුවන් තරමට උස යන්නත් බැරිවෙන එක.

දරුවෙකුට ඕනෑ කරන පෝෂණය නැති වුණාම ඒක උස මහතට විතරක් නෙවෙයි මොලේ වැඩීමටත් බලපානවා. ඒ කියන්නේ හරියට කෑම ටික කැවෙන්නෙ නැති දරුවකුට ඉගෙන ගන්න ගණන් හදන්න එහෙමත් අමාරු වෙන්න පුළුවන්.

මේ තත්වය නැති කරන්න පිටිකිරිවලින් පුළුවන් ද ?

මේ ප්‍රශ්නයට උත්තර හොයන්න අපි දැනගන්න ඕන දේවල් ටිකක් තියෙනවා. වැදගත් ම දේ තමයි අපි දැනගන්න ඕන කුඩා දරුවෙක් ගෙ බඩට දාන්න පුළුවන් කෑම ප්‍රමාණය වැඩිහිටියකුට වඩා ගොඩක් අඩුයි කියන එක. ඒ නිසා අපිට බබෙකුට කෑම දෙනකොට වුවමනා දේවල් විතරක් ම තෝරලා දෙන්න වෙනවා. ඒ වගේම ඒ පොඩි ඉඩට පුළුවන් තරම් වැඩි කෑම ප්‍රමාණයක් කවාගන්නත් වෙනවා. අන්න ඒ නිසා තමයි දරුවකුට කෑම කවද්දී දියර වර්ගවලට වඩා ඝන දේවල් දෙන්න ඕන කරන්නේ.

පොඩ්ඩක් හිතන්න අපි බබෙකුට අඹ කෑල්ලක් කන්න දුන්නා කියලා. එතකොට අඹ කෑල්ලේ තියෙන විටමින් , ඛනිජ ලවණ වගේ හැම දෙයක් ම දරුවාට ලැබෙනවා වගේම බඩ පිරෙන්නෙත් නෑ. බඩේ ඉඩ ඉතුරු වෙනවා. හැබැයි අපි අඹ කෑල්ලෙන් බීම හදලා දුන්නොත් අඹ කෑල්ලේ ඉඩ විතරක් නෙවෙයි වතුරවල ඉඩත් ඕන කරන නිසා බඩ පිරිලා වෙන දෙයක් කන්න බැරිවෙනවා. එතකොට ඉබේම පෝෂණය අඩු වෙලා බබාගෙ බර අඩු වෙනවා.

කෑම වේලකට කලින් කිරි දුන්නමත් වෙන්නෙ ඔහොම දෙයක් ම තමයි. කිරි වීදුරුවක වැඩියෙන්ම තියෙන්නෙ වතුර. තව සීනිත් තියෙනවා. ප්‍රධාන කෑම වෙලකට කලින් කිරි දෙනවා කියන්නෙම එයාට වැදගත් දෙයක් කන්න තියෙන ඉඩ නැතිකරන එක.

ඒ නිසා අපි ඉගෙනගන්න ඕන වැදගත්ම දෙයක් තමයි පොඩි දරුවකුට එයාගෙ තියෙන පොඩි බඩට එයාට ඕන කරන හැම දෙයක් ම දෙන්න නම් කන දේවල් උකුවට දෙන්න ඕන කියන එක.

එතකොට එක දවසකදි එයාට ඕන කරන හැම දෙයක් ම දීල එයාගෙ බර වැඩි කරගන්න පුළුවන්.

අනිත් වැදගත් ම කාරනාව තමයි දරුවකුට ඕන කරන හැම පෝෂ්‍ය පදාර්තයක් ම ස්වාභාවික කෑමවලින් ලැබෙනවා. අමතර විටමින් වත් කෘතිම කෑම ජාති වත් ඕනෑම නෑ.

ඒ වගේම තමයි හොඳ බරක් ඒ කියන්නෙ බබාගෙ බර පොතේ කොළ පාට කොටසෙ ඉන්න බබෙකුට වගේ නෙවෙයි රතු පාට කොටසෙ හරි සුදු පට කොටසෙ හරි ඉන්න බබෙකුට කෑම කවන්නෙ නැතුව දියර වර්ග වැඩිපුර දෙනව කියන්නෙ ඒ බබාගෙ බර තවත් අඩු වෙන්න හේතුවක් කියන එක අපි හැමෝම තේරුම් ගන්න ඕනෑ.

දරුවකුට හරියටම කන්න දුන්න කියල කියන්න නම් අපි කරන්න ඕනෑ කරන දේවල් තුනක් තියෙනවා. ඒ තමයි හොඳ දේවල් දෙන එක. හොඳ දේවල් ඕන කරන ප්‍රමාණයට, ඒ කියන්නෙ ඇතිවෙන්න දෙන එක සහ නරක දේවල් නොදී ඉන්න එක.

ඉතිං පිටි කිරි, බීම වර්ග වගේ දේවල් අයිති වෙන්නෙ මොන කොටසටද කියන එක අම්මලා තාත්තලාම හිතල බලන්න ඕන.

**වෛද්‍ය නුවන් තොටවත්ත**

# ටොම්සන් මහත්තයා

## මැටි සහ පොටරි

"මොකක්ද ටොම්සන් මහත්තයා මේ මැටි ප්‍රශ්නය?" කියා ඇසුවේ ඇම්බන් මහත්තයා. හුඟක් කාලයකට පස්සේ මුණගැසීමේ සතුට නිසා ටොම්සන් මහත්තයා සහ ඇම්බන් මහත්තයා 'ඇඹුල' අවන් හලට වැදී බත් කමින් සිටියේ මැටි පිඟාන්වලය. මැටි කිව්වාට ඒවා පිඟන් මැටියෙන් තනාපු අලංකාර පිඟන්ය. ආහාර දමා තිබුණේ රතු පැහැති මැටි වළංවලය. සමහර විට ඇලුමිනියම් වළංවල උයා මැටි වළංවලට දැමුවා වන්නටද බැරි නැත.

"මේකනේ ඇම්බන් මහත්තයා... දැන් ඔය රාජ්‍ය අමාත්‍යාංශයක් ආවානේ වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය කියලා... ඒකේ එකක් තමයි මැටි ඒ කියන්නේ ඉංග්‍රීසියෙන් පොටරි කියලයි තියෙන්නේ... " ටොම්සන් මහත්තයා බත් කටක් කටේ දා ගන්න ගමන් කීවේය.

"හරි ඉතින්... මොකක්ද ඕකේ තියෙන ප්‍රශ්නේ... ඒක මේ රටේ හරිම පැරණි ග්‍රාමීය කර්මාන්තයක් නේ.. ඒ විතරක් නෙවෙයි... ටොම්සන් මහත්තයාට කියන්න... ඒ කාලේ අපි ඉස්කෝලෙදි මැටිවලින් අත්කම් කළානේ... මැටි අනලා භාජන හැදුවා... ගඩොළු හැදුවා... මැටි කැට හැදුවා... පිගන් හැදුවා... දැන් ඉතින් ඒවා නැනේ... දැන් කඩෙන් අරන් ක්ලේ පැකට් නේ ළමයි අරන් යන්නේ..."

"ඒක තමයි... දැන් මේ අමාත්‍යාංශේ තියෙන අනික් ඒවා ගන්නකෝ... වේවැල්, පිත්තල, ලී බඩු වගේ අනික් කිසි දෙයක් ගැන නොකියා මොකද මේ මැටි ඇමති කියන්නේ... මොකක්ද ඒකේ තේරුම... වේවැල් ඇමැති කියන්න තිබුණානේ... එහෙම නැත්නම් පිත්තල ඇමැති, එහෙමත් නැතිනම් ලී බඩු ඇමැති... ඇත්තටම මේක ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශයක් නේ... ඉතින් මේ රටේ මිනිස්සුන්ගේ හැටි එහෙම තමයි... ඕනෑ එකක අවමාන කරන්න පුළුවන් දෙයින් තමයි අල්ලා ගන්නේ..." කියා ටොම්සන් මහත්තයා අත සෝදා ගත්තේය.

"මට නං හිතෙන්නේ එහෙම නෙවෙයි ටොම්සන් මහත්තයා... දැන් ඔය මාධ්‍ය කට්ටිය නේ මැටි ඇමැති කියන වචනේ රෙජිස්ටර් කරන්න හදන්නේ... එතන කරන්නේ ඇත්තටම ඒ වචනය අවමානයට පාවිච්චි කරන එක නේ... ඒ කාලේ ඉස්කෝලේ ඒ තරම් ඉගෙන ගන්න දක්ෂකම් නැති ළමයින්ට මැටිටා කියලා කිව්වා නේ... අපේ පන්තියේ හිටපු එක මැටිටෙක් ඇත්තටම අද වෙන කොට අර මොළගොඩ මැටි කර්මාන්තය ගම්මානයේ ලොකු සාප්පුවක් දා ගෙන ඉන්නවා... එහෙම බැලුවම අපි තමයි මැටිටෝ වෙලා තියෙන්නේ... නැද්ද මං අහන්නේ...?" කියා ඇම්බන් මහත්තයා සිනහසුණේය.

"මට තියෙන ප්‍රශ්නේ ඒකම නෙවෙයි ඇම්බන් මහත්තයා... අනුන්ට මැටි මැටි කියන මේ මාධ්‍ය මහත්තුරු කවදාවත් මැටි පාගලා නැති අයනේ... අඩු ගණනේ ඇවිදින කොටවත් මැටි ටිකක් පෑගිලා නෑ... ඒකනේ අර මහජනයාට කියලා පටන් ගත්ත බැංකුවටත් මැටි අමතක වෙලා ප්ලාස්ටික්වලට ගියානේ... පහු ගිය අවුරුදු කීයක් මේ විදිහට ග්‍රාමීය ශිල්පීන්ට ලැබෙන්න තිබුණු ආදායම ප්ලාස්ටික් වෙළෙන්දන්ට යන්න ඇතිද? හොඳ වෙලාවට ඒක මේ සැරේ වැළකුණා... නිකම් හිතන්න මැටි කැට ලක්ෂයක් කියන්නේ ඒ ආදායම යන්නේ මේ රටේ ග්‍රාමීය ශිල්පීන්ට නේද? අපේ රටේ දේශපාලනය මීට කලින් මේ විදිහට හැසිරෙව්වා නම් අපේ රටට කොයි තරම් වෙනසක් වෙන්න තිබුණාද?"

ඇම්බන් මහත්තයා දුරකතනයෙන් මහජන ලොක්කාට කතා කළේය.

"දැන් ලොකු මහත්තයා... පහු ගිය කාලේ නිකමටවත් හිතුණේ නැද්ද මේ විදිහට ප්ලාස්ටික් කැට ළමයින්ට දෙන කොට ඒකේ තියෙන ආදීනව... එක පැත්තකට ඒ ප්ලාස්ටික් කැටය නොදිරන අප ද්‍රව්‍යයක් වෙනවා... අනික් පැත්තට නිකම් හිතන්නකෝ මැටි කැටය ඇතුළේ කාසි හෙලවෙන කොට කොච්චර මිහිරි සංගීතයක්ද? ඒ විතරක් නෙවෙයි... දේශීය ශිල්පීන්ට ලැබෙන්න තිබුණු ආදායමක් නේද මේ විදහට නැති කළේ...? ඒ විදිහටද මහජනයා වෙනුවෙන් වැඩ කරන්නේ...? හොඳ වෙලාවට මේ සැරේ ඒකට භාර කාරයෙක්ම ආවේ... නැතිනම් මේ සැරේ වෙන්නෙත් ඒකම තමයි නේද?" කියා ඇම්බන් මහත්තයා කොචොක් එකට කතා කළේය.

මහජන ලොක්කා ටික වේලාවක් කතා නොකර සිටියේය. එක සැරේටම කියන්නට උත්තරයක් සොයා ගන්නට ලොක්කාට නොහැකි විය.

"මේකනේ ඇම්බන් මහත්තයා... ඇත්තටම නම් නිදහසින් පස්සේ අපි ඔක්කෝටම වැරදුණා තමයි... අපේ රටේ තියෙන දේශීය සම්පත් අත ඇරලා පිට රටට ගියානේ.... ඔක්කොම පිස්සු වැටිලා නේ හිටියේ.. අන්තිමට කැටපෝලෙත්, සරුංගලෙත් රටින් ගෙන්නුවා... දැන් තමයි හරි පාරට වැටිලා තියෙන්නේ... ඒකේ හිතේ අමාරුවට තමයි ඔය ඇමැතිතුමාට අවමාන කරන්න නම් පට බඳින්නේ... දැන්වත් හරි පාරට වැටුණු එකට මටත් හරි සතුටුයි... එහෙනං ජය වේවා..." කියා මහජන ලොක්කා දුරකතනය විසන්ධි කළේය.

ටොම්සන් මහත්තයා හිස වැනුවේය.

"ඇම්බන් මහත්තයා... මේ රටේ වැඩි ජනතාවක් හොඳට මොළේ ඇතිව වැඩ කරන අය... මොළේ මැටිවලින් හැදිලා තියෙන්නේ ටික දෙනෙකුගේ විතරයි... ඒ අය තමයි ඔය නම් පට බඳින්නේ... ඔය වගේ අසනීපවලට බෙහෙතුත් නෑ නේ... ඒ හින්දා කළ යුතු දේ හරියට කරන එක තමයි තියෙන්නේ... නැද්ද ඇම්බන් මහත්තයා... එහෙනම් අපි යමු..."

ඇම්බන් මහත්තයාත් සමඟ ටොම්සන් මහත්තයා 'ඇඹුල' අවන් හලෙන් එළියට බැස්සේය.

**බන්දුල පී. දයාරත්න**

# බද්දරමල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

## කස්සප රජුනි මම තව සිහිගිරි පවුවේ

ඇඳගෙන බොලට පුන් පියොවුරු වසාගෙන
පැල් කොටයක රහට අහරක් පිහාගෙන
පැටවුන් දෙක තුනක් උකුළේ ගසාගෙන
හිටියේ එහෙම ඉන්නයි මං හිතාගෙන

රන් රුව වගේ කරුමෙට ලැබු රුව දැකලා
රජු මා බලෙනි ගෙන ආවේ මෙහි කුදලා
පෙර පව් නිසා පවුවට ආ දා ඉඳලා
හැඬුවා මිසක් නැත මම දෙවියන් වැඳලා

පිනවන්නට අනුන්ගේ දෙනයන ද සිත
නිරුවත් කළෙමි තුණු නැඹුල් සුමුදු වත
සිත්තම් කරන විට ඒ සිත්තරුගෙ අත
සායම් කළේ නැත්තේ ඇයි කඳුළු නෙත

සියවස් ගණන් අවු වැසි සුළඟේ දැවටී
දහසක් දෙනා යන එන හැටි ඇහෙන් දිටි
තවමත් වෙනස් නැත මේ ලෝකයෙහි හැටි
පොහොසත් කම් අසල රූපය වෙයි දැහැටි

අඩුවක් නැතුව හැඩ වැඩ නම් අඟ පසඟ
යහමින් නොතිබුණොත් අත මිට ඇයගෙ ළඟ
පහසක් ලබන එක පහසුයි කියා ඇඟ
ගැහැනුන් ළඟට ළංවෙන අය නොමැත හිඟ

නොනිවෙන ගින්නකින් තවමත් දැවෙන ළයේ
රජ සැප නිසා නොපිරුණු හිස් තැනක් තියේ
බිලිඳකු හඬන පැල් කොටයක අඳුරු රයේ
සෙනෙහස පිරුණු කවි පදවැල් රසට ගැයේ

ඇයි මහ බඹුනි මා රූමත් ලෙස මැවුවේ
කවුරුත් නොමැත මගෙ හදවත ගැන හෙවුවේ
මුහුණේ මඳහසකි හිත දුකමයි දෙවුවේ
කස්සප රජුනි මම තව සිහිගිරි පවුවේ

**දිල්රූ ජයසේකර**

## බංකොලොත් මිනිස්සු

කෙනෙක් ඉතා සන්සුන් තැනක එළිමහනේ ගැවසෙමින් ගහ කොළ සැලකිල්ලෙන් විමසමින් පොතක දළ සටහන් අඳියි. ඈ කරන්නේ කුමක්දැයි විමසූ විට ඇගේ පිළිතුර වන්නේ ආභරණ මෝස්තර නිර්මාණය කිරීමට ඒ ශාඛ පත්‍ර, මල් පෙති හැඩ, වර්ණ කදිම අනුප්‍රාණයක් සපයන බවයි. විටෙක ස්වභාවික පරිසරය විටෙක මිනිසා තැනූ දේ, විටෙක තමන්ගේ සිහින ලෝකයක මවා ගන්න දේ නිර්මාණයකට උත්පාදකය සපයයි. වෙනත් නිර්මාණකරුවකුට ඒ ගැන වෙනත්ම හුරුකමක්, ප්‍රගුණනයක් තිබිය හැකිය. එසේ නොවී නම් ලෝකය මේ තරම් සොඳුරු අනේකප්‍රකාර නිර්මාණවලින් හැඩ වූ තැනක් නොවනු ඇත.

ජනප්‍රිය, ප්‍රසිද්ධ කලා නිර්මාණ බිහි කිරීමට සමත් අදහස් පහළ වන්නේ කෙසේද යන්න බොහෝ විට කලාකරුවන්, රචකයන් වෙත ඉදිරිපත් වෙන ප්‍රශ්නයකි. ඒ පැනයට හරි, වැරදි පිළිතුරක් නැත. විවිධාකාරවූ සිතුම් පැතුම් ඇති මිනිසුන් වන අපගේ මනසේ හැලහැප්පීම්, අහිනව මත රාශි, දැනුම, විඳීම සහ ඒවා සමඟ නිදහසේ ක්‍රීඩා කිරීමට, අත්හදා බැලීමට කෙනකුගේ ඇති හැකියාව, නිර්භීතකම මත එකිනෙකා වෙතින් බිහිවෙන නිර්මාණ ඒකාකාරී වීම වැළැක්වේ.

පෞද්ගලිකව මගේ අත්දැකීම අනුව නම් කතාවකට, ගීතයකට අදහසක් ඇති වන්නේ මා තුළින්මය. නොයෙක්වර සඳහන් කර ඇති ලෙසටම ගසක මල් ඵල හට ගන්නාක් මෙන් එම අදහස මතුවන්නේ මගේ මනසේ ඇතුළතින් මිස පිටින් මගේ මනස තුළට නොවේ. නමුත් ගසක මල් ඵල හට ගැනීමට ඉර එළිය, ජලය, පස, වාතය මෙකී නොකී පාරිසරික සාධක අවැසි සේ මට ද අවට ලෝකයෙන් අවැසි පෝෂණය, ආභාසය ලැබේ. නමුත් නිර්මාණය බිහිවන්නේ මා තුළිනි. වෙනත් නිර්මාණකරුවකුට තමන්ගේ නිර්මානකරණය පිළිබඳ අදහස ඊට සපුරා වෙනස් එකක් වනු ඇත.

"නොසිතූ මොහොතක අකුණක් වැදුණා වාගේ මේ නිමැයුම බිහිකිරීමට දීප්තිමත් අදහසක් මගේ ඔළුවට ආවා," "ඉතා දුක්බරව ලොවම එපා වී සිටිද්දී දකින්නට ලැබුණ දෙයක් නිසා මා ඒ ගීතය ලීවා," "හදිසියේ හමු වූ අමුතු කෙනෙක් නිසා ඒ චරිතයට ආභාසය සැපයුවා," වැනි කතාන්දර නොයෙක් විට නිර්මාණකරුවන් ඔබට පවසනු ඇත. "අනේ අපට එහෙම අදහසක් පහළ වෙන්නේ කවදාදැයි?" නව නිර්මාණකරුවෝ විමසති. තමන්ගේ නැවුම් අදහස් ගුණවත් බලවත් ඒවා නොවේ යැයි ඔවුන් කුකුස් ඇති කර ගනියි. එසේ නොවී තමන් බිහි කල නිර්මාණය පිළිබඳ විශ්වාසයක් ඇති, ඒ වෙනුවෙන් ඉදිරිපත් වන නව යොවුන් නිර්මාණකරුවෝද සිටිති. අපට අර වාගේ ගීතයක් ලියා දෙනවාද මේ වාගේ කතාවක් ලියා දෙනවාදැයි මගෙන් ඉල්ලා සිටිනා නව යොවුන් අය හමුවෙති. මේ වාගේ වචන ලියා දෙනවාද, අහවල් ගීතය වාගේ ජනප්‍රිය එකක් ලියන්නට හැකිද වැනි දේ පවා විමසන අය ඇත. එසේම නිර්මාණයක හෘදයාංගම උපත ගැන මනා වැටහීමක ස්වාභාවිකවම තේරුම් ගත් පිරිසක් ද ඇත.

අපට ජනප්‍රිය ගීතයක් ලියා දෙනවාදැයි ඉල්ලන කෙනෙකුට මා විසින් ලැබෙන පිළිතුරක් ඇත. ගීතයක් ලියා දීමට හැක, නමුත් ඒ ජනප්‍රිය කරවීමට මා අත මැජික් දණ්ඩක් නැත. නිර්මාණයක ජනප්‍රිය බව තනිකරම රඳා පවතින්නේ එය පිළිගන්නා රසික සභාව මත මිස එය පිළිගන්වන නිෂ්පාදක කණ්ඩායම අත නොවේ. නිර්මාණයක් ප්‍රසිද්ධ කරවීම අලෙවිකරණයේ උප්පරවැට්ටි දැම්මෙන් කළ හැකි වුවත්, එය ජනප්‍රිය කරවීම බලෙන් කළ නොහැක. රේඩියෝවේ, රූපවාහිනියේ බලෙන් ප්‍රචාරය කරවා නිතර ඇසෙන්නට සැලැස්වීමෙන් ප්‍රසිද්ධ වීමට ඇතැම් ගීතයකට ඉඩ ඇතැත් එය ඉතා කන්දොස්කිරියාවක් වීමට ඉඩ ඇත. නමුත් ඇතැම් ගීතයක් අසන්නා ඉතා ප්‍රිය කරනා නිසා නිතර ප්‍රචාරය වීමට ඉල්ලීම සිදු වීම වෙනස් කාරණාවකි. ගීත පමණක් නොව චිත්‍රපටියක් වේවා, නවකතා පොතක් වේවා, වෙනත් ඕනෑම ඉන්ද්‍රියගෝචර නිර්මාණයක් වෙනුවෙන් එය විඳින්නා වෙතින් එන නොඉඳුල් කැමැත්ත සහ වෙළෙඳපොළ ප්‍රචාරණය නිසා වෙන ප්‍රසිද්ධිය කාරණා දෙකකි. කලාකරුවෙක්, නිර්මාණකාරියක්, නිමැවුම්කරුවෙක් විසින් තමන්ගේ නිර්මාණය ලෝකයට ඉදිරිපත් වීමෙන් පසු එයින් ලැබිය යුතු ප්‍රතිඵලය කුමක් විය යුතුදැයි කිසියම් අපේක්ෂණයක පිහිටයි. නමුත් වැරදීමට හෝ හරියැමට ඉඩ හරිමින් අප විසින් ඉදිරිපත් කරන දේ අප විසින් ඉදිරිපත් වෙන නිර්මාණයක් විය යුතුය.

අනුන්ගේ නිර්මාණ සොරාගනිමින්, එහෙන් මෙහෙන් වෙනස් කරමින්, අනුන්ගේ දේ අලප්ජී ලෙස පිටපත් කරමින් නිර්මාණ සොරකමක යෙදෙන්නා මෙන් නොව හෘදයංගම නිර්මාණකරුවාට වටින්නේ කිනම් ආභාසයක උපකාරයක් සමඟ හෝ වේවා නිර්මාණය තමන් තුළින් ඉපදීමයි. ප්‍රසිද්ධවීමට, සම්මාන ලැබීමට, මුදල් ඉපයීමට පෙර සැබෑ නිර්මාණකරුවාට අවැසි වන්නේ ආත්ම වංචාවක් නොකර තමන් තෘප්තියට පමුණුවන නිර්මාණයක් බිහිකිරීමයි. අනෙක් සියලු කාරණා පෙළගැස්සෙන්නේ ඊට අනතුරුවයි. ජීවන අරගලය සහ අයහපත් ක්‍රමය විසින් පරදවා තමන්ගේ නිර්මාණශීලිත්වය ගුණාත්මක නොවන තත්වයකින් විකුණා කෑමට සිදු වූ අසරණ කලාකරුවන්, නිර්මාණශිල්පීන් ඉතිහාසය පුරා ඕනෑ තරම් නැතුවා නොවේ. නමුත් ඔවුන් පවා අනුන්ගේ ඒවා හොරකම් නොකරන තමන්ට අවංක වූ නිර්මාණ බිහිකරන්නෝ වෙති. කොරියන් නාටකයක ඇති දෙබස් එහෙ මෙහෙ කරමින් කවි පොතක් සිංහලෙන් ලියා සම්මානයක් ඉල්ලන කෙනකු මෙන් නොව තමන්ගේ සරල ගීතයක් වේග රිද්මය හා මුසු කර වෙළෙඳපොළට අනුකූල කරවන ගායකයා සතුව තමන්ගේ නිර්මාණශීලිත්වය ගැන වඩා අවංකභාවයක් ඇත.

නිර්මාණයක් බිහිකිරීමට අදහස පහළ වූ තැන සිට එය පරිසමාප්ත කිරීමට ගන්නා වෙහෙස තුළින් අවසාන ප්‍රතිඵලය දක්වා විවිධාකර අත්දැකීම් ලබමින් විවිධාකර පුහුණුවක යෙදුණද වඩා වැදගත් කාරණාව වන්නේ ඒ ඉදිරිපත් වන නිර්මාණය කෙතරම් දුරට තමන්ටත් අනෙකාටත් අවංකද යන කාරණාවයි. දැනුම ලැබීම, අභාසය, පෝෂණය වීම, දැඩි වීම, අනුප්‍රාණය සාර්ථක නිර්මාණකරුවෙක් බිහිකරයි.

එහෙත් අමු අමුවේ වෙනත් කෙනකුගේ නිර්මාණ සොරකමින් බිහිවන්නේ ආත්මය බංකොලොත් මිනිසෙකි.

**හිමාලි එන්. ලියනගේ**

## ගුණවතී ප්‍රේම කතාව පලතුරු

## මඟුල් මතක

පුංචි කාලෙ මතක දැන් මතක් කරනකොට පෙනෙන්නෙ පරණ චිත්‍රපටයක් වගේ බොඳවෙලා. එහෙම බොඳවෙලා පෙනෙන මතක අතරෙ තියෙනවා මඟුල් ගෙදරක මතක. ඒ "කැන්දන් ඒමේ මඟුල් ගෙදරක්". මං තට්ටු දෙකේ ලා තැඹිලිපාට ගවුමක් ඇඳලා අම්මගෙ වටේ රවුම් බාගෙක හැඩේට කැරකෙමින් ඉන්නවා. ගවුම ඇතුළෙන් කටු කටු වගේ ඇගේ ඇනෙනවා දැනෙනවා. ලස්සනට ඉන්න ටිකක් දුක් විඳින්න වෙනවා කියලා පුංචිකමට වුණත් තේරුම් අරගෙන මම ගවුමෙ අපහසුව ගැන අම්මට නොකියා ඉන්න තීරණය කරනවා. ඉඳලා හිටලා "මනමාලි ඇන්ටි තාම නැත්තෙ ඇයි?" කියලා අම්මගෙ කනට කිට්ටු කරලා අහනවා. මගේ වචන වටපිට උදවියට ඇහුණේ නෑ කියලා සැක ඇරගන්න වගේ අම්මා වටපිට බලනවා. ඔරලෝසුවේ දිග කටුව වට කීපයක් ගියාට පස්සෙ රතිඤ්ඤා සද්දෙ ඇහෙනවා."මනමාල ජෝඩුව එනවා" කියලා කට්ටිය කලබලෙන් එහාට මෙහාට දුවනවා.

මනමාලි ඇස් ගිනිකණ වැටෙන රතුපාට සාරියක් ඇඳලා මනමාල මහත්තයත් එක්ක ගෙට ගොඩවෙනවා. දොර උළුවස්සෙ මල් රතිඤ්ඤා වැලක් එල්ලලා තියෙනවා. ජෝඩුව ගෙට ගොඩවෙනකොටම ජාතික ඇඳුම ඇඳපු තරුණ මහත්තයෙක් ගිහින් මල් රතිඤ්ඤා වැලේ නූලෙන් අදිනවා. රතිඤ්ඤා පොකුරෙන් පාට පාට වෙවාරණ කොල කැලි මනමාල ජෝඩුවගෙ ඔළුවට වැටෙනවා. එයාලා ඒවා අතින් පිහිදාන ගමන් හිනා මූණෙන් ගෙට ගොඩවෙනවා. මනමාල මහත්තයාගෙ අම්මා පිච්ච මල් දාපු වතුර විදුරුවක් අරන් ඇවිත් මනමාල ජෝඩුවටම උගුර උගුර පොවනවා. ඊට පස්සෙ එයාලා ගිහින් රතුපාට ඇන්තූරියම්වලින් හැඩ කරපු සෙට් බැක් එකක් තියෙන සෙට් එකේ ඉඳගන්නවා.

මංගල සභාව පටන්ගන්නෙ ඊට ටිකකට පස්සෙ. විවාහ ජීවිතේ යහපත්ව ගත කරන්නෙ කොහොමද කියලාත්, දරු මල්ලො හුඟාරියක් හිටියාම බොහොම හොඳ විත්තියත් ටිකක් තලතුනා මහත්තුරු දෙතුන් දෙනක් කතා පවත්වලා මනමාල ජෝඩුවට කියලා දෙනවා. ඒ කතා අහලා මනමාලි ඇන්ටි ලජ්ජාවෙන් වගේ බිම බලාගෙන ඉන්නවා.

ඊට පස්සෙ මනමාල ජෝඩුව ලොකු තට්ටු ගානක කේක් එකක් කපනවා. මම ලොකු කේක් ගෙඩියෙන් කේක් කෑල්ලක් ලැබෙනකල් බලන් හිටියට ඇත්තටම ලැබෙන්නෙ පාට කොළේකින් ඔතපු වෙනම ජාතියක කේක් කෑල්ලක්. මම ඒ ගැන දුකෙන් ඉන්න විත්තිය තේරිලා ලොකු කේක් එක බොරු කේක් එකක් විත්තිය අම්මා කියලා දෙනවා. එච්චර උජාරුවට බොරු කේක් හදන්නෙ මොකටද කියලා පුංචි කමට මං කල්පනා කරනවා. දවල්ට කන්න කලින් දෙන එන්සල් ඇටේ හපපුවාම මම අකැමැති රහක් දැනෙනවා. ඒක දෙන්නෙ කට සුවද ගහන්න විත්තිය අම්මා කියනවා.

ඔය සියලු සිදුවීම් අස්සෙ බඩු පුරවපු ලොකු ලොරියක් මඟුල් ගෙදර දිහාට එනවා. හැමෝගෙම ඇස් ඒ ලොරියෙ ඇලවෙනවා. ඒ ගෙනාවෙ මනමාලි ඇන්ටිගෙ දෑවැද්දය කියලා එදා නැතත් පස්සෙ කාලෙක මම තේරුම් ගන්නවා. මංගල්ලෙ අහවර වෙනකොට හිතට වගේම ගතටත් හරිම තෙහෙට්ටුයි.

මනමාලි ඇන්ටි අපේ අම්මගෙ යාළුවෙක් වෙච්ච් හින්දා මාස දෙක තුනකට සැරයක් මම ඇන්ටිව දකිනවා. ලස්සනට හිටපු ඇන්ටිගෙ

## ගොල්ලි කතන්දර

මූණ දිග ඇදිලා කෙඩෙත්තු ගති පිරෙන්න ගන්නවා. ජීවිතේ හරි මහන්සියි කියලා ඇන්ටි වචනෙන් නොකියුවට ඇන්ටිගෙ මූණ ඒකට සාක්ෂි දරනවා.

කාලෙත් එක්ක මනමාලි ඇන්ටිගෙ ජීවිතේ මංගල්ලෙන් පස්සෙ ලස්සන නොවිච්චි විත්තිය මම දැන ගන්නවා."දරුවො නිසා ඉවසගෙන හිටියා" කියලා කොණ්ඩෙත් සුදුපාට වුනාට පස්සෙ කාලෙක මනමාලි ඇන්ටි හිතේ දුක වචන කරල හිස් අවකාශෙට මුදා හරිනවා. ගත වෙච්ච ජීවිත කාලෙ ගැන විස්සෝපයක් මනමාලි ඇන්ටිගෙ මූණෙ තියෙනවා.

මං ලොකු ගෑනු ළමයෙක් වෙලා රස්සාවක් කරන්න පටන් ගත්තට පස්සෙ අනන්ත මංගල උත්සවවලට ආරාධනා ලැබෙනවා. යාළුවෙක් වෙච්ච නටාලි කොළඹ ලොකු හෝටලේක කසාද බැඳලා, කැන්දන් ඒමේ මංගල්ලෙ කොළඹ තව ලොකු හෝටලේක ගන්නවා. මංගල්ලෙට බැංකු ණයකින් ගත්ත සල්ලි වියදම් කරලා එයාලා කුලියට පදිංචියට යනවා.

නටාලි ලොකු රස්සාවක් කරන හින්දා එයා ලොරියකින් අලුත් ගෙදරට බඩු ගෙනියන්නෙ නෑ. එයාගෙ පඩි සල්ලිවලින් ගෙදරට ගැළපෙන බඩු සල්ලිවලට ගන්නවා. ඒත් "දෑවැදි ගෙනාවෙ නෑ" කියලා වටපිටේ උදවිය ඇහෙන නැහෙන සද්දෙන් කියන කතන්දර එයාට ඇහෙනවා කියලා එයා දුක් ගැනවිලි කියන වෙලාවට මං අහගෙන ඉන්නවා.

අවුරුදු දෙක තුනකින් නටාලි එයාගෙ මහත්තයා එක්ක නීත්‍යනුකූලව තිබ්බ්ච් බැඳීම ලිහලා දානවා. වෙන්වීමට හේතුව "නොගැලපීම" කියලා නටාලි කියුවත්, අපහාස උපහාස කතන්දර හතර වටෙන් ඇහෙනවා. "ගෑනු වුණාම ඉවසන්න ඕනෙ" කියලා අලුත් තාලෙට අඳින පලඳින අපේම යාළුවෙක් නටාලිට මූණටම කියනවා. "ජීවිතේම දුක් විඳින්න ඕනෙ නෑ." නටාලි සිතුවිලි තරුණ කාලෙම වචන කරපු හන්දා එයාගෙ ජීවිතෙන් බාගයක්ම ඉතිරි වෙනවා.

"අම්මලා හරි කලබලයිනෙ. සම්බන්ධයක් ගැන දැනගත්ත ගමන්ම කසාද ප්ලෑන් කරනවා. මනුස්සයාව හරියට අඳුනගන්න වෙන්නෙත් නෑ. හරියට නිකන් හදපානෙ පැනලා යයි කියලා බයේ වගේ". නටාලි බැඳීම් ලිහලා දැම්මට පස්සෙ දවසක හිනාවෙලා කියනවා. අලුත් තාලෙ මංගල්ලවල හැඩේ වෙනස් වුණාට මිනිස්සුන්ගෙ සිතුවිලි රටාව වෙනස් කරන්න කිසිම අලුත් පන්නෙකට බැරිවෙලා තියෙන විත්තිය මම එයාට මතක් කරලා දෙනවා.

මූදුවලින් එහා රටවල උදවිය වෙනස් විදිහට කසාද බඳිනවා. ගෙදර පසුපස මිදුලෙ (Backyard) එයාලා මංගල සාද පවත්වනවා. ඒ උත්සවවල සතුටු සිනා ඉතිරෙනවා. දෑවැදිවල බර නැති හන්දා හිත්වල සැහැල්ලුව පිරිලා තියෙනවා. අවුරුදු දහ අටෙන් පස්සෙ වෙනම ජීවත්වෙන්න යන නිසා එයාලා ජීවිතයක් තනියම ගත කරන එකේ වියහියදම් බරපතලකම් ගැන හොඳට දන්නවා. කැපෙන සහකරුවෙක් තෝරාගනිද්දි හුඟ වෙලාවට එයාලා ඉස්සෙල්ලා එකට ජීවත්වෙලා ගැළපීම් නොගැළපීම් පාස්සගන්න බලනවා. එහෙම අමාරු නම් කලින්ම හිත් නොහොඳ කරගන්නෙ නැතුව එකිනෙකාට සමුදෙනවා. හොඳටෝම ගැළපෙනවා නම් විතරක් ඇඟිල්ලට මුද්දක් දානවා. පොතේ ලියලා කසාද බඳිනවා. එහෙම කසාද ලිහෙන්නේ හරි කලාතුරකින්.

අපේ රටේ උදවිය, "අපෝ සංකර චාරිත්‍ර" කියලා මූදුවලින් එපිට ජීවිත දිහා අපුලෙන් බලනවා. ඊටත් පස්සෙ චාරිත්‍රවලට මුල් තැන දීලා කසාද බඳිනවා. එක්කො කසාද ලිහෙනවා එහෙම නැත්නම් මනමාලි ඇන්ටි වගේ "දරුවො" නිසා කසාදෙ රැකගෙන ජීවිතේ දුක් විඳින්නම වියදම් කරනවා. අහම්බෙන් කිරියි පැණියි වගේ ගැළපෙන ජෝඩු සන්තෝසෙන් ජීවත්වෙනවා.

කාලෙ වෙනස් තාලෙ අලුත් ලෝකෙක මඟුල් තුලා අලුත් පන්නෙට සිද්ධ වෙනවා. ඒත් හිතන පන්නෙ කවදාවත් වෙනස් වෙන්නෙ නෑ.

**දසුනි හෙට්ටිආරච්චි**

බද්දරමල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
සංස්කරණය - දිල්රූ ජයසේකර

**බද්දර මල්ල ගැන ඔබේ අදහස් අපට කියන්න**
"බද්දර මල්ල" දිනමිණ
ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
baddaramalla@lakehouse.lk

# 20 වැනි සංශෝධනයේ තිබෙන විගණකාධිපතිගේ බලය දුර්වල කිරීම වැනි රටට අහිතකර කරුණු අධ්‍යයනය කරමින් සිටිනවා



## බෙංගමුවේ නාලක හිමි

**අනුර ප්‍රේමලාල්**

විසිවෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් දුර්වල තැන් තිබෙන අතර එහිදී ජනාධිපතිවරයා අධිකරණය හමුවට ගෙන ඒමට නොහැකිවීම , විගණකාධිපතිගේ බලය දුර්වල කිරීම වැනි කරුණු තිබෙන බවත් ඒවා අනුමත කරන්න නොහැකි බවත් ඒ ගැන පූර්ණ අධ්‍යනයක් කොට ජනතාවට ඉදිරියේදී තවත් කරුණු කීමටත් රජයට ලිඛිතව කරුණු දැනුම් දීමට බලාපොරොත්තුවන බවත් ජාතික සංවිධාන සම්මේලනයේ සභාපති බෙංගමුවේ නාලක හිමියෝ ප්‍රකාශ කළහ.

උන්වහන්සේ මේ පිළිබඳ ප්‍රකාශ කළේ පසුගියදා (07) කොළඹ07, මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ පැවැති ජාතික සංවිධාන සම්මේලනයේ මාධ්‍ය හමුවට සහභාගි වෙමින්ය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ බෙංගමුවේ නාලක හිමියෝ මෙසේද කීහ. මේ රජය ගෙනා විසිවෙනි සංශෝධනයේ අඩුපාඩුකම් අනවශ්‍ය කාරණා තියෙනවා. මේ ගැන පූර්ණ අධ්‍යනයක් තවම අපි කරලා නැති නිසා ඒ ගැන නිසි අධ්‍යයනයක් කොට වෙනම මාධ්‍ය දැනුවත් කිරීමක් කරන අතර රජයටත් ඒ ගැන ලිඛිතව දැනුම් දීමට පියවර ගන්නවා. එහි ජනාධිපති උසාවි ගෙන ඒම ඇහිරෙන විදියේ ඡේද තියෙනවා.ඒක හරි නැහැ. ජනාධිපති ඒක දන්නවා නම් ඒකට කැමැති වෙන එකක් නැහැ. එහි අනෙක් පැත්තෙන් කියනනේ වැරැදි කර කර ඉන්න පුළුවන් කියන එකනේ ජනාධිපති වුණත් එහෙම වෙන්න බැහැ. දැනට සිටින ජනාධිපතිවරයා නම් එසේ වැරැදි නොකරන කෙනෙක් කියලා අපි විශ්වාස කරනවා. මෙම නීති පනවන්නේ වර්තමානයට පමණක් නොවේ අනාගතයටත් එක්කයි. ඒ නිසා ජනාධිපති වුණත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට රටට පටහැනිව කටයුතු කරනවානම් උසාවි ගෙන යෑමට අවස්ථාව තිබිය යුතුමයි.

ඒ වගේම තමයි විගණකාධිපතිගේ බලතල දුර්වල කරලා එහි කරුණු සඳහන් වෙනවා. සමහර අමත්‍යාංශ විගණනය කිරීමේ බලය අත්හිටුවලා කපා හැර තියෙනවා. විගණකාධිපතිට පුළුවන් කමක් තියෙන්න ඕනේ ආණ්ඩුව වියදම් කරන දේවල් සොයා බලා එහි හරි වැරැදි පෙන්වා දීමේ අයිතියක් තියෙන්න ඕනේ. පසුගිය යහපාලන රජය කොයිතරම් වැරැදි කළාද කියලා අමුතුවෙන් කාටවත් කියන්න ඕනේ නැහැ. සමහර ඒවා විගණකාධිපතිගේ දැඩි මැදිහත්වීම නිසා නොකෙරුණා වෙන්නත් පුළුවන්. ඒ නිසා විගණකාධිපතිගේ බලතල අඩු කිරීම අපි පිළිගන්නේ නැහැ. පොලිස් කොමිසමට පැමිණිලි කළ හැක්කේ සාමාන්‍ය මිනිසුන්ට පමණයි. පොලිස් නිලධාරින්ට බැහැ. ඒ අයට පැමිණිලි කරන්න තියෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටයි. එම කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි ප්‍රමාණය විශාලයි. මෙවැනි කරුණු තවත් තිබෙන්න පුළුවන් ඒ නිසා මේ 20 වෙනි සංශෝධනය ගැන පූර්ණ අධ්‍යනයක් කොට ඉදිරියේදි කරුණු පැවැසීමට බලාපොරොත්තුවෙනවා.

පළාත් සභා එපා කියලා අපි පළාත් ගෙන එන කොටම කිව්වා. එය දැනුත් කියනවා. අපිට බැහැ අපේ සත්‍ය මත වාදය වෙනස් කරන්න. අපි එක මතයකයි සිටින්නේ. සමහර දේශපාලකයෝ ඒ අයගේ වාසියට මතය වෙනස් කළාට අපි එය කරන්නේ නැහැ. පළාත් සභාව මේ රටට අවශ්‍ය නැහැ කියන එක තමයි අපි පැහැදිලිවම කියන්නේ. රාජ්‍ය නොවන සංවිධානය මේ රටට විශාල හානියක් කරනවා. යුද්ධය පැවැති සමයේ උතුරු නැගෙනහිර පළාත්වලට රිංගලා දෙමල මිනිසුන්ට විශාල හානියක් කළා. කෘෂිකාර්මික ජීවිතයක් ගත කළ ඒ මිනිසුන්ව එම ජීවිතවලින් වෙනස් කොට නිවෙස්වල සිට රාජ්‍ය නොවන සංවිධානවලින් ලබාදෙන ආධාරවලින් නිකං සිට කන බොන තත්ත්වයට පත්වුණා. ඒ නිසා ආණ්ඩුව ප්‍රවේශම් වෙන්න ඕනේ රාජ්‍ය නොවන සංවිධාන වලින්. එම සංවිධානවල සිටින කිසිම අයෙක් රජයේ තනතුරුවලට හා විදෙස් තානාපති සේවාවලට පත් නොකළ යුතුයි යන්න ජාතික සංවිධාන සම්මේලනයේ මතයයි. මේවා අපි කියන්නේ රටට අහිතිකර නිසයි.

**රුහුණු රට භික්ෂු පෙරමුණේ , තුන්හෙළ ජාතික සංවිධානයේ සභාපති ඕමාරේ කස්සප හිමියෝ**- මෙම මාධ්‍ය හමුවේ අරමුණ රටේ දියුණුවට රජයේ හා ජනතාවගෙන් ඉටුවිය යුතු දේවල් මොනවාද කියලා පෙන්වා දෙන එකයි. වත්මන් ජනාධිපතිවරයාත්, රජයත් පත් කරගැනීමට ජාතික සම්මේලනයට සිදුකළ කාර්ය සාර්ථකවීම ගැන අපි සතුටු වෙනවා. පසුගිය යහපාලන ආණ්ඩුව රටට කරපු විනය, හානිය නිසා රටේ සෑම ප්‍රදේශයකම වගේ ජනතාවට ජනාධිපතිවත් ඉන්පසු ඒ මහතාගේ ඉල්ලීම අනුව වත්මන් ආණ්ඩුවත් වැඩිම ඡන්දයෙන් පත් කරගත්තා. මේ අය ආණ්ඩුකරන විට ඒවාට උපදෙස්දීම ඊට සහයෝගය දැක්වූ අපේ යුතුකමයි. අල්ලක් තරම් මේ කුඩා බිම් කඩ කෑලි නවයකට පත්කොට පාළාත් සභාවලට යටත් කරලා පාලනය කරන දුර්වල තීරණය ගත්තේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතියි. විදේශ බලපෑමක් හැටියට එදා ඉන්දියාවේ බලපෑමතුල තමයි ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කළේ. ඒ ගිවිසුම අත්සන් කරද්දි විරෝධයක් පලවුණා රටතුල ශ්‍රී ලංකා යුධ හමුදාවේ ආරක්ෂක භටයෙක් ඉන්දීය නායකයාට පහරදීමක් පවා සිදුවුණා. ඒ තරම් මුළු රටේම අප්‍රසාදයක් පිළිකුලක් අත්සන් කරන ගිවිසුම සම්බන්ධයෙන් ඇතිවුණා. නමුත් මේ පාලකයින් පාලන බලය ගත්තාම ඒ අය බලනවා ඔහුන්ගේ බුදලයක් ලෙස වැඩ කරන්න. ඒ ලෙස කරන්න ගිහිල්ලා තමයි ජයවර්ධන මහත්තයා මේ ගිවිසුම අත්සන් කළේ ජනතා විරෝධය නොතකා. මේ ගිවිසුමෙන් යෝජනාවුණේ උතුරේ හා නැගෙනහිර දෙපලාතේ කාලයක් තිස්සේ ඇතිවු කැරැල්ල සඳහා පළාත් සභා විසඳුමක් ලෙස ඉදිරිපත්වුණා. පසුව ලංකාව පුරාවටම මේ පළාත් සභා ක්‍රියාත්මක කළා. පයවරට පිටිකර බෙහෙත් බඳිනාසේ අන්තිමට කිසිම සම්බන්ධයක් නැති අනෙක් පළාත්වලටත් මේ පළාත් සභා පර කරපින්නන්න කටයුතු කළා. මේක 1987 සිට ගණනය කරලා බැලුවොත් මේ පළාත් සභා වෙනුවෙන් කරපු පිරිවැය මේ රටේ ජාතික සංවර්ධනයට යොදන්න තිබු සල්ලි එක්තරා කණ්ඩායම්වල පැවැත්මට යෙදුණා. ඒ කියන්නේ මහා ඇමති , ඇමැතිවරු පස් දෙනෙක් ඔවුන්ගේ නඩත්තු කණ්ඩායම් ලේකම්වරු අධ්‍යක්ෂවරු , යටිතල පහසුකම් මේ සියල්ල වෙනුවෙන් කරන සියලු වියදම් කරන්න සිදුවුණේ ඒ පළාත් සභා යටතේයි. මේ පළාත් සභා එන්න කලින් රටේ සංවර්ධනය හොඳින් සිදුවුණා. කුඩා පාර්ලිමේන්තු නවයක් මධ්‍යම පාර්ලිමේන්තුවත් ගත්තාම පාර්ලිමේන්තු දහයක්. අද මහා පාර්ලිමේන්තුව නඩත්තු කරගැනිම අසීරු බව ජනතාව කතා බහ කරන අතරේ තවත් පාර්ලිමේන්තු නවයක් නඩත්තු කරන්න ජනතාවට සිදුවෙලා තියෙනවා.

**බෞද්ධ තොරතුරු කේන්ද්‍රයේ අධ්‍යක්ෂ අඟුල් ගල්ලේ ජිනානන්ද හිමි.....** විශේෂයෙන් සිහිපත් කරන්න ඕනේ ඉකුත් යහපාලන රජය පිරිහෙන්න හේතුවූයේ රටට අහිතකර අණපනත් සම්මත කරගන්න යෑමයි. ඔවුන්ගේ විදේශයන්ගේ අවශ්‍යතාවයන් ඉටුකර ගන්න යෑම. ඒ නිසා බහුතරසඟරුවනගේ හා බහුතර ජනතා කැමැත්ත මත මේ රජය පත් කරගන්න හැකිවුණේ. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිටත් ,ඇමැති මණ්ඩලය මෙහෙයවන අගමැති මහින්ද රාජපක්ෂ මහතාටත් ,මන්ත්‍රී මණ්ඩලයටත් වගකීමක් තියෙනවා ඉකුත් රජය සිදුකළ දේවල් කිසිම හේතුවක් නිසා මේ රජය සිදුනොකරන්න වග බලාගන්න. මෑත භාගයේ සිදුවන කරුණුවලදී අපිට ආරංචි පැමිණෙනවා එම්.සී.සී. ගිවිසුම යළි ක්‍රියාත්මක කරන්නට අමෙරිකානු තානාපති කර්යාලයත් තවත් අය ක්‍රියාත්මක වන බව. ඒ නිසා ගුණරුවන් මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කෙරුණා. ඇක්සා, සෝෆා ඇතුළු අනෙකුත් රටට අහිතකර ගිවිසුම් සඳහා අපි අධිකරණයට ගොස් තියෙනවා. ජපානයේ ඔකිනාවා දූපතේ වර්තමානයේ ඇතිවි තිබෙන තත්ත්වය ඔබලාට දැක බලාගන්න පුළුවන්. එහි ක්‍රියාත්මක වන්නේ එම්.සී.සී. ගිවිසුමෙන් පසු අමෙරිකාවේ නීතියයි.

මෙහිදි මතුගම සෙනෙවිරුවන්, ප්‍රගතිශීලි තරුණ ව්‍යාපාරයේ සභාපති බි.එම්. එම්.වීරසිරි යන මහත්වරුද මාධ්‍ය හමුව ඇමතූහ.

---

# යුද හමුදා විශේෂ බළකා පුහුණුව ලැබූ භට පිරිස් රට රැක්මට විසිර යති

## විශේෂ බළකායට නව නිල ඇඳුමක්

**රත්නසිරි පතිරණ සහ රක්ෂණ ශ්‍රියන්ත, මාදුරුඔය සිට...**

තිස් වසරක යුද්ධය නිමා කිරීමට අසම සම දායකත්වයක් දැක්වූ යුද හමුදාව, තව දුරටත් රට රකිමින් මත්ද්‍රව්‍ය සහ පාතාලය රටින් තුරන් කිරීමටද දායක වන බව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ විශේෂ බළකා රෙජිමේන්තු අධිපති, ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා අවධාරණය කළේය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කොරෝනා අභියෝගය සාර්ථකව මැඩලීමට දායකත්වය දැක්වූවා සේම ඉදිරියේදී මෙරටට එල්ලවන කුමන ආකාරයේ අභියෝගයකට වුවද සාර්ථකව මුහුණ දීමේ ධෛර්යයෙන් හැකියාවෙන් හා ශක්තියෙන් පසු වන ලොව කිසිම රටකට නොදෙවැනි හමුදාවක් බවද කියා සිටියේය.

යුද හමුදාධිපතිවරයා මේ බව ප්‍රකාශ කළේ පෙරේදා (12) මාදුරුඔය යුද හමුදා විශේෂ බළකා පුහුණු පාසලේ පැවැති පාඨමාලා අංක 50 සාර්ථකව නිම කළ නිලධාරින් හා සෙසු නිලයන් විසිර යාමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක් වෙමිනි.

මෙහිදී විශේෂ බළකා පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කළ නිලධාරින් 05 දෙනෙකු හා සෙසු නිලයන් 295 දෙනෙක් විසිර ගියහ. මෙම අවස්ථාවේදී විශේෂ බළකායට නව නිල ඇඳුමක් හඳුන්වාදීමට යුද හමුදාපතිවරයා විසින් සිදු කරන ලද අතර එම නව නිල ඇඳුමෙන් සැරසී යුද හමුදාපතිවරයාද උත්සවයට එක්ව සිටියේය.

මෙහිදී උත්සවය වර්ණවත් කරමින් තූර්ය වාදක සංදර්ශනයක්, පැරෂුට් සන්දර්ශන, ටයිකොන්ඩෝ සන්දර්ශනයක්, ධාවන පැදි සංදර්ශනයක්, සංග්‍රාමික කුසලතා සංදර්ශනයක්. ප්‍රහාරක ධාවන පැදි සමඟ නගර බද හමුදා ක්‍රියාන්විත සංදර්ශනයක් විශේෂ බළකා සාමාජිකයන් විසින් පවත්වන ලදී.

මෙම විශේෂ බළකා පාඨමාලා අංක 50 පාඨමාලාවේ දක්ෂතම සිසුවා සහ දක්ෂතම ශාරීරික අභ්‍යාස සිසුවා ලෙස ලුතිනන් ටී.එම්.ටී.ජී.තෙන්නකොන් මහතාටත් දක්ෂතම වෙඩි තබන්නා ලෙස ලාන්ස් කෝප්‍රල් එ.ජී. අලුත්ත්ගෙදර මහතා වෙත ශූරතා කුසලාන පිරිනැමීමද යුද හමුදාපතිවරයා විසින් සිදු කරන ලදී.

මේ අවස්ථාවට ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ උසස් නිලධාරීන්, යුද හමුදා විශේෂ කාර්ය බළකා පුහුණු පාසලේ සේනා විධායක කර්නල් ආර්.පී.එස්.ප්‍රසාද් මහතා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ නිලධාරින්, සම්භාවනීය අමුත්තන්, විසිර ගිය විරුවන්ගේ මාපියන් ඇතුළු පවුල්වල ඥාතීහු එක්ව සිටියහ.

---



# මේ සෙබළු අද සිට පවුලේ පමණක් නොව රට රකින විශේෂ බළකා පවුලේද සාමාජිකයෝ

## යුද හමුදාපති

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ විශේෂ බළකා රෙජිමේන්තු අධිපති, ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා වැඩිදුරටත් අදහස් දක්වමින්:

ඉතාමත් අභියෝගාත්මක හා අති දුෂ්කර පාඨමාලාවක් සාර්ථකව හදාරා විශේෂ බළකායේ විශිෂ්ටයන් අතරට එක්වීම සඳහා අද දිනයේ විසිර යන නිලධාරීන් සහ සෙසු නිලයන් හට වර්තමාන යුද හමුදාපති හා රෙජිමේන්තුවේ අධිපති වශයෙන් මාගේ සුභාශිංසන පිරිනමනවා.

"අධිෂ්ඨානයෙන් අභීතව අරමුණ කරා" යන ආදර්ශ පාඨය පෙරටුකොට ගත් ඔබ රෙජිමේන්තුව යුද හමුදාව තුළ සුවිශේෂිතම රෙජිමේන්තුවක්. වර්ෂ 1985 අගෝස්තු මස 26 වැනි දින ඇරඹි විශේෂ කාර්ය බළකායේ යුද හමුදාව සතුව සිටි අභීත සටන්කාමී නිලධාරීන් මෙම බළකාය නගා සිටුවීම සඳහා කැප කිරීම් කළ ආකාරය විශේෂයෙන්ම සිහිපත් කළ යුතුයි.

කුඩා බළකායක් ලෙස ඇරඹි විශේෂ කාර්ය බළකාය වර්තමානය වන විට රෙජිමේන්තුවක් සහ බළසේනාවක් දක්වා වර්ධනය වෙමින් පුහුණු පාසල් දෙකකින්ද බළ ඇණි හතරකින්ද සමන්විත වී තිබෙනවා.

රටේ ස්වෛරීත්වය සහ භෞමික අඛණ්ඩතාවය සුරක්ෂිත කිරීම වෙනුවෙන් සුවිශේෂී සේවාවක් වර්තමානයේදී ඉටුකරමින් පවතින විශේෂ බළකාය වෙත ඇතුළත් වීමට වාසනාව උදාවීම සම්බන්ධයෙන් එහි නවකයන් වන තරුණ ඔබ සියලු දෙනා මහත් සේ ආඩම්බර විය යුතුයි. අද පටන් ඔබ එක්වන විශේෂ බළකාය 1980 දශකයේ සිට 2009 වර්ෂයේ මැයි 18 වන දින ත්‍රස්තවාදය අවසන් වන තුරු විශේෂ කැපකිරීම් සිදු කළ රෙජිමේන්තුවක්. විශේෂයෙන්ම දිගු දුර මෙහෙයුම් හා වන ගත සටන් සඳහා මෙම බළකාය යුද්ධයේදී ශක්තිමත්.

